**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ**
**නවවැනි පාර්ලිමේන්තුවේ පළමු සභාවාරය**

**පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 165**

# අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවල පළමුවැනි වාර්තාව

**(2021 ඔක්තෝබර්)**

**නියෝජ්‍ය කථානායක සහ කාරක සභා සභාපති**
**ගරු අජිත් රාජපක්ෂ මහතා**
**විසින්**
**2022 ක් වූ ජූනි මස 09 වැනි දින ඉදිරිපත් කරන ලදී.**

අනුමැතිය ලැබීම මත මාසික වාර්තාවට ඇතුළත් කරන ලද කාරක සහා කාර්ය සටහන් පහත දැක්වේ.

| අනු අංකය | අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ නම | දිනය |
|---|---|---|
| 01. | ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2020.11.21 |
| 02. | වාරිමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2020.11.23 |
| 03. | රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2020.11.23 |
| 04. | නාගරික සංවර්ධන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2020.11.24 |
| 05. | කෘෂිකර්ම කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2020.11.24 |
| 06. | ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2020.11.25 |
| 07. | වැවිලි කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2020.11.26 |
| 08. | ඉඩම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2020.11.26 |
| 09. | අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2020.11.28 |
| 10. | විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2020.11.30 |
| 11. | විදුලිබල කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2020.11.30 |
| 12. | ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2020.12.01 |
| 13. | වෙළෙඳ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2020.12.01 |
| 14. | වරාය හා නාවික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2020.12.02 |
| 15. | සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2020.12.02 |
| 16. | පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2020.12.03 |
| 17. | වනජීවී හා වන සංරක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2020.12.03 |

| | | |
|---|---|---|
| 18. | ප්‍රවාහන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2020.12.04 |
| 19. | අධිකරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2020.12.05 |
| 20. | මුදල් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2020.12.07 |
| 21. | මහාමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2020.12.07 |
| 22. | සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.02.09 |
| 23. | අධිකරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.02.10 |
| 24. | කෘෂිකර්ම කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.02.11 |
| 25. | විදේශ කටයුතු පළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.02.11 |
| 26. | අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.03.10 |
| 27. | පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.03.25 |
| 28. | ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.03.26 |
| 29. | ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.07.20 |
| 30. | වනජීවී හා වන සංරක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.09.21 |

මේ වන තෙක් අනුමැතිය නොලැබීම හේතුවෙන් මාසික වාර්තාවට ඇතුළත් නොකරන ලද කාරක සභා කාර්ය සටහන් පහත දැක්වේ.

| | **උපදේශක කාරක සභාවේ නම** | **දිනය** |
|---|---|---|
| 01. | බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2020.11.23 |
| 02. | බලශක්ති කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2020.11.25 |
| 03. | තරුණ හා ක්‍රීඩා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2020.11.26 |
| 04. | ජල සම්පාදන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2020.11.27 |
| 05. | සෞඛ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2020.11.28 |
| 06. | කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2020.12.03 |
| 07. | කම්කරු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2020.12.04 |
| 08. | කෘෂිකර්ම කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.03.09 |
| 09. | මුදල් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.03.09 |
| 10. | විදුලිබල කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.03.09 |
| 11. | වෙළෙඳ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.03.10 |
| 12. | වැවිලි කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.03.23 |
| 13. | ප්‍රවාහන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.03.23 |
| 14. | නාගරික සංවර්ධන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.03.24 |
| 15. | වරාය හා නාවික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.03.24 |
| 16. | ඉඩම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.03.24 |

| | | |
|---|---|---|
| 17. | වාරිමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.03.26 |
| 18. | රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.04.07 |
| 19. | ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.04.08 |
| 20. | මහාමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.07.19 |
| 21. | විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.08.04 |
| 22. | පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.08.05 |
| 23. | ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.08.05 |
| 24. | වාරිමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.09.07 |
| 25. | අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.09.10 |
| 26. | අධිකරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.10.07 |
| 27. | ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.10.21 |
| 28. | සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.10.21 |
| 29. | වනජීවී හා වන සංරක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.10.22 |

**ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමුවන රැස්වීම - 2020 නොවැම්බර් 21**

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා (සභාපති)
ගරු ශාන්ත බණ්ඩාර මහතා
ගරු මනූෂ නානායක්කාර මහතා
ගරු උද්දික ප්‍රේමරත්න මහතා
ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා
ගරු මහින්ද අමරවීර මහතා
ගරු ඩිලාන් පෙරේරා මහතා
ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
ගරු මොහමඩ් මුසම්මිල් මහතා
ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා
ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා
ගරු අජිත් රාජපක්ෂ මහතා
ගරු ගුණතිලක රාජපක්ෂ මහතා
ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
ගරු වීරසුමන වීරසිංහ මහතා
ගරු තවරාජා කලෙයි අරසන් මහතා
ගරු සාගර කාරියවසම් මහතා
ගරු (ආචාර්ය) සුරේන් රාසවත් මහතා
ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතා
ගරු මර්ජාන් ෆලීල් මහතා

**1. ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා**

**1.1 සංශෝධනය කිරීමට නියමිත ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ට අවස්ථාව ලබා දීම - ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**

පුවත්පත් මණ්ඩල පනත සංශෝධනය කිරීමට බලාපොරොත්තු වන බැවින් මන්ත්‍රීවරුන්ට ඒ සඳහා යෝජනා ඉදිරිපත් කරන මෙන් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**1.2 මාධ්‍ය ආයතන සඳහා ස්වයං නියාමන ක්‍රමවේදයක් සැකසීම සහ වෙනත් කරුණු - ගරු මනූෂ නානායක්කාර මහතා**

ස්වයං නියාමන ක්‍රමවේදයක් සැකසීමට පාර්ලිමේන්තු පනත් කෙටුම්පතක් සකස් කර ඇති අතර, එය නීතිගත කිරීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

### 1.2.1 පාර්ලිමේන්තු සභාවාර විකාශය කිරීම

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ අයි නාලිකාව මගින් පාර්ලිමේන්තු සභාවාර විකාශය කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

### 1.2.2 වෙබ් අඩවි පාලනය හා නියාමනය

ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලද අන්දමේ වෙබ් අඩවි නියාමනය කිරීමේ ක්‍රමවේදයක් ඇති කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.2.3 ප්‍රවෘත්ති වෙබ් අඩවි සහ සමාජ මාධ්‍ය හැසිරවීම

ප්‍රවෘත්ති වෙබ් අඩවි සහ සමාජ මාධ්‍ය තුලින් අසත්‍ය කරුණු පදනම්ව ද්වේශසහගතව පුද්ගල චරිත ඝාතන, අපාහස සිදුකරන හෙයින් ඒවා නැවැත්වීම සඳහා සුදුසු ක්‍රමවේදයක් අවශ්‍ය බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාව වෙත දන්වා සිටින ලදී.

## 1.3 විදේශ වෙබ් අඩවි තුළ පළකරනු ලබන අසත්‍ය පුවත් වාරණය කිරීම - ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතා

සමහර විදේශීය වෙබ් අඩවි මගින් පුද්ගලයින්ගේ චරිත ඝාතනය වන අන්දමින් ප්‍රවෘත්ති විකාශනය කරන බැවින් ඒවා නියාමනය සඳහා ක්‍රමවේදයක් සකස් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 1.4 2018 වසරේදී ‘දිඟන’ ප්‍රදේශයේ සිදුවූ ගැටුම් සම්බන්ධයෙන් මාධ්‍ය වාර්තාකරණය - ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා

ජාතිවාදය පැතිරෙන ප්‍රවෘත්ති අන්තර්ජාලය තුළින් පල කිරීම හැසිරවීමට අවශ්‍ය බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.5 මුලතිව් දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය මාධ්‍යවේදීන් දෙදෙනෙකුට පහරදීම සහ වෙනත් කරුණු - ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

**1.5.1** මුලතිව් දිස්ත්‍රික්කයේ සිදුවන වන සංහාරය පිළිබඳ වාර්තා කිරීමේ යෙදී සිටි මාධ්‍යවේදීන් දෙදෙනෙකුට පහරදීම සහ කැමරා උපකරණ විනාශ කිරීමට අදාළව නීතිමය පියවර ගෙන ඇති බව රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.5.2 මුලතිව් දිස්ත්‍රික්කයේ මුල්ලියාවලයි නගරයේ තැපැල් කාර්යාලය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ලබා දීම

මුලතිව් දිස්ත්‍රික්කයේ මුල්ලියාවලයි නගරයේ උප තැපැල් කාර්යාලය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ලබා දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.5.3 නිදහස් මාධ්‍යවේදීන් සඳහා සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ දායකත්වය ලබාදීම

මාධ්‍යවේදීන් සඳහා සේවක අර්ථසාධක සහ සේවක භාරකාර අරමුදලේ දායකත්වය ලබාදීමට කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 1.6 උතුරු හා නැඟෙනහිර ප්‍රදේශවල පවතින ගැටළු - ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා

### 1.6.1 පළාතේ මාධ්‍යවේදීන් සඳහා මූලික වැටුපක් නියම කිරීම

මාධ්‍යවේදීන්ගේ හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා වු ක්‍රමවේදයක් සකසන ලෙසත් වෘත්තීය පදනම් කරගෙන මූලික වැටුපක් නියම කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

### 1.6.2 උතුරු හා නැඟෙනහිර පළාතේ ජනමාධ්‍ය පිළිබඳව අධ්‍යාපනය ලද පුද්ගලයන් රැකියාගත කිරීම

මාධ්‍ය අධ්‍යයනය, ජනමාධ්‍ය සන්නිවේදන සහ සන්නිවේදන අධ්‍යයනය යන විශ්ව විද්‍යාල උපාධි හැදෑරූ උපාධිධාරීන්ට එම ක්ෂේත්‍රවලට අදාළව පත්වීම් ලබා දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.6.3 උතුරු හා නැඟෙනහිර පළාතේ මාධ්‍යවේදීන්ට පුහුණුව සඳහා ශබ්දාගාර ඇති කිරීම

උතුරු නැගෙනහිර පළාත්වල මාධ්‍යවේදීන්ගේ පුහුණුවීම් වලට අදාළ ශබ්දාගාර ස්ථාපනය කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.6.4 උතුරු හා නැඟෙනහිර පළාතේ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය සඳහා ඇති ගුරු හිඟය

සන්නිවේදනය සහ මාධ්‍ය අධ්‍යයනය යන විෂයයන් ඉගැන්වීම සඳහා උපාධිධාරී ගුරුවරුන් ලබාදෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

### 1.6.5 උතුරු හා නැඟෙනහිර පළාතේ නිදහස් මාධ්‍යවේදීන්ට උසස් අධ්‍යාපනය ලබාගැනීම සඳහා ශිෂ්‍යත්ව ලබාදීම

මාධ්‍යවේදීන් සඳහා ශිෂ්‍යත්ව වැඩසටහනක් සහ උසස් අධ්‍යාපනය ලබා ගැනීම සඳහා අදාළ පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කිරීමට කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

### 1.6.6 උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ බහුවිධ සන්නිවේදන මධ්‍යස්ථානයක් ගොඩනැඟිම

දැනට යෝජනා වී ඇති, යාපන දිස්ත්‍රික්කයේ රංගශාලාවක්, රූපවාහිනීගාරයක් සහ ශ්‍රවණාගාරයක් යනාදී ගොඩනැගිලි ඉදි කිරීමට කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.

### 1.6.7 උතුරු හා නැඟෙනහිර පළාතේ මාධ්‍යවේදීන්ට භාෂාවන් ඉගෙන ගැනීමට අවශ්‍ය භාෂා මධ්‍යස්ථාන ඇති කිරීම

උතුරු නැගෙනහිර පළාතේ මාධ්‍යවේදීන්ට සිංහල සහ ඉංග්‍රීසි භාෂා ඉගෙන ගැනීමට අවශ්‍ය භාෂා සම්පත් මධ්‍යස්ථාන ඇතිකරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.6.8 උතුරු හා නැඟෙනහිර පළාතේ මාධ්‍යවේදීන්ට හැඳුනුම්පත් ලබාදීම

උතුරු පළාත් මාධ්‍යවේදීන්ට ජනමාධ්‍ය හැඳුනුම්පත් ලබාදෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන ඇතැම් යෝජනා සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධ වැඩපිළිවෙලකට යා යුතු බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දන්වන ලදී.

වෛද්‍ය උපාධිධාරීන්ට මෙන් ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ උපාධිධාරීන් අනිවාර්යය රැකියාගත කිරීමකට යාම දුෂ්කර වුවත් අනෙකුත් විෂය කෙෂත්‍රයන්හි උපාධිධාරීන්ට මෙන් අවස්ථා සැලසීමට හැකි බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දන්වන ලදී.

එමෙන්ම මාධ්‍ය ක්ෂේත්‍රයේ නියුතු වෘත්තිකයන් වෙනුවෙන් උපාධි සහ පශ්චාත් උපාධි හැදෑරීම සඳහා රාජ්‍ය හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ අනුමත පෞද්ගලික ආයතන වෙත අමාත්‍යාංශ මට්ටමින් අදාළ පාඨමාලාවන් සඳහා මූල්‍ය අනුග්‍රහය ලබාදීමේ වැඩ පිළිවෙලක් ඇති කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දන්වා සිටින ලදී.

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය පිළිබඳව ප්‍රායෝගික හා විෂයානුබද්ධ අධ්‍යාපනයක් ලබාදීම සඳහා දිස්ත්‍රික්ක 25 තුළ ජනමාධ්‍ය පාසල් 25 ඇතිකිරීමට යෝජිත බවත් එම පාසල්වල මාධ්‍ය ඒකක සඳහා අවශ්‍ය මාධ්‍ය උපකරණ ලබාදීමට බලාපොරොත්තු වන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දන්වන ලදී.

තවද උතුරු හා බස්නාහිර පළාත් තුළ ඩිජිටල්කරණ ක්‍රියාවලිය ආරම්භ කිරීමට බලාපොරොත්තු වන බවද ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දන්වන ලදී.

අමාත්‍යාංශය විසින් මාධ්‍ය ක්ෂේත්‍රයේ නියැලී සිටින සියයකට අධික පුද්ගලයන් සඳහා අධ්‍යයන පාඨමාලා හැදෑරීමට ශිෂ්‍යත්ව ප්‍රදානය කරන බවත් උතුරු හා නැඟෙනහිර පළාතේ මාධ්‍යවේදීන්ට ද ඒ සඳහා අවස්ථාව ඇති බව අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දන්වන ලදී.

### 1.6.9 යුධ හමුදා පාලනයෙහි පවතින යාපනය දිස්ත්‍රික්කයේ පේදුරුතුඩුව තැපැල් කාර්යාල ගොඩනැගිල්ල

මෙම ගොඩනැගිල්ල තැපැල් දෙපාර්තමේන්තුවට පවරා දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

2022 වර්ෂයේදී මෙය පවරා දියහැකි බවත් එතෙක් ශ්‍රී ලංකා යුධ හමුදාව යටතේ පැවතීම වඩාත් සුදුසු බවත්, තැපැල්පති විසින් කාරක සභාව වෙත දැනුම් දෙන ලදී.

### 1.6.10 නැගෙනහිර පළාතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ දෙමළ මාධ්‍යවේදීන්ගේ සංගමයේ ලේකම්වරයාට ඇති තර්ජන

මඩකලපුව දිස්ත්‍රික්කයේ වනාන්තර විනාශය පිළිබඳව වාර්තා කිරීමට කටයුතු කළ නැගෙනහිර පළාතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ දෙමළ මාධ්‍යවේදීන්ගේ සංගමයේ ලේකම්වරයාට තර්ජනය කර ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාව වෙත දැනුම් දෙන ලදී.

## 1.7 ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සහ ස්වාධින රූපවාහිනී ආයතනයේ වර්තමාන තත්වය - ගරු ශාන්ත බණ්ඩාර මහතා

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සහ ස්වාධීන රූපවාහිනී ආයතනයේ වර්තමාන තත්ත්වය පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

එම ආයතන පාඩු ලබන තත්ත්වයට පත්ව ඇතත්, ඉදිරියේදී ලාභ ලබන තත්ත්වයට වැඩිදියුණු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාව වෙත දන්වා සිටින ලදී.

### 1.7.1 කුරුණෑගල දිස්ත්‍රික්කයේ තැපැල් දෙපාර්තමේන්තුවෙන් ලිපි බෙදාහැරීම

කොවිඩ් රෝගය නිසා අඩාල වූ කුරුණෑගල දිස්ත්‍රික්කයේ තැපැල් දෙපාර්තමේන්තු කටයුතු කුරුණෑගල ප්‍රාදේශීය තැපැල් අධිකාරී කාර්යාලය ප්‍රාදේශීය උපතැපැල් කාර්යාලවල කටයුතු වලට මෙම තත්ත්වය තදින් බලපෑ බව තැපැල්පති විසින් දැනුම් දෙන ලදී.

කෙසේවෙතත්, ඉදිරියේදී සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව කාර්යාල විවෘත කිරීමට බලාපොරොත්තු වන බවද තවදුරටත් දන්වන ලදී.

දිස්ත්‍රික්කයේ ඖෂධ බෙදාහැරීමේ කටයුතු අඛණ්ඩව සිදු කරනු ලබන බවද තැපැල්පති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී. කුරුණෑගල ප්‍රාදේශීය තැපැල් අධිකාරි කාර්යාලය සහ තාවකාලිකව ප්‍රාදේශීය උප තැපැල් කාර්යාල තාවකාලිකව වසා දැමීමට සිදු වූ බව තැපැල්පති විසින් කාරක සභාවට දන්වා සිටින ලදී.

එමෙන්ම දිස්ත්‍රික්කයේ ඖෂධ බෙදාහැරීමේ කටයුතු අඛණ්ඩව පොල්පිතිගම කාර්යාලය මූලික කොට ගෙන ක්‍රියාත්මක වන බවද තැපැල්පතිවරයා විසින් කාරක සභාවට දන්වා සිටින ලදී.

### 1.7.2 ජනමාධ්‍ය අධ්‍යයනය සහ සෞන්දර්ය විෂයයන් සඳහා පාසල්වල පවතින ගුරු හිඟය

වයඹ පළාතේ පාසැල් සඳහා සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය, චිත්‍ර කලාව, සහ නාට්‍ය හා රංග කලාව යන විෂයන් සඳහා ගුරුවරුන්ගේ හිඟයක් පවතින හෙයින් එය විසඳන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.

දැනට පුහුණුවන උපාධිධාරීන් 18,000ක් ප්‍රමාණයක් එලදායීව ගුරු සේවයට යොදවන බවත් කැළණිය විශ්වවිද්‍යාලයේ සෞන්දර්ය උපාධිධාරීන්වද ගුරු හිඟය පවතින පාසැල්වලට යෙදවිය හැකි බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාව වෙත දන්වා සිටින ලදී.

## 1.8 මාධ්‍ය තුළින් ප්‍රවෘත්ති විකාශනයේදී භාෂාව පරිශීලනය කිරීම - ගරු උද්දික ප්‍රේමරත්ක මහතා

පෞද්ගලික නාලිකා තුළ ප්‍රවෘත්ති විකාශයේදී භාෂාව භාවිතා කිරීම් පිරිහීමක් ඇති බැවින් ඒ සඳහා මාර්ගෝපදේශයන් සැකසීම වඩාත් සුදුසු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට යෝජනා කරන ලදී.

### 1.8.1 රජයේ රූපවාහිනී නාලිකාවල නව නිර්මාණාත්මක වැඩ සටහන් විකාශනය කිරීම

කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ ප්‍රේක්ෂකයන් රූපවාහිනි වැඩ සටහන් නැරඹීමට වඩාත් යොමුව ඇති හෙයින් නව නිර්මාණශීලි සහ හරවත් වැඩ සටහන් නිෂ්පාදනය කර විකාශය කිරීමට කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

### 1.8.2 රජයේ රූපවාහිනී ආයතනවල ආදායම වැඩිකර ගැනීම

රජයේ රූපවාහිනී ආයතනයන්හි නාලිකාවල නිර්මාණාත්මක වැඩසටහන් නිෂ්පාදනය සඳහා කාර්ය මණ්ඩලයේ උපරිම දායකත්වය ලබා ගැනීම සඳහා පෞද්ගලික නාලිකාවල මෙන් යම්කිසි ඉලක්කයක් ලබා දියයුතු බවත් ඒ අනුව ප්‍රතිලාභ ලබාදීමේ ක්‍රමයක් සැකසිය යුතු බවටත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාව වෙත යෝජනා කරන ලදී.

## 1.9 තැපැල් දෙපාර්තමේන්තුවේ ලිපි බෙදාහැරීමේ සීමාවන් නිර්ණය කර සංශෝධනය කිරීම - ගරු වීරසුමන වීරසිංහ මහතා

මාතර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය ප්‍රදේශවල ලිපි බෙදාහැරීමේ සීමා නිර්ණයන් සංශෝධනය කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

ඉදිරි කාලයේදී සියලු සීමා නිර්ණය කටයුතු අවසන් කර ගැටළු නිරික්ෂණය කළ හැකි බව තැපැල්පති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.9.1 තැපැල් දෙපාර්තමේන්තුවේ ආදේශක ලෙස ලිපි බෙදාහැරීමේ කටයුතු කරන පුද්ගලයන් ස්ථිර කාර්ය මණ්ඩලයට අනුයුක්ත කිරීම

ලිපි බෙදාහැරීමේ ආදේශකයන් ලෙස වසර ගණනාවක් කැපවීමෙන් සේවය කරන පිරිස ස්ථිර කාර්ය මණ්ඩලය වෙත අනුයුක්ත කිරීමට පියවර ගන්නා මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීම් කරන ලදී.

දැනට සීමා නිර්නයන් අවසන් කළ 150 ක ප්‍රමාණය සඳහා අවශ්‍ය බඳවා ගැනීම් සඳහා ඉල්ලුම් කර ඇති බවත් පුරප්පාඩු ඇතිවීම මත ආදේශකයන් යම් ප්‍රමාණයක් ස්ථිර කල හැකි බව තැපැල්පති විසින් කාරක සභාව වෙත දන්වා සිටින ලදී.

### 1.9.2 තැපැල් දෙපාර්තමේන්තුවට අයත් ග්‍රාමීය උප තැපැල් කාර්යාල ප්‍රතිසංස්කරණය කිරීම

දුෂ්කර ප්‍රදේශවල ග්‍රාමීය උප තැපැල් කාර්යාල ප්‍රතිසංස්කරණය නොකිරීම නිසා විනාශ වී යාමේ ඉඩකඩක් පවතින හෙයින් කඩිනමින් සුදුසු පියවර ගන්නා මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.

දෙපාර්තමේන්තුව යටතේ ප්‍රතිසංස්කරණයට උප තැපැල් කාර්යාල 60 ප්‍රමාණයක් ඇති බවත් 2021 වසරේදී අවශ්‍ය ප්‍රතිසංස්කරණ කළ හැකි බවත් තැපැල්පති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.9.3 මාතර දිස්ත්‍රික්කයේ දෙනියාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිටබැද්දර තැපැල් කාර්යාලය

මෙම කාර්යාලය කුලී පදනම මත පවත්වාගෙන යන හෙයින් නව ගොඩනැගිල්ලක ස්ථාපිත කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.

## 1.10 සමාජ මාධ්‍ය භාවිතය පිළිබඳව නියාමනයක් ඇති කිරීම - ගරු අජිත් රාජපක්ෂ මහතා

අසත්‍ය පුවත් පළ කෙරෙන මාධ්‍ය වාරණය කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයක් ඇතිකරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාව වෙතින් ඉල්ලීමක් කරන ලදී.

සමාජ මාධ්‍ය භාවිතය පිළිබඳව කඩිනම් පියවර ගැනීමට යෝජිත බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාව වෙත දන්වා සිටින ලදී.

## 1.11 වෙබ් අඩවි ලියාපදිංචිය සඳහා පහසු සරල ක්‍රමවේදයක් සැකසීම සහ වෙනත් කරුණු - ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

උතුරු සහ නැගෙනහිර පළාත්වල කුඩා පරිමාණයේ ප්‍රවෘත්ති වෙබ් අඩවි විශාල ප්‍රමාණයක් ක්‍රියාත්මක වන හෙයින් වෙබ් අඩවි ලියාපදිංචිය සඳහා පහසු සරල ක්‍රමවේදයක් සකසන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.

### 1.11.1 ප්‍රවෘත්ති වෙබ් අඩවි තුළ පළකරන අසත්‍ය පුවත් ප්‍රකාශයන්ට එරෙහිව පැමිණිලි කිරීමට ක්‍රමවේදයක් සැකසීම

ප්‍රවෘත්ති වෙබ් අඩවි තුළ පළ කෙරෙන පුද්ගල හා ආයතනවල ප්‍රතිරූපයන්ට සාමාජීය වශයෙන් ගැටළු හා හානි ඇති කරන පුවත් පළ කෙරෙන හෙයින් මාධ්‍ය නිදහසට බාධාවන් නොවන ලෙස ඊට එරෙහිව පැමිණිලි කිරීම සඳහා සුදුසු ආයතන ව්‍යුහයක් සකසන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

### 1.11.2 ආචාරශීලි මාධ්‍යවේදීන් බිහි කිරීම සඳහා ක්‍රමවේදයක් සැකසීම

ආචාරශීලි මාධ්‍ය සම්ප්‍රදායක් වෙනුවෙන් කටයුතු කරන මාධ්‍යවේදීන් බිහිකිරීම සඳහා යම් ක්‍රමවේදයක් සැකසීම වඩාත් යහපත් බවද ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දන්වා සිටින ලදී.

වෙබ් අඩවි ලියාපදිංචිය සම්බන්ධයෙන් 2014 වසරේ තම රජය යටතේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණ බවත් නැවතත් එම ක්‍රියාදාමය ක්‍රියාත්මක කිරීම බලාපොරොත්තු වන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දන්වා සිටින ලදී.

ලියාපදිංචි කිරීමේ හා වාර්ෂික ගාස්තු යම් ප්‍රමාණයකින් අඩු කිරීමට කටයුතු කරන බවද ගරු සභාපතිතුමා විසින් කාරක සභාව වෙත දන්වා සිටින ලදී.

එමෙන්ම අසත්‍ය පුවත් පළකිරීම්වලට එරෙහිව ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ පැමිණිලි කිරිමේ හැකියාව ගරු මන්ත්‍රීතුමාට පවතින බවද ගරු සභාපතිතුමා විසින් තවදුරටත් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් මාධ්‍ය ක්ෂේත්‍රයේ නියැලී සිටින සියයකට අධික පුද්ගලයන් සඳහා අධ්‍යයන පාඨමාලා හැදැරීමට ශිෂ්‍යත්ව ප්‍රදානය කරන බවත් අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාව වෙත දැනුම් දෙන ලදි.

මාධ්‍යවේදීන් සඳහා රක්ෂණ ක්‍රමයක් ඇරඹීමට ප්‍රතිපාදන වෙන්ව ඇති බවත් සදාචාරාත්මක මාධ්‍ය සංස්කෘතියක් බිහි කිරීම සඳහා උසස් ගුණාත්මක සහ සංවේදී මාධ්‍යවේදීන් බිහි කිරීම වෙනුවෙන් විශේෂ මාධ්‍ය විද්‍යාලයක් ඇරඹීමට 2021 වසරේදී ගරු සභාපතිතුමාගේ මඟපෙන්වීම යටතේ කටයුතු කිරීමට යෝජිත බව අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාව වෙත දන්වා සිටින ලදී.

**2.** කාරක සභාව පෙ.ව.11.30 ට 2021 ජනවාරි 19 දින ප.ව. 2.00 දක්වා කල් තබන ලදී.

---

**වාරිමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමු වැනි රැස්වීම - 2020 නොවැම්බර් 23**

**පැමිණ සිටි සාමාජික මන්ත්‍රීන්**

ගරු චමල් රාජපක්ෂ මහතා (සභාපති)
ගරු සිරිපාල ගම්ලත් මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු අනුරාධ ජයරත්න මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු ඩිලාන් පෙරේරා මහතා
ගරු ෆයිසාල් කාසිම් මහතා
ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා
ගරු නිමල් පියතිස්ස මහතා

**පැමිණ සිටි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු (වෛද්‍ය) සීතා අරඹේපොළ මහත්මිය
ගරු රෝහණ දිසානායක මහතා
ගරු එච්.එම්.එම් හරීස් මහතා
ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා
ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු උදයන කිරිඳිගොඩ මහතා
ගරු එච්. නන්දසේන මහතා
ගරු සුදත් මංජුල මහතා

ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා
ගරු ගුණතිලක රාජපක්ෂ මහතා
ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා
ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
ගරු මොහොමඩ් මුසම්මිල් මහතා
ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා
ගරු මර්ජාන් ෆලීල් මහතා

**1. අමාත්‍යාංශයීය කටයුතු පිළිබඳ සාකච්ඡාව**

**1.1 අමාත්‍යාංශයේ ඉදිරි ක්‍රියාමාර්ග**

වාරිමාර්ග අමාත්‍යාංශයේ ඉදිරි සැලසුම් සහ වත්මන් ක්‍රියාකාරිත්වය පිළිබඳව වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට විස්තරාත්මක දැනුම් දීමක් කරන ලදී.

**2. ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා**

**2.1 පානීය හා කෘෂි ජල අවශ්‍යතා සපුරා ගැනීම - ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා**

උතුරු නැගෙනහිර පළාත්වල වැව් අමුණු ශුද්ධ කර ගැනීමෙන් පානීය හා කෘෂි ජල අවශ්‍යතා සපුරා ගත හැකි බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.2 හැඩඔය ව්‍යාපෘතිය කඩිනම් කිරීම - ගරු ෆයිසාල් කාසිම් මහතා**

කුඹුක්කන් ඔය ව්‍යාපෘතියද ආරම්භ කිරීමට බලාපොරොත්තුවන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ස්වේච්ඡා සංවිධාන, ගමේ ජනතාව සහ වෙනත් සංවිධානයන්හි සහයෝගය ලබාගෙන සියළු වැව් ප්‍රතිසංස්කරණය කිරීමට අදහස් කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.3 වැව් ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ප්‍රතිපාදන ලබාගැනීම - ගරු එච්. නන්දසේන මහතා**

එක් ගමකට එක් වැවක් හෝ ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.4 මොණරාගල දිස්ත්‍රික්කයේ වැව් ප්‍රතිසංස්කරණය කිරීම - ගරු ෆයිසාල් කාසිම් මහතා**

ගම්වාසීන් ස්වේච්ඡා සංවිධාන සහ හමුදාව සහභාගීත්වයෙන් මෙම වැව් ප්‍රතිසංස්කරණය කළයුතු බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

උතුරු ප්‍රදේශයේ ජනතාවට ඇති පානීය ජල ප්‍රශ්නය විසඳීම සඳහා වැසි වතුර එක් රැස් කිරීමේ වැඩ පිළිවෙලක් සැකසීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 2.5 ගරු ඩිලාන් පෙරේරා මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 2.5.1 උමා ඔය ව්‍යාපෘතිය නිසා ඉඩම් අහිමි වූ ජනතාවට වන්දි ලබාදීම

ව්‍යාපෘති සඳහා ඉඩම් පවරා ගැනීමේදී ඉඩම් හිමිකරුවන්ට ප්‍රමාදයකින් තොරව වන්දි ලබාදීමට කටයුතු කළයුතු බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 2.5.2 මොරාගහ ව්‍යාපෘතිය කඩිනමින් නිම කිරීමට කටයුතු කිරීම

මොරාගහ ව්‍යාපෘතිය කඩිනමින් නිම කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.

## 2.6 පොතුවිල්, ආරුගම්බේ ප්‍රදේශයේ පානීය ජල හිඟය - ගරු එස්.එම්.එම් මුෂාරෆ් මහතා

පොතුවිල් ප්‍රදේශයේ පවතින පානීය ජල හිඟය හේතුවෙන් සාමාන්‍ය ජන ජීවිතය අඩාල වී ඇති අතර එය සංචාරක ව්‍යාපාරයටද දැඩි ලෙස බලපෑම් කරන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී. හැඩඔය සම්පූර්ණ කරන්නේ නම් මෙම ගැටළුව විසඳිය හැකි බවද ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එම ගැටළුව විසඳීමට කඩිනම් පියවර ගන්නා බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 2.7 මොණරාගල දිස්ත්‍රික්කයේ ඇතිමලය ප්‍රදේශයේ ජල ගැටළුව - ගරු එච්.එම්.එම් හරීස් මහතා

වැලිඔය ව්‍යාපෘතිය කඩිනම් කර දිස්ත්‍රික්ක තුනටම සහන සැලසීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එම ව්‍යාපෘතියේ මූලික වැඩ කටයුතු මේ වනවිටත් අවසන් කර ඇති බව වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 2.8 රුවන්වැල්ල මැතිවරණ කොට්ඨාසයේ බස්නාගොඩ වැව ඉදි කිරීමේදී ඉඩම් අහිමි වූ පවුල් 07ක් විකල්ප ඉඩම් ඉල්ලුම් කිරීම - ගරු සුදත් මංජුල මහතා

ඉඩම් අහිමිවූවන්ට වන්දි ලබාදීමේ කටයුතු සිදුවෙමින් පවතින බවත් ඊට සමගාමීව ඉඩම් අවශ්‍ය පුද්ගලයන් හඳුනාගෙන ඉඩම් ලබාදීමේ කටයුතු සිදුකරන බවත් වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එම ප්‍රදේශය නිරීක්ෂණය කර සුදුසු ඉඩමක් හඳුනාගෙන අවශ්‍ය ඉඩම් ලබාදීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු රාජ්‍ය අමාත්‍යවරුන්ගෙන් ඉල්ලීමක් කරන ලදී.

## 2.9 ගරු ෂානක්කියා රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 2.9.1 මඩකලපුව දිස්ත්‍රික්කයේ වැව් ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති සඳහා වෙන්වී ඇති ප්‍රතිපාදන

කුඩා වැව් ප්‍රතිසංස්කරණය කිරීම, වැව් අමුණු ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරන බවත් වාරි ගැටළු සඳහා දීර්ඝ කාලීන විසඳුම් සෙවීමට කටයුතු කරන බවත් රාජ්‍ය අමාත්‍ය ගරු අනුරාධ ජයරත්න මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 2.9.2 පුළුකුනාව වැව ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු කඩිනම් කිරීම

මඩකලපුව ප්‍රදේශයේ ගංවතුර තර්ජනය මැඩපැවැත්වීම සඳහා ජලාශ 04 ක් ඉදිකිරීමට යෝජනා වී ඇති අතර රඹකැන් ඔය ව්‍යාපෘතිය අවසන් කර ඇති බව වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ව්‍යාපෘති සඳහා මේ වසරේ අයවැයෙන් ප්‍රතිපාදන වෙන් වී ඇති බවත් ඒ අනුව ගංවතුර පාලනය වන අතර යල කන්නයේ වගා කටයුතු සඳහා ජලය ලබාදීමේ හැකියාව ලැබෙන බවත් තවදුරටත් දැනුම් දෙන ලදී.

### 2.9.3 මුන්දෙනුආරු ජලාශයේ වැලි අයින් කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමේදී සිදු වී ඇති අක්‍රමිකතාවය

මුන්දෙනුආරු ජලාශයේ වැලි අයින් කිරීම සඳහා වෙන්කලඩි වාරිමාර්ග ඉංජිනේරුවරයා විසින් විශේෂ බලපත්‍රයක් නීත්‍යානුකූල නොවන අන්දමට නිකුත් කිරීමට අවසර දී තිබුණද බලපත්‍ර 32 ක් නිකුත් කර ඇති බවට තොරතුරු අනාවරණය වී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මහවැලි ව්‍යාපෘතිවල මසකට කියුබ් 30ක උපරිමයකට යටත්ව වැලි ඉවත් කිරීම සඳහා බලපත්‍ර නිකුත් කළ හැකි බවත් විශේෂ බලපත්‍ර නිකුත් කරන්නේ නම් එය ප්‍රධාන කාර්යාලය හරහා සිදු කරන බවත් වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පෞද්ගලික පාර්ශව මගින් ගංභාවල වැලි ගොඩ දැමීමේදී ගං ඉවුරු වලට හානි සිදු කිරීම හා ගඟ පතුල අධික ලෙස හැරීම සිදුකරන බැවින් එම කටයුතු ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් කළයුතු බවත් වැලි ගොඩ දැමීමෙන් පසු ඒවා ප්‍රවාහනය කිරීම සඳහා අනෙකුත් පාර්ශවවලට අවස්ථාව ලබාදිය යුතු බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 2.10 ඉරණමඩු ව්‍යාපෘතියේ අනවසර වැලි ගොඩ දැමීම - ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා

අනවසර වැලි ගොඩ දැමීම නතර කිරීම සඳහා පැහැදිලි උපදෙස් සහිතව චක්‍රලේඛයක් නිකුත් කිරීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

**2.11 මාතලේ දිස්ත්‍රික්කය හරහා ගලායන වයඹ මහ ඇළෙන් දිස්ත්‍රික්කයේ වාරි අවශ්‍යතා සපුරා ගැනීම - ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා**

මෙම ව්‍යාපෘතිය සඳහා අපේක්ෂිත ඇස්තමේන්තුව තරමක් අධික වුවද, දිස්ත්‍රික්කයේ වාරි අවශ්‍යතා ඉටු කිරීමට කටයුතු කරන බව අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.12 නුවරඑළිය දිස්ත්‍රික්කයේ වතු ආශ්‍රිත වැව් ජනතා පරිහරණයට ලබාදීම - ගරු නිමල් පියතිස්ස මහතා**

මෙම වතු ආශ්‍රිත වැව් සහ අමුණු අනවසරයෙන් අත්පත් කරගෙන ඇති බැවින් ඒවා නිදහස් කරගෙන ජනතා අයිතියට පත් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**2.13 හේවාහැට ආසනයේ වැව් ප්‍රතිසංස්කරණය කිරීම හා පූජාපිටිය අංකුඹුර ගෝණමඩ රක්ෂිතයේ වැවක් ඉදිකිරීම - ගරු උදයන කිරිදිගොඩ මහතා**

මුතුකෙලිනා වැව, මොරගොල්ල සහ බෝගමුව වැව් ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන ලෙසත් පූජාපිටිය, අංකුඹුර, ගෝණමඩ රක්ෂිතයේ පිහිටි වැව ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**2.14 මාතලේ දිස්ත්‍රික්කයේ, මොරගහකන්ද ජලාශය ආශ්‍රිත මොරගොල්ල හා අක්කර 50 ගම්වාසීන්ගේ ගැටළු - ගරු රෝහණ දිසානායක මහතා**

ගම්වාසීන්ගේ වාරි අවශ්‍යතාවය සපුරා නොමැති වීම හා අක්කර 50 ගම්මානයේ නිවාස පුපුරා ඉරි තැලීමට ලක්වී ඇති අතර අලි ගම්වැදීම හේතුවෙන් ගැටළුකාරී තත්ත්වයන්ට මුහුණ පා ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

නිවාස ඉරිතැලීම් සම්බන්ධව ප්‍රාදේශීය ආපදා කළමණාකරණ මධ්‍යස්ථානය දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත් මහවැලි අධිකාරිය හා සම්බන්ධ කටයුතු මෙම අමාත්‍යාංශය හරහා සිදු කරන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.15 කිලිනොච්චිය, මුලතිව්, මන්නාරම සහ වවුනියාව දිස්ත්‍රික්කවල කෘෂිකර්මයට අවශ්‍ය ජල පහසුකම් ලබාගැනීම - ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**

කිලිනොච්චිය,මුලතිව්,මන්නාරම සහ වවුනියාව යන දිස්ත්‍රික්ක ලංකාවේ වී ගොවිතැනට ප්‍රධාන දායකත්වයක් සපයන බවත් උතුරු පළාතේ පාලි ආරු, කුඩමුරුට්ටියාරු, මන්ඩකල්ලාරු යන ඔයවල ජලය කෘෂිකර්මයට ප්‍රයෝජනයක් රහිතව මුහුදට ගලායන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මීට ඉහත පාලි ආරු ඔයේ ජලය යාපනය දක්වා හැරවීමට සාකච්ඡා කරන ලද අතර වාවාකච්චේරියේ වැවක් ඉදිකිරීමට අත්තිවාරම් දමන ලද බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දන්වා සිටින ලදී. එම ව්‍යාපෘතීන් එම ප්‍රදේශයට පානීය ජලය සැපයීම සඳහා වූ වැදගත් ව්‍යාපෘතීන් වූ නමුත් ඒවා අතරමග නතර කරන ලද බවත් ගරු මන්ත්‍රීතුමා විසින් තවදුරටත් දන්වා සිටින ලදී.

එසේම කිලිනොච්චිය දේවපුරම් ග්‍රාමයට කුඹුරු ලබාදී ඇති නමුත් ජලය නොමැති වීමෙන් ඒවා වගාකිරීමට නොහැකි තත්ත්වයක තිබෙන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දන්වා සිටින ලදී.

ආනවිලුද්දාන් වැව් ජලයෙන් ගොවිතැන් කිරීමට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ගොවියන්ට අවහිර කරන බවත් තවදුරටත් දන්වා සිටින ලදී.

වට්ටකච්චි පුලුදියආරු වැව මඟින් කෘෂි ඉඩම් අක්කර 1000 කට ජලය සැපයිය හැකි නමුත් එය වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ නොමැති බවත් එම වැව ප්‍රතිසංස්කරණය කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 2.16 ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 2.16.1 පුලිදියආරු වැව ප්‍රතිසංස්කරණය කිරීම

මෙම වැව් බැම් විශාල ගස්වලින් ගහණව පැවතීම හේතුවෙන් වැව ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතුවලට බාධා වී ඇතිබව වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ වාරිමාර්ග 114 ක් ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු ආරම්භ කිරීමට නියමිත බව අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 2.16.2 "වැව් ගම් පුබුදුව" ව්‍යාපෘතියේ කටයුතුවල ප්‍රමාදය

විදේශීය ණය ආධාර ලබා නොගෙන දේශීය තාක්ෂණය යොදාගනිමින් මෙම ව්‍යාපෘති කරගෙන යාමට අපේක්ෂා කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 2.17 ගරු චාල්ස් නිර්මලනාදන් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 2.17.1 ඉරණමඩු ජනතාවගේ පානීය ජල ගැටළුව විසඳීම සඳහා පියවර ගැනීම

ඉරණමඩු ජනතාවගේ පානීය ජල ගැටළුව විසඳීම සඳහාත් පවුල් දහසකට විදුලිය ලබාදීමටත් කඩිනම් පියවර ගැනීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 2.17.2 මන්නාරම යෝධවැව ව්‍යාපෘතිය සහ කිවුල්ඔය ව්‍යාපෘතිය කඩිනම් කිරීම

2021 අයවැය මගින් අදාළ වැව් ප්‍රතිසංස්කරණය කිරීමට ප්‍රතිපාදන ලබා දී ඇති බව අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මන්නාරම යෝධවැව ව්‍යාපෘතියේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා බැකෝ යන්ත්‍රයේ අවශ්‍යතාවය ඉදිරියේදී සලකා බලන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

යෝධවැව තුළ අනවසරයෙන් ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳව අවධානය යොමු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී

**2.18 මඩකළපුව දිස්ත්‍රික්කයේ ඇති කුඩා වැව් ප්‍රතිසංස්කරණය කිරීම, පිරිසිදු පානීය ජල සැපයුම, වාරිමාර්ග සහ කෘෂි පාරවල් සංවර්ධනය කිරීම - ගරු ගෝවින්දන් කරුණාකරන් මහතා**

වාර්ෂිකව වී මෙට්‍රික් ටොන් ලක්ෂ තුනක පමණ අස්වැන්නක් ලබා දෙන මඩකලපුවේ කුඹුරු සඳහා ජලය ලබා දෙන කුඩා වැව් වල පිරී ඇති රොන් මඩ ඉවත් කිරීම මගින් අස්වැන්න 50% කින් වැඩි කළ හැකි බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පඩුවන්කරෙයි ප්‍රදේශයේ ඇති කුඩා කෘෂි පාරවල් සියල්ල වාරිමාර්ගයට අයිති බැවින් එම පාරවල් සංවර්ධනය කරදෙන මෙන්ද ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

එසේම මඩකළපුව දිස්ත්‍රික්කයේ ජනතාවගේ පානීය ජල ගැටළුව විසඳීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන ලෙසද ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

රජය ප්‍රතිපත්තියක් වශයෙන් ලිෆ්ට් ඉරිගේෂන් සඳහා ප්‍රතිපාදන වෙන් කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**2.19 කල්මුනේ දිස්ත්‍රික්කයේ ගංවතුර පාලනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම - ගරු එච්. එම්. එම්. හරීස් මහතා**

මේ සඳහා මඩකලපුව දිස්ත්‍රික්කයේ මෝයකට පුළුල් කිරීමේ වැඩ පිළිවෙලක් යෝජනා වී ඇතත් එම දිස්ත්‍රික්කයේ ධීවරයන්ගේ දැඩි විරෝධය හේතුවෙන් එය ක්‍රියාත්මක කළ නොහැකි බව වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.20 නායයාම හේතුවෙන් බිඳීගිය වැලිමඩ, අඹේවෙල ඇළ ප්‍රතිසංස්කරණය කිරීම - ගරු ඩිලාන් පෙරේරා මහතා**

මේ සඳහා නිසි වැඩපිළිවෙලක් අනුගමනය කරන බව වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.21 ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**

**2.21.1 අත්තනගලු ඔයේ බාදනයට ලක්වී ඇති ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම**

අමුණු 18 ක් ප්‍රතිසංස්කරණය කිරීමටත් නව අමුණු කිහිපයක් සෑදීමටත් යෝජනා වී ඇති බව වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී. එමෙන්ම මෙම කාර්යය සඳහා බස්නාගොඩ ජලාශ ව්‍යාපෘතියට වෙන් කරන ප්‍රතිපාදනවලින් කොටසක් යොදා ගත හැකි බවද දැනුම් දෙන ලදී.

**2.21.2 ගල්වැටි යොදා අත්තනගලු ඔයේ ජලය බැසයාමේ වේගය අඩු කිරීමට කටයුතු කිරීම**

මෙම කාර්යය කඩිනම් කිරීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ට උපදෙස් ලබා දෙන ලදී.

**2.22 කළුතර දිස්ත්‍රික්කයේ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම තුළින් ගංඉවුර හානිවීම අවම කිරීම - ගරු මර්ජාන් ෆලීල් මහතා**

බෙන්තර ගඟට සම්බන්ධවන හඳුනාගත් ඇළමාර්ග කීපයක් ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු සිදු කිරීමට අපේක්ෂා කරන බව වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ප්‍රධාන ඇළමාර්ග හඳුනාගෙන ඒවා ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.23 පොතුවිල් ප්‍රදේශයේ පිහිටා ඇති කුඩා හා විශාල ප්‍රමාණයේ වැව් ප්‍රතිසංස්කරණය කිරීම - ගරු එස්. එම්. එම්. මුෂාරෆ්ම හතා**

මේ වනවිටත් එම වැව් ප්‍රතිසංස්කරණය කිරීමට අවශ්‍ය මැනුම් කටයුතු සිදු කරමින් පවතින බව වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.24 ගරු සුදත් මංජුල මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**

**2.24.1 ගංගා පිටාර ගැලීම හේතුවෙන් පීඩාවට පත්වන රුවන්වැල්ල හා දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ජනතාවට සහන සැලසීම සහ වාරිමාර්ග උප කාර්යාලයක් පිහිටුවීම**

ගංගා පිටාර ගැලීම හේතුවෙන් කෘෂිකාර්මික කටයුතුවලටද දැඩි ලෙස බලපෑම් සිදුවන බැවින් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීමටත් එවන් අවස්ථාවක පැමිණිලි කිරීම සඳහා වාරිමාර්ග කාර්යාලයක් ආසනය තුළ නොමැති බැවින් උප කාර්යාලයක් පිහිටුවීමටත් කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

වාරිමාර්ග අමාත්‍යාංශයේ නිලධාරියකු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත කිරීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ට උපදෙස් ලබාදුන් අතර ගරු රාජ්‍ය අමාත්‍යතුමාට එම ප්‍රදේශයට ගොස් මෙම කටයුතු සොයා බලන ලෙසටද උපදෙස් ලබා දෙන ලදී.

**2.24.2 මොරලිය ග්‍රාමසේවක වසමේ සහ දෙහිඕවිට කනන්ගම ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ ජනතාවගේ පානීය ජල ප්‍රශ්නය සහ පිවිසුම් මාර්ග වල ගැටළු**

මෙම කරුණ ඉදිරියේදී සලකා බලන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.** කාරක සභාව පස්වරු 12.45 ට 2021 ජනවාරි මස 20 දින පෙ.ව. 11.00 දක්වා කල් තබන ලදී.

**රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ**
**අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමු වැනි රැස්වීම - 2020 නොවැම්බර් 23**

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා (සභාපති)
ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු සුදත් මංජුල මහතා

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු ප්‍රසන්න රණතුංග මහතා
ගරු තේනුක විදානගමගේ මහතා
ගරු චන්දිම වීරක්කොඩි මහතා
ගරු රෝහණ දිසානායක මහතා
ගරු ශාන්ත බණ්ඩාර මහතා
ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු ලලිත් එල්ලාවල මහතා
ගරු උදයන කිරිදිගොඩ මහතා
ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා
ගරු මිලාන් ජයතිලක මහතා
ගරු කුලසිංහම් තිලීපන් මහතා
ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා
ගරු චාමර සම්පත් දසනායක මහතා
ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා
ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා
ගරු අසංක නවරත්න මහතා
ගරු අනුප පස්කුවල් මහතා
ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය
ගරු නලින් ප්‍රනාන්දු මහතා
ගරු මායාදුන්න චින්තක අමල් මහතා
ගරු අජිත් රාජපක්ෂ මහතා
ගරු ගුණතිලක රාජපක්ෂ මහතා
ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා
ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය
ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා
ගරු මධුර විතානගේ මහතා
ගරු ඩී. වීරසිංහ මහතා
ගරු වීරසුමන වීරසිංහ මහතා
ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා
ගරු මර්ජාන් ෆලීල් මහතා
ගරු ඩයනා ගමගේ මහත්මිය

**1. ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා :-**

**1.1. රාජ්‍ය සේවකයින් සඳහා විශ්‍රාම වැටුප් ලැබීමේ ප්‍රමාදය - ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා**

රාජ්‍ය සේවයේ ප්‍රමාදයන් පවතින කාර්යාල පිළිබඳව සහ විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රමවේදයන් පිළිබඳව විස්තරයක් අමාත්‍යාංශයේ ලේකම් සහ විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම ගැටළුව සම්බන්ධයෙන් අවධානය යොමු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

**1.2. පළාත් සහා පාසල්වල පවතින ගුරු හිඟය සහ වෙනත් කරුණු - ගරු ශාන්ත බණ්ඩාර මහතා**

**1.2.1. පළාත් සහා පාසල්වල පවතින ගුරු හිඟය**

අලුතින් ගුරුවරුන් බඳවා ගැනීම සඳහා ගරු අධ්‍යාපන අමාත්‍යතුමා විසින් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇති බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

**1.2.2. නාරම්මල ප්‍රාදේශීය සභාව සඳහා ප්‍රජා ශාලාවක අවශ්‍යතාවය**

මේ සම්බන්ධයෙන් ලිඛිත ඉල්ලීමක් තමා වෙත ඉදිරිපත් කරන ලෙස ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදි.

**1.2.3. පෞද්ගලික පළිගැනීම් මත විශ්‍රාම වැටුප අහිමි වීම**

මෙම කරුණ පිළිබඳ අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

**1.3. ගුරුවරුන්ට පළමු පත්වීම දුෂ්කර පළාත්වලට ලබා දීම - ගරු ඩයනා ගමගේ මහත්මිය**

මෙසේ කටයුතු කිරීම තුළින් ගුරුවරුන්ට පෞද්ගලිකව ගැටළු රාශියක් ඇති වන බැවින් ඔවුන් පදිංචි පළාතටම පළමු පත්වීම ලබා දීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමිය විසින් ඉල්ලීමක් කරන ලදි.

පදිංචි පළාතටම පළමු පත්වීම ලබා දීම සඳහා තීරණය කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

**1.4. බඳවා ගැනීම්වලදී හා පත්වීම් ලබා දීමේදී සාධාරණ ලෙස කටයුතු කිරීම සහ වෙනත් කරුණු - ගරු චන්දිම වීරක්කොඩි මහතා**

**1.4.1. බඳවා ගැනීමේදී සහ පත්වීම් ලබා දීමේදී සාධාරණ ලෙස කටයුතු කිරීම**

මේ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට උපදෙස් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

ඒ පිළිබඳ අවධානය යොමු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

### 1.4.2. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවය සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

වර්තමානයේ පවතින කොවිඩ් වසංගත තත්ත්වය මත විශ්‍රාම වැටුප නිර්ණය කිරීමට නොහැකි වූ විශ්‍රාමිකයන් වෙනුවෙන් තාවකාලිකව රු. 25,000/- ක දීමනාවක් ගෙවීමට කටයුතු කළ බව අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 1.4.3. වාර්ෂිකව විශ්‍රාම ගන්නා රාජ්‍ය නිලධාරින් සංඛ්‍යාව

මෙම නිලධාරීන් සංඛ්‍යාව නිශ්චය කර ගැනීම සඳහා පවතින ක්‍රමවේදය සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදි.

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් මෙම කරුණ සම්බන්ධයෙන් කාරක සභාවට පැහැදිලි කිරීමක් කරන ලදි.

### 1.4.4. ඇතැම් අවස්ථාවලදී විශ්‍රාම වැටුප සම්බන්ධ දීමනා නොලැබීම

තම දරුවා බිහි කිරීමේදී මියගිය මවක් වෙනුවෙන් ලැබිය යුතු විශ්‍රාම වැටුප සම්බන්ධ දීමනා මෙතෙක් ලැබී නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

මේ සම්බන්ධ තොරතුරු තමා වෙත ලබා දෙන ලෙසත් ඒ පිළිබඳ අවධානය යොමු කරන බවත් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදි.

### 1.4.5. ඉමදූව ප්‍රාදේශීය සභාවේ ඇති ශ්‍රවණාගාරය බදු දීමට කටයුතු කිරීම

මෙවැනි කටයුතු සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

ප්‍රාදේශීය සභා ලේකම්වරුන් බඳවා ගැනීමේදී සුදුසුකම් ඇති අය පත් කිරීම තුළින් මෙම ආයතනවල සිදුවන මෙවැනි දූෂණ අඩු කරගත හැකි බවද ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදි.

## 1.5. විශ්‍රාම වැටුප් ගෙවීම් සම්බන්ධයෙන් ආයතන අතර සම්බන්ධීකරණයක් සිදු නොවීම - ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

මේ සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු බව ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

## 1.6. විශ්‍රාම වැටුප් ලබා දීම සඳහා නව ක්‍රමවේදයක් හඳුන්වා දීම සහ වෙනත් කරුණු - ගරු මායාදුන්න චින්තක අමල් මහතා

### 1.6.1. විශ්‍රාම වැටුප් ලබා දීම සඳහා නව ක්‍රමවේදයක් හඳුන්වා දීම

කඩිනමින් විශ්‍රාම වැටුප් ලබා දීම සඳහා සුදුසු නව ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

විශ්‍රාම වැටුප නිර්ණය කර ගෙවීම් කරන තෙක් පසුව අයකර ගැනීමේ පදනම මත විශ්‍රාම ගත් දින සිට මාසිකව දීමනාවක් ලබා දීමේ හැකියාව සම්බන්ධයෙන් ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් විමසීමක් කරන ලදි.

විශ්‍රාම වැටුප් ලබා දීමේදී සිදුවන ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ හැකි බව අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදි.

### 1.6.2. පුත්තලම මැතිවරණ බල ප්‍රදේශය සඳහා ග්‍රාම නිලධාරීන් පත් කිරීම

පුත්තලම මැතිවරණ බල ප්‍රදේශය තුළ ග්‍රාම සේවා වසම් ආවරණය කිරීම සඳහා ග්‍රාම නිලධාරීන් නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

මෙම බල ප්‍රදේශය සඳහා ග්‍රාම නිලධාරීන් පත් කරන ලෙසත් එසේ පත් කිරීමේදී ඔවුන්ට භාෂාව හැසිරවීමට ඇති හැකියාව පිළිබඳව අවධානය යොමු කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

### 1.6.3. ආණමඩුව ප්‍රාදේශීය සභාව බෙදා වෙන් කිරීම

වැඩි ජනගහනයක් සිටින මෙම ප්‍රාදේශීය සභාව බෙදා වෙන් කිරීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදි.

### 1.6.4. "ගමින් ගමට දොරින් දොරට" වැඩසටහන යටතේ කළ කටයුතු සඳහා ගෙවීම් සිදු නොකිරීම

මෙම වැඩසටහන ක්‍රියාත්මක කළ කණ්ඩායම් සඳහා ගෙවීම් සිදු කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

මෙම වසරේ දෙසැම්බර් 31 වන දිනට පෙර සියලු ගෙවීම් නිරවුල් කරන බවට යෝජනා වී ඇති බව අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

## 1.7. නව රජය විසින් උපාධිධාරී පත්වීම් ලබා දීම සහ අභ්‍යාසලාභී උපාධිධාරීන් ස්ථිර කිරීම - ගරු වීරසුමන වීරසිංහ මහතා

### 1.7.1. නව රජය විසින් උපාධිධාරී පත්වීම් ලබා දීම

මෙම පත්වීම් ලබා දී ඒවා අවලංගු කිරීම හේතුවෙන් ඇතිව තිබෙන ගැටළුකාරී තත්ත්වය සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

මෙම ගැටළුවට අදාළ කරුණු සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ ලේකම් විසින් පැහැදිලි කිරීමක් කරන ලදි.

### 1.7.2. ස්ථිර නොවූ අභ්‍යාසලාභී උපාධිධාරීන් ස්ථිර කිරීම

14,000 ක් පමණ සිටින මෙවැනි උපාධිධාරීන් ස්ථිර කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

මෙම උපාධිධාරීන් ස්ථිර කිරීම සඳහා ගරු මුදල් අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කර ඇති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සඳහා අනුමැතිය ලැබී ඇති බව අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

## 1.8. උපාධි සහතිකවල වලංගු දිනය සම්බන්ධයෙන් පැවති ගැටළුව සඳහා මැදිහත් වීම - ගරු අසංක නවරත්න මහතා

2012 – 2013 වසරවල කැළණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සහ පේරාදෙණිය විශ්වවිද්‍යාල විසින් ලබා දුන් උපාධි සහතිකවල වලංගු දිනය සම්බන්ධයෙන් පැවති ගැටළුව සඳහා මැදිහත් වීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් තම ස්තුතිය පළ කරන ලදි.

## 1.9. මිල්ලනිය ප්‍රාදේශීය සභාව සඳහා පහසුකම් ලබා දීම - ගරු ලලිත් එල්ලාවල මහතා

අඩු පහසුකම් යටතේ පවතින මිල්ලනිය ප්‍රාදේශීය සභාව වෙනුවෙන් ගොඩනැගිලි පහසුකම් ඇතුළු සෙසු පහසුකම් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

මෙම ඉල්ලීම ලිඛිතව ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

## 1.10. පළාත් සභාවල ලේකම්වරුන් විශ්‍රාම යාමෙන් පසු සේවා කාලය දීර්ඝ කිරීම සහ වෙනත් කරුණු - ගරු ප්‍රසන්න රණතුංග මහතා

### 1.10.1. පළාත් සභාවල ලේකම්වරුන් විශ්‍රාම යාමෙන් පසු සේවා කාලය දීර්ඝ කිරීම

මෙසේ කටයුතු කිරීමෙන් පහළ ශ්‍රේණිවල නිලධාරීන්ට ඉහළ තනතුරුවලට පත්වීමට අවස්ථාව ලැබී නොමැති බව ගරු අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදි.

මෙසේ කටයුතු කිරීමට අවශ්‍යතාවයක් නොමැති නමුත් ආණ්ඩුකාරවරුන් එසේ කටයුතු කිරීම නිවැරදි නොවන බව අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදි.

### 1.10.2. පළාත් සභා සහ මධ්‍යම රජයේ රාජ්‍ය ආයතන අතර නිලධාරීන් ස්ථාන මාරු කිරීම

ස්ථාන මාරු සඳහා සුදුසු ක්‍රමවේදයක් හඳුන්වා දීමේ හැකියාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදි.

මේ සඳහා විසඳුමක් ලබා දීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

## 1.11. පළාත් පාලන ආයතන සහ ග්‍රාමසේවා වසම්වල ඇති පුරප්පාඩු සහ වෙනත් කරුණු - ගරු මධුර විතානගේ මහතා

### 1.11.1. පළාත් පාලන ආයතනවල තනතුරුවල පවතින පුරප්පාඩු

කොළඹ දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතනවල ඇති පුරප්පාඩු සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

ප්‍රධාන නගර සභාවල කොමසාරිස් තනතුරු සඳහා පරිපාලන සේවයේ අධි ශ්‍රේණියේ නිලධාරීන් පත් කරන ලෙස ද ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

මෙම ආයතනවල සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඇති පුරප්පාඩු වෙනුවෙන් මෑතකදී විශ්‍රාම ගත් නිලධාරීන් නැවත සේවයේ යෙදවීමට අනුමැතිය ලබා ගත හැකි බව අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදි.

එමෙන්ම කළමනාකරණ සේවයේ වසර 15 ක පමණ සේවා අත්දැකීම් ඇති නිලධාරීන්ට අධි ශ්‍රේණියේ තනතුරුවල පත්වීම් ලබා දිය හැකි බව ඔහු විසින් තවදුරටත් දැනුම් දෙන ලදි.

පළාත් පාලන ආයතනවල ඉංජිනේරුවරුන්ගේ හිඟයක් පවතින බැවින් එම පුරප්පාඩු සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදි.

ඉංජිනේරුවරු 190 දෙනෙක් පමණ බඳවා ගැනීම සඳහා ලිඛිත පරීක්ෂණයක් පැවැත්වීමට බලාපොරොත්තු වන නමුත් හදිසි අවශ්‍යතාවයක් වේනොත් කොන්ත්‍රාත් පදනම මත පත්වීම් ලබා දීමට අනුමැතිය දිය හැකි බව අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදි.

### 1.11.2. අසමතුලිත ලෙස ග්‍රාමසේවා වසම් වෙන් කර තිබීම

මෙම අසමතුලිතතාවය තුළින් ගැටළුකාරී තත්ත්වයක් ඇති වී තිබෙන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

එමෙන්ම බොහෝ ග්‍රාමසේවා වසම් තුළ පුරප්පාඩු පවතින බවද ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදි.

### 1.11.3. පළාත් පාලන ආයතනවල අභ්‍යන්තර විගණන පද්ධතියක් නොමැති වීම

පළාත් පාලන ආයතනවල අභ්‍යන්තර විගණනය සඳහා ස්වාධීන කණ්ඩායමක් පත් කිරීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදි.

### 1.11.4. මධ්‍යම රජයේ සේවයේ නියුතු වෛද්‍යවරු පළාත් රාජ්‍ය සේවයට එකතුවීම

මධ්‍යම රජයේ සේවයේ නියුතු වෛද්‍යවරු පළාත් රාජ්‍ය සේවයට එකතුවීම සිදු නොවීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදි.

මෙවැනි තත්ත්වයක් නොමැති බවත් නමුත් වෛද්‍යවරුන්ගේ හිඟයක් පවතින බව අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

#### 1.11.5. නගර සභා සඳහා ප්‍රධාන වෛද්‍ය නිලධාරියෙක් පත් කිරීම

මෙම අමාත්‍යාංශය හරහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට මෙම ඉල්ලීම ඉදිරිපත් කළහොත් අමාත්‍යාංශයේ නිර්දේශය ලබා දිය හැකි බව අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

### 1.12. උතුරු නැගෙනහිර පළාත්වල පළාත් පාලන ආයතනවල පවතින ගැටළු - ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

#### 1.12.1. ග්‍රාම සේවා වසම් අසමතුලිත ලෙස වෙන් කර තිබීම

මෙම කරුණ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

#### 1.12.2. පළාත් පාලන ආයතන අලුතින් පිහිටුවීම සහ පවතින පළාත් පාලන ආයතන යාවත්කාලීන කිරීම

වත්මන් ජනගහනය අනුව පළාත් පාලන ආයතන අලුතින් පිහිටුවීම සහ පවතින පළාත් පාලන ආයතන යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවයක් ඇතිවී තිබෙන බවද ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

කිලිනොච්චි සහ මුලතිව් දිස්ත්‍රික්ක සඳහා නගර සභාවක් පිහිටුවීමේ අවශ්‍යතාවය ඇති බවත් මෙවැනි කරුණු සලකා බැලීම සඳහා වෙනම කමිටුවක් පත් කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ සඳහා කමිටුවක් පත් කිරීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

#### 1.12.3. කල්මුණේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා ගණකාධිකාරීවරයෙක් පත් කිරීම

මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.13. ජා-ඇල කඩ කාමර සඳහා සිදු කරන ලද තක්සේරුව ප්‍රමාද වීම - ගරු නලින් ප්‍රනාන්දු මහතා

ජා-ඇල නගර සභාව සහ ජා-ඇල ප්‍රාදේශීය සභාවේ කඩ කාමර කුලියට දීමෙන් වසර 12 කට පමණ පසු රජය විසින් නැවත තක්සේරුවක් කර කුලී මුදල විශාල ප්‍රමාණයකින් වැඩි කර ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ සඳහා සහන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 1.14. පළාත් පාලන ආයතනවල ගොඩනැගිලි ප්‍රයෝජනවත් කාර්යයන් සඳහා යෙදවීම සහ පවතින පළාත් පාලන මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම - ගරු ඩී. වීරසිංහ මහතා

### 1.14.1. පළාත් පාලන ආයතනවල ගොඩනැගිලි ප්‍රයෝජනවත් කාර්යයන් සඳහා යෙදවීම

අම්පාර නගර සභාවේ ඉදි කරන ලද බස් නැවතුම්පොළෙහි ඉහල මාලයේ කඩ කාමර වැනි අලුතින් ඉදිකරන ලද ගොඩනැගිලි නියමිත කාර්යයන් සඳහා යොදා නොගන්නා බැවින් මෙවැනි ස්ථාන ප්‍රයෝජනවත් කාර්යයක් සඳහා වෙන් කිරීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදි.

### 1.14.2. පවතින පළාත් පාලන මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම

වර්තමානයේ පවතින පළාත් පාලන මැතිවරණ ක්‍රමය වෙනුවට වඩා සුදුසු ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

පවතින පළාත් පාලන මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගෙන ඇති බව ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

මිශ්‍ර සමානුපාතික නියෝජන ක්‍රමය තුළ ඇති අඩුපාඩු මේ වනවිට අමාත්‍යාංශය විසින් හඳුනාගෙන මෙම මැතිවරණ ක්‍රමය වැඩිදියුණු කිරීමට හෝ වෙනත් මැතිවරණ ක්‍රමයක් හඳුන්වා දීම සඳහා කමිටුවක් පත් කිරීම සම්බන්ධයෙන් ගරු අමාත්‍යතුමා වෙත යෝජනාවක් ඉදිරිපත් කර ඇති බව පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ නීති නිලධාරී විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

## 1.15. පළාත් සභා ක්‍රියාත්මක නොවීම තුළ ප්‍රතිපාදන වෙන් වීම ක්‍රමවත් ලෙස සිදු නොවීම - ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

මෙම තත්ත්වය හේතුකොටගෙන කෑගල්ල දිස්ත්‍රික්කය වෙනුවෙන් සාධාරණ ලෙස ප්‍රතිපාදන වෙන් නොවන බව ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

කෑගල්ල දිස්ත්‍රික්කයේ ඉතා අඩු ආදායම් ලබන යටියන්තොට සහ බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාවල සංවර්ධන කටයුතු සඳහා මධ්‍යම රජය මඟින් හෝ ප්‍රතිපාදන වෙන් කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමිය විසින් ඉල්ලීමක් කරන ලදි.

එක් එක් පළාත් පාලන ආයතන විසින් පාලනය වන ප්‍රදේශ සඳහා යෝජිත සංවර්ධන කටයුතු සම්බන්ධ යෝජනා තමා වෙත ඉදිරිපත් කරන ලෙස ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදි.

## 1.16. පළාත් සභා මැතිවරණය පැවැත්වීම - ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා

පළාත් සභා මැතිවරණය ඉක්මණින් පැවැත්විය යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදි. පළාත් පාලන මැතිවරණ ක්‍රමය සංශෝධනයේදී ඇතුළත් කරන ලද අසාධාරණ වගන්ති නිවැරදි කිරීමට කටයුතු කරන ලෙසද ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් ඉල්ලීම් කරන ලදි.

පළාත් සභා මැතිවරණය පැවැත්වීම සම්බන්ධයෙන් ගරු අග්‍රාමාත්‍යතුමා දැනුවත් කර ඇති බවත් ඉක්මණින් මේ සඳහා ක්‍රියාත්මක වන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

සීමා නිර්ණය සිදු කර එය 2/3 ඡන්දයෙන් සම්මත නොවූ බැවින් එය සමාලෝචන කමිටුවකට යොමු කර ඇති බවත් එම කමිටුව මගින් වාර්තාව මෙතෙක් ඉදිරිපත් කර නොමැති බවත් ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදි.

## 1.17. පළාත් පාලන සංශෝධන පනතට ඇතුළත් කරන ලද නීති සංශෝධනය කිරීම සහ වෙනත් කරුණු - ගරු රෝහණ දිසානායක මහතා

### 1.17.1. පළාත් පාලන සංශෝධන පනතට ඇතුළත් කරන ලද නීති

පසුගිය පළාත් පාලන මැතිවරණය ආසන්නයේදී ඇතැම් නිලධාරී කොට්ඨාශයකට ඡන්දය සඳහා ඉදිරිපත් වීමට නොහැකි ලෙස ඇතුළත් කරන ලද නීති සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

### 1.17.2. අවුරුදු 5 කට යටත්ව රාජ්‍ය නිලධාරීන් දුෂ්කර සේවය සඳහා අනුයුක්ත කිරීම

රාජ්‍ය නිලධාරීන් දුෂ්කර සේවය සඳහා අවුරුදු 5 ක කාල සීමාවකට යටත්ව යොමු කර ඇතත් එම කාල සීමාවෙන් පසු ඔවුන් වෙනත් ස්ථානයකට අනුයුක්ත කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

එමෙන්ම ඉදිරියේදී නිලධාරීන්ට ඔවුන්ගේ පදිංචි පළාත තුළම පත්වීම් ලබා දීමට ක්‍රමවේදයක් සකස් කරන ලෙසද ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

### 1.17.3. ජාතික මට්ටමින් පළාත් පාලන ආයතන අතර තරඟයක් පැවැත්වීම

පළාත් පාලන ආයතනවල කාර්යසාධනය ඉහළ නැංවීම අරමුණු කරගෙන ජාතික මට්ටමින් පළාත් පාලන ආයතන අතර තරඟයක් පැවැත්වීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

## 1.18. රත්නපුර දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන මගින් කෙරෙන කටයුතු - ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

රත්නපුර දිස්ත්‍රික්කයේ රක්වාන ආසනයෙහි පළාත් සභාවට අයත් මාර්ග ප්‍රතිසංස්කරණය කර කාණු පද්ධතිය සකස් කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමිය විසින් ඉල්ලීමක් කරන ලදි.

එමෙන්ම මාදම්ප මාළු වෙළෙඳසැල අසල ඇති අක්කරයක පමණ ඉඩමෙහි සාප්පු සංකීර්ණයක් ඉදි කිරීමට කටයුතු කරන ලෙසද ගරු මන්ත්‍රීතුමිය විසින් ඉල්ලීමක් කරන ලදි.

## 1.19. මන්නාරම සහ මුලතිව් දිස්ත්‍රික්ක සඳහා ගිනි සේවා හා ගිනි නිවීමේ රථවාහන අඩුපාඩුව සහ වෙනත් කරුණු - ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

### 1.19.1. මන්නාරම සහ මුලතිව් දිස්ත්‍රික්ක සඳහා ගිනි සේවා හා ගිනි නිවීමේ රථවාහන

මන්නාරම සහ මුලතිව් දිස්ත්‍රික්ක සඳහා ගිනි සේවා හා ගිනි නිවීමේ රථවාහන සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලීම් සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදි.

මේ සඳහා ඇණවුම් සිදු කර ඇති බවත් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් අදාළ අනුමැතිය ලබා දීමෙන් පසු මාස පහක් හෝ හයක් ඇතුළත එම රථවාහන ලබා ගත හැකි බවත් ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 1.19.2. උතුරු පළාතේ ප්‍රාදේශීය සභා හතරක් අලුතින් පිහිටුවීම

උතුරු පළාතේ ප්‍රාදේශීය සභා හතරක් අලුතින් පිහිටුවීමේ කටයුතුවල ප්‍රගතිය සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදි.

අලුතින් පළාත් පාලන ආයතන පිහිටුවීම සඳහා මේ වනවිට යෝජනා 83 ක් ලැබී ඇති බවත් ඒ සඳහා දිස්ත්‍රික් කමිටු පත්කර අවසන් බවත් පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

## 1.20. විශේෂඥ පුහුණු ලබා ගන්නා පළාත් පාලන සේවයේ නිලධාරීන් මෙම සේවයෙන් බැහැර වීම සහ වෙනත් කරුණු - ගරු සුදත් මංජුල මහතා

### 1.20.1. විශේෂඥ පුහුණු ලබා ගන්නා පළාත් පාලන සේවයේ නිලධාරීන් මෙම සේවයෙන් බැහැර වීම

විශේෂඥ පුහුණු ලබා ගන්නා පළාත් පාලන ආයතනවල නිලධාරීන් එම පුහුණු ලබා ගැනීමෙන් පසු පළාත් පාලන සේවයෙන් බැහැරවීම තුළින් පළාත් පාලන ආයතනවලින් ලබා දෙන සේවයේ විශාල පසුබෑමක් පෙනී යන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 1.20.2. පළාත් පාලන ආයතනවල වාර්ෂික අයවැය

පළාත් පාලන ආයතනවල වාර්ෂික අයවැය පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවේ අවධානයට යොමු කරන ලදි.

### 1.20.3. පළාත් පාලන සේවය විධිමත් කිරීම

පළාත් පාලන ආයතන තුළම සේවයේ සිටින අදාළ විෂයානුබද්ධ දැනුම ඇති නිලධාරීන්ගේ සේවය ලබා ගෙන පළාත් පාලන සේවය විධිමත් කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

## 1.21. සීමා නිර්ණය ක්‍රමය වෙනස් කිරීම සහ වෙනත් කරුණු - ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

### 1.21.1. සීමා නිර්ණය ක්‍රමය වෙනස් කිරීම

අත්තනගල්ල ආසනයේ සිංහල හා මුස්ලිම් ගම්මාන පවතින බැවින් ප්‍රාදේශීය සභා මැතිවරණවලදී එම ජාතීන් නියෝජනය වන ලෙස මන්ත්‍රීවරයෙක් පත් කර ගැනීම සඳහා පවතින සීමා නිර්ණය ක්‍රමය වෙනස් කිරීම අවශ්‍ය බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 1.21.2. පළාත් පාලන ආයතනවල අභ්‍යන්තර විගණන ක්‍රමය ශක්තිමත් කිරීම

පළාත් පාලන ආයතනවල අභ්‍යන්තර විගණන ක්‍රමය ශක්තිමත් කර පළාත් පාලන සේවය විධිමත් කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

### 1.21.3. අත්තනගල්ල ආසනය වෙනුවෙන් පළාත් පාලන ආයතන දෙකක් ස්ථාපනය කිරීම

මේ වනවිට වැඩි ජනගහනයක් සිටින අත්තනගල්ල ආසනය වෙනුවෙන් පළාත් පාලන ආයතන දෙකක් ස්ථාපනය කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

### 1.21.4. ආදාහනාගාරයක් ස්ථාපනය කිරීම

බෙම්මුල්ල සහ ඌරාපොළ නගර සඳහා ආදාහනාගාර ස්ථාපනය කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

## 1.22. සීමා නිර්ණය කිරීමේදී විශේෂ අවධානය යොමු වීමේ අවශ්‍යතාවය - ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

මේ වනවිට පවතින සීමා නිර්ණය අනුව බණ්ඩාරවෙල සහ හපුතලේ ආසනවල ගැටළුකාරී තත්ත්වයක් ඇති වී තිබෙන බැවින් මෙයින් ජනතාව අපහසුතාවයකට පත්ව ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

ඉදිරියේදී සීමා නිර්ණය කිරීමේදී මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

මෙය ලිඛිතව ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

**2.** කාරක සභාව ප.ව. 4.45 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

**නාගරික සංවර්ධන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමුවැනි රැස්වීම - 2020 නොවැම්බර් 24**

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු මුජිබුර් රහුමාන් මහතා
ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය
ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු අංගජන් රාමනාදන් මහතා
ගරු චන්දිම වීරක්කොඩි මහතා
ගරු ෆයිසාල් කාසිම් මහතා
ගරු එච්. එම්. එම්. හරීස් මහතා
ගරු ශාන්ත බණ්ඩාර මහතා
ගරු කේ. කාදර් මස්තාන් මහතා
ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු තිසකුට්ටි ආරච්චි මහතා
ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා
ගරු උදයන කිරිඳිගොඩ මහතා
ගරු ජගත් කුමාර මහතා
ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා
ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා
ගරු කුලසිංහම් තිලීපන් මහතා
ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා
ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා
ගරු අසංක නවරත්න මහතා
ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය
ගරු නලින් ප්‍රනාන්දු මහතා
ගරු සුදත් මංජුල මහතා
ගරු අජිත් රාජපක්ෂ මහතා
ගරු ගුණතිලක රාජපක්ෂ මහතා
ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා
ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා
ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය
ගරු මධුර විතානගේ මහතා
ගරු වීරසුමන වීරසිංහ මහතා
ගරු සමන්ප්‍රිය හේරත් මහතා
ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා
ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතා
ගරු මර්ජාන් ෆලීල් මහතා

**1. අමාත්‍යාංශයීය කටයුතු පිළිබඳ සාකච්ඡාව**

## 1.1. නාගරික ජනාවාසවල ජනතාවගේ ජීවන තත්ත්වය දියුණු කිරීම සහ වෙනත් කරුණු - ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

### 1.1.1. නාගරික ජනාවාසවල ජනතාවගේ ජීවන තත්ත්වය දියුණු කිරීම

නාගරික ජනාවාස ඒකකවල ඇති අඩු පහසුකම් හේතුවෙන් එම ප්‍රජාවට මුහුණ දීමට සිදුව ඇති ගැටළු සම්බන්ධයෙන් කටයුතු කිරීමට නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් සංයුක්ත ක්‍රියාකාරී සැලැස්මක් හඳුන්වා දිය යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන බව රාජ්‍ය අමාත්‍ය, ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.1.2. ජපන් මිත්‍රත්ව පාර ආසන්නව යටිතල පහසුකම් දියුණු කිරීම

ජපන් මිත්‍රත්ව පාරට සමාන්තරව ඇති ඇවිදින මංතීරු ආසන්නයේ පැවති වැසිකිළි පද්ධතිය නැවත විවෘත කිරීමට පහත් බිම් සංවර්ධන මණ්ඩලයට උපදෙස් දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

එමෙන්ම මේ ආසන්නයේ ඇති පහත් බිම් සංවර්ධන මණ්ඩලයට අයත් ව්‍යායාම් මධ්‍යස්ථානය අසළ පොදු පහසුකම් සැපයෙන ස්ථානයක් ඉදි කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 1.2. රජය විසින් ක්‍රියාත්මක කරන වැඩසටහන් සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දැනුවත් කිරීම - ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

අඩු ආදායම්ලාභීන් වෙනුවෙන් නිවාස ලබා දීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරන වැඩසටහන් සඳහා අදාළ ආසනයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සම්බන්ධ කර ගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

ඉදිරියේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති තනතුරු සඳහා පත් කිරීමට නියමිත බැවින් මෙම ගැටළුකාරී තත්ත්වය ඇති නොවන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.3. සැලසුම් අනුමත කිරීම මාර්ගස්ථ ක්‍රමයට සිදු කිරීම සහ වෙනත් කරුණු - ගරු මධුර විතානගේ මහතා

### 1.3.1. සැලසුම් අනුමත කිරීම මාර්ගස්ථ ක්‍රමයට සිදු කිරීම

පළාත් පාලන ආයතන විසින් සැලසුම් අනුමත කිරීමේ ක්‍රියාවලිය මාර්ගස්ථ ක්‍රමයට සිදු කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

### 1.3.2. සැලසුම් අනුමත කිරීමේ නීතිරීති යාවත්කාලීන කිරීම

නිවාස හා ගොඩනැගිලි සඳහා සැලසුම් අනුමත කිරීමට අදාළ නීතිරීති යාවත්කාලීන කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

ගරු අග්‍රාමාත්‍යතුමා විසින් ලබා දී ඇති උපදෙස් අනුව ඉහත කරුණු සම්බන්ධයෙන් කඩිනම් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.3.3. පළාත් පාලන ආයතන සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ ස්ථිර නිලධාරියෙක් පත් කිරීම

අනවසර ඉදි කිරීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී ඇති වන ප්‍රමාදය වැළැක්වීම සඳහා සෑම පළාත් පාලන ආයතනයකම නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් ස්ථිර නිලධාරියෙක් පත් කිරීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.3.4. ස්වභාවික ජලය බැසයන මාර්ග අවහිර වීම

නගරබද ප්‍රදේශවල ඇති ජනාකීර්ණ තත්ත්වය හේතුවෙන් ස්වභාවික ජලය බැසයන මාර්ග අවහිර කර නිවාස ඉදිකිරීම් සිදු කර ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.3.5. ඉදිරි ව්‍යාපෘති සම්බන්ධයෙන් මන්ත්‍රීවරු දැනුවත් කිරීම

අපේක්ෂිත ව්‍යාපෘති හා සැලසුම් සම්බන්ධයෙන් ප්‍රදේශයේ මන්ත්‍රීවරු දැනුවත් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

### 1.3.6. පසුගිය කාලයේ නාගරික සංවර්ධන අධිකාරියේ සිදුවූ අක්‍රමිකතා දැනුවත් කිරීම

පසුගිය වසර පහක කාලය තුළ නාගරික සංවර්ධන අධිකාරියේ සිදුවූ අක්‍රමිකතා සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

### 1.3.7. ඉංජිනේරුවරුන් සහ ගෘහ නිර්මාණ ශිල්පීන් ගොඩනැගිලි සැලසුම් කිරීමේදී ප්‍රායෝගිකව කටයුතු නොකිරීම

මේ සම්බන්ධයෙන් ඉංජිනේරුවරුන් සහ ගෘහ නිර්මාණ ශිල්පීන්ට උපදෙස් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

නාගරික සංවර්ධන අධිකාරියේ මාර්ගෝපදේශ සංශෝධනය කිරීම සඳහා විශේෂඥ කමිටුවක් පත් කිරීමට බලාපොරොත්තු වන බව රාජ්‍ය අමාත්‍ය, ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා විසින් දැනුම් දෙන ලදී.

### 1.3.8. කැළිකසල කළමනාකරණය කිරීම

මේ සම්බන්ධයෙන් හඳුන්වා දුන් ව්‍යාපෘතිවල වත්මන් තත්ත්වය පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් විමසීමක් කරන ලදී.

කැළිකසලවලින් බලශක්තිය නිෂ්පාදනය කිරීම සඳහා ආරම්භ කරන ලද කෙළවරපිටිය ව්‍යාපෘතිය මෙම වසරේ අවසන් වන බව රාජ්‍ය අමාත්‍ය, ගරු(ආචාර්ය) නාලක ගොඩහේවා මහතා විසින් දැනුම් දෙන ලදී.

කරදියාන ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම අසාර්ථක වී ඇති බැවින් එය ක්‍රියාත්මක කිරීම සඳහා වෙනත් පාර්ශවයකට ලබා දීමට කටයුතු කරන බව ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් තවදුරටත් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.3.9. කොළඹ මහල් නිවාස ක්‍රමවත් ලෙස නඩත්තු නොවීම

මෙම තත්ත්වය සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

### 1.3.10. ජල ප්‍රවාහන අධිකාරියක් පිහිටුවීමේ අවශ්‍යතාවය

ජල මාධ්‍යය ඔස්සේ ප්‍රවාහන කටයුතු සිදු කිරීමේදී ඇති වන නීතිමය සහ පරිපාලනමය ගැටළුකාරී තත්ත්වය විසඳා ගැනීම සඳහා අමාත්‍යාංශය යටතේ ජල ප්‍රවාහන අධිකාරියක් පිහිටුවීමේ අවශ්‍යතාවය ඇති වී තිබෙන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ලිඛිතව ලබා දෙන ලෙස රාජ්‍ය අමාත්‍ය, ගරු(ආචාර්ය) නාලක ගොඩහේවා මහතා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 1.4. නිවාස සැලසුම් අනුමත කිරීම අයථා ලෙස සිදු වීම සහ වෙනත් කරුණු - ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

### 1.4.1. නිවාස සැලසුම් අනුමත කිරීම අයථා ලෙස සිදු වීම

නිවාස ඉදිකිරීම්වලට අදාළ සැලසුම් අනුමත කිරීමේ ක්‍රියාවලිය තුළ වර්තමානයේ මාෆියාවක් ක්‍රියාත්මක වන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.4.2. නිවාස සැලසුම් අනුමත කිරීම හා වෙනත් කටයුතු සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ මැදිහත්වීම

ග්‍රාමීය නිවාස ඉදිකිරීම්වලදී සැලසුම් අනුමත කිරීමට අදාළ නීතිරීති සම්බන්ධයෙන් සාමාන්‍ය ජනතාවගේ දැනුවත්බව අඩු නිසා ඔවුන් විවිධ අපහසුතාවලට මුහුණ දෙන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම නීතිරීති ඉදිරි වසර 2 තුළ සංශෝධනය කළ යුතු බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

දැනට සැලසුම් අනුමත කිරීම සඳහා විශාල අයදුම්පත් සංඛ්‍යාවක් ඇති බැවින් කඩිනම් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතු බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

නිවාස සැලසුම් අනුමත කිරීමේ කටයුතු නාගරික සංවර්ධන අධිකාරිය විසින් කඩිනමින් සිදු කරන බව අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.5. ග්‍රාම නිලධාරි වසම්වල ක්‍රියාත්මක වන නිවාස ව්‍යාපෘතිය සහ මීරිගම නගර සැලසුම - ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

### 1.5.1. ග්‍රාම නිලධාරි වසම්වල ක්‍රියාත්මක වන නිවාස ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය යටතේ ඉඩමක අයිතිය ඇති නමුත් නිවසක් සාදා ගැනීමට වත්කමක් නොමැතිව කුලී පදනම මත පදිංචි අයට ද නිවසක් සාදා ගැනීමට ප්‍රතිපාදන ලබා දීමේ හැකියාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමිය විසින් විමසීමක් කරන ලදී.

දැනට එක් ග්‍රාම නිලධාරි වසමට එක් ගෙයක් ලබා දීමේ ක්‍රියාපිළිවෙළ වැඩි කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව අදාළ වගකීම භාර ගන්නේ නම් ඉහත ව්‍යාපෘතිය සඳහා වෙන් කර ඇති මුදල් ගරු මන්ත්‍රීතුමිය විසින් සඳහන් කළ කරුණ සඳහා ලබා දිය හැකි බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.5.2. මීරිගම නගර සැලසුම

මේ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාවෙන් විමසීමක් කරන ලදී.

## 1.6. නගර සැලැසුම් ක්‍රියාත්මක කිරීම - ගරු වීරසුමන වීරසිංහ මහතා

### 1.6.1. නගර සැලසුම් නිර්මාණය කිරීම

නගර සංවර්ධනයේදී දිස්ත්‍රික්කය තුළ ඇති අවශ්‍යතා අනුව ප්‍රමුඛතාවය ලබා දිය යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.6.2. දෙනියාය, වැලිගම සහ අකුරැස්ස යන නගර සඳහා නගර සැලසුම් ක්‍රියාත්මක කිරීම

දෙනියාය නගර සැලසුමෙහි මූලික සැලැස්ම සම්බන්ධයෙන් අදාළ පාර්ශව සමඟ සාකච්ඡා කිරීමට සහ කඹුරුපිටිය නගර සැලැස්ම ක්‍රියාත්මක කිරීමට නියමිත බව නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එමෙන්ම හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා මූලික සැලැස්මක් සකස් කිරීමට නියමිත බවද ඔහු විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

සෑම නගරයකටම නගර සැලසුමක් නිර්මාණය කරන ලෙස සෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකටම දැනුම් දී ඇති බවත් ඉදිරි කාලයේදී ප්‍රමුඛතාවය අනුව ඒවා ක්‍රියාත්මක කිරීමට අදහස් කරන බවත් රාජ්‍ය අමාත්‍ය, ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.7. මත්තල ගුවන් තොටුපොළ ආසන්න ප්‍රදේශය නාගරික සංවර්ධන අධිකාරිය විසින් පවරා ගැනීම සහ වෙනත් කරුණු - ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

### 1.7.1. මත්තල ගුවන් තොටුපොළ ආසන්න ප්‍රදේශය නාගරික සංවර්ධන අධිකාරිය විසින් පවරා ගැනීම

මත්තල ගුවන් තොටුපොළට ආසන්න මීටර් 200 ක ප්‍රදේශය නාගරික සංවර්ධන අධිකාරිය විසින් පවරාගැනීම සඳහා හම්බන්තොට දිස්ත්‍රික් සංවර්ධන කමිටුව අනුමත කර ඇති බැවින් මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

### 1.7.2. කලාපීය රටාවකට ගැළපෙන පරිදි නිවාස ඉදි කිරීම

මෙම අදහස සම්බන්ධව නාගරික සංවර්ධන අධිකාරියට උපදෙස් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

සියළු පළාත් පාලන ආයතන සම්බන්ධීකරණය කරගෙන හම්බන්තොට දිස්ත්‍රික්කය වෙනුවෙන් ප්‍රධාන සැලැස්මක් නිර්මාණය කරන බව නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.8. නාගරික සංවර්ධන අධිකාරියේ බලය පළාත් පාලන ආයතන ප්‍රධානීන්ට ලබා දීම සහ රුවන්වැල්ල නගර සැලැස්ම - ගරු සුදත් මංජුල මහතා

### 1.8.1. නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් සතු බලය පළාත් පාලන ආයතන ප්‍රධානීන්ට ලබා දීම

ඉදිකිරීම් සැලසුම් සඳහා අනුමැතිය ලබා දීමේදී නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් සතු බලය පළාත් පාලන ආයතන ප්‍රධානීන්ට ලබා දීමේදී තාක්ෂණික ගැටළුකාරී තත්ත්වයක් ඇති වන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඒ සඳහා මේ වනවිට පත්වීම් ලබාදී ඇති උපාධිධාරීන් සඳහා තාක්ෂණික පුහුණුවක් ලබා දී නාගරික සංවර්ධන අධිකාරිය නියෝජනය කරන නිලධාරියෙක් ලෙස පළාත් පාලන ආයතනවලට යොමු කිරීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.8.2. රුවන්වැල්ල නගර සැලැස්ම

රුවන්වැල්ල නගර සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ඉඩම් පවරා ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ මූල්‍ය සහ තාක්ෂණික දායකත්වය අවශ්‍ය බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම නගර සංවර්ධන සැලැස්මට සමගාමීව නාගරික ව්‍යාපාරික ප්‍රජාව වෙනුවෙන් නිවාස සංකීර්ණයක් ඉදි කිරීමේ අවශ්‍යතාවය ඇති බව ද ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.9. යාපනය දිස්ත්‍රික්කය සඳහා වන උපායමාර්ගික සංවර්ධන ව්‍යාපෘතිය - ගරු අංගජන් රාමනාදන් මහතා

මෙම ව්‍යාපෘතියේ වත්මන් තත්ත්වය පිළිබඳ ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මේ සම්බන්ධයෙන් තමා අධීක්ෂණය කළ බවත් මෙම ව්‍යාපෘතිය තවදුරටත් සිදු කරගෙන යාම සම්බන්ධයෙන් නැවත සාකච්ඡා කරන බවත් රාජ්‍ය අමාත්‍ය, ගරු(ආචාර්ය) නාලක ගොඩහේවා මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.10. නාගරික සංවර්ධන අධිකාරිය මගින් ඉඩම් පවරා ගැනීම සහ වෙනත් කරුණු - ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

### 1.10.1. නාගරික සංවර්ධන අධිකාරිය මගින් ඉඩම් පවරා ගැනීම

මෙවැනි අවස්ථාවලදී ජනතාව සමඟ වඩා නම්‍යශීලී ලෙස කටයුතු කිරීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.10.2. මොරටුව සොයිසාපුර නිවාස සංකීර්ණයේ ගැටළු

මොරටුව නිවාස සංකීර්ණයේ ඇති ගැටළුව සඳහා පවුල් 16 ක් වෙනුවෙන් නිවාස ලබා දීමෙන් විසඳිය හැකි බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී. ඉතිරි වී ඇති නිවාස පහේ පදිංචි වීමට පවුල් පහක් කැමති බවත් ඉතිරි පවුල් 11 සඳහා නිවාස ලබා දීම සිදුවුවහොත් ඔවුන් එහි පදිංචි වීමට කැමති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

ඉදිරි දිනවලදී ඉදි කිරීම් ආරම්භ කිරීමට නියමිත නිවාස සංකීර්ණයෙන් අදාළ ගෙවීම් කළහොත් ඉතිරි පවුල් 11 සඳහා නිවාස ලබා දිය හැකි බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.10.3. මොරටුව වෙරළ තීරයේ ඛාදනය

මෙම තත්ත්වය සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.11. බණ්ඩාරවෙල නගර සැලසුම සහ වෙනත් කරුණු - ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

### 1.11.1. බණ්ඩාරවෙල නගර සැලසුම

බණ්ඩාරවෙල නගරය වෙනුවෙන් විධිමත් නගර සැලසුමක් නිර්මාණය කරන ලෙසත් මෙම කරුණ සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන දැනුවත් කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

### 1.11.2. බණ්ඩාරවෙල සහ ඇල්ල නගර ආදර්ශ නගර බවට පත් කිරීම

සංචාරක ක්ෂේත්‍රයේ වැදගත් නගර වන බණ්ඩාරවෙල සහ ඇල්ල නගර ආදර්ශ නගර බවට පත් කිරීමේ සංකල්පය පිළිබඳ අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

### 1.11.3. ඇල්ල නගරයේ අවිධිමත් සැකැස්ම

මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

### 1.11.4. නාය යාම් නිසා නිවාස අහිමි වූ ජනතාව වෙනුවෙන් සහනයක් සැලසීම

නාය යාම් නිසා නිවාස අහිමි වූ ජනතාව සඳහා ඉඩම් ලබා දීම වෙනුවට නිවාස සංකීර්ණයක් ඉදි කිරීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

නැවත පදිංචි කිරීම යටතේ ප්‍රතිපාදන වෙන් වී ඇති බැවින් ප්‍රදේශයේ මන්ත්‍රීවරුන් ලෙස ජනතාවගේ අනුමැතිය ලබාගතහොත් එසේ කටයුතු කළ හැකි බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.11.5. බණ්ඩාරවෙල නගරය සඳහා මාර්ග සංඥා පද්ධතියක් හෝ ගුවන් පාලමක් ඉදි කිරීම

බණ්ඩාරවෙල නගරයේ පවතින දැඩි රථවාහන තදබදය වෙනුවෙන් මාර්ග සංඥා පද්ධතියක් සහ ගුවන් පාලමක් ඉදි කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.12. මහනුවර නගරයේ සිදුවන අනවසර ඉදි කිරීම් සහ වෙනත් කරුණු - ගරු උදයන කිරිදිගොඩ මහතා

### 1.12.1. මහනුවර නගරයේ සිදුවන අනවසර ඉදි කිරීම්

මහනුවර නගරයේ සිදුවන අනවසර ඉදි කිරීම් නැවැත්වීම සඳහා අධිකරණ නියෝගයක් ලබා ගැනීමේ අවස්ථාව පළාත් පාලන ආයතනවලට සලසා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

### 1.12.2. මහනුවර නගරය සඳහා නගර සැලසුමක අවශ්‍යතාවය

අක්‍රමවත් ලෙස නිර්මාණය වී ඇති මහනුවර නගරය සඳහා විධිමත් නගර සැලසුමක අවශ්‍යතාවය සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.12.3. පළාත් පාලන ආයතනවල නිලධාරින් දිගු කාලයක් එකම ආයතනයක සේවයේ යෙදීම

පළාත් පාලන ආයතනවල නිලධාරින් දිගු කාලයක් එකම ආයතනයක සේවයේ යෙදීම නිසා ඒකාධිකාරයක් නිර්මාණය වී ඇති බැවින් මේ සම්බන්ධයෙන් සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

#### 1.12.4. මහනුවර දිස්ත්‍රික්කයේ සිදුවන භූ චලන

මෑතදී මහනුවර දිස්ත්‍රික්කයේ සිදු වූ භූ චලන සම්බන්ධයෙන් වාර්තාවක් ලබා ගැනීම සඳහා විශේෂඥ කමිටුවක් පත් කර ඒ පිළිබඳ ජනතාව දැනුවත් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.13. පළාත් පාලන ආයතනය නොසලකා නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය මත නිවාස ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සහ වෙනත් කරුණු - ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

#### 1.13.1. පළාත් පාලන ආයතනය නොසලකා නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය මත නිවාස ව්‍යාපෘතියක් ආරම්භ කිරීම

පළාත් පාලන ආයතනය නොසලකා නාගරික සංවර්ධන අධිකාරිය විසින් ලබාදුන් අනුමැතිය මත පෞද්ගලික ආයතනයක් විසින් අත්තනගල්ල ආසනයේ පෞද්ගලික ඉඩමක නිවාස ව්‍යාපෘතියක් ආරම්භ කර ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී. පසුකාලීනව මෙම ව්‍යාපෘතිය නතර කර ඇති බැවින් එය පවරාගෙන ක්‍රමවත් ලෙස ක්‍රියාත්මක කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

ගම්පහ ලංකා ලෝහ භාණ්ඩ කර්මාන්ත ශාලාවට අයත් ඉඩමක් කොටස් කර වෙන්දේසි කිරීමට සූදානම් වන බැවින් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරින්ට උපදෙස් ලබා දෙන ලදී.

විශාල ජල මාර්ගයක් හරස් කර තාප්පයක් ඉදි කරන බැවින් පරීක්ෂණයක් සිදු කරන ලෙසද ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

#### 1.13.2. නිවාස ව්‍යාපෘතියක් ඉදි කිරීම

අත්තනගල්ල ආසනයේ විශාල පවුල් සංඛ්‍යාවක් ජීවත් වන පර්චස් 60 ක ඉඩමෙහි නිවාස ව්‍යාපෘතියක් ඉදිකර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

#### 1.13.3. වේයන්ගොඩ නගරය දියුණු කිරීම

වේයන්ගොඩ නගරය අවිධිමත් තත්ත්වයේ පවතින බැවින් එම නගරය දියුණු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

### 1.14. නගර සැලසුම් නිසිපරිදි ක්‍රියාත්මක කිරීම - ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගර මෙන්ම සෙසු නගර සඳහාද නගර සැලසුම් නිසිපරිදි ක්‍රියාත්මක කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

## 1.15. ඉදි කිරීම් සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබා ගත යුතු වීම සහ කිලිනොච්චි නගර සැලසුම - ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

### 1.15.1. ඉදි කිරීම් සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබා ගත යුතු වීම

යාපනය දිස්ත්‍රික්කයේ සිදු කිරීමට යෝජිත ඉදි කිරීම් සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබා ගත යුතු බවට ගැසට් නිවේදනයක් නිකුත් කිරීම නිසා දිස්ත්‍රික්කයේ ඇතැම් ප්‍රදේශවල ජනතාව පීඩාවට ලක්වන බැවින් ඒ පිළිබඳව අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

යාපනය නගරය තවදුරටත් විහිදිය යුතු බැවින් මෙම ප්‍රදේශය නාගරික බල ප්‍රදේශයක් ලෙස නම් කිරීම සඳහා ගැසට් නිවේදනය නිකුත් කළ බව නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.15.2. කිලිනොච්චිය නගරය සඳහා නගර සැලසුම

කිලිනොච්චිය නගරය සඳහා නගර සැලසුමක් ක්‍රියාත්මක කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

සමස්ථ යාපනය දිස්ත්‍රික්කයටම නගර සැලසුමක් නිර්මාණය කර ඇති බවත් කිලිනොච්චිය නගර සැලසුම 2021 මාර්තු වන විට කෙටුම්පත් කර අවසන් කරන බවත් රාජ්‍ය අමාත්‍ය, ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.16. මුලතිව් බස් නැවතුම්පළෙහි සහ මන්නාරම ක්‍රීඩාංගනයේ ඉදි කිරීම් කටයුතු - ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

### 1.16.1. මුලතිව් බස් නැවතුම්පළෙහි ඉදි කිරීම් කටයුතු

නාගරික සංවර්ධන අධිකාරිය විසින් ආරම්භ කරන ලද මුලතිව් බස් නැවතුම්පළෙහි ඉදි කිරීම් කටයුතු අවසන් කර නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මුලතිව් බස් නැවතුම්පොළෙහි මූලික අදියර අවසන් කර පළාත් පාලන ආයතනයට එය භාර දුන් නමුත් ඔවුන් භාර නොගන්නා බව නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී. මෙහි දෙවන අදියරෙහි ඉදි කිරීම් කටයුතු සඳහා ප්‍රතිපාදන මීළඟ වසරට වෙන් කර ඇති බවත් ඔහු විසින් තවදුරටත් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.16.2. මන්නාරම ක්‍රීඩාංගනයේ ඉදි කිරීම් කටයුතු

මන්නාරම පල්ලේමුණේ ක්‍රීඩාංගනයේ ඉදි කිරීම් කටයුතු සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් විමසීමක් කරන ලදී.

මෙම ඉදි කිරීම් කටයුතු අදාළ පෞද්ගලික කොන්ත්‍රාත්කරු විසින් එය නිසි පරිදි සිදු කර නොමැති බැවින් ගරු අමාත්‍යතුමා සමඟ සාකච්ඡා කර මීළඟ වසරේ ලැබෙන ප්‍රතිපාදන

අනුව මෙම ක්‍රීඩාංගනයේ ඉදි කිරීම් කටයුතු අවසන් කිරීමට කටයුතු කරන බව නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.17. ඇඹිලිපිටිය වාපි උද්‍යානයේ ඉදි කිරීම් කටයුතු - ගරු අජිත් රාජපක්ෂ මහතා**

මෙහි ඉදි කිරීම් කටයුතු අවසන් කර නොමැති බැවින් එම ව්‍යාපෘතිය කඩිනමින් අවසන් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.18. කල්මුණේ පිහිටා ඇති අබලන් තත්ත්වයේ පවතින ගොඩනැගිල්ල සහ වෙනත් කරුණු - ගරු එච්. එම්. එම්. හරීස් මහතා**

**1.18.1. කල්මුණේ පිහිටා ඇති අබලන් තත්ත්වයේ පවතින ගොඩනැගිල්ල**

කල්මුණේ ප්‍රදේශයේ විවිධ රාජ්‍ය ආයතන ඇතුළු ආයතන කිහිපයක් ක්‍රියාත්මක වූ පැරණි ගොඩනැගිල්ලක් මේ වනවිට අබලන් තත්ත්වයේ පවතින බැවින් මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙවර අයවැයෙන් පැරණි ගොඩනැගිලි අළුත්වැඩියාවට ප්‍රතිපාදන වෙන් වී ඇති බැවින් මෙය සිදු කළ හැකි බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.18.2. ජාතික ආධුනික හා කාර්මික පුහුණු අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාලය සඳහා කුලියට ඉඩමක් ලබා ගැනීම**

කල්මුණේ ප්‍රදේශයේ ඇති ජාතික ආධුනික හා කාර්මික පුහුණු අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාලය සඳහා කුලියට ඉඩමක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එය ඉටු කළ හැකි බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.19. කුලියාපිටිය මීගහකොටුවේ උද්‍යානයක් ඉදි කිරීම - ගරු සමන්ප්‍රිය හේරත් මහතා**

කුලියාපිටිය මීගහකොටුවේ සොහොනකඩේ හන්දිය ස්ථානය ගොඩකර උද්‍යානයක් ඉදි කිරීමේ සැලසුමක් ඇති බැවින් මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් ලබා දෙන ලදි.

**1.20. බද්දේගම නගර සැලසුම - ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා**

බද්දේගම බස් නැවතුම්පොළෙහි ඉදි කිරීම් කටයුතු කඩිනමින් අවසන් කරන ලෙසත් බද්දේගම නගර සැලසුම සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**1.21. නිවාස ව්‍යාපෘති වෙනුවෙන් යටිතල පහසුකම් ලබා දීම - ගරු අසංක නවරත්න මහතා**

පසුගිය කාලයේදී ගල්ගමුව ආසනයේ ආරම්භ කරන ලද නිවාස ව්‍යාපෘති වෙනුවෙන් යටිතල පහසුකම් ලබා දීම සිදු නොවූ බැවින් ඒ සම්බන්ධයෙන් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

මේ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගත හැකි බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.22. යටියන්තොට හා කිතුල්ගල නගර සඳහා නගර සැලසුම් සහ මාවනැල්ල නගරයේ බස් නැවතුම්පොළෙහි ඉදි කිරීම් කටයුතු - ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය**

**1.22.1. යටියන්තොට හා කිතුල්ගල නගර සඳහා නගර සැලසුම් ක්‍රියාත්මක කිරීම**

මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

යටියන්තොට නගර සැලසුම නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට නියමිත බව නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.22.2. මාවනැල්ල නගරයේ බස් නැවතුම්පොළෙහි ඉදි කිරීම් කටයුතු**

මෙම ඉදි කිරීම් කටයුතු අවසන් කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

**1.23. ඉමදූව නගර සංවර්ධනයේ ඉදිරි කටයුතු සහ වෙනත් කරුණු - ගරු චන්දිම වීරක්කොඩි මහතා**

**1.23.1. ඉමදූව නගර සංවර්ධනයේ ඉදිරි කටයුතු**

මෙම කටයුතු කඩිනමින් සිදු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

**1.23.2. රුමස්සල සංරක්ෂිත පරිසර කලාපයක් ලෙස නම් කිරීම**

මෙම කරුණ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

**1.23.3. උණවටුන සඳහා සැලසුමක් සකස් කිරීම**

උණවටුන සඳහා විධිමත් සැලසුමක් සකස් කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 1.23.4. ගාල්ල නගර සැලැස්ම

ගාල්ල නගර සැලැස්ම ක්‍රියාත්මක කිරීමට පෙර දිස්ත්‍රික් මන්ත්‍රීවරු දැනුවත් කර ඔවුන්ගේ අදහස් ලබා ගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

නගර සැලසුම් නිර්මාණය කිරීමේදී එම දිස්ත්‍රික්කයට ගොස් දේශපාලන අධිකාරිය හා පළාත් පාලන ආයතන සමඟ සාකච්ඡා කර කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශයේ ලේකම්ට උපදෙස් ලබා දෙන ලදී.

ගාල්ල බහුකාර්ය මධ්‍යස්ථානය ඉදි කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් විමසීමක් කරන ලදි.

මේ සම්බන්ධයෙන් ගරු අමාත්‍යතුමා සමඟ සාකච්ඡා කළ යුතු බව නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 1.23.5. ඇල්පිටිය නගර සැලැස්ම

ඇල්පිටිය නගර සැලැස්ම ක්‍රියාත්මක කිරීම අත්හිටුවා ඇති බැවින් දේශපාලන අධිකාරියේ යෝජනාද සලකා විධිමත් ලෙස නැවත එම සැලසුම ක්‍රියාත්මක කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

### 1.23.6. ගාල්ල කොටුව ආශ්‍රිත ප්‍රදේශය

ගාල්ල කොටුව ආශ්‍රිත ප්‍රදේශය සංචාරක කර්මාන්තයට ගැළපෙන ලෙස සකස් කළ යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

අදාළ සියළුම පාර්ශ්ව සම්බන්ධ කරගෙන ප්‍රමුඛතා හඳුනාගෙන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බව රාජ්‍ය අමාත්‍ය, ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

## 1.24. ඔලුවිල් වරාය ඉදි කිරීමෙන් ධීවර ජනතාව පීඩාවට පත්වීම - ගරු ෆයිසාල් කාසිම් මහතා

මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරමින් පවතින බව රාජ්‍ය අමාත්‍ය, ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

## 1.25. අලව්ව, නාරම්මල හා දඹදෙණිය නගරවල සැලසුම් ක්‍රියාත්මක කිරීම - ගරු ශාන්ත බණ්ඩාර මහතා

අලව්ව නගරය තුළ පවතින විශාල වාහන තදබදය සම්බන්ධයෙන් ද අලව්ව, නාරම්මල හා දඹදෙණිය නගර සඳහා නගර සැලසුම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන්ද අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

**1.26. රක්වාන හා ගොඩකවෙල නගර සඳහා නගර සැලැස්ම ක්‍රියාත්මක කිරීම - ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය**

මෙම නගර සැලැසුම් ක්‍රියාත්මක කරදෙන ලෙස සහ කහවත්ත බස් නැවතුම්පොළ සංවර්ධනය කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදි.

කාරක සභාවට සහභාගි වූ ගරු මන්ත්‍රීවරුන් ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධයෙන් කාරක සභාවේ සභාපති, ගරු අග්‍රාමාත්‍යතුමා දැනුවත් කරන බවත් රාජ්‍ය අමාත්‍යවරු ලෙස තම විෂය පථයට අයත් කරුණු සම්බන්ධයෙන් ගරු අග්‍රාමාත්‍යතුමා දැනුවත් කර ක්‍රියාත්මක වන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

**2.** කාරක සභාව ප.ව. 1.00 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

**කෘෂිකර්ම කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමු වැනි රැස්වීම - 2020 නොවැම්බර් 24**

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා (සභාපති)
ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු ඩී.බී. හේරත් මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
ගරු ඉෂාක් රහුමාන් මහතා
ගරු උදයකාන්ත ගුණතිලක මහතා
ගරු කුලසිංහම් තිලීපන් මහතා
ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු චමල් රාජපක්ෂ මහතා
ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
ගරු ඩග්ලස් දේවානන්දා මහතා
ගරු දයාසිරි ජයසේකර මහතා
ගරු ලසන්ත අලගියවන්න මහතා
ගරු කනක හේරත් මහතා
ගරු කංචන විජේසේකර මහතා
ගරු ජයරත්න හේරත් මහතා
ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
ගරු චන්දිම වීරක්කොඩි මහතා
ගරු රෝහණ දිසානායක මහතා
ගරු අශෝක් අබේසිංහ මහතා
ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා
ගරු වේලු කුමාර් මහතා
ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු තිසකුට්ටි ආරච්චි මහතා
ගරු උදයන කිරිදිගොඩ මහතා
ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා
ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා
ගරු චාමර සම්පත් දසනායක මහතා
ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා
ගරු සුදත් මංජුල මහතා
ගරු ගුණතිලක රාජපක්ෂ මහතා
ගරු එච්.එම්. සමන්ප්‍රිය හේරත් මහතා
ගරු සාගර කාරියවසම් මහතා
ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

**නිවාඩු පිළිබඳ යෝජනා**

ගරු එස්. වියාලේන්ද්‍රන් මහතා, රාජ්‍ය අමාත්‍ය

## 1. ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා

### 1.1 ගරු ලසන්ත අලගියවන්න මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

#### 1.1.1 2021 වර්ෂයේ දේශීය ආහාර අවශ්‍යතාව සපුරා ගැනීම සඳහා ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ දත්ත අනුව අනුගමනය කළහැකි වැඩපිළිවෙල

මේ සම්බන්ධයෙන් ගරු අමාත්‍යතුමා විසින් විමසීමක් කරන ලදී.

#### 1.1.2 දේශීය ආහාර භෝග සහ දියර කිරි නිෂ්පාදනය, වෙළඳපොල සහ පාරිභෝගික අවශ්‍යතාවය සැපිරීම සඳහා කළමනාකරණය කිරීම

අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය 16ක් සම්බන්ධයෙන් අවධානය යොමු කොට අවශ්‍ය සැලසුම් පිළියෙල කර ඇති බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පලාවර්ග වැනි අනෙකුත් ආහාර භෝග වගාව සම්බන්ධයෙන්ද විශේෂ අවධානයක් යොමු කරන ලෙස ගරු අමාත්‍යතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.2 තේ,කුරුඳු, රබර් වැනි භෝග සඳහා පොහොර සහනාධාරය ක්‍රමවත් පරිදි නොලැබීම - ගරු කනක හේරත් මහතා

ගොවිජන සේවා මධ්‍යස්ථාන 525 ක් සඳහා පස පරීක්ෂා කිරීමේ කට්ටල (Soil Test Kit) ගෙන්වීමෙන් ලබන වසරේ සිට පස පරීක්ෂා කිරීමෙන් පසුව අවශ්‍ය පොහොර ප්‍රමාණය නිකුත් කිරීමට කටයුතු කරන බවත් පොහොර අවශ්‍යතාවය වැඩි දිස්ත්‍රික්ක හඳුනාගෙන එම දිස්ත්‍රික්කවලට වැඩියෙන් පොහොර නිකුත් කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇති බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.3 මොණරාගල දිස්ත්‍රික්කයේ අනෙකුත් භෝග සඳහා පොහොර ලබා ගැනීම - ගරු රංජිත් මද්දුම බණ්ඩාර මහතා

මොණරාගල දිස්ත්‍රික්කයේ අනෙකුත් භෝග සඳහා නිකුත් කරන පොහොර ප්‍රමාණවත් නොවන බැවින් ප්‍රමාණවත් පරිදි පොහොර නිකුත් කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.
කුඩා තේවතු හිමියන්ට කර්මාන්තශාලා හරහාම තේ පොහොර ලබා ගැනීමට කටයුතු කරන ලෙස දැනුම්දීම තුළින් ගැටළුකාරී තත්ත්වය මඟහැරෙන බව ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

2021 වර්ෂයේ සිට ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා පොහොර බෙදා හැරීමට කටයුතු කරන බවත්, ඊට අමතරව විවෘත වෙළඳපලෙන් මිලදී ගැනීමට හැකි වන අයුරින් කටයුතු සම්පාදනය කරන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ගොවිජන සේවා මධ්‍යස්ථානය හා කුඩා තේ වතු සංවර්ධන මණ්ඩලය සම්බන්ධ කිරීමෙන් එම කටයුතු සාර්ථකව පවත්වාගෙන යා හැකි බව ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.4 සහල් මිල පාලනය - ගරු ඉෂාක් රහුමාන් මහතා

කුඩා සහල් මෝල් හිමියන්ට බැංකු හරහා ලබාදෙන මාස 06ක ණය පියවීමේ කාලසීමාව මාස 09 ක් දක්වා වැඩි කිරීමෙන් සහ සහල් සඳහා පාලන මිලක් නියම කිරීමෙන් මිල පාලනය කළ හැකි බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ලබන කන්නයේ සිට පොහොර සහනාධාරය ලබා දෙන සෑම ගොවියෙකුගෙන්ම මුල් හෙක්ටයාර් එකෙන් වී කිලෝ 1000 ක්ද දෙවන හෙක්ටයාර් එකෙන් වී කිලෝ 500ක් බැගින් වී අලෙවි මණ්ඩලය හරහා වී මෙට්‍රික් ටොන් ලක්ෂ තුනක් මිලදී ගැනීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.5 උතුරු පළාතේ ගොවීන්ට බීජ අල සහනාධාරය නොලැබීම - ගරු ඩග්ලස් දේවානන්ද මහතා

50% ක බීජ අල සහනාධාරය ලබාදීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීමට යාපනය දිස්ත්‍රික් ප්‍රාදේශීය ලේකම් දැනුවත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ට උපදෙස් ලබා දෙන ලදී.

## 1.6 ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.6.1 "ප්ලෙජ්" (Pledge) ණය යෝජනා ක්‍රමය යටතේ බැංකු මගින් වී අස්වැන්න පිළිබඳ දත්ත ගබඩාවක් තබා ගැනීම

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් දැනටමත් වී නිෂ්පාදනය පිළිබඳ දත්ත ගබඩාවක් පවත්වාගෙන යාමට අවශ්‍ය පියවර ගෙන ඇති බවත්, ඉදිරියේදී වී අස්වැන්න පිළිබඳ සියලුම දත්ත ලබාගත හැකි බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.6.2 භෝග වගාවේදී භෝග විවිධාංගිකරණයට කටයුතු කිරීම

කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රමුඛතම කාර්යය වනුයේ ජාතික ප්‍රතිපත්තියක් සැකසීම සහ දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

දත්ත ගබඩාවක් සැකසීම තුළින් ඉදිරියේදී එක් එක් දිස්ත්‍රික්කයට උචිත භෝග පමණක් වගාකිරීම සඳහා ගොවීන් දිරිමත් කර එම අස්වැන්න සඳහා ඉහල මිලක් ලබාදීමට අපේක්ෂා කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.6.3 හේන් ගොවීන්ගේ ගැටළු සඳහා ස්ථිරසාර විසඳුමක් ලබාගැනීම

ව්‍යාපාරිකයන් විශාල ඉඩම් සඳහා අවසර පත්‍ර ලබාගෙන ස්ථිර භෝග වගා කිරීම පිළිබඳව අධීක්ෂණය කළ යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.7 ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා

### 1.7.1 බදුල්ල දිස්ත්‍රික්කයේ වගා කටයුතු සඳහා සුදුසු ටීඑස්පී (TSP) පොහොර ප්‍රමාණවත් නොවීම

තාක්ෂණික පිරිවිතර දෝෂ හේතුවෙන් අතශවශ්‍ය පොහොර ගෙන්වීමේ ගැටළුවක් පවතින බැවින් අවශ්‍ය අධ්‍යයනයන් සිදුකර එම ගැටළුව අවම කිරීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.7.2 බණ්ඩාරවෙල හල්පේ ගොවිපල හා කෘෂි පර්යේෂණායතනය සංවර්ධනය කර කෘෂි පර්යේෂණ කටයුතු සඳහා යොදා ගැනීම

අධිකරණයේ පැවති නඩුව අවසන් වී ඇති බැවින් ඉදිරියේදී පර්යේෂණායතනයට අවශ්‍ය නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.7.3 බදුල්ල බණ්ඩාරවෙල ප්‍රදේශයට සැප් (SAPP) ව්‍යාපෘතිය මගින් හඳුන්වා දී ඇති බහු උමං (Poly Tunnels) වැඩි ප්‍රමාණයක් ලබාදීමට කටයුතු කිරීම

අවශ්‍ය ඉඩම් ප්‍රමාණය සහිත ලැයිස්තුවක් ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.7.4 බදුල්ල දිස්ත්‍රික්කයේ මීමැසි පාලනය ඉහළ නැංවීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙලක් සකස් කිරීම

අවශ්‍ය ප්‍රතිපාදන හා නිලධාරි හිඟය මේ සඳහා බාධාවක් වී ඇති බවත් මීළඟ වසරේ ප්‍රතිපාදන වලින් සුදුසු වැඩපිළිවෙලක් සකස් කරන බව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ විශේෂිත පුහුණුවක් ලද නිලධාරීන් පිරිසක් සිටින බැවින් මේ කටයුත්ත සඳහා එම නිලධාරීන් යෙදවිය හැකි බව රාජ්‍ය අමාත්‍ය ගරු ඩී.බී. හේරත් මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එම කටයුතු කළමනාකරණය කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

### 1.7.5 බණ්ඩාරවෙල ශීතාගාර පහසුකම් සහිත නව ආර්ථික මධ්‍යස්ථානයක් ඉදි කිරීම

මේ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම සඳහා රාජ්‍ය අමාත්‍ය ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා දැනුවත් කරන ලෙස රාජ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්ට (ක්‍රම සම්පාදන) ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබාදෙන ලදී.

ශීතාගාර පහසුකම් ලබාදීම ප්‍රායෝගික නොවන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

බදුල්ල දිස්ත්‍රික්කයට තොග එකතු කිරීමේ මධ්‍යස්ථානයක් ලබාදීමට නියමිත බව රාජ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රම සම්පාදන ) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.8 කාබනික පොහොර භාවිතය ප්‍රවර්ධනය කිරීම - ගරු සමන්ප්‍රිය හේරත් මහතා

කාබනික පොහොර වගාවට යොදා ගැනීමට සම්බන්ධ ඉදිරි සැලසුම් පිළිබඳව ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.9 පස පරීක්ෂා කිරීමේ මෙවලම් (Soil Test Kit) යොදා ගැනීමේ වැදගත්කම - ගරු උදයන කිරිඳිගොඩ මහතා

ඉදිරියේදී පොහොර නිකුත් කිරීමට පෙර කෘෂිකර්ම පරීක්ෂකවරු සහ කෘෂි පර්යේෂණ නියාමන සහකාරවරු විසින් පස පරීක්ෂා කර බලා ගොවි මහතුන්ට පසෙහි සංයුතිය පිළිබඳ කූපනයක් නිකුත් කිරීමට කටයුතු කරන අතර එය පොහොර ලබාගැනීමේදී ඉදිරිපත් කළයුතු බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම ක්‍රියාදාමය තුළින් පොහොර භාවිතය අවම කිරීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

කාබනික සහ රසායනික පොහොර භාවිතය, ගුණාත්මක භාවයෙන් ඉහළ පොහොර ආනයනය යන කරුණු වලින් නිෂ්පාදනය වැඩි කරගැනීමට බලාපොරොත්තු වන බව කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

## 1.10 ගල්ගමුව ප්‍රදේශයේ කුඹුරුවල පස පරීක්ෂා කිරීම - ගරු චමල් රාජපක්ෂ මහතා

ජපානයේ විශේෂඥයන් පිරිසක් මගින් ගල්ගමුව ප්‍රදේශයේ කුඹුරුවල පස පරීක්ෂා කර පොහොර භාවිතය සීතියම්ගත කිරීමට කටයුතු කළද, එය ක්‍රියාත්මක නොවීම පිළිබඳ ගරු චමල් රාජපක්ෂ අමාත්‍යතුමා විසින් විමසීමක් කරන ලදී.

පස පරීක්ෂා කිරීමේ මෙවලම් (Soil Test Kit) සහ අවශ්‍ය අනිකුත් උපකරණ හා යන්ත්‍ර ගොවිජන සේවා මධ්‍යස්ථානයට ලබාදී පස පිළිබඳවද වගාවන් පිළිබඳවද නිරීක්ෂණයන් ලබාගෙන පොහොර නිකුත් කිරීමට බලාපොරොත්තු වන බව කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම්දෙන ලදී.

ඉහත කී අන්දමට පස නිරීක්ෂණය කර පොහොර සහනාධාරය ගොවිජන සේවා මධ්‍යස්ථානය හරහාම ලබාදීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ඊට අමතරව බීජ හා පැළ අලෙවිසැල් සහ අනෙකුත් පහසුකම්ද ලබාදී ගොවිජන සේවා නිලධාරී හරහා ගොවීන්ගේ ගැටළු වලට කෙලින්ම විසඳුම් ලබා දීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.11 නාරම්මල කොවුල්ලැවත්ත වැව සංවර්ධනය කිරීමට අවශ්‍ය නීත්‍යානුකූල අයිතිය ලබාගැනීම - ගරු ශාන්ත බණ්ඩාර මහතා

පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ සභාපති හා ගොවීන් සමඟ සාකච්ඡා කර එකඟතාවයකට පැමිණීමෙන් පසු වැව ප්‍රතිසංස්කරණය සඳහා අවසර ලබාදීමට කටයුතු කළ හැකි බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.12 ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.12.1 වට්ටකච්චි ගොවිපළ රජයේ ගොවිපළක් බවට පත් කිරීම

එය සිවිල් ආරක්ෂක බලකාය යටතේ ගොවිපළක් වශයෙන් පාලනය වන බව ගරු අංගජන් රාමනාදන් මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එය හමුදා භාරයෙන් ලබාගැනීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.12.2 කාබනික පොහොර භාවිතා කරන ගොවීන්ට සහනාධාර ලබා ගැනීම

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ලබා දී ඇති ප්‍රමිතියට අනුව කාබනික පොහොර නිපදවන, ජාතික පොහොර ලේකම් කාර්යාලයේ ලියාපදිංචි බලපත්‍රලාභී පොහොර නිෂ්පාදකයන්ගෙන් පොහොර මිළ දී ගෙන නොමිලේ වී ගොවිතැන සඳහා බෙදාහැරීම

දැනටමත් ආරම්භ කර ඇති බව රාජ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.13 ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.13.1 වන සතුන්ගෙන් වන හානි වලකා ගැනීම සඳහා ස්ථිරසාර ජාතික වැඩපිළිවෙලක් සකස් කිරීම

වන සත්ව ආරක්ෂණ නීති අනුව වන සතුන් ඝාතනය කිරීමට අවසර නොමැති අතර වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය හා එක්ව රිලව් වැනි සතුන් වන්ධ්‍යාකරණයට ලක් කිරීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

කැලේ මැද වගාවන් සිදු කිරීමෙන් අලින් ගම්වැදීම වැලැක්වීම, කෘෂි රක්ෂණ මණ්ඩලය හා එක්ව වගාකරුවන්ට ඒ සඳහා වන්දි ලබාදීමට කටයුතු කිරීම හා අලිවැට ඉදි කිරීම යනාදී පියවරයන් අනුගමනය කිරීමට අපේක්ෂා කරන බව තවදුරටත් දැනුම් දෙන ලදී.

### 1.13.2 පලිබෝධනාශක හා කෘෂි බීජ වර්ගවල ඒකාධිකාරය

ජාන නාමය භාවිතයෙන් පලිබෝධනාශක ගෙන්වීමට කටයුතු කරන බැවින් එහි මිල ගණන් ඉහළ දැමිය නොහැකි බවත් මිළ පහලයාම තුළින් භාවිතය වැඩිවීම අනතුරුදායක විය හැකි බවත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

බඩඉරිඟු වැනි කෘෂි බීජ සහ අනෙකුත් කෘෂි නිෂ්පාදන නිසි ප්‍රමිතියකින් තොරව විවිධ මිළ ගණන් වලට අලෙවි කිරීම නියාමනයට වැඩපිළිවෙලක් ඇති බව අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම ගැටළුවලට දීර්ඝකාලීන විසඳුමක් ලෙස සියළුම මව් බීජ මෙරට නිෂ්පාදනය කිරීමට අපේක්ෂා කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ වනවිටත් නවීන තාක්ෂණය භාවිතා කරමින් දෙමුහුන් බීජ නිෂ්පාදනය ආරම්භ කර ඇති බව කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.13.3 පොලිස් දෙපාර්තමේන්තුව විසින් භාවිතයට ගන්නා රහංගල ගොවිපළ කෘෂිකර්ම අමාත්‍යාංශයට පවරා ගැනීමට කටයුතු කිරීම

ආරක්ෂක අමාත්‍යාංශයට ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර එය නිදහස් කර ගැනීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම්ට උපදෙස් ලබා දෙන ලදී.

### 1.13.4 අක්කරයකට ලැබෙන අස්වැන්න ප්‍රමාණය ඉහළ නංවාගැනීම මඟින් කෘෂි නිෂ්පාදන වල මිළ පහල දැමීම

තාක්ෂණය යොදා ගැනීමෙන් අස්වැන්න තවදුරටත් ඉහළ නැංවීමට කටයුතු කළ හැකි බව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.14 ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ සේවකයන්ට පාරිතෝෂික ගෙවීම - ගරු වේලු කුමාර් මහතා

ඒ සඳහා ප්‍රතිපාදන සපයා ගැනීමේ ගැටළුවක් පවතින බවත් ඉදිරි වසරේදී එම අරමුදල්වලින් අඩක් හෝ ගෙවීමට අපේක්ෂා කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.15 ගරු අංගජන් රාමනාදන් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.15.1 යාපනේ දිස්ත්‍රික්කයේ මිදි අස්වැන්න අඩුවීම සම්බන්ධයෙන් සිදුකරන පර්යේෂණ කටයුතුවල ප්‍රගතිය සහ නව මිදි ප්‍රභේද හඳුන්වාදීම - ගරු අංගජන් රාමනාදන් මහතා

මිදි වගාවේ අස්වැන්න අඩුවීම පිළිබඳ සිදුකරන පර්යේෂණවල ප්‍රගතිය සහ මෙරට දේශගුණයට සරිලන නව මිදි ප්‍රභේද හඳුන්වාදීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මෙම පර්යේෂණ කටයුතු කිලිනොච්චියේ පිහිටි පර්යේෂණ ආයතනය මගින් සිදු කරන අතර මෙම භූමියට සුදුසු මිදි ප්‍රභේද හඳුන්වාදීමට කෘෂි නවීකරණ ව්‍යාපෘතිය යටතේ සාකච්ඡා කර ඇති බව කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙරට දේශගුණික තත්ත්වයට ගැළපෙන ප්‍රභේද සම්බන්ධ ගැටළුවක් පවතින බවත් ඒවා ව්‍යාපාරික මට්ටමට ගෙන ඒම දුෂ්කර කාර්යයක් බවත් අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.15.2 ප්‍රතිසංස්කරණය කළ යුතු වැව් 56 ක් ප්‍රතිසංස්කරණය කිරීම

මේ සඳහා කොන්ත්‍රාත් පිරිනමා ඇති අතර එම වැව්වල ජලය සිඳීයන කාලය වනතෙක් ප්‍රතිසංස්කරණ කටයුතු ඇරඹිය නොහැකි බව අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.16 ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.16.1 ඌරන්ගෙන් අත්තනගල්ල ප්‍රදේශයේ වගාවන්ට සිදුවන හානි

දැනටමත් තුවක්කු නිකුත් කිරීමට කටයුතු කර ඇති බවත්, ඉල්ලීම් ඉදිරිපත් වීමේදී දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ අනුමැතිය ලබාගෙන තුවක්කු නිකුත් කිරීමට කටයුතු කරන බවත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම කරුණු පිළිබඳව ආරක්ෂක අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.16.2 දඹුලේනාගෙන් පොල් වගාවට හානි සිදුවීම

අත්තනගල්ල ප්‍රදේශයේ පොල් වගාවට දඹුලේනාගෙන් සිදුවන හානි වැළැක්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන ලෙසත් මොණරුන්, ලේනුන් හා ඌරු ගහණය සීඝ්‍ර ලෙස වැඩි වී ඇති බැවින් ඒ සඳහා සුදුසු පියවර ගන්නා ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.16.3 කුඹුරු ඉඩම් ගොඩකිරීම නතර කිරීමට අවශ්‍ය පියවර ගැනීම

වාරන රජ මහා විහාර ප්‍රවේශ මාර්ගයේ දෙපස කුඹුරු වගා කිරීම ඇතුළුව කුඹුරු ඉඩම් ගොඩ කිරීම මහා පරිමාණයෙන් සිදුවන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කොළඹ, ගම්පහ කළුතර යන දිස්ත්‍රික්කවල කිසිදු ගොඩ කිරීමකට 2018 වර්ෂයේ සිට අවසර ලබා දී නොමැති බව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එවැනි අනවසර ගොඩකිරීම් සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.16.4 ගම්පහ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා මධ්‍යස්ථානය ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කිරීම සහ කාර්යාල සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීම

මෙවර අයවැයෙන් එම මධ්‍යස්ථානවලට ප්‍රතිපාදන වෙන්වී ඇති බැවින් අවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකරන බවත්, යන්ත්‍රෝපකරණ ලබාදීමට හැකි බවත් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.16.5 වේයන්ගොඩ ආර්ථික මධ්‍යස්ථානයේ වෙළඳසැල් සඳහා සෙවිලි ආවරණ ලබා දීම

වේයන්ගොඩ ආර්ථික මධ්‍යස්ථානයේ වෙළඳසැල් සඳහා ප්ලාස්ටික් සෙවිලි ආවරණ ලබා දෙන ලෙසත් අවශ්‍ය ප්‍රතිපාදන නොමැති නම් ආර්ථික මධ්‍යස්ථානයේ කළමණාකරන භාරයේ අරමුදල් වලින් ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ආර්ථික මධ්‍යස්ථානයේ කළමණාකරන භාරයේ අරමුදල් වලින් ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීමට අවශ්‍ය අනුමැතිය ලබාදෙන ලෙසට ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

### 1.16.6 අත්තනගල්ල ප්‍රදේශයේ හරක් හොරකම මැඩපැවැත්වීම සඳහා කටයුතු කිරීම

මේ සම්බන්ධයෙන් ගම්පහ ප්‍රදේශයේ නියෝජ්‍ය පොලිස්පතිවරයාට ලිඛිත දැනුම් දීමක් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

## 1.17 ගරු චාල්ස් නිර්මලනාදන් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.17.1 වව්නියා දිස්ත්‍රික්කයේ සහ මන්නාරමේ මුසලි ප්‍රදේශයේ ගොවීන්ට පොහොර ලබාදීම ප්‍රමාද වීම

උතුරු හා උතුරු මැද පළාත්වලට පොහොර බෙදාදීම ලංකා පොහොර සමාගම මගින් සිදු කිරීමට තීරණය කර ඇති බව රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කොළඹ අවට ප්‍රදේශවල පොහොර බෙදාහැරීම කොළඹ කොමර්ෂල් පොහොර සමාගම මගිනුත් පිට පළාත්වල පොහොර බෙදාහැරීම ලංකා පොහොර සමාගම මගිනුත් සිදු කිරීමට අපේක්ෂා කරන බව රාජ්‍ය අමාත්‍ය ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පොහොර ගබඩා කර තැබීම සඳහා ඒ ඒ පළාත්වල ගබඩා පහසුකම් නොමැතිවීම හේතුවෙන් ප්‍රමාදවීම් සිදුවන බව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඉදිරියේදී දුම්රිය මගින් පොහොර බෙදා හැරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන බවත් වගා කටයුතු බහුලව සිදුකරන ප්‍රදේශවලට ප්‍රමුඛතාවය ලබාදීමට කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.17.2 වන සතුන්ගෙන් ගොවිතැන් කටයුතුවලට සිදුවන හානි

වනජීවී හා වනසංරක්ෂණ අමාත්‍යාංශය හා එක්ව කමිටුවක් පත්කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.17.3 වව්නියා දිස්ත්‍රික්කයේ ඕමන්ත සහ තාන්ඩිකුලම් ප්‍රදේශවලට පොහොර ගබඩා ලබාදීමට කටයුතු කිරීම

ලබන වසරේ අළුතින් පොහොර ගබඩා ලබාදීමට අපේක්ෂිත ලැයිස්තුවට මෙම ස්ථාන ඇතුළත් කරගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්ට උපෙදෙස් ලබාදෙන ලදී.

## 1.18 ගරු මධුර විතානගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.18.1 කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවල නාගරික ප්‍රදේශවල කුඹුරු, පුරන් කුඹුරු ඉඩම් හඳුනාගැනීම

කොළඹ  ගම්පහ වැනි දිස්ත්‍රික්කවල නගරාශ්‍රිත ප්‍රදේශවල කුඹුරු ඉඩම් හා පුරන් කුඹුරු ඉඩම් සම්බන්ධයෙන් සංගණනයක් සිදුකර අවශ්‍ය තොරතුරු පළාත් පාලන ආයතනවලට ලබාදීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

දෙනිය, ඕවිට, පිල්ලැව සහ කමත ලෙස හඳුනාගත් කුඹුරු නොවන ඉඩම් සම්බන්ධයෙන් ඉල්ලීමක් ඉදිරිපත් වූ අවස්ථාවලදී පරීක්ෂණයක් සිදුකර චක්‍රලේඛයට අනුව ගොඩකිරීමට අවසර ලබා දෙන බව කොමසාරිස් ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

### 1.18.2 කෝට්ටේ ගොවිජන සේවා මධ්‍යස්ථානයට පහසුකම් ලබාදීම

දැනට සේවය කරමින් සිටින අතිරික්ත සේවක පිරිස අවශ්‍ය ස්ථානවලට මුදා හැරීම සඳහා මේ වන විටද උපදෙස් ලබාදී ඇති බව අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එම ගොවිජන සේවා මධ්‍යස්ථාන ප්‍රතිසංස්කරණය කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසත්, අතිරික්ත සේවක පිරිසට ස්ථාන මාරුවීම් ලබාදෙන ලෙසත්, ගොවිජන සේවා මධ්‍යස්ථානයට අවශ්‍ය පහසුකම් ලබාදෙන ලෙසත් ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබාදෙන ලදී.

## 1.19 ගරු ඩී.බී. හේරත් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.19.1 කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් බඳවා ගැනීමේ වයස් සීමාව ඉහළ දැමීම

2015 වර්ෂයේ බඳවා ගැනීමේ පටිපාටියට අනුව කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් බඳවා ගැනීමට ගැසට් නිවේදනයක් නිකුත් කර ඇති බැවින් මෙම ගැටළුවට මුහුණ දීමට සිදුවී ඇති බවත්, සංශෝධිත බඳවාගැනීමේ පටිපාටිය අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති බවත් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඒ අනුව බඳවා ගැනීමේ වයස් සීමාව අවුරුදු 45 ක් දක්වා දීර්ඝ කරන ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ලිඛිත ඉල්ලීමක් කර ඇති බවත් බඳවාගැනීමේ ගැසට් නිවේදනය කල් දැමීමටත් තීරණය කර ඇති බවත් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.19.2 කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් සංවර්ධන නිලධාරී තනතුරට උසස් කිරීමේදී පැන නඟින ගැටළුවලට පිළියම්

අභියාචනාධිකරණයේ ගොනු කල නඩුවක් ප්‍රතික්ෂේප වීමෙන් අනතුරුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් 47 දෙනෙක්ට සහනයක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කරන ලද බව ගොවිජන සේවා කොමසාරිස් ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

පුරප්පාඩු පවතින බැවින් එම නිලධාරීන් 47 දෙනාටම උසස්වීම් ලබාදීමට එකඟ බව දන්වා යැවුවද නැවත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තරඟ විභාගයක් පැවැත්වීමට කටයුතු කරන ලෙස දන්වා ඇති බැවින් ගැසට් නිවේදනයක් නිකුත් කර ඇති බව තවදුරටත් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.** කාරක සභාව ප.ව. 3.45 ට, 2021 පෙබරවාරි මස 11 වන දින ප.ව. 2.00 දක්වා කල් තබන ලදී.

**ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමුවැනි රැස්වීම - 2020 නොවැම්බර් 25**

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ගරු ඩග්ලස් දේවානන්දා මහතා (සභාපති)
ගරු කංචන විජේසේකර මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු අංගජන් රාමනාදන් මහතා
ගරු චන්දිම වීරක්කොඩි මහතා
ගරු නිරෝෂන් පෙරේරා මහතා
ගරු එච්.එම්.එම්. හරිස් මහතා
ගරු ශාන්ත බණ්ඩාර මහතා
ගරු කේ. කාදර් මස්තාන් මහතා
ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

## 1. අමාත්‍යාංශයීය කටයුතු පිළිබඳ සාකච්ඡාව

### 1.1. ගරු චාල්ස් නිර්මලනාදන් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

#### 1.1.1. ඉන්දියානු ධීවර බෝට්ටු උතුරු මුහුදු සීමාවට ඇතුළුවීම

ඉන්දියානු ධීවර බෝට්ටු නිසා මෙරට ධීවර ජනතාවට ඇති වන බලපෑම් සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් විසඳුමක් ලබා දෙන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

#### 1.1.2. උතුරු මුහුදේ රාත්‍රී කාලයේ සිලින්ඩර් යොදා මාළු ඇල්ලීම

මන්නාරම සහ මුලතිව් හැර උතුරු පළාතේ අනිකුත් ප්‍රදේශවල රාත්‍රී කාලයේදී යම් පිරිසක් විසින් සිලින්ඩර් යොදා මුහුදු කුඩැල්ලන් සහ හක්බෙල්ලන් ඇල්ලීම හේතුවෙන් දහවල් කාලයේ එම ප්‍රදේශවල ධීවර කටයුතුවල යෙදෙන කුඩා පරිමාණයේ ධීවර ජනතාවගේ ජීවනෝපායට බලපෑම් ඇතිවී තිබෙන බැවින් එම තත්ත්වය නිවැරදි කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

උතුරු පළාතේ රාත්‍රී කාලයේදී මෙන්ම දහවල් කාලයේදී ද සිලින්ඩර් යොදා මාළු ඇල්ලීම තහනම් කර ඇති බව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

උතුරු පළාතේ නාවික අණදෙන නිලධාරිවරයාගේ මැදිහත්වීමෙන් එම තත්ත්වය වැළැක්වීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.2. ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.2.1. හම්බන්තොට වරාය හා කිරින්ද ධීවර වරාය සංවර්ධනය කිරීම

හම්බන්තොට කිරින්ද ධීවර වරාය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

එසේම, හම්බන්තොට ධීවර වරායේ දියකඩනය අළුත්වැඩියා කිරීමට කටයුතු කරන ලෙසද ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

සියළුම වරායන්වල වැලි ඉවත් කිරීමේ කටයුතු කඩිනමින් ඇරඹීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කිරින්ද ධීවර වරායේ වැලි ඉවත් කිරීමේ කටයුතු තාවකාලිකව නතර කර ඇති බවත් එය වෙනත් ස්ථානයක අළුතින් ඉදිකරන ලෙස ගරු නාමල් රාජපක්ෂ මහතාගෙන් ඉල්ලීමක් ලැබී ඇති බැවින් ඒ සඳහා අවශ්‍ය අධ්‍යයන කටයුතු සිදුකරන බවත් ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.2.2. ක්‍රැබ් සිටි (Crab City) ව්‍යාපෘතියේ ප්‍රගතිය

මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

ක්‍රැබ් සිටි (Crab City) ව්‍යාපෘතිය කකුළුවන් සඳහා සුදුසු නොවන බව දක්වා ඇති බැවින් ඉස්සන් වගාව සම්බන්ධයෙන් එය ක්‍රියාත්මක කරන බව ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.2.3. කුඩාවැල්ල ධීවර වරායට වහලක් (Shelter) ලබා ගැනිම

මේ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඉදිරි වර්ෂයේ මෙම කටයුතු සිදුවන බවත් මෙම ධීවර වරාය හරිත වරායක් ලෙස වැඩිදියුණු කිරීමට බලාපොරොත්තු වන බවත් ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.3 ගරු අංගජන් රාමනාදන් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.3.1 පේදුරු තුඩුව සහ ගුරුනගර් වරායන් සංවර්ධනය කිරීම

මේ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම ඉල්ලීම ඉටු කිරීමට බලාපොරොත්තු වන බව ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.3.2 මුහුදු පැළැටි සහ ජල ජීවී වගා නැවත ආරම්භ කිරීම

අතරමග නතර වී ඇති ජලජීවී සහ මුහුදු පැළැටි වගාවන් නැවත ඇරඹීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

2021 වර්ෂයේ අයවැයෙන් වෙන් වී ඇති මුදල් මගින් මෙම කටයුතු ඇරඹීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා සහ ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.3.3 ඉන්දීය ධීවරයන් මෙරට මුහුදු සීමාවේ ධීවර කටයුතුවල යෙදීම

මෙම ක්‍රියාකාරකම් වැළැක්වීම සඳහා කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙහිදී ගැටළුවලට මුහුණපාන මෙරට ධීවරයින්ට බහුදින ධීවර යාත්‍රා, සහනාධාර සහ අවශ්‍ය පුහුණුවද ලබාදීමට බලාපොරොත්තු වන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.3.4 ධීවරයන්ට අවශ්‍ය වන තාක්ෂණික උපකරණ සහ පුහුණුව

ශ්‍රී ලාංකික ධීවරයන්ට අත්‍යාවශ්‍ය තාක්ෂණික උපකරණ සහ ඒ පිළිබඳ පුහුණුවක් ලබා දිය යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.4 ගරු ශාන්ත බණ්ඩාර මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.4.1. මිරිදිය ධීවර ආම්පන්න ලබාගැනීම - ගරු ශාන්ත බණ්ඩාර මහතා

කුරුණෑගල දිස්ත්‍රික්කයේ මිරිදිය ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවරයන්ට අවශ්‍ය ධීවර ආම්පන්න ලබාදීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

පෞද්ගලික අංශය හා ඒකාබද්ධ වී සහනදායී පොලී අනුපාත යටතේ රාජ්‍ය බැංකු හරහා ණය ලබා දීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බව ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මත්ස්‍ය තොග තැන්පත් කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් වී ඇති බැවින් වැව්වල තැන්පත් කිරීමට බලාපොරොත්තු වන මත්ස්‍ය තොග පිළිබඳව දැනුම්දීමට කටයුතු කරන ලෙසද ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.4.2. නීතිවිරෝධී අයුරින් ධීවර කටයුතුවල යෙදීම මැඩ පැවැත්වීම

මේ සඳහා ක්‍රමවේදයක් සැකසීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම කටයුතු විධිමත් කිරීම සඳහා වැටලීම් ඒකකයක් ඇති කිරීමට බලාපොරොත්තු වන බව ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.5 ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.5.1 කිලිනොච්චි දිස්ත්‍රික්කයේ කිරාන්චි ප්‍රදේශයේ මුහුදේ ගිලී ඇති රෝලර් ඉවත්කිරීම

මෙම රෝලර් හේතුවෙන් කිරාන්චි ශ්‍රී මුරුගන් සමූපකාර ධීවර සමිතියේ ධීවරයන් අපහසුතාවයන්ට මුහුණපාන බැවින් ඒවා ඉවත් කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

මේ සම්බන්ධයෙන් ලැබී ඇති අධිකරණ තීන්දුව පිළිබඳව අදාළ අංශ සමග සාකච්ඡා කර තීරණයකට එළඹෙන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.5.2 ඉරනතීවු, ඉරනමාතා ග්‍රාමයේ ධීවර තොටුපලට ප්‍රවේශ මාර්ගයක් ලබා ගැනීම

අයවැය විශේෂ ප්‍රතිපාදන තුළින් මෙය ඉටු කරදෙන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.5.3 පල්ලිකුඩා සහ පල්ලිකුඩා කලෙයිමගල් ධීවර තොටුපලේ වැලි ඉවත් කර ගැනීම

වලෙයිපාඩු ජනතාවට ධීවර කටයුතු සඳහා වූ මුහුදට පිවිසුම් මාර්ගයක් සකසා දෙන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙවර අයවැයෙන් ඉහත පිවිසුම් මාර්ග සඳහා ප්‍රතිපාදන ලබාගෙන සහන සලසන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.5.4 කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ධීවර ජනතාව මුහුන පාන ගැටළු

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ධීවර ජනතාව පූනකරි ප්‍රදේශයේ ජීවත්වන බවත් පෙල්ලිකුඩා, වලෙයිපාඩු, නාච්චිකුඩා, ඉරනතීවු යන ප්‍රදේශද ඊට ඇතුළත්වන බැවින් ඔවුන්ට ප්‍රතිපාදන ලබාදී සහන සලසන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී. චුන්ඩිකුලම්, කල්ලාරු, කන්ඩාවලෙයි, පුලියම්පොක්කනෙයි, ධර්මපුරම් ප්‍රදේශයේ ධීවර ජනතාවට වෙන්වූ මුහුදු සීමාවක් නොමැති බැවින් යාපනයේ සිට මුලතිව් දක්වා ඇති මුහුදු සීමාවෙන් කි.මී 10 ක් ලබා දීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

කිලිනොච්චි දිස්ත්‍රික් සම්බන්ධීකරණ රැස්වීමේදී සාකච්ඡා කර මෙම කටයුත්ත සම්බන්ධයෙන් තීරණයක් ලබාදෙන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.5.5 ඉරනමඩු ධීවර ජනතාව මුහුන පාන ගැටළු

ඉරනමඩු මුහුදු ප්‍රදේශයේ ඇති ගල්බොක්ක අතරින් වැසි සමයේදී මත්ස්‍ය පැටව් ඉවත්වන බැවින් ඒ සඳහා දැලක් සවිකිරීමට අවශ්‍ය බවට එම ධීවර ජනතාව ගරු අග්‍රාමාත්‍යතුමා දැනුවත් කර ඇති බැවින් ඒ පිළිබඳව ගරු මන්ත්‍රීතුමා සහ ගරු අංගජන් රාමනාදන් මහතා විසින් විමසීමක් කරන ලදී.

### 1.5.6 නෙඩුන්තිව් ධීවර ජනතාවට ධීවර තොටුපලක් ලබාදීම

මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 1.6 ගරු චන්දිම වීරක්කොඩි මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.6.1. කිමිදී විදිමින් මසුන් මැරීමේ තහනම් නීතිය ලිහිල් කිරීම

සංචාරකයන්ගේ ඉහළ ඉල්ලුමක් ඇති ඉහත ක්‍රීඩාව සඳහා ඇති නීති ලිහිල් කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ධීවර හා ජලජ සම්පත් පනත සංශෝධන කිරීම සඳහා කටයුතු කරන බැවින් අවශ්‍ය සංශෝධන සිදුකර ඒ සඳහා අනුමැතිය ලබා දීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.6.2. කිමිදී මසුන් මරන්නන් සඳහා පනවා ඇති තහනම ඉවත් කිරීම

කිමිදී මසුන් ඇල්ලීම මේ වන විට තහනම් කර ඇති බැවින් ඒ සඳහා යම් කාල සීමාවකට යටත්ව හෝ අවසර ලබාදෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 1.7 ගරු එච්.එම්. එම්. හරිස් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.7.1. අම්පාර දිස්ත්‍රික්කයේ ඔළුවිල් වරාය සංවර්ධනය කිරීම

අම්පාර දිස්ත්‍රික්කයේ ඔළුවිල් වරාය ආශ්‍රිතව ඉදිකරන ලද දිය කඩනයේ දෝෂ සහිත බව නිසා ගැටළු පැන නැගී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඩෙන්මාර්ක් රජයෙන් ලැබීමට නියමිත වන්දි මුදල උපයෝගී කරගෙන මෙම වරාය ධීවර වරායක් ලෙස සංවර්ධනය කරන දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ සඳහා සකස් කර ඇති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුමත වීමෙන් පසු මෙම වරාය අංගසම්පූර්ණ ධීවර වරායක් ලෙස සංවර්ධනය කිරීමට කටයුතු කරන බව ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.7.2. ඔළුවිල් වරාය තුළ ස්ථාපිත අයිස් නිෂ්පාදනාගාරය සංවර්ධනය කිරීම

ඔළුවිල් වරාය තුළ ඇති මහ පරිමාණයේ තාවකාලික අයිස් නිෂ්පාදනාගාරය සංවර්ධනය කර ධීවරයින්ට සාධාරණ මිලට අයිස් ලබාදෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

ශීතාගාර පහසුකම් ලබාදීමට වරාය අධිකාරිය එකඟ වී ඇති බැවින් එම කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වන බව ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.7.3. කල්මුනෙයි ප්‍රදේශයේ ධීවර වාඩි තැනීම

කල්මුනෙයි ප්‍රදේශයේ මීටර් 65 ක් දුරට ධීවර වාඩි තැනීටම සැළසුම් කර තිබුණ නමුත් දැන් එහි පෞද්ගලික ගොඩනැගිලි ඉදිකර ඇති බවත් එහි ස්ථාන දෙකක් තෝරාගෙන පොකුරු ක්‍රමයට වාඩි දෙකක් තැනීමට කටයුතු කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

### 1.7.4. ධීවර මා දැල් ප්‍රමිතියෙන් තොරවීම

ධීවරයින් විසින් මිලදී ගනු ලබන මා දැල්වල ප්‍රමිතියක් නොමැති බැවින් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම මාදැල් මිලදීගනු ලැබූ ආයතනය පිළිබඳ දැන ගැනීමෙන් පසු ඒ සම්බන්ධයෙන් විසඳුම් ලබාදිය හැකි බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 1.8 ගරු කේ. කාදර් මස්තාන් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.8.1. ස්කූබා (Scuba) ක්‍රමයට මසුන් ඇල්ලීමේ තහනම ඉවත් කිරීම

ස්කූබා (Scuba) ක්‍රමයට මසුන් ඇල්ලීම තහනම් කිරීම හේතුවෙන් මන්නාරමේ ධීවර ජනතාවගේ ජීවනෝපායට බොහෝ බලපෑම් ඇතිවී තිබෙන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එසේ මසුන් ඇල්ලීම මාස දෙකක කෙටි කාලයකට පමණක් සීමාවන බැවින් ඒ සඳහා අනුමැතිය ලබාදෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ඉහත කරුණ සම්බන්ධයෙන් සාකච්ඡා කර තීරණයක් ලබාදෙන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.8.2. ධීවර විශ්‍රාම වැටුප් ක්‍රමය සඳහා සාමාජිකත්වය ලබාදීම

ධීවර විශ්‍රාම වැටුප් ක්‍රමයේදී වැඩිහිටි ධීවරයින්ට සාමාජිකත්වය ලබාදී නොමැති බැවින් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ධීවර විශ්‍රාම වැටුප් හැකි ඉක්මණින් ගෙවීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.8.3. මන්නාරම සහ මුලතිව් මුහුදු සීමාවේ වෙරළ ඛාදනය වැලැක්වීම

මෙම තත්ත්වය වැළැක්වීම සඳහා කිසියම් ක්‍රමවේදයක් අවශ්‍ය බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එසේම මන්නාරම සහ මුලතිව් ප්‍රදේශයේ ධීවර තොටුපලවල් නොමැති බවත් එරුක්කලම්පිට්ටි තොටුපල වැසී ඇති අතර පේසාලෙයි සම්බන්ධයෙන්ද ප්‍රශ්ණ ඇති

බැවින් ධීවර තොටුපල ඉදිකිරීම සඳහා ස්ථාන නම් කිරීම සුදුසු බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ඒ සම්බන්ධයෙන් අවශ්‍ය විස්තර ලබාදීමට කටයුතු කරන ලෙසත් ප්‍රමුඛතා අනුව අවශ්‍යතා ඉටුකරදීමට හැකි බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**2.** කාරක සභාව ප. ව. 3.00 ට 2021 ජනවාරි මස 21 වන දින දක්වා කල් තබන ලදී.

---

**වැවිලි කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමු වැනි රැස්වීම - 2020 නොවැම්බර් 26**

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා (සභාපති)
ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු ජානක වක්කුඹුර මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු කනක හේරත් (රාජ්‍ය අමාත්‍ය)
ගරු පලනි දිගම්බරම් මහතා
ගරු උදයන කිරිඳිගොඩ මහතා

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු කේ. කාදර් මස්තාන් මහතා
ගරු වේලු කුමාර් මහතා
ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු වරුණ ලියනගේ මහතා
ගරු එම්. උදයකුමාර් මහතා
ගරු කුලසිංහම් තිලීපන් මහතා
ගරු සුදත් මංජුල මහතා
ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා
ගරු ගුණතිලක රාජපක්ෂ මහතා
ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා
ගරු මධුර විතානගේ මහතා
ගරු මර්ජාන් ෆලීල් මහතා

**නිවාඩු පිළිබඳ යෝජනා**

ගරු එම්. රාමේෂ්වරන් මහතා
ගරු වීරසුමන වීරසිංහ මහතා

**1.** **වෙනත් කටයුතු**

## 1.1. දැනට භාවිතයට නොගන්නා ඉඩම්වල දැවමය ශාක රෝපණ අවශ්‍යතාවය සහ වෙනත් කරුණු - ගරු උදයන කිරිදිගොඩ මහතා

### 1.1.1. දැනට භාවිතයට නොගන්නා ඉඩම්වල දැවමය ශාක රෝපණ අවශ්‍යතාවය

රාජ්‍ය වැවිලි සංස්ථාවේ සේවකයින් යොදා ගනිමින් දැනට භාවිතයට නොගන්නා ඉඩම්වල දැවමය වටිනාකමක් සහිත පැළ රෝපණය සඳහා අවධානය යොමු කරන ලෙස ඉල්ලීමක් කරන ලදී.

දැව හෙළීම සඳහා දැනටමත් අවසර ලබා දී ඇති බවත්, ඒ සමඟම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ උපදෙස් ද ඇතිව නැවත වන වගාව ද සිදු කරන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.1.2. තේ පාලන පනත සඳහා කාලෝචිත සංශෝධනයන් සිදු කිරීම

තේ වෙන්දේසි සඳහා තේ මණ්ඩලය හරහාම ඉදිරිපත් වීමේ අවශ්‍යතාවය වෙනස් කර වතුහිමියන් හට සෘජුව ඒ සඳහා ඉදිරිපත් වීමට හැකියාව ලබා දීමට හැකි වන පරිදි තේ පාලන පනත සංශෝධනය පිළිබඳ ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

තේ නැවත වගාව ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරන බවත් නව තේ අපනයනකරුවන් හට අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙස තේ මණ්ඩලයට උපදෙස් ලබා දී ඇති බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.1.3. චීන සහ වෙනත් විදේශික වෙළෙඳුන් අපනයන භෝග වෙළඳපළ සැළකිය යුතු කොටසක් ලබා ගැනීමට උත්සාහ දැරීම සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස වන යෝජනාව

මෙම කරුණ ගැන අවධානය යොමු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.1.4. ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ පසුගිය වකවානුවක දී ඇති වූ සේවක අර්ථසාධක හා භාරකාර අරමුදල් ගැටලු සම්බන්ධව වර්තමාන අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින් සඳහා නීතිමය සහන ලබා දීම සම්බන්ධව

මේ සඳහා විකල්ප යෝජනාවක් මඟින් මෙම ගැටලු නිරාකරණය කිරීමට සූදානම් වන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.1.5. කසළ තේ නිෂ්පාදනය අධෛර්යමත් කිරීම

කසළ තේ නිෂ්පාදනය දැඩි ලෙස නියාමනය කිරීමට කටයුතු ආරම්භ කර ඇති බවත් නිෂ්පාදනය අධෛර්යමත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

කසළ තේ යන නාමයට ප්‍රති සැකසුම් තේ යන සංකල්පය හඳුන්වා දී පනත් පවා වෙනස් කිරීමට කටයුතු කරන බවත් තවදුරටත් දැනුම් දෙන ලදී. කර්මාන්තශාලාවේ සිට ප්‍රවාහනය සඳහා ලබා දී ඇති කාලය දින 07 සිට 02 දක්වා අඩු කළ බවද දැනුම් දෙන ලදී.

## 1.2. තල් සංවර්ධන මණ්ඩලයෙහි උතුරු පළාත සඳහා 2021 වර්ෂයේ ඇති වැඩසටහන් පිළිබඳව - ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

### 1.2.1. අපතේ යන තල් රා ඵලදායී ලෙස යොදා ගැනීමේ අවශ්‍යතාව

යාපනයේ ඇති තල් පර්යේෂණ ආයතනය සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන බව රාජ්‍ය අමාත්‍ය ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා විසින් දැනුම් දෙන ලදී.

කිලිනොච්චි මුලතිව් සහ යාපනය දිස්ත්‍රික්කයන්හි තල් රා මදින්නන් පුහුණු කර කර්මාන්ත සංවර්ධනය කිරීමටත් ප්‍රාදේශීය ලේකම් දිස්ත්‍රික් ලේකම් හරහා දැනට පවතින තල් ගස්වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමටත් කටයුතු කරන බව දැනුම් දෙන ලදී.

දෙවන පොල් ත්‍රිකෝණය ලෙස යාපනය, වන්නිය, කිලිනොච්චි හා මුලතිව් ආශ්‍රිතව ඇති කිරීමටත් බලාපොරොත්තු වන බවද වන්නි දිස්ත්‍රික්කය (මන්නාරම) සඳහා ද නව ස්කාගාරයක් ඇති කිරීමට අපේක්ෂා කරන බවද රාජ්‍ය අමාත්‍ය ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා විසින් දැනුම් දෙන ලදී.

පොල් වගා කිරීමට උනන්දුවක් දක්වන්නන් සඳහා පස පිළිබඳ පර්යේෂණ සිදු කිරීම තල් පර්යේෂණායතනය මඟින් සිදු කිරීමට බලාපොරොත්තු වන බව ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා විසින් දැනුම් දෙන ලදී.

මේ වන විට වැසී ඇති තල් අරක්කු තැබැරුම් නැවත ශක්තිමත් ලෙස ස්ථාපිත කිරීමට අපේක්ෂා කරන බව රාජ්‍ය අමාත්‍ය ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා විසින් දැනුම් දෙන ලදී.

### 1.2.2. මන්නාරම දිස්ත්‍රික්කය සඳහා හොඳ වර්ගයේ පොල් පැළ ලබා ගැනීම

මන්නාරම පොල්පැළ තවාන මඟින් ගුණාත්මකභාවයෙන් ඉහළ වර්ගයේ පැළ මිලදී ගත හැකි බවත් ව්‍යාපෘති සඳහා නොමිලයේ වුවද පැළ සැපයිය හැකි බවත් පොල් වගාකිරීමේ මණ්ඩලයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

## 1.3. ගරු පලනි දිගම්බරම් මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා

### 1.3.1. වතු කම්කරු වැටුප් වැඩිකිරීම සිදුකළ යුතු බවට වන යෝජනා

මේ සම්බන්ධව පවතින යෝජනා ලබා දෙන ලෙසත් වෘත්තීය සමිති කැඳවා සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.3.2. වතුවල පවතින බඹරු ප්‍රශ්නය නිරාකරණය කිරීම

මේ සම්බන්ධව කටයුතු කිරීම පිළිබඳව වතු සමාගම්වල කාර්යයභාරය විමසීමට වතු සමාගම් සමඟ සාකච්ඡා කිරීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 1.4. ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා

### 1.4.1. පොල් ඉඩම් කට්ටි කිරීම හා රබර් ඉඩම්වල රබර් ගස් හෙළීම සම්බන්ධව නීතිය

අක්කර 5ට වැඩි ඉඩම් කට්ටි කිරීමේ දී අනුමැතිය ලබා ගත යුතු ලෙස අදාළ පනත් සංශෝධනය කිරීමට බලාපොරොත්තු වන බවත් සැම පොල් ගසක් හෙළීම ගස් හෙළීමේ පනත යටතට ගෙන ඒමෙන් මෙය වළක්වා ගත හැකි බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.4.2. සුළු අපනයන බෝග වගාව සම්බන්ධව

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි එම දෙපාර්තමේන්තුව විසින් නිර්දේශිත පැල ඇති ස්ථාන සම්බන්ධව දැනුම් දුනහොත් ප්‍රතිපාදන සැපයීම පිළිබඳ සළකා බැලිය හැකි බව රාජ්‍ය අමාත්‍ය ගරු ජානක වක්කුඹුර මහතා විසින් දැනුම් දෙන ලදී.

### 1.4.3. කුරුණෑගල වතු සමාගම හා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු අත්තනගල්ල ප්‍රදේශයේ පවතින ඉඩම්

ගම් වැසියන් විසින් සොහොන්පිටි හා පිට්ටනි සාදා ගැනීම සඳහා ඉල්ලීම් කරන බව ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා විසින් දැනුම් දෙන ලදී.

### 1.4.4. වැලිකඩමුල්ල ග්‍රාමයේ ඇති රබර් පැළ තවානෙහි සේවය කරන සේවකයින්ගේ සේවා ගැටලු

මෙම සේවකයින්ගේ ගැටලුව ගැන අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.4.5. කන්දේගම වැලිකඩමුල්ල මායිමේ පිහිටි මහා පරිමාණ කුණු එකතු කිරීමේ ස්ථානයක් සඳහා වන ජනතා විරෝධය

මෙය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා විෂය පථයට අයත් බැවින් ඒ පිළිබඳ ඉඩම් අමාත්‍යතුමා සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපති දැනුවත් කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.4.6. අත්තනගල්ල ප්‍රදේශයේ රඹුටන් හා දූරියන් කර්මාන්තය දියුණු කිරීම සඳහා ක්‍රමවේදයක් සැකසීම සඳහා වන ඉල්ලීම

ඍජුවම විෂය පථයට අයත් නොවුණද අගය එකතු කිරීමේ ක්‍රමවේදය හරහා අපනයන කෘෂි කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ඇති ව්‍යවසායන් හරහා රඹුටන් හා දූරියන් කර්මාන්තය සඳහා සහාය දැක්විය හැකි බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.4.7. පුවක් වැට සංකල්පය ලෙස පුවක් වගාව වර්ධනය කිරීම සඳහා පුවක් පැළ ලබා ගැනීම සම්බන්ධව

ගරු මන්ත්‍රීතුමාගේ යෝජනා ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 1.5. ගරු වේලු කුමාර් මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා

### 1.5.1. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා සේවකයින් හට ගෙවිය යුතු පාරිතෝෂික මුදල් හා අර්ථ සාධක / සේවක භාරකාර අරමුදල්

මේ සම්බන්ධව ඉදිරි පියවර ගැනීමට බලාපොරොත්තු වන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.5.2. රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත නැවත පවරාගත් මැද මහනුවර වෛතලාව වත්ත කාර්යක්ෂම කරන ලෙස වන යෝජනාව

මේ පිළිබඳව සොයා බලා කටයුතු කරන බවටත් වගා නොකර ඇති කොටස සඳහා outgrow model යොදා ගැනීම පිළිබඳ සාකච්ඡා කරන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.5.3. වතු යායන්හි පවතින සංචාරක ආකර්ෂණය ඇති ස්ථානයන්හි විවිධ සංචාරක ව්‍යාපෘති ක්‍රියාත්මක වුවත් එම ව්‍යාපෘති නිසි ක්‍රමවේදයක් යටතට ගෙනා ආ යුතු බවට වන යෝජනාව

මෙවැනි ස්ථානයන්හි පරිපාලනය, මුදල් පරිපාලනය හා ආරක්ෂාව විධිමත් කිරීමට කටයුතු කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.5.4. රාජ්‍ය වැවිලි සංස්ථාව යටතේ ඇති වැවතැන්න කොට්ඨාශ 5 (ගුඩ්සෙඩ් වත්ත) අකර්මණ්‍ය වී පැවතීම

මෙම වතුයායවල්වල සිටින වගා කිරීමට හැකියාව ඇති තරුණ තරුණියන් ව්‍යවසායකයින් ලෙස සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය බිම් ලබා දී සමුපකාර ක්‍රමයකට පරිවර්තනය කිරීම සුදුසු ලෙසත් එයින් කුලී ක්‍රමයෙන් මුදවා ගත හැකි බවත් ගරු වේලු කුමාර් මහතා විසින් යෝජනා කරන ලදී.

වැටුප් පිළිබඳව ගැටලුව මේ වන විට වතු කළමණාකාරීත්වයට ද විසඳා ගත නොහැකි මට්ටමක පවතින නිසා වතු කම්කරුවන් ව්‍යවසායකයින් බවට පත් කිරීමේ දීර්ඝකාලීන වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.5.5. රංගල පවතින රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් අත් හරින ලද වතු යායන්හි මහාපරිමාණ ලෙස කබානා ඇති කිරීම

මේ පිළිබඳ අවධානය යොමු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.5.6. පුද්ගලික අංශයේ වතු කම්කරුවන්ගේ සුභසාධනය පිළිබඳ එම ආයතන ක්‍රියා නොකිරීම සම්බන්ධව අමාත්‍යාංශ මට්ටමින් ගත හැකි ක්‍රියාමාර්ග

මේ පිළිබඳ ඉදිරියේ දී විශේෂ අවධානයක් යොමු කර කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 1.6. ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා

### 1.6.1. ගුඩ්සයිඩ් වත්ත, මැදදුම්බර ප්‍රදේශයේ අපනයන ගම්මානයක් සෑදීම

යෝජනා කරන ලද ව්‍යාපෘතිය පිළිබඳ නිළධාරීන් විසින් සිදු කරන ක්ෂේත්‍ර චාරිකාවකින් පසු අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.6.2. කිරිමැටියවත්ත අක්කර 2000 භූමි ප්‍රමාණය වඩා ඵලදායී ලෙස යොදා ගන්නා ලෙස කරන ලද යෝජනාව

කිරිමැටියවත්ත භූමිය සම්බන්ධ අධිකරණයේ නඩු කටයුත්තක් පවතින බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.6.3. හන්තාන වත්ත ඇතැම් ඉඩම් අයුතු ලෙස භාවිතා වීම සම්බන්ධව පරීක්ෂණයක් පවත්වන ලෙස කරන ලද ඉල්ලීම

හන්තානවත්ත කෘෂිකර්ම අමාත්‍යාංශය යටතට වැටෙන බැවින් ඒ පිළිබඳ ගරු කෘෂිකර්ම අමාත්‍යතුමාට දැනුම් දී අනවසර ඉදි කිරීම් හා ඉඩම් අත්පත් කර ගැනීම් සම්බන්ධව නීතිය ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලීමක් කරන බවට ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.6.4. අපනයන ආදායම් ජනිත කරන කිතුල් වගාව දිරිමත් කරන අටියෙන් කිතුල් ගස් කැපීම නතර කිරීම, නව නිෂ්පාදන හඳුන්වා දිම, නව කිතුල් ප්‍රභේද හඳුන්වා දීම ආදී කිතුල් කර්මාන්තය මහනුවර දිස්ත්‍රික්කය තුළ වර්ධනය කළ යුතු බවට යෝජනාව

කිතුල් මදින්නන්ගේ හිඟකම බව කිතුල් වගාවේ වර්ධනයට විශාල බාධාවක් බව ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

පැණි හකුරු කර්මාන්තය දියුණු කිරීමටත් එකතු කිරීමේ මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය උපකරණ හා තාක්ෂණික දැනුම බෙදා දීමටත් කටයුතු කරන බවද දැනුම් දෙන ලදී.

අපනයනාභිමුඛ ලෙස හා දේශීය වෙළඳපළාභිමුඛව කිතුල් කර්මාන්තය සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීමට හා ශ්‍රී ලංකා ප්‍රමිති සහතික ලබා දීමටත් ඉදිරියේ දී කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

එසේම කිතුල් කර්මාන්තයේ යෙදෙන්නන් සම්බන්ධ කර ගනිමින් කුඩා සමිති නිර්මාණය කරන ලෙස ගරු වසන්ත යාපාබණ්ඩාර මහතාට දැනුම් දෙන ලදී.

### 1.6.5. සෑම නිවසකම ගෙවත්ත ආර්ථික වටිනාකමක් සහිතව සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා ගැනීම

ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ තෝරා ගත් ප්‍රදේශ සඳහා පැළ කොටස් වශයෙන් ලබා දීම සඳහා අවශ්‍ය සහය ලබා දීමට හැකි බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

#### 1.6.6. සුලු අපනයන බෝග වගාකරුවන් සඳහා වියළුම් යන්ත්‍ර ලබා දීම

මේ සඳහා ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

අමාත්‍යාංශයේ දැනට පවතින ව්‍යාපෘතියක් යටතේ තෝරා ගත් පිරිසකට මේ සඳහා ප්‍රතිපාදන ලබා දීමේ හැකියාවක් පවතින බවද, වෙළීම් කටයුතු සඳහා ගමකට එක් මධ්‍යස්ථානයක් ඇති කිරීමේ හැකියාවක් ද පවතින බවද රාජ්‍ය අමාත්‍ය ගරු ජානක වක්කුඹුර මහතා විසින් දැනුම් දුන්නේය.

#### 1.6.7. සුලු අපනයන බෝග සඳහා අගය එකතු කිරීමේ ක්‍රියාවලියක් ඇති කිරීමේ අවශ්‍යතාව

දැනටමත් අගය එකතු කිරීමේ ක්‍රියාවලියේ නිරතවන්නන් විසින් ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කිරීමෙන් ඒ අය සඳහා අවශ්‍ය සහාය ලබා දිය හැකි බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ගම්මිරිස් සඳහා මේ වන විට කර්මාන්ත 6ක් පමණ ඇති කරමින් මෙම ක්‍රියාවලිය ආරම්භ කර ඇති බව රාජ්‍ය අමාත්‍ය ගරු ජානක වක්කුඹුර මහතා විසින් දැනුම් දෙන ලදී.

#### 1.6.8. මහනුවර නාථ දේවාල ඉඩම් පුස්සැල්ලාව වතු සමාගමෙන් ඉවත් කර ගැනීම

මෙම ඉඩම පිළිබඳව නඩු කටයුත්තක් පවතින බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී. ඒ පිළිබඳ විස්තර සතියක කාලයක දී ගරු මන්ත්‍රීතුමාට ලබා දෙන ලෙස ලේකම්ට උපදෙස් ලබා දෙන ලදී.

### 1.7. ගරු ගුණතිලක රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

#### 1.7.1. මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව ප්‍රදේශයේ කර්මාන්තකරුවන් සමඟ සාකච්ඡාවක් සිදු කිරීම පිළිබඳ යෝජනාව

ඒ සඳහා දිනයක් ලබා දිය හැකි බව රාජ්‍ය අමාත්‍ය ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා විසින් දැනුම් දෙන ලදී.

#### 1.7.2. සාදික්කා, කරාබුනැටි ආදී වගාවන්ට සාධාරණ මිලක් ලබා දීම

කුළුබඩු සංස්ථාව ස්ථාපිත කිරීමෙන් ගොවියන් හට සාධාරණ මිලක් ලබා දීම සහතික කිරීමට බලාපොරොත්තු වන බවත් වෙළඳ අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කරන "බජට් ෂොප්" 14000 සඳහා නිෂ්පාදන ලබා දීමට බලාපොරොත්තු වන බවත් රාජ්‍ය අමාත්‍ය ගරු ජානක වක්කුඹුර මහතා විසින් දැනුම් දෙන ලදී.

සුළු අපනයන බෝග සඳහා වෙන්දේසි ක්‍රමයක් මඟින් සාධාරණ මිලක් ලබා ගැනීමට කටයුතු කරන බවද දැනුම් දෙන ලදී.

## 1.8. ගරු මධුර විතානගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.8.1. ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමෙහි පුද්ගලික අංශයේ ආයෝජනය හා ලාභාංශ පිළිබඳ හා රජයට ලැබිය යුතු මුදල් නොලැබී යාම පිළිබඳ විමසීම

ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම මේ වනතෙක් පාඩු ලබන බවත් පුද්ගලික අංශයේ ආයෝජකයා විසින් 49% ක් වන කොටස් සඳහා රුපියල් මිලියන 496ක් ආයෝජනය කළ යුතු බවත් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ලංකා ඔරික්ස් ලීසිං සමාගම (LOLC) සහ බ්‍රවුන්ස් (Browns) සමාගම් විසින් 28% ක් වන පොළී අනුපාතයට ලබා දෙන ලද ණය පහසුකම ආයෝජනය ලෙස ඔවුන් සළකන බවත් මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ අවධානය යොමු කරන බවත් ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් වැඩිදුරටත් දන්වන ලදී.

මෙම සමාගම් මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ ව්‍යෝහාරික විගණන වාර්තාවක් පසුගිය වකවානුවේ දී සිදු කර ඇති බවත් එම තොරතුරු ද අදාළ කර ගත හැකි බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

මෙම ගිවිසුම නැවත සකස් කිරීමට බලාපොරොත්තු වන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී. ගරු මන්ත්‍රීතුමාට අවශ්‍ය තොරතුරු සතියක කාලයක දී ලබා දෙන ලෙස ද ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.8.2. රජය සතු ලාභ ලැබිය හැකි ආයතන සඳහා ස්ථාවර ක්‍රමවේදයක් සෑදීම

මෙම කරුණ පිළිබඳව අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.8.3. වතු සමාගම්වල නිළධාරීන් විසින් වතු ජනතාවට පීඩා වන අයුරින් කටයුතු කිරීම පිළිබඳ වැඩපිළිවෙලක් සකස් කිරීම

වතු සමාගම් කළමනාකාරීත්වය පිළිබඳ ඇගයීමක් සිදු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

අවිස්සාවේල්ල දම්රෝ ෆෙම්රික් වතුයායේ ජනතාවගේ අවශ්‍යතාව පිළිබඳ අවධානය යොමු කරන ලෙස අමාත්‍යාංශ නිළධාරීන් හට ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 1.9. ගරු සුදත් මංජුල මහතා විසින් ඉදිරිපත් කළ යෝජනා

### 1.9.1. වතු සමාගම් (රබර්) අත්තනෝමතිකව ක්‍රියා කිරීම හා වතු ජනතාවගේ සුභසාධනය පැහැර හැරීම

රබර් මිල පහත වැටීමත් සමඟ ෆාම් ගස් සිටුවීම නිසා ජල මූලාශ්‍ර සිඳී ගොස් පරිසරය අනතුරක පවතින බවත් වතු සමාගම්හි සේවය කරන කම්කරුවන්ගේ සුභසාධනය සම්පූර්ණයෙන්ම අතහැර දමා ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ප්‍රතිපත්තියක් ලෙස නැවත කටුපොල් වගාව සිදු කිරීමට ඉඩ නොදීමේ අතිගරු ජනාධිපතිතුමාගේ ස්ථාවරය අනුව මෙය තහනම් කර ගැසට් පත්‍රයක් නිකුත් කරන ලෙස ජනාධිපති ලේකම්ගෙන් ඉල්ලා ඇති බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.9.2. දිස්ත්‍රික්කය තුළ රබර් ආශ්‍රිත නිෂ්පාදනයක් ඇති කිරීම

මේ වනවිට රබර් සඳහා හොඳ මිලක් ලැබෙන බව පැවසූ ගරු සභාපතිතුමා ඇ.ඩො.මිලියන 300 ක ආයෝජනයක් සහිත ටයර් කර්මාන්තශාලාවක් හම්බන්තොට ඇති කිරීම සඳහා පසුගියදා ගිවිසුම් අත්සන් කළ බව දැනුම් දෙන ලදී.

2021 වර්ෂයේ දී වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ දැවැන්තම ආයෝජනය සඳහා චීන හයිනැන් රබර් ආයතනය ද සූදානම් බව දැනුම් දෙන ලදී.

### 1.9.3. පුද්ගල ආර්ථිකය සෘජුවම පෝෂණය කළ හැකි අපනයන ගම්මාන (ගම්මිරිස්/කුරුඳු/දූරියන් වැනි) හඳුන්වා දී සංවර්ධනය කිරීම

සම්ප්‍රදායික ක්‍රම වලින් බැහැරව මෙම අපනයන බෝග කර්මාන්තය දියුණු කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 1.10. ගරු වරුණ ලියනගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.10.1. තේ පර්යේෂණ ආයතනය මගින් නව ක්ලෝන හඳුන්වා නොදීම හේතුවෙන් කුඩා තේ වතු හිමියන්ට ඉහළ ඵලදායිතාවයක් සහිතව තේ වගා කිරීමට අවස්ථාව හිමි නොවීම

නව ක්ලෝන විශේෂ රාශියක් මේ වනවිට හඳුන්වා දී ඇති නමුත් රෝපණ ද්‍රව්‍ය ලබා ගැනීමේ ගැටලු පවතින බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.10.2. කුඩා තේවතු හිමියන්ට අක්කරයකට ලබා දෙන මුදල රුපියල් ලක්ෂ 5ක් දක්වා වැඩි කර ගැනීම

මිල වැඩි කිරීම සඳහා කටයුතු කරන බවත් ඉක්මණින් නැවත වගාව සඳහා යොමු විය හැකි පාංශු සංරක්ෂණය සඳහා වන ගෝතමාලා ක්‍රමවේදය වැනි ක්‍රමවේද ඔස්සේ කාලය අඩු කර ගැනීමේ වැඩසටහනක් පිළිබඳ අවධානය යොමු කර ඇති බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.10.3. පුද්ගලික වතු කම්කරුවන්ගේ නිවාස අලුත්වැඩියා කිරීම

කම්කරු නිවාස අලුත්වැඩියා කර දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.10.4. වතු ආශ්‍රිතව පවතින සොහොන් භූමි නිදහස් කිරීම

නීතිපතිතුමා සමඟ සාකච්ඡා කර රජය හා සමාගම් අතර ඇති බදු ගිවිසුම් සම්බන්ධ තීරණයක් ගැනීමට බලාපොරොත්තු වන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**1.10.5. බලන්ගොඩ ප්‍රදේශයේ පුද්ගලික වතු හිමිකරුවකු විසින් වත්ත වෙන්දේසි කර අත්තනෝමතික ලෙස වතු කම්කරු නිවාස ඉවත් කිරීම**

ප්‍රාදේශීය ලේකම් හරහා ඉඩම් කොටසක් ලබා දීමට කටයුතු කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

නිවාස සංවර්ධන අධිකාරියේද සහාය ඇතිව නිවාස වැඩි වශයෙන් ලබා දීමේ ක්‍රමවේදයක් ඉදිරියේදී ඇති වන බව රාජ්‍ය අමාත්‍ය ගරු කනක හේරත් මහතා විසින් දැනුම් දෙන ලදී.

**1.10.6. මහනුවර දිස්ත්‍රික්කයේ වතු ආශ්‍රිත නායයෑම් වලට ලක් වූ නිවාස සඳහා නිවාස ලබා ගැනීම**

එම කටයුතු ඉදිරියට කරගෙන යාම සඳහා හඳුනා ගත් ඉඩමක් සමඟ අදාළ යෝජනාව ඉදිරිපත් කරන ලෙස ගරු මන්ත්‍රීතුමාට දන්වන ලදී.

**2.** කාරක සභාව පෙ.ව. 11.00 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

**ඉඩම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමු වැනි රැස්වීම - 2020 නොවැම්බර් 26**

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා (සභාපති)
ගරු රොෂාන් රණසිංහ මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු ගයන්ත කරුණාතිලක මහතා
ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා
ගරු තිසකුට්ටි ආරච්චි මහතා
ගරු අසංක නවරත්න මහතා
ගරු මායාදුන්න චින්තක අමල් මහතා

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු ජගත් පුෂ්පකුමාර මහතා
ගරු ජේ. සී. අලවතුවල මහතා
ගරු කේ. කාදර් මස්තාන් මහතා
ගරු අශෝක ප්‍රියන්ත මහතා
ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු අමරකීර්ති අතුකෝරළ මහතා
ගරු සම්පත් අතුකෝරල මහතා
ගරු සංජීව එදිරිමාන්න මහතා
ගරු උදයන කිරිඳිගොඩ මහතා
ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා
ගරු මිලාන් ජයතිලක මහතා
ගරු එච්. නන්දසේන මහතා

ගරු සුදත් මංජුල මහතා
ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා
ගරු ගුණතිලක රාජපක්ෂ මහතා
ගරු සමන්ප්‍රිය හේරත් මහතා

## 1. ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා

## 1.1 බලපත්‍ර ලබා දී ඇති ඉඩම් සඳහා සින්නක්කර ඔප්පු ලබා දීම සහ වෙනත් කරුණු - ගරු ජගත් පුෂ්පකුමාර මහතා

### 1.1.1 බලපත්‍ර ලබා දී ඇති ඉඩම් සඳහා සින්නක්කර ඔප්පු ලබාදීමේ ප්‍රමාදය වැළැක්වීම

මෙම ක්‍රියාවලිය ඉක්මන් කිරීම සඳහා ඉඩම් සංවර්ධන ආඥා පනත සංශෝධනය කිරීමට බලාපොරොත්තු වන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

මැනුම් කටයුතුවලදී සිදුවන ප්‍රමාදය අවම කිරීමට ඉදිරියේදී සහනදායි ක්‍රමයකට ගාස්තු අයකරගෙන මැනුම් කටයුතු සිදු කර ගැනීමට ජනතාවට අවස්ථාව ලබා දීමට බලාපොරොත්තු වන බව මැනුම්පති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

කාර්යක්ෂම ලෙස සම්පූර්ණ ක්‍රියාවලියම සිදු කිරීම සඳහා වැඩපිළිවෙළක් යොදා ඇති බව ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 1.1.2 ඉඩම් ආඥා පනත සංශෝධනය

මව හෝ පියා මියගිය විට ඉඩමක හිමිකාරීත්වය පවුලේ වැඩිමහල් දරුවාට ලැබිය යුතුය යන කරුණ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදි.

ඉඩම් ආඥා පනත සංශෝධනයේදී මෙම කරුණ පිළිබඳව සලකා බැලෙන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

### 1.1.3 ඉඩම්වල හිමිකාරීත්වය ඇතුළත් වන ලෙස දත්ත ගබඩාවක් සකස් කිරීම

සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක්ම සම්බන්ධීකරණය කරගෙන එක් එක් පුද්ගලයා සතු ඉඩම් ඇතුළත් වන පරිදි දත්ත ගබඩාවක් සකස් කිරීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදි.

දැනටමත් මේ සම්බන්ධයෙන් දත්ත ගබඩාවක් සෑදීමට කටයුතු කරන බව ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් දැනුම් දෙන ලදි.

## 1.2 බිම්සවිය ව්‍යාපෘතිය මඟින් සිදු කෙරෙන ඉඩම් මැනුම් කටයුතු සහ වෙනත් කරුණු - ගරු මිලාන් ජයතිලක මහතා

### 1.2.1 බිම්සවිය ව්‍යාපෘතිය මඟින් සිදු කෙරෙන ඉඩම් මැනුම් කටයුතු

බිම්සවිය වැඩසටහන යටතේ ඉඩම් මැනුම් කටයුතු සිදු කිරීම නිවැරදි මට්ටමක නොමැති බැවින් ප්‍රාදේශීය සභා විසින් අදාළ ඉඩමෙහි පිඹුර සඳහා අනුමැතිය ලබා නොදෙන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදි.

බිම්සවිය වැඩසටහන සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් මූලික කරුණු කිහිපයක් ඇතුළත් කර ඉඩමක් සඳහා කැඩැස්තර පිඹුරක් සකස් කිරීම සිදු කරන බව රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි. නමුත් සැලැස්මක් අනුමත කර ගැනීම සඳහා පළාත් පාලන ආයතනවලට ඉදිරිපත් කිරීමේදී ඔවුන්ට අවශ්‍ය වන්නේ වඩා විස්තරාත්මක කරුණු ඇතුළත් කර සකස් කරන ලද සංවර්ධන පිඹුරක් බවත් ඔහු විසින් දැනුම් දෙන ලදි.

මෙහිදී ගැටළුව වන්නේ සංවර්ධන පිඹුර සකස් කරන විට කැඩැස්තර පිඹුර පාදක කර නොගන්නා බැවින් මේ සඳහා විසඳුමක් ලෙස අදාළ පනතට සංශෝධනයක් සිදු කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කරන බවත් රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදි.

මූලික පිඹුරුපත්වල නිවැරදි මායිම් නොසලකා ඇතැම් පුද්ගලයින් දීර්ඝ කාලයක් තිස්සේ ඉඩම් භුක්ති විඳීම හේතුව පෙන්නුම් කරමින් මූලික මායිම් වෙනුවට වෙනත් මායිම් ඇතුළත් කර සකස් කරන ලද පිඹුරුපත් ඉදිරිපත් කර ඒවා අනුමත නොවීම තුළ ගැටළුවක් ඇති වන බව රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදි.

මෙම සියලු ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා ඉඩම් ආඥා පනත සංශෝධනය කිරීමේ කටයුතු කඩිනම් කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

### 1.2.2 ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම්වල පදිංචි ජනතාවට එම ඉඩම් කට්ටි කර බෙදා දීම

මේ වන විට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම්වල පදිංචි ජනතාවට එම ඉඩම් කට්ටි කර බෙදා දීමේදී යම්කිසි මුදලක් ගෙවීමට නියම කරන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදි.

එම මුදල ගෙවීමට නොහැකි අඩු ආර්ථික මට්ටමක අය වෙනුවෙන් යම්කිසි සහනයක් ලබා දීමේ හැකියාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදි.

මේ සඳහා සාධාරණ මුදලක් අය කර ගැනීම සම්බන්ධයෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් චක්‍රලේඛයක් නිකුත් කිරීමට බලාපොරොත්තු වන බව අතිරේක ලේකම් (ඉඩම්) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

යම් අයෙක් පදිංචිව සිටින පර්චස් 20 ට අඩු ඉඩම් සම්බන්ධයෙන් පමණක් මෙහිදී සළකා බලන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

## 1.3 හම්බන්තොට දිස්ත්‍රික්කයේ නීතිවිරෝධී ලෙස ඉඩම් අත්පත් කර ගැනීම - ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

### 1.3.1 හම්බන්තොට දිස්ත්‍රික්කයේ නීතිවිරෝධී ලෙස ඉඩම් අත්පත් කර ගැනීම

නින්දගම් ඉඩමක් ලෙස එක් පුද්ගලයෙකුට හිමිකම් තබා ගත හැකි උපරිම සීමාව අක්කර 50 වන බවත් එසේ අක්කර 50 ක නින්දගම් ඉඩමක් පෙන්නුම් කරමින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ යම් පුද්ගලයෙක් විසින් තවත් ඉඩම් අල්ලා ගැනීම සිදු වන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදි.

ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් එම ඉඩම් ලියාපදිංචි කිරීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදි.

මෙහිදී හිමිකම් තබා ගත හැකි ඉඩමෙහි සීමාව නිවැරදි ලෙස නිර්ණය කර නොතිබීම මීට හේතුව ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදි.

හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත තුළින් මේ සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමට අපේක්ෂා කරන බව රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදි. මෙහිදී ඉඩම පිහිටි ස්ථානයට ගොස් අදාළ මැනුම් කටයුතු සිදු කර ඉඩම ලියාපදිංචි කිරීමට බලාපොරොත්තු වන බැවින් ගරු මන්ත්‍රීතුමා විසින් සඳහන් කළ ආකාරයේ නීතිවිරෝධී කටයුතු ඉදිරියේදී සිදු නොවන බවත් රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදි.

ගරු මන්ත්‍රීතුමා විසින් සඳහන් කරන කරුණට අදාළව පරීක්ෂණයක් සිදු කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ලැබීමට සලස්වන බව රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදි.

### 1.3.2 ගම් මට්ටමින් සිටින ව්‍යවසායකයින් දිරිගැන්වීම සම්බන්ධයෙන් ඇති වැඩසටහන

ගරු මන්ත්‍රීතුමාගේ ඉල්ලීම පරිදි ගම් මට්ටමින් සිටින ව්‍යවසායකයින් දිරිගැන්වීම සඳහා ඉඩම් සම්බන්ධයෙන් ඇති වැඩසටහනට අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය මාසයක කාලයකින් දීර්ඝ කරන ලෙස ගරු සභාපතිතුමා විසින් නිලධාරින්ට උපදෙස් ලබා දෙන ලදි.

## 1.4 ඉඩම් සංවර්ධන පනත සංශෝධනය කිරීම සහ වෙනත් කරුණු - ගරු උදයන කිරිඳිගොඩ මහතා

### 1.4.1 ඉඩම් සංවර්ධන පනත සංශෝධනය කිරීම

මෙම පනත සංශෝධනය කිරීම සම්බන්ධයෙන් මේ වනවිටත් කටයුතු කෙරෙමින් පවතින බව රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදි.

### 1.4.2 රජයේ දේපළවල භුක්තිය නැවත ලබා ගැනීම

රජයේ දේපළ සන්තකය පවරා ගැනීමේ පනත යටතේ ඉතා කෙටි ක්‍රමවේදයක් මගින් අනවසර භුක්තිකරුවන්ගෙන් රජයේ දේපළවල භුක්තිය නැවත ලබා ගත හැකි බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදි.

මේ වනවිට විහාර හා දේවාලගම්වලට නීත්‍යානුකූල නොවන ඔප්පු ඇති අවස්ථා විශාල සංඛ්‍යාවක් නිරීක්ෂණය වන බැවින් අවශ්‍ය නම් බිම්සවිය යටතේ මැනුම් කටයුතු සිදුකර අධිකරණ අමාත්‍යාංශයේද සහයෝගය ඇතිව ඉහත පනත අනුව කටයුතු කිරීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදි.

### 1.4.3 මහනුවර නාගස්තැන්න ප්‍රදේශයේ ඉඩම් ඔප්පු ලබා දීමේ කටයුතුවල ප්‍රමාදයක් පැවතීම

මහනුවර නාගස්තැන්න ප්‍රදේශයේ ගඟබඩකෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජනතාව සඳහා ඉඩම් ඔප්පු 270 ක් ලබා දීමේ කටයුතුවලට අදාළව සියලු කාර්යයන් සිදු කර ඇති නමුත් ඔප්පුවල ප්‍රමාදයක් පවතින බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදි.

### 1.4.4 ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ගලහ, අම්බලමානවත්ත ප්‍රදේශයේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියට අදාළව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ලබා දී ඇති ඉඩම සඳහා බදු මුදල් ගෙවීමේදී ඇතිව තිබෙන ගැටළුකාරී තත්ත්වය මත විදේශීය ආයෝජකයා මෙම ව්‍යාපෘතිය හැර යාමේ තතත්වයක් ඇති වී තිබෙන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම්දෙන ලදි.

මීට අදාළ විස්තර තමා වෙත ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීතුමා වෙත ඉල්ලීමක් කරන ලදි.

## 1.5 ඉඩම්වල සන්තකය පවරා ගැනීම සහ වෙනත් කරුණු - ගරු මායාදුන්න චින්තක අමල් මහතා

### 1.5.1 සන්තකය පවරා ගත් ඉඩමක් එම ඉඩම භුක්ති විඳි මුල් පුද්ගලයාට නැවත ලබා දීම

පුත්තලම දිස්ත්‍රික්කයේ අක්කර 217 ක ඉඩමක රජයට ගෙවිය යුතු බදු මුදල් ගෙවීමක් නොකර එක්තරා පුද්ගලයෙක් විසින් දීර්ඝ කාලයක් වගා කටයුතු සිදු කර ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද පැමිණිලි අනුව මේ වනවිට අධිකරණ ක්‍රියාමාර්ගයක් ගෙන ඇති බවත් අධිකරණ තීරණයෙන් පසු එම ඉඩම නැවත එම පුද්ගලයාටම ලබා දීමට කටයුතු කෙරෙමින් පවතින බව ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදි.

සන්තකය පවරා ගැනීමේ පනත යටතේ නියමානුකූල කළ නොහැකි ඉඩම්වල සන්තකය පමණක් පවරා ගැනීම සිදුවන බවත් සංවර්ධනය කරන ලද ඉඩමක් නම් හැකිතාක් දුරට නියමානුකූල කිරීමට කටයුතු කිරීම මිස සන්තකය පවරා ගැනීමට කටයුතු නොකරන බවත් ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් දැනුම් දෙන ලදි.

ගරු මන්ත්‍රීතුමා විසින් සඳහන් කරන පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි ඉඩම සම්බන්ධයෙන් මේ වනවිට විමර්ශන කටයුතු සිදු කෙරෙමින් පවතින බව රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදි.

මෙම කරුණ සම්බන්ධයෙන් අවධානය යොමු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

### 1.5.2 එකම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පදිංචි ඉඩම් සඳහා වැඩි බදු මුදල් අය කිරිම

එකම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක වෙනත් ග්‍රාම සේවා වසමකට පදිංචිය මාරු කිරීමේදී වැඩි බදු මුදලක් අය කිරීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදි.

මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

### 1.5.3 ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ඉඩම් මැනුම් කටයුතු සඳහා ඉහළ ගාස්තු අය කිරීම

ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාට මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

## 1.6 දිස්ත්‍රික් මට්ටමෙන් ඉඩම් කට්ටි ලක්ෂයක් බෙදාදීමේ රජයේ වැඩසටහන - ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා

දිස්ත්‍රික්ක 25 තුළම ඉඩම් කට්ටි ලක්ෂයක් ලබා දීමේ සැලැස්ම ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි. ඒ අනුව මෙම සැලැස්ම උතුර නැගෙනහිර පළාත්වලත් ක්‍රියාත්මක කෙරෙන බවද දැනුම් දෙන ලදි.

ඉදිරියේදී දෙමළ භාෂාවෙන් අදාළ ඉල්ලුම්පත්‍ර ගරු මන්ත්‍රීවරුන් වෙත ලබා දීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

## 1.7 විහාර සහ දේවාලගම්වලට අයිති දේපළවල හිමිකම අහිමි වීම සහ වෙනත් කරුණු - ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා

### 1.7.1 විහාර සහ දේවාලගම්වලට අයිති දේපළවල හිමිකම අහිමි වීම

1931 අංක 19 දරන බෞද්ධ විහාර දේවාලගම් පනත යටතේ පාලනය වන විහාර සහ දේවාලගම්වලට අයිති දේපළවල අනවසර පදිංචිකරුවන් භුක්ති විඳීම හේතුවෙන් මේ වනවිට එම දේපළවල හිමිකම එම විහාර දේවාලගම්වලට අහිමි වී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදි.

බෞද්ධ විහාර දේවාලගම් පනත සංශෝධනයේදී මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් මැනීම් කටයුතු සිදු කිරීමේ හැකියාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදි.

හිමිකම් නිරවුල් කිරීමේ පනත ක්‍රියාත්මක වන ප්‍රදේශවල මැනීම් කටයුතු නොමිලේ සිදු කරමින් පවතින බවත් මෙහිදී දේවාලවල භාරකරුවන් විසින් අවශ්‍ය ලේඛන හිමිකම් පරීක්ෂණවලට ඉදිරිපත් කළ යුතු බවත් රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදි.

විහාර දේවාලගම් පනත යටතේ ඇති පූජනීය ස්ථානවලට අයත්වන දේපළ සම්බන්ධව කිසිදු තීරණයක් නොගෙන තිබූ ලිපිගොනු සම්බන්ධයෙන් කටයුතු කිරීම ආරම්භ කළ බව රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදි.

ඒ අනුව විහාර දේවාලගම් පනත යටතේ පාලනය වන දේපළක් නම් එහි අයිතිය එම විහාරයට හෝ දේවාලයට ලබා දෙන බවත් විහාරයට හෝ දේවාලයට සම්බන්ධ පුද්ගලයෙක් එම ඉඩමක පදිංචි ව සිටී නම් එම පුද්ගලයාගේ සම්බන්ධතාවයට යටත්ව අදාළ ඉඩමෙහි අයිතිය එම විහාරයට හෝ දේවාලයට ලබා දෙන බවත් ඔහු විසින් තවදුරටත් දැනුම් දෙන ලදි.

### 1.7.2 පෞරාණිකව පදිංචිව සිටින ජනතාවගේ ඉඩම් වනජීවී ඉඩම් ලෙස සැලකීම මත ඔවුන්ට ඉඩම් සඳහා බලපත්‍රයක් ලබා නොදීම

හසලක සහ මිණිපේ ප්‍රදේශවල පෞරාණිකව පදිංචිව සිටින ජනතාවගේ ඉඩම් වනජීවී ඉඩම් ලෙස සැලකීම මත ඔවුන්ට ඉඩම් සඳහා බලපත්‍රයක් ලබා දී නොමැති බැවින් එම ජනතාව සඳහා බලපත්‍ර ලබා දීමේ ක්‍රමවේදයක් සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදි.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අයුතු ලෙස අවශේෂ කැලෑ පවරා ගෙන තිබීම සම්බන්ධයෙන් චක්‍රලේඛයක් නිකුත් කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

වනජීවී දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් නැවත පවරාගෙන එම ඉඩම් කෘෂිකාර්මික කටයුතු සඳහා ලබා දීමට කටයුතු කරන බව අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදි.

### 1.7.3 හසලක නගරයේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ඉඩමක පිහිටි දේපළ පවරා දීම

හසලක නගරයේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ඉඩමක පිහිටා ඇති කඩ කාමරවල ව්‍යාපාරික කටයුතුවල නිරත වන ජනතාවට එම දේපළ නිත්‍යානුකූලව ලබා දීමේ හැකියාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදි.

මෙම දේපළ නීත්‍යානුකූල ලෙස ලබාදීමට කටයුතු කළ හැකි බව රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදි.

## 1.8 නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වෘත්තීය පුහුණු අධිකාරිය සතු ඉඩම වෙනත් පාර්ශවයකට පැවරීම සහ වෙනත් කරුණු - ගරු සම්පත් අතුකෝරල මහතා

### 1.8.1 නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වෘත්තීය පුහුණු අධිකාරිය සතු ඉඩම පෞද්ගලික පාර්ශවයකට ලබා දීම

එම ඉඩම නැවත වෘත්තීය පුහුණු අධිකාරියට ලබා දීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

### 1.8.2 හිනිදුම ප්‍රදේශය තුළ ඇති ඉඩම් ගැටළු

හිනිදුම ප්‍රදේශය තුළ ඉඩම් ගැටළු විශාල ප්‍රමාණයක් ඇති බැවින් ඒවා නිරාකරණය කර ගැනීම සඳහා කටයුතු කිරීමට බිම්සවිය වැඩසටහන යටතේ කාර්යාල දෙකක් හෝ ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

බිම්සවිය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ඉදිරියේදී හිනිදුම ප්‍රදේශයද මෙම වැඩසටහනට ඇතුළත් කර ගැනීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදි.

## 1.9 ස්වර්ණ භූමි ඔප්පු යටතේ ලබා දුන් ඉඩම්වල අයිතිය හිමිවීමේ ගැටළුකාරී තත්ත්වය සහ වෙනත් කරුණු - ගරු සුදත් මංජුල මහතා

### 1.9.1 ස්වර්ණ භූමි ඔප්පු යටතේ ලබා දුන් ඉඩම්වල අයිතිය හිමිවීමේ ගැටළුකාරී තත්ත්වය

ස්වර්ණ භූමි ඔප්පු යටතේ ලබා දුන් ඉඩම්වල අයිතිය දෙමව්පියන්ගෙන් පසු පවුලේ වැඩිමහල් දරුවාට හිමිවීම සම්බන්ධයෙන් විවිධ ගැටළුකාරී තත්ත්වයන් නිර්මාණය වී ඇති බැවින් මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

ඉඩම් සංවර්ධන ආඥා පනත සංශෝධනයේදී ඉහත කරුණ කෙරෙහි අවධානය යොමු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

### 1.9.2 ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම්වල පදිංචිකරුවන්ගෙන් බදු මුදල් අය කිරීම

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම්වල පදිංචිවී සිටින අයගෙන් අයකර ගනු ලබන බදු මුදල් ඉහළ අගයක් ගන්නා බැවින් අඩු ආර්ථික මට්ටමක සිටින ජනතාව පීඩාවට පත්වන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදි.

### 1.9.3 කෑගල්ල දිස්ත්‍රික්කයේ ඉඩම් අහිමි ජනතාවට ඉඩම් ලබා දීම

ඉඩම් අහිමි ජනතාව වෙනුවෙන් ගම් පුළුල් කිරීමේ වැඩසටහන යටතේ ඉඩම් පවරා ගැනීමේදී ප්‍රාදේශීය ලේකම්වරුන්ට වතු හිමිකරුවන්ගෙන් විවිධ බාධා ඇති වන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදි.

## 1.10 වන්නි ප්‍රදේශයේ නිවාස සංවර්ධන කටයුතු සඳහා රජයේ ඉඩම් ලබාගැනීම - ගරු කේ. කාදර් මස්තාන් මහතා

### 1.10.1 වන්නි ප්‍රදේශයේ නිවාස සංවර්ධන කටයුතු සඳහා රජයේ ඉඩම් ලබාගැනීම

වන රක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් නොවන රජයේ ඉඩම්, නිවාස සංවර්ධන කටයුතු සඳහා ලබා ගැනීමේදී ගැටළුකාරී තත්ත්වයක් ඇති වී තිබෙන බැවින් එම ප්‍රදේශයේ රජයේ ඉඩම් සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් හරහා කඩිනම් විසඳුම් ලබාදෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

වන්නි දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු සහ නිවාස සඳහා අවශ්‍ය ඉඩම් ප්‍රමාණය සම්බන්ධයෙන් ඉල්ලීමක් ලිඛිතව ඉඩම් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීතුමාගෙන් ඉල්ලීමක් කරන ලදී.

### 1.10.2 මන්නාරම අලකට්ටුකර ප්‍රදේශයේ අවසිය දෙනෙකුට ඉඩම් ඔප්පු ලබාදීම

ඉඩම් ඔප්පු ලබා දී නියමිත ඉඩම් වෙන්කර දී නොමැති අතර අදාළ ස්ථානවල වෙනත් අය නිවාස සාදා ඇති බැවින් කමිටුවක් පත්කර එමගින් මේ සඳහා විසඳුම් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ගරු මන්ත්‍රීතුමාගේ ඉල්ලීම පරිදි වන්නි දිස්ත්‍රික්කයේ ක්ෂෙත්‍ර චාරිකාවක නිරත වන ලෙස ගරු සභාපතිතුමා විසින් නිලධාරින්ට උපදෙස් ලබා දෙන ලදි.

## 1.11 අත්තනගල්ල, වැලිකඩමුල්ල ප්‍රදේශයේ ක්‍රියාත්මක වන කසල ව්‍යාපෘතිය සහ වෙනත් කරුණු - ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

### 1.11.1 අත්තනගල්ල, වැලිකඩමුල්ල ප්‍රදේශයේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩමක ක්‍රියාත්මක වන කසල ව්‍යාපෘතිය හේතුවෙන් පැන නගින පාරිසරික ගැටළු

මෙම ප්‍රදේශය මේ වනවිට කර්මාන්ත පුරයක් ලෙස ක්‍රියාත්මක වන බැවින් මේ සම්බන්ධයෙන් ගරු කර්මාන්ත අමාත්‍යතුමා සමඟ සාකච්ඡා කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීතුමාගෙන් ඉල්ලීමක් කරන ලදී.

### 1.11.2 අත්තනගල්ල ප්‍රදේශයේ භාවිතා නොකරන ඉඩම් ක්‍රීඩා පිටි ඉදි කිරීම සඳහා යොදාගැනීම

මේ වනවිට මෙවැනි ඉඩම් හඳුනාගෙන ලැයිස්තුගත කර ඇති බවත් මෙවැනි ඉඩම් සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ තීරණයක් ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරියේදී ඉදිරිපත් කිරීමට නියමිත බවත් රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදි.

### 1.11.3 අත්තනගල්ල ප්‍රදේශයේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීම

මෙම ඉඩම්වල සංවර්ධන කටයුතු සිදු කිරීමේදී ඉඩම්වල හිමිකම නිසි පරිදි නිර්ණය කර නොතිබීම මත ගැටළුකාරී තත්ත්වයක් ඇතිව තිබෙන බැවින් මෙම ඉඩම්වල

අයිතිය ප්‍රාදේශීය ලේකම් වෙත ලබා දීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

**2.** කාරක සභාව ප.ව.3.30 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

**අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමුවන රැස්වීම - 2020 නොවැම්බර් 28**

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා (සභාපති)
ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු විජිත බේරුගොඩ මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු (වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය (රාජ්‍ය අමාත්‍ය)
ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා
ගරු අනුප පස්කුවල් මහතා
ගරු යදාමිණී ගුණවර්ධන මහතා
ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු ලසන්ත අලගියවන්න මහතා
ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය
ගරු ගුණතිලක රාජපක්ෂ මහතා
ගරු සමන්ප්‍රිය හේරත් මහතා
ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා
ගරු මධුර විතානගේ මහතා
ගරු සුදත් මංජුල මහතා
ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා
ගරු ඉෂාක් රහුමාන් මහතා
ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා
ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා
ගරු අශෝක ප්‍රියන්ත මහතා
ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා
ගරු මංජුලා දිසානායක මහත්මිය
ගරු ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා
ගරු විදුර වික්‍රමනායක මහතා
ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා
ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා
ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා
ගරු නලින් ප්‍රනාන්දු මහතා
ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු අමරකීර්ති අතුකෝරළ මහතා
ගරු නිමල් පියතිස්ස මහතා
ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා
ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
ගරු ඩයනා ගමගේ මහත්මිය
ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතා
ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා
ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
ගරු අලි සබ්රි රහීම් මහතා
ගරු දයාසිරි ජයසේකර මහතා
ගරු කුමාරසිරි රත්නායක මහතා
ගරු අජිත් රාජපක්ෂ මහතා
ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා

## 1. අමාත්‍යාංශයීය කටයුතු පිළිබඳ සාකච්ඡාව

### 1.1 ගරු ලසන්ත අලගියවන්න මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

#### 1.1.1 2020 වර්ෂයේ පහ වසර ශිෂ්‍යත්ව විභාගය සහ උසස් පෙළ විභාගය

නිරෝධායන ඇඳිරි නීතිය මධ්‍යයේ පහ වසර ශිෂ්‍යත්ව විභාගය සහ උසස් පෙළ විභාගයේ කටයුතු වලට සහභාගිවූ ශාලාධිපතිවරුන් සහ ගුරුවරුන් සඳහා අමතර දීමනාවක් ගෙවීමට කටයුතු කරන ලෙස ගරු ලසන්ත අලගියවන්න මහතා විසින් ඉල්ලීමක් කරන ලදී.

#### 1.1.2 වැඩ බලන විදුහල්පතිවරුන්ගේ ගැටළුව

වර්ෂ ගණනාවක් පුරා විදුහල්පති විභාගය නොපැවැත්වීම නිසා බොහෝ පළාත් සහා පාසැල් සඳහා වැඩ බලන විදුල්පතිවරුන් ලෙස පත්කරන ලද ජ්‍යෙෂ්ඨ ගුරුවරුන් ස්ථිර කිරීමට කටයුතු කරන මෙන් ගරු අමාත්‍යතුමා විසින් ඉල්ලීමක් කරන ලදී. අධිසේවක පදනම, අධ්‍යාපන සුදුසුකම් සහ පත්වීමෙන් පසු දක්වා ඇති කුසලතා යන කරුණු සලකා බලා විභාග පැවැත්වීමකින් තොරව මෙම විදුහල්පතිවරුන්ට පත්වීම් ලබා දෙන මෙන්ද ගරු අමාත්‍යතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

බඳවා ගැනීමේ නීති රීති සංශෝධනය සහ කැබිනට් සංදේශයක් ඉදිරිපත් කිරීම මගින් මෙම ගැටළුව ඉදිරි කාලයේදී විසඳනු ලබන බව අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

#### 1.1.3 ගුරු උපදේශක සේවය ස්ථාපිත කිරීම

ගුරු උපදේශක සේවය ස්ථාපිත කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති නමුත්, ගුරු උපදේශකවරුන් දැනට සේවය කරන සමහර පළාත් සභාවලින් අදාළ අන්තර්ග්‍රහණය කිරීම සඳහා එකඟතාවය ලැබී නොමැති බැවින් මෙම කාර්යය ප්‍රමාද වී ඇති බව ගරු අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.1.4 2021 වර්ෂය සඳහා පාසල්වලට දරුවන් ඇතුළත් කර ගැනීම

ගරු අමාත්‍යතුමා විසින් මෙම කරුණ සඳහා වන ප්‍රතිපත්තිය පිළිබඳ කාරක සභාවේ අවධානයට යොමු කරන ලදී.

ගරු අධිකරණය විසින් කරන ලද දැනුම් දීම අනුව ගරු අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි පළමු වසර සහ අනෙකුත් ශ්‍රේණි සඳහා බඳවා ගන්නා ළමුන් සංඛ්‍යාව සංශෝධනය කිරීමට අවසරය ඉල්ලා ඇති බව අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

## 1.2 විශ්වවිද්‍යාල සඳහා උපකුලපතිවරුන් පත් කිරීම - ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා

විශ්වවිද්‍යාල සඳහා උපකුලපතිවරුන් පත් කිරීම සඳහා පවතින පනත උල්ලංඝනය වන අයුරින් චක්‍රලේඛයක් නිකුත් වී ඇත්ද යන්න ගරු මන්ත්‍රීතුමා විසින් විමසන ලදී.

පනතට අනුකූලව නිසි ක්‍රමවේදයකට මේවන විට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

## 1.3 පළමු ගුරු පත්වීම් දුෂ්කර පළාත් වෙත යොමු කිරීම - ගරු ඩයනා ගමගේ මහත්මිය

ගුරුවරුන්ට තම පළමු ගුරු පත්වීම දුෂ්කර ප්‍රදේශ වලට ලබා දීමෙන් ගුරුවරුන්ගේ පුද්ගලික ජීවිතයට හා පවුල් සංස්ථාවට සිදුවන බලපෑම මත ඔවුන්ගෙන් 100% ක ඵලදායිතාවක් ලබා ගත නොහැකි බවත්, ඊට විසඳුමක් ලෙස තමා පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට ලබා දීම සුදුසු බවත් ගරු මන්ත්‍රීතුමිය විසින් අවධාරණය කරන ලදි.

## 1.4 ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.4.1 2020 වසර සඳහා සිසුන් බඳවා ගැනීමේ දී විශ්වවිද්‍යාල ප්‍රවේශයේ මතු වී තිබෙන ගැටළු

2019 උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල මත, 2020 වසර සඳහා විශ්වවිද්‍යාලවලට සිසුන් බඳවා ගැනීමේ දී පැරණි නිර්දේශය සහ නව නිර්දේශය මත තෝරා ගැනීමේ ක්‍රමවේදය ගැටළුසහගත වී ඇති බව ගරු මන්ත්‍රීතුමිය විසින් දැනුම් දෙන ලදි.

2012 වර්ෂයේදී මීට සමාන අවස්ථාවක් සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දුන් නියෝගයට අනුකූලව මේ අවස්ථාවේදීද කටයුතු කරන බව විශ්ව විද්‍යාල කොමිෂන් සභාවේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

මෙම කරුණට අදාළව වාර්තාවක් මෙම කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය විසින් ඉල්ලීමක් කරන ලදී.

විශ්ව විද්‍යාලයන්හි ධාරිතාව සලකා බලා විශ්ව විද්‍යාලයන්ට ඇතුල්වීමට බලාපොරොත්තුවන ශිෂ්‍යයන්ට අසාධාරණයක් නොවන අන්දමට මෙම ගැටළුව විසඳීමට කටයුතු කිරීමට අපේක්ෂා කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.4.2 පර්යේෂණ සහ වෙනත් කටයුතු සඳහා විදේශ විශ්වවිද්‍යාල/සංවිධාන සමග විශ්වවිද්‍යාල අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම සඳහා වන ක්‍රමවේදයන්

පාස්කු ප්‍රහාරයෙන් පසු ගනු ලැබූ තීරණ මත විශ්වවිද්‍යාලවල අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීමේ ක්‍රමවේදයේ සංකීර්ණභාවය නිසා සිදුවන ප්‍රමාදය වැළැක්වීමේ අවශ්‍යතාවය ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.5 උතුරු පළාතේ අධ්‍යාපන ක්‍රමවේදයන්ගේ සහ යාපනයේ විශ්වවිද්‍යාලයේ පවතින අඩුපාඩු - ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

උතුරු පළාතේ පෙර පාසල්වල මානව සම්පත් සංවර්ධනය, ජ්‍යෙෂ්ඨතම විශ්වවිද්‍යාලයක් වන යාපනය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයක් ආරම්භ කිරීම, අනෙකුත් විශ්වවිද්‍යාල සම්බන්ධ කර ගනිමින් නොයෙකුත් අංශ සංවර්ධනය කිරීම, යාපනය විශ්වවිද්‍යාල සිසුන්ගේ චින්තනය වැඩි දියුණු කිරීම සහ යාපනය විශ්වවිද්‍යාලයේ භෞතික අවශ්‍යතා සැපිරීමේ අවශ්‍යතාවය ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවේ අවධානයට යොමු කරන ලදී.

## 1.6 මන්නාරම ප්‍රදේශයේ උසස් තාක්ෂණික ආයතනය සඳහා යෝජිත ගොඩනැගිල්ලක් ලබා ගැනීම - ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

මෙම ඉදිකිරීමට අදාළ ප්‍රතිපාදන දැනටමත් ලබා දී ඇති බැවින් ඉදිකිරීම් ආරම්භ කළ හැකි බව ගරු රාජ්‍ය අමාත්‍ය (වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.7 වයඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධව කුලියාපිටියේ මහාචාර්ය ඒකකයක් පිහිටුවීම - ගරු සමන්ප්‍රිය හේරත් මහතා

වයඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ වෛද්‍ය විද්‍යාලය ස්ථාපිත කිරීමේදී ගනු ලැබූ තීරණය මත, කුලියාපිටියේ මහාචාර්ය ඒකකයක් මේ වන තුරු පිහිටුවා නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම ගැටළුවට තීරණයක් ලබා ගැනීමට විශේෂඥ වෛද්‍යවරුන්ගෙන් සමන්විත කමිටුවක් පිහිටුවා ඇති බව විශ්වවිද්‍යාල කොමිෂන් සභාවේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.8 ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කළ යෝජනා

### 1.8.1 2020 ශිෂ්‍යත්ව විභාගය සහ උසස් පෙළ විභාගය

විභාගයන්ට ඉදිරිපත් වූ සමහර ශිෂ්‍යයන් කොවිඩ් ආසාදිතයන් බවට පත්වීම නිසා එම ශිෂ්‍යයන් හට දුෂ්කරතා මතුවූ බැවින් සානුකම්පිතව සලකා බලා යම් සහනදායී ලකුණු කීපයක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ජාතික තලයේ විභාගයන් පැවැත්වීමේ සම්මතයන්ගෙන් බැහැර වීමට නොහැකි බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.8.2 නිවිටඹුව සංඝබෝධි ජාතික පාසැල

නිවිටඹුව සංඝබෝධි ජාතික පාසල නියමිත සංඛ්‍යාවන්ට අනුව ගුරුවරුන් සහ අනධ්‍යන කාර්ය මණ්ඩලය පත් කිරීම් කඩිනම් කරන ලෙසත් මෙහි අවශ්‍ය භෞතික සම්පත් ලබා දෙන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

### 1.8.3 ශිෂ්‍ය සංඛ්‍යාව අඩුවීම නිසා වසන ලද පාසල් වෘත්තීය පුහුණු ආයතන බවට පරිවර්තනය කිරීම

අත්තනගල්ල ප්‍රදේශයේ මෙන්ම දිවයින පුරාම පාසල් මේ අන්දමින් වැසී ඇති බැවින් සම්පත් විනාශ වීම මගහරවා ගැනීමට ඒවා වෘත්තීය පුහුණු ආයතන ලෙස පරිවර්තනය කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 1.9 ගරු ඉෂාක් රහුමාන් මහතා විසින් ඉදිරිපත් කළ යෝජනා

### 1.9.1 අනුරාධපුර දිස්ත්‍රික්කයේ තලාව මුස්ලිම් මධ්‍ය මහා විද්‍යාලයේ ගොඩනැගිලිවල අඩුපාඩු

මෙම විද්‍යාලයේ ගොඩනැගිලිවල අඩුපාඩු රාශියක් පවතින බැවින් එම අඩුපාඩු සම්පූර්ණ කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

### 1.9.2 අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඇතිකරන ලද පාසැල්වල අඩුපාඩු

මෙම පාසැල්වල අඩුපාඩු සම්පූර්ණ කරදෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 1.10 පාසැල් වල ස්වේච්ඡා ගුරුවරු ස්ථිර කිරීම - ගරු අනුප පස්කුවල් මහතා

මෙතෙක් පාසල් වලට බඳවා ගත් ස්වේච්ඡා ගුරුවරු ස්ථිර කිරීමේ කටයුතු සිදු කළ බවත්, තවදුරටත් ස්ථිර නොකළ ස්වේච්ඡා ගුරුවරු සිටින්නේද යන්න සංගණනය කළ යුතු බවත් ඉන්පසු ක්‍රියාමාර්ග ගත යුතු බවත් රාජ්‍ය අමාත්‍ය, ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.11 මුලතිව් ජාතික පාසැල් විදුහල්පතිවරයාගේ ස්ථාන මාරුව - ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

වසර 14 ක් පුරා අඛන්ඩව සේවය කළ මුලතිව් ජාතික පාසලේ විදුහල්පතිවරයාට, පළාත් අධ්‍යක්ෂ ලෙස ලැබී ඇති ස්ථාන මාරුව ක්‍රියාත්මක කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ සම්බන්ධව අවධානය යොමු කරන ලෙස ගරු රාජ්‍ය අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත මහතා විසින් අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා ආයතන) වෙත උපදෙස් ලබා දෙන ලදී.

**1.12 ගිරාගම සෞන්දර්යය ගුරු අභ්‍යාස විද්‍යාලය නඟා සිටුවීම - ගරු වසන්ත යාපා බණ්ඩාර මහතා**

අක්කර 18 ක් පුරා විහිදුණු ගොඩනැගිලි සහිත එකම සෞන්දර්යය ගුරු අභ්‍යාස විද්‍යාලය වන ගිරාගම ගුරු අභ්‍යාස විද්‍යාලය පුහුණු පාසලක් බවට හෝ පාසලක් බවට පත් කිරීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදි.

**1.13 ගල්ගමුව ආසනයේ උඩුදිවුල්වැව පාසලේ භෞතික සම්පත් නඟා සිටුවීම - ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා**

පළාත් සභා පාසලක් වන ගල්ගමුව ආසනයේ උඩුදිවුල්වැව පාසලේ අවම පහසුකම්වත් නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.14 නාත්තණ්ඩිය ධම්මිස්සර ජාතික පාසලට විදුහල්පතිවරයෙක් පත් කිරීම - ගරු අශෝක ප්‍රියන්ත මහතා**

2016 වසරේ සිට මෙතෙක් නාත්තණ්ඩිය ධම්මිස්සර ජාතික පාසලේ වැඩ බලන විදුහල්පතිවරයෙකු රාජකාරි කරන බැවින් එම පාසලට ස්ථිර විදුහල්පතිවරයෙකු අනුයුක්ත කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**1.15 දෙබරවැව ජාතික පාසැලේ පිහිණුම් තටාකය ඉදි කිරීම - ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා**

දැනට ඉදි කිරීම නැවතී ඇති දෙබරවැව ජාතික පාසැලේ පිහිණුම් තටාකයේ ඉදි කිරීම් නැවත ආරම්භ කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**1.16 රුවන්වැල්ල රාජසිංහ මධ්‍ය විද්‍යාලයේ සහ වැන්දල ප්‍රාථමික විද්‍යාලයේ පවතින ගැටළු - ගරු සුදත් මංජුල මහතා**

වැන්දල ප්‍රාථමික විද්‍යාලයේ දරුවන්ට රුවන්වැල්ල රාජසිංහ මධ්‍ය විද්‍යාලයට ඇතුළත් වීමේදී සිදු වන අසාධාරණය මඟහරවා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම ඉල්ලීම ඉටු කළ හැකි බව රාජ්‍ය අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.17 මහින්දෝදය විද්‍යාල ද්විතික පාසල් යටතේ තාක්ෂණ පාසල් ඇති කිරීම - ගරු මංජුලා දිසානායක මහත්මිය**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ එක් ආසනයකට එක් තාක්ෂණ පාසලක් බැගින් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමිය විසින් ඉල්ලීමක් කරන ලදී.

රජය විසින් හඳුන්වා දුන් තාක්ෂණ විෂය මාලාව හැදෑරීම සඳහා පන්ති ප්‍රමාණය වැඩි කිරීම සඳහා කලාප අධ්‍යක්ෂ මගින් අධ්‍යයනය කරන බව රාජ්‍ය අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා විසින් දැනුම් දෙන ලදී.

අධ්‍යාපන ප්‍රතිපත්ති වෙනස් කිරීමට නියමිත බැවින් ඉදිරියේදී මෙම කරුණ සලකා බැලෙන බව රාජ්‍ය අමාත්‍ය ගරු (වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී

**1.18 මොණරාගල දිස්ත්‍රික්කයේ පාසල් වල පවතින ගැටළු- ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා**

**1.18.1** සෙවණගල මහ විද්‍යාලයේ තාක්ෂණ විෂය මාලාව හැදෑරීම සඳහා තෙමහල් ගොඩනැගිල්ලක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**1.18.2** ජාතික පාසල් සඳහා උපාධිධාරි ගුරුවරු අනුයුක්ත කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**1.18.3** උසස් පෙළ විෂයයන් ඉගැන්වීම සඳහා වන ගුරු පුරප්පාඩු සහ විදුහල්පති පුරප්පාඩු සපුරා දෙන ලෙස ද ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**1.18.4** තණමල්විල පළාත් අධ්‍යාපන කාර්යාලයට ගොඩනැගිල්ලක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම කරුණ පළාත් සභාව සමග සාකච්ඡා කර විසඳිය යුතු බව රාජ්‍ය අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.18.5** පළාතේ ගුරුවරුන්ගේ උසස්වීම් සහ ආපදා ණය සඳහා ප්‍රතිපාදන ලැබී නොමැති බව ද ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.19 අම්පාර, පොතුවිල් සඳහා අධ්‍යාපන කලාපයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටීම - ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා**

ගරු මන්ත්‍රීතුමා විසින් මෙම කරුණ සම්බන්ධයෙන් ඉල්ලීමක් කරන ලදී.

**1.20 පුත්තලම දිස්ත්‍රික්කයේ පාසැල්වල අඩුපාඩු - ගරු අලි සබ්රි රහීම් මහතා**

**1.20.1** හලාවත, මාදම්පෙ පාසැලෙහි මහල් දෙකක ගොඩනැගිල්ලක් ඉදිකළද වැඩ අවසන් කර නොමැති බවත් එය සම්පූර්ණ කර දෙන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**1.20.2** පුත්තලම මුස්ලිම් ජාතික පාසලේ වසර 10 ඉක්මවූ ගුරුවරුන්ගේ ස්ථාන මාරු ක්‍රියාත්මක කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**2** කාරක සභාව ප.ව.4.30 ට 2021 ජනවාරි මස 21 දින ප.ව. 2.00 දක්වා කල් තබන ලදී.

---

**විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමු වැනි රැස්වීම - 2020 නොවැම්බර් 30 වැනි දින**

**පැමිණ සිටි සාමාජික මන්ත්‍රීන්**

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (සභාපති)
ගරු තාරක බාලසූරිය මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
ගරු ගාමිණී වලේබොඩ මහතා
ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා

**පැමිණ සිටි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා
ගරු රෝහණ දිසානායක මහතා
ගරු ෆයිසාල් කාසිම් මහතා
ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා
ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු උදයන කිරිඳිගොඩ මහතා
ගරු ජගත් කුමාර මහතා
ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා
ගරු උදයකාන්ත ගුණතිලක මහතා
ගරු මිලාන් ජයතිලක මහතා
ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා
ගරු අසංක නවරත්න මහතා
ගරු මධුර විතානගේ මහතා
ගරු තවරාජා කලෙයි අරසන් මහතා
ගරු යදාමිණී ගුණවර්ධන මහතා
ගරු මර්ජාන් ෆලීල් මහතා
ගරු ඩයනා ගමගේ මහත්මිය

**1. ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා**

**1.1 ඔන්ටාරියෝ ව්‍යවස්ථාදායකය විසින් ඉදිරිපත් කරනු ලබන පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත - ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා**

ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් කැනඩාවේ ඔන්ටාරියෝ ප්‍රාන්තයේ ව්‍යවස්ථාදායකයේ යෝජනා වී ඇති පනත් කෙටුම්පත, තුන්වන වර කියවීමට දරන උත්සාහය සම්බන්ධයෙන් ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම පනත් කෙටුම්පත දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ශ්‍රී ලංකාවට ද මෙරට පරමාධිපත්‍යයට ද බලපෑමක් වන බැවින් මෙම කරුණ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙසට ගරු මන්ත්‍රීතුමා විසින් තවදුරටත් කරුණු දක්වමින් ඉල්ලා සිටින ලදී.

## 1.2 මැදපෙරදිග ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් වෙනුවෙන් යම්කිසි රක්ෂණ ක්‍රමයක් ඇති කිරීම සහ වෙනත් කරුණු - ගරු ඩයනා ගමගේ මහත්මිය

### 1.2.1 ජපන් ජාතික බාල වයස් දැරියක් ශ්‍රී ලංකාවට රැගෙන ඒමේ සිදුවීම

ශ්‍රී ලාංකික තරුණයෙක් විසින් ජපන් ජාතික බාල වයස් දැරියක් පැහැරගෙන ශ්‍රී ලංකාවට රැගෙන ඒමේ සිදුවීම සම්බන්ධයෙන් ගෙන ඇති නීතිමය ක්‍රියාමාර්ග පිළිබඳව ගරු මන්ත්‍රීතුමිය විසින් විමසීමක් කරන ලදි.

මෙම සිදුවීම සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක වන බවත්, ජපාන තානාපති කාර්යාලය දැනුවත් කිරීමක් සිදු කර ඇති බවත් අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 1.2.2 මැදපෙරදිග ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් වෙනුවෙන් යම්කිසි රක්ෂණ ක්‍රමයක් ඇති කිරීම

මැදපෙරදිග රටවල සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් රක්ෂණ ක්‍රමයක් ඇති කිරීමට එම රටවල් සමඟ ද්වි පාර්ශවික එකඟතාවයකට එළඹීමේ හැකියාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමිය විසින් විමසීමක් කරන ලදි.

මැද පෙරදිග විදෙස් ශ්‍රමිකයින්ගෙන් වැඩි දෙනෙක් නීත්‍යානුකූල නොවන මාර්ග හරහා විදෙස්ගත වන බැවින් මේ සම්බන්ධයෙන් නව නීති කෙටුම්පත් කිරීමට බලාපොරොත්තු වන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 1.2.3 විදේශිකයන් පැමිණීමේදී කොවිඩ් රෝගය නොමැති බවට තහවුරු කර ගැනීම

මෙරටට පැමිණෙන විදේශිකයන් කොවිඩ් එන්නත එන්නත් කර ගෙන ඇති බවට සහතිකයක් ඉදිරිපත් කළ යුතුදැයි ගරු මන්ත්‍රීතුමිය විසින් විමසීමක් කරන ලදි.

මේ වනතෙක් කොවිඩ් වෙනුවෙන් එන්නතක් හඳුන්වා දී නොමැති බැවින් ඒ සම්බන්ධයෙන් මාර්ගෝපදේශ නොමැති නමුත් මෙරටට පැමිණෙන සෑම විදේශිකයෙක්ම පී.සී.ආර්. පරීක්ෂණයට ලක්ව සිටිය යුතු බව අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 1.2.4 විදෙස් රටවල ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ප්‍රවර්ධනය කිරීම

විදෙස් රටවල ක්‍රියාත්මක ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාල විසින් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ප්‍රවර්ධනය කිරීමේ කටයුතුවල අඩුවක් නිරීක්ෂණය වන බැවින් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

## 1.3 ශ්‍රී ලංකාව වෙනත් රටවල් සමඟ පවත්වන වාණිජ සබඳතා සහ වෙනත් කරුණු - ගරු ගාමිණී වලේබොඩ මහතා

### 1.3.1 මෙරට හමුදා කඳවුරුවල දර්ශන ඇතුළත් කර රූගත කරන ලද වාර්තාමය චිත්‍රපටය

ශ්‍රී ලංකාවේ හමුදා කඳවුරු තුළ දර්ශන ඇතුළත් කර මෙරට රූගත කරන ලද වාර්තාමය චිත්‍රපටයක් යූ - ටියුබ් හරහා ලොව පුරා විකාශය කිරීම පිළිබඳව විදේශ අමාත්‍යාංශයේ මැදිහත් වීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදි.

### 1.3.2 බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ එල්.ටී.ටී.ඊ. සංවිධානයට පක්ෂව විවාද පැවැත්වීම

බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ එල්.ටී.ටී.ඊ. සංවිධානයට පක්ෂව විවිධ ක්‍රියාකාරකම් පැවැත්වීම සම්බන්ධයෙන් විදේශ අමාත්‍යාංශය විසින් අනුගමනය කරනු ලබන ක්‍රමවේදය සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදි.

මෙම කරුණ සම්බන්ධයෙන් මේ වන විටත් විදේශ අමාත්‍යාංශය මැදිහත් වී රාජ්‍යතාන්ත්‍රිකව කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 1.3.3 ජාත්‍යන්තරය සමග ශ්‍රී ලංකාවේ වාණිජ සංගම් (Commerce Chambers) යාවත්කාලීන කිරීම

ශ්‍රී ලංකාව වෙනත් රටවල් සමඟ පවත්වන මිත්‍රත්ව සංගම් ප්‍රතිව්‍යුහගත කර ශ්‍රී ලංකාවේ වාණිජ සංගම් (Commerce Chambers) යාවත්කාලීන කර විදෙස් සම්බන්ධතා වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

විවිධ ක්ෂේත්‍ර සඳහා මෑතකදී ආරම්භ වූ වාණිජ සංගම්වල ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු බව රාජ්‍ය අමාත්‍ය, ගරු තාරක බාලසූරිය මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 1.3.4 එක් රාජ්‍යතාන්ත්‍රික මධ්‍යස්ථානයකට එක් වාණිජ නිලධාරියෙක් පත් කිරීම

එක් රාජ්‍ය තාන්ත්‍රික මධ්‍යස්ථානයකට එක් වාණිජ නිලධාරියෙක් පත් කර වාණිජ ඉලක්කයක් ඇති කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

මීළඟ වසරේ මෙසේ වාණිජ ඉලක්ක ඇති කිරීමට බලාපොරොත්තු වන බව රාජ්‍ය අමාත්‍ය, ගරු තාරක බාලසූරිය මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 1.3.5 ඉහළ වෘත්තිමය මට්ටමක් ඇති වෘත්තිකයන්ට විදෙස් රැකියා අවස්ථා ලබා දීම

ඉහළ වෘත්තිමය මට්ටමක් ඇති දේශීය වෘත්තිකයන්ට විදෙස් රටවල රැකියා අවස්ථා ලබා දීමේ ජාතික වැඩපිළිවෙලක් ඇති කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

මේ සම්බන්ධයෙන් අවධානය යොමු කර ඇති බව රාජ්‍ය අමාත්‍ය, ගරු තාරක බාලසූරිය මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 1.3.6 ශ්‍රී ලංකාවේ මැණික් අපනයනය

රාජ්‍ය තාන්ත්‍රික සබඳතා නොමැති මැණික් කැණීම් සිදු කරන රටවල් සමඟ සබඳතා දියුණු කරගෙන ශ්‍රී ලංකාවට මැණික් අපනයනයෙන් වැඩි ආදායමක් ලබා ගැනීම සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

නේපාල රජය සහ චීන රජය සමඟ මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරන බව රාජ්‍ය අමාත්‍ය, ගරු තාරක බාලසූරිය මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

ද්විත්ව බදු ගිවිසුම් (Double Tax Agreement) අත්සන් කිරීම ප්‍රමාද වී ඇති රවටල් 12 සමඟ ගිවිසුම අත්සන් කිරීම සම්බන්ධයෙන් විදේශ අමාත්‍යාංශයේ අවධානය යොමු විය යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

එමෙන්ම වෙළෙඳ ගිවිසුම් සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් ද ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

වෙළෙඳ ප්‍රතිපත්තියක් පිළියෙළ කිරීමේ ක්‍රියාවලිය දැනටමත් සිදු කෙරෙමින් පවතින බවත් නිදහස් වෙළඳ ගිවිසුම (Free Trade Agreements) ඇති කළ යුතු බවත් රාජ්‍ය අමාත්‍ය, ගරු තාරක බාලසූරිය මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

## 1.4 විදෙස්ගත වූ ශ්‍රී ලාංකිකයන් මෙරටට ගෙන්වා ගැනීම - ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා

ශ්‍රී ලාංකිකයන් මෙරටට ගෙන්වා ගැනීම සම්පූර්ණයෙන් නවත්වා ඇති බැවින් සංචාර සහ රැකියා සඳහා විදෙස්ගතව නැවත මෙරටට පැමිණීමට නොහැකිව සිටින ශ්‍රී ලාංකිකයන් සම්බන්ධයෙන් විදේශ අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදි.

මේ වනවිට ප්‍රධාන වශයෙන් මැද පෙරදිග රටවල් වෙත වැඩි අවධානයක් යොමු කරමින් සෙසු රටවල්වල සිට ද ශ්‍රී ලාංකිකයන් මෙරටට ගෙන්වා ගැනීමට ගුවන් ගමන් ආරම්භ කර ඇති බව අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

එතිහැඩ්, එමිරේට්ස් වැනි ගුවන් සේවාවන් හරහා පෞද්ගලිකව තම ගමන් සඳහා ගෙවීම් කර මෙරටට පැමිණිය හැකි අතර තානාපති කාර්යාල හරහා සංවිධානය කරනු ලබන විශේෂ ගුවන් ගමන් මගින් ද මෙරටට ශ්‍රමිකයන් විශාල වශයෙන් රජය මගින් ගෙන්වනු ලබන බව අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.5 ඉන්දියාවේ පදිංචිව සිටින ශ්‍රී ලාංකික සරණාගතයින් මෙරටට ගෙන්වා ගැනීම - ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

### 1.5.1 ඉන්දියාවේ සිටින ශ්‍රී ලාංකික සරණාගතයින් මෙරටට ගෙන්වා ගැනීම

උතුරු - නැගෙනහිර යුධ සමයේදී ඉන්දියාවට සංක්‍රමණය වී එම රජයේ ලියාපදිංචි නොවී සිටින දෙමළ ජනතාව මෙන්ම සරණාගත කඳවුරුවල සිටින දෙමළ ජනතාව

ලංකාවට ගෙන්වා ගැනීම සම්බන්ධයෙන් කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදි.

මෙම කාර්යය කඩිනමින් සිදු කිරීමට පියවර ගන්නා බවත්, මීළඟ කාරක සභා රැස්වීමේදී මේ සම්බන්ධයෙන් විස්තරාත්මක ලෙස සාකච්ඡා කළ හැකි බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

යුධ සමයේදී ඉන්දියාවට සංක්‍රමණය වී උපාධිය හදාරා ලංකාවට පැමිණ ඇති ලාංකික ශිෂ්‍යයන්ගේ උපාධිය වෙනුවෙන් පිළිගැනීමක් ලබා දී අදාළ පත්වීම් ලබා දෙන ලෙසට ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදි.

ශ්‍රී ලාංකික ශිෂ්‍යයන් විදේශ විශ්ව විද්‍යාලයක් මගින් ලබා ගන්නා උපාධිය මෙරට රජය මගින් පිළිගැනීම පුද්ගලයා අනුව වෙනස් විය නොහැකි බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 1.5.2 ඉන්දියානු ධීවර යාත්‍රා මෙරට ධීවර කර්මාන්තයේ යෙදී සිටීම

ඉන්දියානු ධීවර යාත්‍රා මෙරට ධීවර කර්මාන්තයේ යෙදී සිටින නිසා දේශීය ධීවර ජනතාවට රැකියාවේ නියැලීමේ අවස්ථාව අහිමි වන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

මේ සම්බන්ධයෙන් ඉදිරි සතියේදී සාකච්ඡා කිරීමට අපේක්ෂා කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

## 1.6 ශ්‍රී ලාංකිකයන් මෙරටට ගෙන්වා ගැනීම - ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

මැද පෙරදිග රටවල සිරවී සිටින ශ්‍රී ලාංකිකයන්ට මෙරටට පැමිණීම සඳහා විදේශ අමාත්‍යාංශය විසින් ලිපියක් නිකුත් කරන්නේදැයි ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් විමසීමක් කරන ලදි.

නිතිපතා ක්‍රියාත්මක වන ගුවන් ගමන් මගින් පැමිණෙන ගුවන් මගීන් වෙනුවෙන් විශේෂ අවස්ථා ලෙස සලකා ලිපියක් නොව ඊ-මේල් අනුමැතියක් නිකුත් කරන බව අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

## 1.7 මඩකලපුව විශ්ව විද්‍යාලය වෙනුවෙන් මුදල් ලැබීම - ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

මඩකලපුව විශ්ව විද්‍යාලය වෙනුවෙන් මුදල් ලැබීම සම්බන්ධයෙන් විදේශ අමාත්‍යාංශය විසින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදු කර තිබේ ද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදි.

මේ සම්බන්ධයෙන් වෙනත් දෙපාර්තමේන්තුවක් විසින් පරීක්ෂණයක් සිදු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

**1.8 විදේශිකයන් පී.සී.ආර්. පරීක්ෂණයට ලක් කිරීම හා වෙනත් කරුණු - ගරු ෆයිසාල් කාසිම් මහතා**

**1.8.1 මෙරටට පැමිණෙන විදේශිකයන් නිරෝධායනයට යොමු කිරීම**

මෙරටට පැමිණෙන විදේශිකයන් පී.සී.ආර්. පරීක්ෂණයට ලක් කිරීමෙන් පසු නිරෝධායනයට යොමු කළ යුතු දැයි ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදි.

විදේශ සංචාරකයන් සම්බන්ධයෙන් මේ වනතෙක් සාකච්ඡා කර නොමැති බවත් ශ්‍රී ලාංකික මෙන්ම ජාත්‍යන්තර මට්ටමේ නිලධාරීන් පැමිණීමේදී පී.සී.ආර්. පරීක්ෂණය සිදු කිරීමෙන් පසු දින 14 ක් නිරෝධායනය විය යුතු බව අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

**1.8.2 නීත්‍යානුකූල නොවන ලෙස ඉන්දියාවට පිටවූ පුද්ගලයෙක් ඉන්දියානු රජය විසින් අත්අඩංගුවට ගෙන නිදහස් කිරීම**

නීත්‍යානුකූල නොවන ලෙස මෙරටින් ඉන්දියාවට පිටවූ පුද්ගලයෙක් ඉන්දියානු රජය විසින් අත්අඩංගුවට ගෙන නිදහස් කර ඇති බැවින් ඔහුව මෙරටට ගෙන්වා ගැනීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදි.

මේ සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා බව අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

**1.9 මාලදිවයිනේ සිටින ශ්‍රී ලාංකික ගුරුවරු හා සිසුන් කණ්ඩායමක් මෙරටට ගෙන්වා ගැනීම - ගරු ජගත් කුමාර මහතා**

මාලදිවයිනේ සිටින ශ්‍රී ලාංකික ගුරුවරු හා සිසුන් කණ්ඩායමක් නිවාඩුවට පැමිණීමට අපේක්ෂා කරන බැවින් ඒ සම්බන්ධයෙන් ගත හැකි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදි.

සතියක් ඇතුළත කණ්ඩායම් දෙකක් ලෙස හෝ මෙරටට ගෙන්වා ගැනීමට කටයුතු කරන බව අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

**1.10 මැද පෙරදිග රටවල සිට ශ්‍රී ලාංකිකයන් මෙරටට ගෙන්වා ගැනීම - ගරු ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා**

මැද පෙරදිග රටවල සිට මෙරටට පැමිණීමට බලාපොරොත්තුවෙන් සිටින ශ්‍රී ලාංකිකයන් පිරිසකගේ නම් ලැයිස්තුවක් තමන් විසින් භාර දී ඇති බැවින් ඒ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදි.

ශ්‍රී ලාංකිකයන් මෙරටට ගෙන්වීම සම්බන්ධයෙන් දීර්ඝ ලෙස සාකච්ඡා කළ බවත් ඒ සඳහා මැදිහත් වන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

**2.** කාරක සභාව මධ්‍යාහ්න 12.00ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

**විදුලිබල කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමුවැනි රැස්වීම - 2020 නොවැම්බර් 30**

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ගරු ඩලස් අලහප්පෙරුම මහතා (සභාපති)
ගරු දුමින්ද දිසානායක මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු සාරතී දුෂ්මන්ත මහතා
ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා
ගරු සමන්ප්‍රිය හේරත් මහතා

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු මහින්ද අමරවීර මහතා
ගරු රෝහණ දිසානායක මහතා
ගරු එම්. එස්. තවුෆික් මහතා
ගරු ශාන්ත බණ්ඩාර මහතා
ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා
ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා
ගරු මිලාන් ජයතිලක මහතා
ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා
ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා
ගරු ගුණතිලක රාජපක්ෂ මහතා
ගරු මධුර විතානගේ මහතා
ගරු ඩී. වීරසිංහ මහතා
ගරු වීරසුමන වීරසිංහ මහතා

**1. ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා**

**1.1 නොදන්වා සිදු කරනු ලබන විදුලි විසන්ධි කිරීම් - ගරු ශාන්ත බණ්ඩාර මහතා**

බොහෝ ප්‍රදේශවල සිදුවන පූර්ව දැනුම්දීමක් රහිත සහ විටින් විට සිදුවන විදුලි විසන්ධි කිරීම් මග හැරීම සඳහා "බන්ඩල් ක්‍රමය" (Bundle System) අනුගමනය කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදි.

සියළු අඩු රැහැන් (LT Overhead lines) ක්‍රමානුකූලව බන්ඩල්ගත කිරීම සඳහා තීරණය කර ඇති බවත්, අධිසැර (33KV) රැහැන් සඳහා මෙම ක්‍රමය අනුගමනය කරන බවත් විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

නඩත්තු කටයුතු සඳහා විදුලි විසන්ධි කිරීම් මසකට පමණ පෙර පුවත්පත් දැන්වීමක් පළ කිරීම මගින් දැනුම් දෙනු ලබන බවද දැනුම් දෙන ලදි.

විදුලි විසන්ධි කිරීම් අදාළ දිනට සතියකට පෙර මහජනතාවට දැනුම් දෙන ලෙස ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් නිලධාරීන්ට දැනුම් දෙන ලදි.

**1.2 තාක්ෂණය භාවිතා කර හදිසි විදුලි බිඳ වැටීමක දී බිඳ වැටීම සිදු වූ ස්ථානය සොයා ගැනීම - ගරු දුමින්ද දිසානායක මහතා**

විදුලි පද්ධතිය ජාලගත කිරීම මගින් හදිසි බිඳ වැටීමකදී ස්ථානය පහසුවෙන් සොයාගත හැකි බව ගරු රාජ්‍ය අමාත්‍ය දුමින්ද දිසානායක මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

ආසියානු සංවර්ධන බැංකුව මගින් ක්‍රියාත්මක ව්‍යාපෘතිය මගින් මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බව ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී විසින් දැනුම් දෙන ලදි.

**1.3 වීථි ලාම්පු පිළිබඳ යෝජනා**

**1.3.1 වීථි ලාම්පු සඳහා සූර්ය පැනල භාවිතා කිරීම - ගරු සමන්ප්‍රිය හේරත් මහතා**

ජනතාවට අත්‍යාවශ්‍ය සේවාවක් වන වීථි ලාම්පු සැපයීම, නඩත්තුව සහ පරිහරණය පිළිබඳ ගැටළු පවතින බැවින් සූර්යකෝෂ පද්ධති පළාත් පාලන ආයතනවලට ලබා දීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට යෝජනා කරන ලදී.

සූර්ය ශක්තියෙන් ක්‍රියාත්මක වන ලාම්පු විදුලිය රහිත ප්‍රදේශවලට ඉතාමත් ප්‍රයෝජනවත් බවත්, ඊට අදාළ වියදම ඉතා අධික බැවින් ඒ සඳහා නිසි ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලෙසත් ගරු මිලාන් ජයතිලක මහතා විසින් කාරක සභාව වෙත යෝජනා කරන ලදී.

වීථි ලාම්පුවක ක්ෂමතාවය සහ වීථි ලාම්පු දෙකක් අතර පරතරය වැනි කරුණු සම්බන්ධයෙන් නිර්නායක හඳුන්වා දෙන ලෙස ගරු මධුර විතානගේ මහතා විසින් කාරක සභාවට යෝජනා කරන ලදී.

**1.3.2 සූර්ය බලශක්ති වීථි ලාම්පු සවි කිරීම - ගරු දුමින්ද දිසානායක මහතා**

වීථි ලාම්පු සඳහා රජය වසරකට කරන වියදම සලකා බැලීමේදී සූර්ය බලශක්ති ලාම්පුවලට කරන වියදම දීර්ඝකාලීන වියදම් රහිත ආයෝජනයක් බව ගරු දුමින්ද දිසානායක මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

සූර්ය බලශක්ති ලාම්පු සපයන සමාගම මගින්ම නඩත්තු ගිවිසුමක් අත්සන් කිරීම මගින් දීර්ඝ කාලයක් අඩු වියදම් සහිත ක්‍රමයකට පරිවර්තනය විය හැකි බව ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදි.

සූර්ය බලශක්ති වීථි ලාම්පු සවිකළහොත් පළාත් පාලන ආයතන මගින් මේවායේ නඩත්තු කටයුතු නිසියාකාරව කරනු ලබයිද යන ගැටළුව නිසා මේ හා සමානව කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත්කර තිබූ යෝජනාව තාවකාලිකව නතර වී ඇති බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට පැහැදිලි කරන ලදී.

මෙය ඉතා වැදගත් යෝජනාවක් බැවින් ලංකා විදුලි බල මණ්ඩලය සහ ලංකා විදුලිබල පුද්ගලික සමාගම සමඟ සාකච්ඡා කර පළාත් පාලන ආයතන සඳහා අදාල නිර්ණායක සකස් කර ඉක්මනින් ලබාදෙන බවට ගරු අමාත්‍යතුමා සහ රාජ්‍ය අමාත්‍යතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

වීථි ලාම්පු සඳහා අනුගමනය කරනු ලබන ප්‍රතිපත්ති පිළිබඳව විදුලිබල අමාත්‍යාංශයේ, පුනර්ජනනීය බලශක්ති හා සංවර්ධන අධ්‍යක්ෂ, විසින් කාරක සභාවට විස්තර කරන ලදි.

**1.4 පළාත් පාලන ආයතනවලින් මහා මාර්ග සැකසීමේ ව්‍යාපෘතිවලදී විදුලි කණු ඉවත් කිරීමට සිදුවන අවස්ථාවල දී ඇතිවන දුෂ්කරතා - ගරු මිලාන් ජයතිලක මහතා**

මාර්ග සංවර්ධනය කරන අවස්ථාවලදී ස්ථාපනය කර ඇති විදුලි කණු මාර්ගයෙන් ඉවත් නොකර ඒවා තිබියදීම මාර්ග සංවර්ධනය කිරීම ගැටළු සහගත තත්ත්වයක් බව ගරු මිලාන් ජයතිලක මහතා විසින් කාරක සභාවේ අවධානයට යොමු කරන ලදී.

**1.5 පෞද්ගලිකව නිෂ්පාදනය කරනු ලබන සූර්ය ශක්තිය ප්‍රධාන විදුලිබල පද්ධතියට ලබාදීම - ගරු ෆයිසාල් කාසිම් මහතා**

අප රටේ දැනට ක්‍රියාත්මක කරන ක්‍රමය වෙනුවට ඇතැම් විදෙස් රටවල අනුගමනය කරන අන්දමට පෞද්ගලිකව නිෂ්පාදනය කරනු ලබන සූර්ය ශක්තිය ඍජුවම ජාතික විදුලි පද්ධතියට ලබාදීම පිළිබඳව සලකා බලන මෙන් ගරු ෆයිසාල් කාසිම් මහතා විසින් කාරක සභාවට යෝජනා කරන ලදී.

**1.6 කොළඹ අවට නාගරික ප්‍රදේශවල වීථි ලාම්පු කළමනාකරණය සම්බන්ධ ගැටළු - ගරු මධුර විතානගේ මහතා**

ලංකා විදුලිබල පුද්ගලික සමාගම මගින් විදුලිය ලබාදෙන ප්‍රදේශවල වීථි ලාම්පු ක්‍රියාත්මක කිරීම (switch on and off) අවිධිමත් සහ අනතුරුදායක බැවින් මේ සම්බන්ධව යම් විගණනයක් සිදුකරන ලෙස ගරු මධුර විතානගේ මහතා විසින් කාරක සභාවට යෝජනා කරන ලදි.

නඩත්තු කටයුතු වලදි ඉවත් කරන ගස් අතු සහ වෙනත් ද්‍රව්‍ය ඉවත් කිරීම් පළාත් පාලන ආයතන වෙත කොන්ත්‍රාත්තුවක් ලෙස ලබාදීම වඩාත් ඵලදායී බව ගරු මධුර විතානගේ මහතාට දැනුම් දෙන ලදි.

විදුලි කණු, ජලය ගලා යන කාණු අවහිර වන ලෙස ස්ථාපනයද ගැටළු සහගත බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදි.
මෙම කරුණු පිළිබඳව විමර්ශනයක් සිදු කර වාර්තා කරන ලෙස ලංකා විදුලි බල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීට සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

**1.7 මන්නාරම ප්‍රදේශයේ ග්‍රිඩ් උපපොල සම්බන්ධ ගැටළුව - ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**

මන්නාරම පුදුක්කාමම් ප්‍රදේශයේ ලංකා විදුලිබල මණ්ඩලයේ ග්‍රිඩ් උපපොල ඉදිකිරීම් ප්‍රමාද වී ඇති බව ගරු චාල්ස් නිර්මලනාදන් මහතා විසින් කාරක සභාවට දන්වා සිටින ලදී.

මීට අමතරව මන්නාරම ලංකා විදුලිබල මණ්ඩලය දිස්ත්‍රික් කාර්යාලය ඉතා පැරණි සහ ඉතා කුඩා ගොඩනැගිල්ලක පවත්වාගෙන යන බැවින් මෙය හොඳින් සැකසිය යුතු බවට කාරක සභාවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රීතුමා සඳහන් කරන කරුණු සම්බන්ධව විමර්ශනයක් කර වාර්තා කරන ලෙස ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීවරයාට ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**1.8 කෑගල්ල දිස්ත්‍රික්කයේ පවතින දැඩි ලෙස අකුණු ගැසීම් - ගරු සාරතී දුෂ්මන්ත මහතා**

දැඩි වර්ෂාපතනයක් සහ කඳු සහිත පරිසරය නිසා කෑගල්ල දිස්ත්‍රික්කයේ බොහෝ ප්‍රදේශවල නිවෙස් වලට අකුණු සැර වැදීම් අධික බැවින් එය වලක්වා ගැනීමට අකුණු සන්නායක ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම තත්ත්වය පිළිබඳව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පර්යේෂණ සිදුකර ඇති බැවින් ඊට අදාළ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී සාකච්ඡා කිරීම සිදු වූ බව ගරු මහින්ද අමරවීර අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.9 සවස් කාලය වනවිට ප්‍රදේශයේ විදුලිය අඩුවීම - ගරු ඩී. වීරසිංහ මහතා**

සවස් කාලය වනවිට ගුවන්විදුලි යන්ත්‍රයක් ක්‍රියාත්මක කරවීමටත් විදුලිය නොමැති බවට ප්‍රදේශවාසීන් පැමිණිලි කරන බවත්, මේ සඳහා යම්කිසි පිළියමක් යොදන ලෙසත් ගරු ඩී. වීරසිංහ මහතා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.

**1.10 සූර්ය බලශක්ති ඒකක සම්බන්ධව යම් නියාමන ක්‍රමවේදයක් තිබීම - ගරු බී.වයි.ජී. රත්නසේකර මහතා**

සියලුම උපකරණ ආනයනය කිරීමේදී සුනීත්‍ය බලශක්ති අධිකාරිය හරහා නියාමනය කරන බව ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙවැනි බලශක්ති පැනල සවි කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය සම්බන්ධ නොවන බවද ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

පොල්ගස් හෝ වෙනත් ගස් වර්ග කපා සූර්ය බලශක්ති ව්‍යාපෘති ඉදි කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය හරහා අනුග්‍රහයක් නොදක්වන බව ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.11 රෝහල් සඳහා සූර්ය විදුලි කෝෂ සවි කිරීම සහ වෙනත් කරුණු - ගරු ෆයිසාල් කාසීම් මහතා**

**1.11.1 රෝහල් සඳහා සූර්ය විදුලි කෝෂ සවි කිරීම**

රාජ්‍ය ආයතන සඳහා සූර්ය පැනල සවි කිරීමට ඉන්දියානු ණය යෝජනා ක්‍රමයක් පිළිබඳව සාකච්ඡා කරමින් පවතින බව ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී. මේ ක්‍රමය මගින් විදුලි බිල ශුන්‍ය කිරීමට යෝජනා වී ඇති බවද දැනුම් දෙන ලදී.

### 1.11.2 විදුලිබලය ලබාදීම සඳහා පෙරගෙවුම් සේවාවක් සැපයීම

ලංකා විදුලිබල මණ්ඩලයට සිදුවන පාඩුව අඩු කිරීම සඳහා යොදාගත හැකි තවත් උපක්‍රමයක් ලෙස පාරිභෝගිකයන් හට පෙර ගෙවුම් ක්‍රමයක් හඳුන්වා දීම සුදුසු බව ගරු ෆයිසාල් කාසීම් මහතා විසින් කාරක සභාවට යෝජනා කරන ලදි.

### 1.11.3 පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා ආරක්ෂක විදුලි පහන් ලෙස එල්ඊඩී (LED) බල්බ ලබාදීම

මේවනවිට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්හට ආරක්ෂක ලාම්පුවල දැඩි අවශ්‍යතාවයක් නොමැති බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සියලු දෙනාම සූර්ය පැනල සවිකර රටට ආදර්ශයක් ලබා දීම වඩා වැදගත් බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

## 1.12 කින්නියා ප්‍රදේශයේ විදුලි අධිකාරී කාර්යාලය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ලබා ගැනීම - ගරු එම්. එස්. තවුෆීක් මහතා

තාවකාලික ගොඩනැගිලිවල සිට ක්‍රියාත්මක වන මෙවැනි කාර්යාල ස්ථිර ගොඩනැගිලිවලට මාරු කිරීමේ වැඩසටහනක් ඇති බවත්, පවතින ආර්ථික දුෂ්කරතා නිසා එම ක්‍රියාවලිය සෙමෙන් සිදුවන බව ලංකා විදුලි බල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී විසින් දැනුම් දෙන ලදි.
මෙම කරුණ සඳහා ප්‍රමුඛතාවය ගෙන කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාව වෙත දන්වා සිටින ලදී.

## 1.13 මෙරටට ආනයනය කරනු ලබන ඉලෙක්ට්‍රොනික උපාංග අපහරණය කිරීමේ ක්‍රමවේදය පිළිබඳ විමසීම - ගරු මධුර විතානගේ මහතා

වර්තමානයේ ගෙන්වනු ලබන සූර්ය පැනල අනාගතයේදී අපහරණය කිරීමට සිදුවන අවස්ථාවේදී අදාළ සමාගමට හෝ අදාළ රටට ආපසු යැවීමට එකඟතාවය සහිතව ගෙන්වනු ලබන බවත් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ සභාපති විසින් කාරක සභාවට දන්වා සිටින ලදී.

ඉදිරි අනාගතයේදී අදාල සමාගම නොතිබුණහොත් ගනු ලබන ක්‍රියා මාර්ගය කුමක්ද යන්න පිළිබඳව ගරු රෝහණ දිසානායක මහතා විසින් විමසීමක් කරන ලදි.

නිවාස ලක්ෂය ව්‍යාපෘතියේ දී පමණක් රක්ෂණාවරණයක් ලබාගන්නේ නම් පවතින සමාගම මත යැපීමේ අවශ්‍යතාවයක් නොමැති බවත් ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

## 1.14 කිරින්ද සහ වීරකැටිය ගම්මාන දෙකකට විදුලිය ලබාගැනීම - ගරු මහින්ද අමරවීර මහතා

කිරින්ද ප්‍රදේශයේ නිවාස තිහක් පමණ ඇති ගම්මානයකට සහ වීරකැටිය ගුවන්විදුලි සංස්ථාව සමඟ ඇති ගම්මානයට විදුලිය ලබා දෙන ලෙස ගරු මහින්ද අමරවීර මහතා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

## 1.15 සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති මාලාව සම්බන්ධ විමසීම සහ වෙනත් කරුණු - ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා

### 1.15.1 එස් පවර් (Ace Power) ඇඹිලිපිටිය සමාගම සහ ලංකා විදුලිබල මණ්ඩලය සමග පවතින ගිවිසුම

එස් පවර් (Ace Power) ඇඹිලිපිටිය සමාගම සහ ලංකා විදුලිබල මණ්ඩලය සමග පවතින ගිවිසුම හා ක්‍රියාකාරකම් සම්බන්ධව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදි.

වාර්ෂිකව රටේ විදුලිබල අවශ්‍යතාවයේ වැඩිවීම එම විදුලිබල අවශ්‍යතාවය සඳහා පවතින ජනතා පද්ධතිවල ධාරිතාවයට වඩා ඉතා වැඩි බැවින් කළමනාකරණය පිළිබඳව ගැටළුවක් පවතින බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි. නමුත් 2025 වන විට පොසිල ඉන්ධන මගින් විදුලිය ලබා ගැනීම් ඉතා අඩු මට්ටමකට ගෙන ඒමට බලාපොරොත්තු වන බවද දැනුම් දෙන ලදි.

පුනර්ජනනීය බලශක්තිය භාවිතයේ ඉදිරි සැලසුම් ඇතුළත්ව ලංකා විදුලිබල මණ්ඩලයේ සැලසුම් පිළිබඳව ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට පැහැදිලි කරන ලදි.

### 1.15.2 ලංකා විදුලිබල මණ්ඩලයේ දූෂිත ගනුදෙනු හා සම්බන්ධ නිලධාරීන්ට දඬුවම් දීම්

ලංකා විදුලිබල මණ්ඩලය, මණ්ඩලයේ නියාමන ආයතනය වන මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ අනුමැතියක් නැතිව කිසිම අයුරකින් ගිවිසුම්ගත කාලය දීර්ඝ කිරීමට කටයුතු නොකරන බව අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාව වෙත දැනුම් දෙන ලදි.

ශ්‍රී ලංකා විදුලිබල පනතට අනුව කිසිම බලාගාරයක් ටෙන්ඩර් කිරීමක් නොමැතිව ක්‍රියාත්මක කිරීමට අනුමැතිය නොදෙන බව ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාව වෙත දැනුම් දෙන ලදී.

## 1.16 දහයියා වලින් විදුලිය ජනනය කිරීමට ඉදිරිපත් කර ඇති යෝජනාව - ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

තිස්සමහාරාම ප්‍රදේශයේ වී මෝල් හිමියකු දහයියා යොදාගෙන මෙගාවොට් 2.5 ක විදුලිබල නිෂ්පාදනය කිරීම සඳහා ඉල්ලීමක් කර ඇතත් මේ වන තෙක් අනුමැතිය ලැබී නැති බව ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා විසින් කාරක සභාවට දන්වා සිටින ලදී.

මෙලෙස නිෂ්පාදනය කරනු ලබන විදුලිය තමාගේ ප්‍රයෝජනය සඳහා භාවිතා කරන්නේ නම් එය ගැටලුවක් නොවන බව ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාව වෙත දැනුම් දෙන ලදී.

**1.17 ප්‍රසම්පාදනයේදී සිදුවන අක්‍රමිකතා වැලැක්වීම - ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා**

ප්‍රසම්පාදන ක්‍රමවේදය ක්‍රමවත් කිරීමට කටයුතු කරන බව ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දන්වා සිටින ලදී.

**2.** කාරක සභාව ප.ව. 04.00 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

**ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමු වැනි රැස්වීම - 2020 දෙසැම්බර් 01**

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ගරු විමල් රාජපක්ෂ මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
ගරු (මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු සී. බී. රත්නායක මහතා
ගරු චන්දිම වීරක්කොඩි මහතා
ගරු රෝහණ දිසානායක මහතා
ගරු ෆයිසාල් කාසිම් මහතා
ගරු එම්. එස්. තවුෆික් මහතා
ගරු ශාන්ත බණ්ඩාර මහතා
ගරු කේ. කාදර් මස්තාන් මහතා
ගරු අශෝක ප්‍රියන්ත මහතා
ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු අමරකීර්ති අතුකෝරළ මහතා
ගරු තිසකුට්ටි ආරච්චි මහතා
ගරු උදයන කිරිඳිගොඩ මහතා
ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා
ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා
ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා
ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා
ගරු අසංක නවරත්න මහතා
ගරු නිමල් පියතිස්ස මහතා
ගරු සුදත් මංජුල මහතා
ගරු අජිත් රාජපක්ෂ මහතා
ගරු ගුණතිලක රාජපක්ෂ මහතා
ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා
ගරු මධුර විතානගේ මහතා
ගරු වීරසුමන වීරසිංහ මහතා
ගරු ගෙවින්දු කුමාරතුංග මහතා
ගරු මර්ජාන් ෆලීල් මහතා

ගරු ඩයනා ගමගේ මහත්මිය

**1. අමාත්‍යාංශයීය කටයුතු පිළිබඳ සාකච්ඡාව**

**1.1. ඇළහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට පොලිස් ස්ථානයක් ලබා දීම හා වෙනත් කරුණු - ගරු අමරකීර්ති අතුකෝරළ මහතා**

ඇළහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි දියබෙදුම උප පොලිස් ස්ථානය, පොලිස් ස්ථානයක් ලෙස උසස් කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන බව අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඇළහැර ප්‍රදේශයේ සුළු පරිමාණ මැණික් කර්මාන්තයේ යෙදී සිටින ජනතාවට විශේෂ කාර්ය බලකාය වෙතින් එල්ල වී ඇති බලපෑම් සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මහා පරිමාණයෙන් මැණික් ගැරීමේ නියැලෙන ජනතාව සම්බන්ධයෙන් පමණක් නීතිය ක්‍රියාත්මක කරන ලෙස උපදෙස් ලබා දී ඇති බව අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.2. අලවතුගොඩ පොලිසිය සඳහා නව ගොඩනැගිල්ලක් වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කිරීම - ගරු ගුණතිලක රාජපක්ෂ මහතා**

යථෝක්ත ගොඩනැගිල්ලේ වැඩකටයුතු අවසන් වී නොමැති බැවින් පෙර ගොඩනැගිල්ල අලුත්වැඩියා කර රාජකාරි කටයුතුවලට යොදා ගැනීම සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ පිළිබඳ අවධානය යොමු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.3. මාතලේ නගර සභාව හා පොලිසිය අතර සිදුවූ ඉඩම් හුවමාරුව සහ කන්දෙනුවර ප්‍රදේශයේ පොලිස් ස්ථානයක් ස්ථාපනය කිරීම - ගරු රෝහණ දිසානායක මහතා**

**1.3.1. ඉඩම් හුවමාරු කර ගැනීම**

1997 කාලයේදී මාතලේ නගර සභාව හා පොලිසිය ඉඩම් හුවමාරුවක් සම්බන්ධයෙන් අත්සන් කරන ලද ගිවිසුම අනුව නගර සභාවට ලැබිය යුතුව තිබූ ඉඩම මෙතෙක් නොලැබුණු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.3.2. කන්දෙනුවර ප්‍රදේශයේ පොලිස් ස්ථානයක් ස්ථාපනය කරන ලෙස ඉල්ලීම**

උකුවෙල - කන්දෙනුවර ප්‍රදේශයේ පොලිස් ස්ථානයක් ස්ථාපනය කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ගරු මන්ත්‍රීතුමා විසින් සඳහන් කරන ලද ඉහත කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.4. රට තුළට මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සහ වෙනත් කරුණු - ගරු වීරසුමන වීරසිංහ මහතා

### 1.4.1. මත්ද්‍රව්‍ය රට තුළට ප්‍රවාහනය වීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම

මත්ද්‍රව්‍ය රට තුළට පැමිණීම බහුලව සිදුවන මාදුගඟේ මෝය කට සහ වැලිගම - පොල්අතුමෝදර මෝය කට යන ස්ථානවල නාවික හමුදාවේ සංචාරක මුරපොළවල් දෙකක් ස්ථාපනය කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.4.2. පොලිස් ස්ථානවල සීමා නිර්ණය ප්‍රායෝගික ලෙස තීරණය කිරීම

පනාකඩුව පොලිස් ස්ථානයට ඇතුළත් කර ඇති පිටබැද්දර ග්‍රාම නිලධාරි වසම් 3 නැවත පිටබැද්දර පොලිස් ස්ථානයට ඇතුළත් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.4.3. මාතර - කොටපොළ මහජන ක්‍රීඩාංගනය නිදහස් කිරීම

2010 වසරේදී විශේෂ කාර්ය බලකා මූලස්ථානයක් ස්ථාපනය කිරීම සඳහා තාවකාලිකව ලබා දුන් මාතර - කොටපොළ මහජන ක්‍රීඩාංගනය නිදහස් කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.5. වන ආශ්‍රිත ප්‍රදේශවල සිදුවන දැව විනාශය සහ වෙනත් කරුණු - ගරු සී.බී. රත්නායක මහතා

### 1.5.1. වන ආශ්‍රිත ප්‍රදේශවල සිදුවන දැව විනාශය

වන ආශ්‍රිත ප්‍රදේශවල සිදු වන දැව විනාශය වැළැක්වීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ සහයෝගය ලබා දෙන ලෙස ගරු අමාත්‍යතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.
වන සංහාරය සිදු වීම වැළැක්වීම සම්බන්ධයෙන් ආරක්ෂක අංශය ක්‍රියාත්මක වන බවත් උතුරු නැගෙනහිර පළාත්වල සිදු වන වන සංහාරය සම්බන්ධයෙන් කටයුතු කිරීමට ආරක්ෂක අංශයට උපදෙස් ලබා දී ඇති බවත් අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.5.2. නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ සිදුවන ස්වාභාවික ආපදා

නුවරඑළිය දිස්ත්‍රික්කයේ ස්වාභාවික ආපදාවලදී ක්ෂණිකව ක්‍රියාත්මක වීමට හැකි කාර්යක්ෂම කාර්ය මණ්ඩලයක අවශ්‍යතාවයත් ප්‍රතිපාදන ලැබී ඇති නමුත් ඉඩම් ලබා ගැනීම ගැටළුවක් වී ඇති අධි අවදානම් ප්‍රදේශවල පවුල් සඳහා නිවාස ඉදි කිරීම් කටයුතු පිළිබඳවත් අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

හදිසි ආපදාවකදී ක්‍රියාත්මක වීමට නුවරඑළිය දිස්ත්‍රික්කයට අනුබද්ධිත කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ගේ වැඩි කිරීමක් සිදු කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 5 ට නිලධාරීන් 5 දෙනෙක් අනුයුක්ත කර ඇති බව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එමෙන්ම වතු ආශ්‍රිත සමාගම් සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කර අවශ්‍ය ඉඩම් ලබා ගැනීම සම්බන්ධයෙන් සාකච්ඡා කළ හැකි බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.5.3. තිස්පනේ ප්‍රදේශය වෙනුවෙන් පොලිස් ස්ථානයක් ස්ථාපනය කිරීම

මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු අමාත්‍යතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ගරු මහජන ආරක්ෂක අමාත්‍යතුමා සමඟ සාකච්ඡා කර පොලිස් ස්ථාන වැඩි කිරීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.5.4. කිතුල් කර්මාන්තයේ නියැලෙන ජනතාව සම්බන්ධයෙන් අසාධාරණ ලෙස නීතිය ක්‍රියාත්මක වීම

මෙය වැළැක්වීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු බව ගරු අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

වැවිලි අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර කිතුල් කර්මාන්තය ශක්තිමත් කිරීමට පියවර ගන්නා බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.6. සෑම පොලිස් ස්ථානයකටම නීතිඥවරු පත් කිරීම සහ මත්ද්‍රව්‍ය ජාවාරම පාලනය කිරීම - ගරු උදයන කිරිඳිගොඩ මහතා

### 1.6.1. සෑම පොලිස් ස්ථානයකටම නඩු මෙහෙයවීම සඳහා නීතිඥවරු පත් කිරීම

නඩු ප්‍රමාදය අඩු කර නඩු නිසිලෙස මෙහෙයවීම ආදී කරුණු කිහිපයක් වෙනුවෙන් සෑම පොලිස් ස්ථානයකටම නඩු මෙහෙයවීම සඳහා නීතිඥවරු පත් කිරීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.6.2. මත්ද්‍රව්‍ය ජාවාරම පාලනය කිරීම

මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් අඩු කිරීම සඳහා ඔවුන් පුනරුත්ථාපනය විධිමත්ව සංවිධානය කළ යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

විශාල පිරිසක් අන්තරාදායක ඖෂධ පාලක මණ්ඩලය යටතේ පුනරුත්ථාපනය කිරීමට අවශ්‍ය වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරන බව අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.7. ලන්දේසි බලකොටු භූමියේ පිහිටි රුවන්වැල්ල පොලිස් ස්ථානය වෙනත් ස්ථානයකට රැගෙන යාම සහ වෙනත් කරුණු - ගරු සුදත් මංජුල මහතා

### 1.7.1. ලන්දේසි බලකොටු භූමියේ පිහිටි රුවන්වැල්ල පොලිස් ස්ථානයකට වෙනත් ස්ථානයට රැගෙන යාම

මෙම පොලිස් ස්ථානය වෙනත් ස්ථානයකට රැගෙන යන ලෙස හෝ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සමඟ එකඟතාවයකට එළැඹී පොලිස් ස්ථානය මෙහිම පවත්වාගෙන යාම සඳහා සහයෝගය ලබා ගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.7.2. ගලපිටමඩ නගරය කේන්ද්‍ර කරගෙන පොලිස් ස්ථානයක් ස්ථාපනය කිරීම

ගලපිටමඩ නගරය කේන්ද්‍ර කරගෙන පොලිස් ස්ථානයක් ස්ථාපනය කරන ලෙසත් ඒ සඳහා ගලපිටමඩ - ඌරුවල ගමේ වසා ඇති පාසල යොදා ගත හැකි බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එම ස්ථානයෙහි පොලිස් මුරපොළක් තාවකාලිකව ස්ථාපනය කිරීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එමෙන්ම මෙම තත්ත්වය පොලිස්පතිතුමාගේ අවධානයට යොමු කරන බවද ගරු සභාපතිතුමා විසින් තවදුරටත් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.7.3. දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය වෙනුවෙන් පොලිසියක් ස්ථාපනය කිරීම

දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය වෙනුවෙන් පොලිසියක් ස්ථාපනය කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 1.8. අකුරැස්ස පොලිස් ස්ථානයේ පොලිස් නිලධාරින්ගේ හිඟය - ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 1.9. පොලිස් ස්ථානවල පොලිස් නිලධාරින්ගේ අඩුවක් පෙනීයාම සහ වෙනත් කරුණු - ගරු මධුර විතානගේ මහතා

### 1.9.1. පොලිස් ස්ථානවල පොලිස් නිලධාරින්ගේ අඩුවක් නිරීක්ෂණය වීම

මෙම කරුණ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.9.2. මත්ද්‍රව්‍ය භාවිතා කරන තරුණ පිරිස වෙනම බන්ධනාගාරයකට යොමු කිරීම

මෙම පිරිස වෙනම බන්ධනාගාරයකට යොමු කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.9.3. සඳහිරුසැයට ග්‍රැනයිට් සැපයීම සම්බන්ධයෙන් වූ ටෙන්ඩරය

මෙම ක්‍රියාවලිය නිසි ක්‍රමවේදයට අනුව සිදු වී නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම සම්පූර්ණ ටෙන්ඩර් පරිපාටිය විනිවිදභාවයකින් යුතුව සිදුව ඇති බව අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.9.4. ජාතික ආරක්ෂාව පිළිබඳ විවිධ පාර්ශව විසින් කරනු ලබන ප්‍රකාශ අධීක්ෂණය කිරීම

මෙම කරුණ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.9.5. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ, පොලිස් බල ප්‍රදේශ හා ග්‍රාම නිලධාරි කොට්ඨාශ සම්බන්ධයෙන් නැවත සීමා නිර්ණය කිරීම

වර්තමානයේදී ජන සනත්වය වෙනස් වී ඇති බැවින් මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ වනවිට පත් කර ඇති සීමා නිර්ණය කොමිසම සමඟ මේ සම්බන්ධයෙන් කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.10. මන්නාරම දිස්ත්‍රික්කයේ ආරක්ෂාව සම්බන්ධ ගැටළු - ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

### 1.10.1. හමුදා කඳවුරු සඳහා මන්නාරම දිස්ත්‍රික්කයේ ඉඩම් අත්පත් කර ගැනීම

මන්නාරම දිස්ත්‍රික්කයේ මාන්තායි නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අක්කර 3500 ක ඉඩම් ප්‍රමාණයක් හමුදා කඳවුරු සඳහා අලුතින් අත්පත් කර ගැනීම නිසා එම ජනතාවට තම ජීවනෝපායන් සිදු කර ගැනීමට දුෂ්කරතා ඇතිවී තිබෙන බැවින් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශයේ ලේකම්ට උපදෙස් ලබා දෙන ලදී.

### 1.10.2. මන්නාරම දිස්ත්‍රික්කයේ පවතින ප්‍රචණ්ඩ ක්‍රියා

මන්නාරම් දිස්ත්‍රික්කයේ පදිංචි එක්තරා පුද්ගලයෙක් විසින් ප්‍රදේශය තුළ ප්‍රචණ්ඩ ක්‍රියා සහ වෙනත් ජාවාරම්වල නිරත වන බවත් ඔහුට විරුද්ධව දැඩි නීති පියවර ගන්නා ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ සම්බන්ධයෙන් තමා පෞද්ගලිකව අවධානය යොමු කරන බව අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.10.3. උතුරු පළාතේ පොලිස් මුරපොළවල් සංඛ්‍යාව සීමා කිරීම**

උතුරු පළාතේ ස්ථානගත කර ඇති පොලිස් ආරක්ෂක මුරපොළවල් සංඛ්‍යාව වැඩි වීම මත මහජනතාව නොයෙකුත් පීඩාවන්වලට මුහුණපාන බැවින් ඒවා සීමා කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ආරක්ෂක තත්ත්වය පිළිබඳ විග්‍රහයක් සිදු කිරීමෙන් පසු පමණක් අවශ්‍ය මුරපොළවල් සංඛ්‍යාව තීරණය කරන නමුත් මෙම ඉල්ලීම සලකා මුරපොළවල් සංඛ්‍යාව අඩු කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කරන බව අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.11. කිලිනොච්චි නගරයේ පුස්තකාලයක් ඉදි කිරීම සඳහා වෙන් කර ඇති ඉඩම නිදහස් කිරීම - ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**

කිලිනොච්චි නගරයේ මහජන පුස්තකාලයක් ඉදි කිරීම සඳහා වෙන් කර ඇති ඉඩමෙන් කොටසක් හමුදාව යටතේ ඇති බැවින් එම ඉඩම් කොටස නිදහස් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

මෙම ඉඩම් කොටස ඉක්මණින් නිදහස් කළ යුතු බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.12. ගාල්ල කොටුව තුළ ස්ථාපිත නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය වෙනත් තැනකට ගෙනයාම හා ගාල්ල දිස්ත්‍රික්කය ආශ්‍රිත වෙනත් ගැටළු - ගරු චන්දිම වීරක්කොඩි මහතා**

**1.12.1. ගාල්ල කොටුව තුළ ස්ථාපිත නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය**

ගාල්ල කොටුවෙහි ස්ථාපිත නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය වෙනත් ස්ථානයකට යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම පොලීසිය පොලිස් කෞතුකාගාරයක් ලෙස පවත්වාගෙන යාමට යෝජනා වී ඇති බව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ප්‍රියන්ත වීරසූරිය මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.12.2. පොලිසිය සඳහා ගොඩනැගිලි ඉදි කිරීමේදී ගෘහනිර්මාණ සැලසුම්කරණය කෙරෙහි අවධානය යොමු කිරීම**

පොලිසිය සඳහා ගොඩනැගිලි ඉදි කිරීමේදී පරිසර වටපිටාවට ගැළපෙන පරිදි ගෘහනිර්මාණ සැලසුම්කරණය කර ඉදි කිරීම් සිදු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**1.12.3. නාගරික සංවර්ධන අධිකාරියට ඉඩම නිදහස් කිරීම**

හබරාදුව පොලිස් නිල නිවාස සඳහා වෙන් කර ඇති ඉඩමෙහි ඉතිරි ඉඩම් ප්‍රමාණය නාගරික සංවර්ධන අධිකාරියට නිදහස් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

අදාළ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී මෙම කරුණ පිළිබඳව අවධානය යොමු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ප්‍රියන්ත වීරසූරිය මහතා වෙත උපදෙස් ලබා දෙන ලදී.

### 1.12.4. හබරාදූව පොලිසිය ස්ථාපනය කිරීම

හබරාදූව පොලිසිය සඳහා වෙන් කර ඇති ඉඩමෙහි පොලිසිය ස්ථාපනය කිරීම සඳහා අදාළ ඉදි කිරීම් සිදු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.12.5. උණවටුන සංචාරක පොලිස් ස්ථානයක් ඇති කිරීම

මෙම කාර්යය සඳහා වෙන් කර දී ඇති ස්ථානයෙහි ඉදිකිරීම් කටයුතු සිදු නොවන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන බව අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.12.6. හපුගල ප්‍රදේශය ආශ්‍රිතව පොලිස් ස්ථානයක් ස්ථාපනය කිරීම

මේ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.12.7. ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලයේ ක්‍රීඩාංගනය සඳහා බූස්ස තුරඟ තරඟ පිටිය යොදා ගැනීම

ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලය සඳහා ක්‍රීඩාංගනයක් අවශ්‍ය බැවින් ඒ සඳහා බූස්ස තුරඟ තරඟ පිටිය යොදා ගත හැකි බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

බූස්ස ශ්‍රී ලංකා යුද්ධ හමුදා කඳවුරු භූමියෙන්, අධිකරණ අමාත්‍යාංශය වෙත නව උසාවි සංකීර්ණය ඉදි කිරීම සඳහා ලබා දුන් ඉඩම, එම කාර්යය සඳහා යොදා නොගන්නා බැවින් නැවත ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත පවරා දෙන ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.12.8. ගාල්ල ශ්‍රවණාගාරය සෑදීම

ගාල්ල ශ්‍රවණාගාරය සෑදීම කුමන ආයතනයක් යටතේ සිදු වන්නේද යන්න ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් විමසීමක් කරන ලදී.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට වෙන්වූ ප්‍රතිපාදන මගින් "Mix Development ව්‍යාපෘතිය" යටතේ මෙහි කටයුතු සිදු කෙරෙන බව ප්‍රධාන මූල්‍ය නිලධාරි, තාරක ලියනපතිරණ මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සවිස්තරාත්මක වාර්තාවක් ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් රාජ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී.

### 1.12.9. නාවික හමුදාවට භාර දී ඇති ගොඩනැගිලි සංකීර්ණය නාගරික සංවර්ධන අධිකාරියට නිදහස් කිරීම

ගාල්ලේ නාවික හමුදා කඳවුර ඉදිරියෙන් පිහිටි නාවික හමුදාවට භාර දී ඇති ගොඩනැගිලි සංකීර්ණය නාගරික සංවර්ධන අධිකාරියට නිදහස් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන බව අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.13. බල්ලකැටුව සඳහා පොලිස් ස්ථානයක් ස්ථාපනය කිරීම හා කොවිඩ් පාලනය කිරීමේ කටයුතු සඳහා සිවිල් ආරක්ෂක බලකායේ කණ්ඩායම් පොලිසියට අනුබද්ධ කිරීම - ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

### 1.13.1. බල්ලකැටුව නගරයට පොලිස් ස්ථානයක් ස්ථාපනය කිරීම

මේ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ පිළිබඳ අවධානය යොමු කරන බව අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

### 1.13.2. කොවිඩ් පාලනය කිරීමේ කටයුතු සඳහා සිවිල් ආරක්ෂක බලකායේ කණ්ඩායම් පොලිසියට අනුබද්ධ කිරීම

බදුල්ල, බණ්ඩාරවෙල ප්‍රදේශවල ක්‍රියාත්මක වන කොවිඩ් පාලනය කිරීමේ කටයුතු සඳහා සිවිල් ආරක්ෂක බලකායේ කණ්ඩායම් පොලිසියට අනුබද්ධ කිරීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.14. මහර බන්ධනාගාරයේ ඇතිවූ කලහකාරී තත්ත්වය පිළිබඳ විමසීම - ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා

මානසික ව්‍යාකූලතා වෙනුවෙන් ලබා දෙන ඖෂධ අධි මාත්‍රාවෙන් භාවිතා කිරීම තුළින් මෙම කලහකාරී තත්ත්වය ඇති වී ඇති බව අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම ඖෂධ විශාල ප්‍රමාණයක් ගබඩාවේ තිබීම සම්බන්ධයෙන් මහර බන්ධනාගාරයේ වෛද්‍යවරයා පිළිබඳව පරීක්ෂණයක් පවත්වන බවත් පවතින කලහකාරී තත්ත්වය අද දින තුළ සම්පූර්ණයෙන්ම පාලනය කිරීමට අපේක්ෂා කරන බවත් අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.15. රන්මිණිතැන්න ටෙලි සිනමා ගම්මානයේ නඩත්තු කටයුතුවල පසුබෑමක් සිදු වීම සහ රිය පැදවීමේදී සිදු කරන වැරදි සම්බන්ධයෙන් දඩ මුදල් ගෙවීම - ගරු ඩයනා ගමගේ මහත්මිය

### 1.15.1. රන්මිණිතැන්න ටෙලි සිනමා ගම්මානයේ නඩත්තු කටයුතුවල පසුබෑමක් සිදු වීම

මෙහි නඩත්තු කටයුතු සිදු කරන නාවික හමුදාවේ නිලධාරින් සංඛ්‍යාවේ අඩු කිරීමක් සිදු කිරීම නිසා මෙම කටයුතුවල පසුබෑමක් සිදුව ඇති බව ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 1.15.2. රිය පැදවීමේදී සිදු කරන වැරදි සම්බන්ධයෙන් දඩ මුදල් ගෙවීම

රිය පැදවීමේදී සිදු කරන වැරදි සම්බන්ධයෙන් දඩ මුදල් ගෙවීම සඳහා අදාළ පුද්ගලයා පදිංචි ලිපිනයට ආසන්න යම් ස්ථානයකට යොමු කිරීමට කටයුතු කිරීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

මේ සම්බන්ධයෙන් ඉක්මණින් සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කිරීමට අපේක්ෂා කරන බව අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

## 1.16. සම්මන්තුරෙයි පොලිස් වසමේ සිදුවන මත්ද්‍රව්‍ය ජාවාරම සහ අක්කරෙයිපත්තුව පොලිස් වසම තුළ මාර්ග බාධක යොදා තිබීම - ගරු ෆයිසාල් කාසිම් මහතා

### 1.16.1. සම්මන්තුරෙයි පොලිස් වසමේ සිදුවන මත්ද්‍රව්‍ය ජාවාරම

මේ සම්බන්ධයෙන් සම්මන්තුරෙයි පොලිසියට හා අදාළ අංශවලට පැමිණිලි කළ නමුත් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත් බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.16.2. අක්කරෙයිපත්තුව පොලිස් වසම තුළ මාර්ග බාධක යොදා තිබීම

කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් මෙසේ විවිධ මාර්ග බාධක යොදා තිබීම නිසා ජනතාවට තම ගොවිතැන් කටයුතුවල නිරත වීමට බාධා ඇති වී තිබෙන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් යුධ හමුදාපති දැනුවත් කරන ලෙස අමාත්‍යාංශයේ ලේකම් විසින් ශ්‍රී ලංකා යුධ හමුදාවේ මාණ්ඩලික ප්‍රධානී වෙත උපදෙස් ලබා දෙන ලදී.

**1.17. බිංගිරිය "බෙන්ජි" කර්මාන්ත ශාලාවෙහි ප්‍රවාහන අංශයේ ගැටළුකාරී තත්ත්වය සහ කුරුණෑගල දිස්ත්‍රික්කයේ රණවිරුවන් වෙනුවෙන් සුබසාධන මධ්‍යස්ථානයක් ලබා දීම - ගරු අසංක නවරත්න මහතා**

**1.17.1. බිංගිරිය කර්මාන්තපුරයෙහි "බෙන්ජි" කර්මාන්ත ශාලාවෙහි ප්‍රවාහන අංශයේ ගැටළුකාරී තත්ත්වය**

මෙම තත්ත්වය සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

මෙය ආරක්ෂක අමාත්‍යාංශයේ විෂය පථයට අයත් නොවන බව අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.17.2. කුරුණෑගල දිස්ත්‍රික්කයේ රණවිරුවන් වෙනුවෙන් සුබසාධන මධ්‍යස්ථානයක් ලබා දීම**

මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන බව අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.18. මනිඅරසම්කුලම් ප්‍රදේශයේ ජනතාවට අධිකරණ කටයුතු සඳහා සහනයක් සැලසීම - ගරු එම්. එස්. තවුෆික් මහතා**

මනිඅරසම්කුලම් පොලිස් මුරපොළ කින්නියා පොලිස් ස්ථානය යටතේ ස්ථාපිත කිරීමෙන් එම ප්‍රදේශයේ ජනතාවට අධිකරණ කටයුතුවලට පහසුවක් වන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙය අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ගත යුතු තීරණයක් බව අමාත්‍යාංශයේ නිලධාරීන් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.** කාරක සභාව ප.ව. 12.30 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

**වෙළෙඳ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමු වැනි රැස්වීම - 2020 දෙසැම්බර් 01**

**පැමිණ සිටි සාමාජික මන්ත්‍රීන්**

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (සභාපති)
ගරු ලසන්ත අලගියවන්න මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු රෝහණ දිසානායක මහතා
ගරු නිරෝෂන් පෙරේරා මහතා
ගරු නලින් ප්‍රනාන්දු මහතා
ගරු මර්ජාන් ෆලීල් මහතා

**පැමිණ සිටි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු මහින්ද අමරවීර මහතා
ගරු ජානක වක්කුඹුර මහතා
ගරු ශාන්ත බණ්ඩාර මහතා
ගරු කේ. කාදර් මස්තාන් මහතා
ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු අමරකීර්ති අතුකෝරළ මහතා
ගරු ලලිත් එල්ලාවල මහතා
ගරු උදයන කිරිඳිගොඩ මහතා
ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා
ගරු මිලාන් ජයතිලක මහතා
ගරු අනුප පස්කුවල් මහතා
ගරු සුදත් මංජුල මහතා
ගරු මායාදුන්න චින්තක අමල් මහතා
ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා
ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා
ගරු වීරසුමන වීරසිංහ මහතා

**1. ගරු සභාපතිතුමාගේ නිවේදන**

වෙළෙඳ අමාත්‍යාංශය දෙපාර්තමේන්තු 03 කින් හා ව්‍යවස්ථාපිත ආයතන 06 කින් සමන්විත වන අතර ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් සකස් කිරීම, අපනයන අමාත්‍ය මණ්ඩල සභාව නැවත පිහිටුවීම, 2003 අංක 26 දරන බුද්ධිමය දේපල පනත සංශෝධනය කිරීම, රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ ප්‍රදර්ශනාගාරය පුළුල් කර " රජවාස " නමින් අලෙවි මධ්‍යස්ථානයක් පිහිටුවීම, රාජ්‍ය වගකීමක් සහිත දැරිය හැකි මුදලකට අත්‍යාවශ්‍ය පරිභෝජන ද්‍රව්‍ය බෙදා හැරීමේ කුඩා අලෙවි සැල් (Q- Shop) ජාලයක් රට පුරා ස්ථාපිත කිරීම, පාරිභෝගික ද්‍රව්‍ය නිවෙස් වෙත ක්ෂණිකව බෙදා හැරීමේ වැඩ පිළිවෙළක් (Q –Delivery) ක්‍රියාත්මක කිරීමට සැළසුම් කිරීම, ලංකා සතොස ආයතනයේ ව්‍යෝහාරික විගණනයක් සිදු කිරීම, සමස්ථ සතොස අලෙවි සැල් ජාලයට ඊ - විස් පද්ධතිය ස්ථාපනය කිරීම, සමුපකාර ක්ෂේත්‍රයේ පූර්ණ ප්‍රතිසංවිධානයක් සඳහා නිර්දේශ ලබා ගැනීමට විද්වත් කමිටුවක් පත් කිරීම යන කාර්යයන් සඳහා ඉදිරි වර්ෂයේදි බලාපොරොත්තු වන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

යෝජිත කිව් ෂොප් පිහිටුවීම සහ පවත්වාගෙන යාම පිළිබඳව ගරු මන්ත්‍රීවරුන් නඟන ලද ප්‍රශ්නවලට ගරු සභාපතිතුමා විසින් පිළිතුරු ලබා දීමට කටයුතු කරන ලදී.

**2. වෙනත් කටයුතු**

## 2.1 ගරු රෝහණ දිසානායක මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 2.1.1. මාතලේ, මඩවල සතොස ශාඛාව වසා දැමීම - ගරු රෝහණ දිසානායක මහතා

මාතලේ, මඩවල ප්‍රදේශයේ වෙළඳාමෙන් අධික ලාභ ලැබූ සතොස ශාඛාව වසා දැමීම පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලද අතර, විසඳුමක් ලෙස අඩු කුලී පදනමට වෙනත් ස්ථානයක් සොයා දීමට හැකි බව ද කාරක සභාවට අවධාරණය කරන ලදී.

කුලී පදනමට ගෙන ඇති මෙම ශාඛාව පැවැත්වූ ගොඩනැගිල්ලේ මාසික කුලිය රුපියල් 40,000/- කින් ඉහළ නැංවීම නිසා නැවත ගොඩනැගිල්ල භාර දීමට සිදු වූ බැවින් වසා දැමීමට සිදුවූ බව ලංකා සතොස සමාගමේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

### 2.1.2. සමූපකාර ව්‍යාපාරයේ අරමුණු

සමූපකාර ව්‍යාපාරයෙහි මූලික අරමුණ විය යුත්තේ විවෘත වෙළඳ පොළෙහි බඩු මිල ඉහල යාමට සහන මිළට ජනතාවට අවශ්‍ය ද්‍රව්‍ය ලබාදීම විය යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම කරුණු ගැන විද්වත් කමිටුවක් මගින් පරීක්ෂණයක් ඉදිරියේදී සිදු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 2.2 සතොස ආයතනයේ වර්ෂ 20 ක ක්‍රියාකාරකම් - ගරු නලින් ප්‍රනාන්දු මහතා

සතොස ආයතනයේ සභාපති වශයෙන් අවුරුදු 10 ක් පමණ තමා කටයුතු කළ බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

300 ක් පමණ තිබූ සතොස ජාලය වෙළඳ ස්ථාන 100 කින් වැඩි වුවද ආදායම වෙනස් වී නොමැති අතර සේවක සංඛ්‍යාව 1500 කින් පමණ වැඩි වී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

නමුත් වෙළඳ ව්‍යාපාරයක් ලෙස මෙම ජාලය සංවර්ධනය කිරීමට දීර්ඝකාලීන සැලසුම් අළුතින් සොයා ගත යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.
තුනෙන් එකකට වැඩි ශාඛා සංඛ්‍යාවක් බස්නාහිර පළාතේ තිබියදී ප්‍රධාන තොග බෙදා හැරීමේ මධ්‍යස්ථානයක් බූස්සේ පිහිටුවීම මගින් ප්‍රවාහනය නිසා විශාල මුදල් නාස්තියක් සිදුවන බව ගරු මන්ත්‍රීතුමා විසින් තව දුරටත් කාරක සභාවට දැනුම් දෙන ලදි.

## 2.3 මාතර, පිටබැද්දර සතොස ශාඛාව වසා දැමීමට ආසන්න තත්වයේ පැවතීම - ගරු වීරසුමන වීරසිංහ මහතා

මෙතෙක් ක්‍රියාත්මක වූ කිසිදු සතොස ශාඛාවක් වසා නොදමන බවත්, එවැනි ශාඛාවක කුලී පදනමේ ගැටලුවක් මතු වුව හොත් ඊට විසඳුම් ස්ථානයක් යෝජනා කරන ලෙස එම ප්‍රදේශයන් හි ගරු මන්ත්‍රීවරුන්ටද පැවරෙන වගකීමක් බවත් ඒ සඳහා ඉල්ලීමක්ද කරන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

ප්‍රදේශයේ රාජ්‍ය ආයතනයන්හි ඉඩකඩ ලබා ගත හැකි අවස්ථාවන්හිදී සතොස ආයතන ඒවායේ පිහිටුවීමට කාරක සභාවට පැමිණ සිටි මන්ත්‍රීවරුන් ඉදිරිපත් කළ යෝජනාවක් සම්බන්ධව ඉදිරියේදී දැඩි අවධානයක් යොමු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 2.4 සමූපකාර පනත අයථා ලෙස භාවිතා කිරීම - ගරු උදයන කිරිඳිගොඩ මහතා

සමූපකාර ව්‍යාපාරය තුළ සමූපකාර පනත අයුතු ලෙස භාවිතා කරමින්, ප්‍රාග්ධන මූල්‍ය බැංකු, මහනුවර දිස්ත්‍රික්කයේ වාහන ආනයනකරුවන්ගේ සමිතිය නමින් සමිති ද පිහිටුවා ගනිමින් මුදල් වංචා කරන අවස්ථා ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි. පනත සංශෝධනය විය යුතු බවද ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

එවැනි අකටයුතුකම් පිළිබඳව තම ප්‍රදේශවල ප්‍රාදේශීය සංගම් මගින් වාර්තා වන අවස්ථා කාරක සභාවට දන්වන ලෙස ගරු මන්ත්‍රීවරුන්ට රාජ්‍ය අමාත්‍ය ගරු ලසන්ත අලගියවන්න මහතා විසින් දැනුම් දෙන ලදි.

සමූපකාර ව්‍යාපාරය ඉදිරියේදී සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන ක්‍රමවේදය පිළිබඳව රාජ්‍ය අමාත්‍ය ගරු ලසන්ත අලගියවන්න මහතා විසින් කාරක සභාව දැනුවත් කරන ලදී.

ඉදිරියේදී සතොස ව්‍යාපාරයේ පිහිටි ප්‍රදේශයේ රැකියා ඇතිවීමේදී අදාල ප්‍රදේශයෙන්ම බඳවා ගැනීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 2.5 ගරු ජානක වක්කුඹුර මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 2.5.1. දුඹුරු සීනි සඳහා මිල පහත හෙළීම

දුඹුරු සීනි සඳහා උපරිම සිල්ලර මිල කිලෝ එකක් සඳහා රු.135/- වන ලෙස අලෙවි කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ලංකා සතොස සමාගමේ සභාපතිවරයාට උපදෙස් ලබා දෙන ලදී.

### 2.5.2. සමූපකාර සංගම් තුළ නිලධාරින් පත් කිරීමේ, මාරු කිරීමේ ගැටළු

සමූපකාර සංගම් තුළ සාමාන්‍යාධිකාරි තනතුරට පුද්ගලයින් පත්කිරීම, මාරු කිරීම, ඉවත් කිරීම, විශ්‍රාම යෑම යන කරුණු වලදී සමූපකාර පනත හෝ සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීමෙන් එම තනතුරේ නිලධාරිවාදය නැති කළ හැකි බව ගරු ජානක වක්කුඹුර මහතා විසින් කාරක සභාවට පෙන්වා දෙන ලදී.

සමූපකාර සංගම් මගින් සිදු කෙරෙන පත්වීම් සළකා බලන සමූපකාර විද්වත් කමිටුවට මෙම ප්‍රාදේශිය සංගම් වල ගැටළුකාරි පත්වීම් ලිපි යොමු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට උපදෙස් දෙන ලදි.

සමූපකාර සංගම් පිළිබඳව ප්‍රශ්න මතු වී ඇති ප්‍රදේශ වල ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ලිඛිතව කැඳවා පළාත් කොමසාරිස්වරු, පළාත් ආණ්ඩුකාරවරු සමඟ සාකාච්ඡා කිරීමට විශේෂ උපදේශක කාරක සභාවක් ඉදිරියේදී කැඳවන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

## 2.6 ගරු චාල්ස් නිර්මලනාදන් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 2.6.1. මන්නාරම දිස්ත්‍රික්කයේ මඩු ප්‍රදේශයේ සතොස ආයතනය

මන්නාරම දිස්ත්‍රික්කයේ මඩු ප්‍රදේශයේ සතොස ආයතනය ව්‍යාපාරිකව ලාභ ඉපැයීම පහළ මට්ටමක ඇති හෙයින් වසා දැමීමේ තර්ජනයකට ලක්ව ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 2.6.2. උතුරු පළාත් සමූපකාර පුහුණු මධ්‍යස්ථානය නැවත ලබා ගැනීම

වව්නියාවේ පිහිටි උතුරු පළාත් සමූපකාර පුහුණු මධ්‍යස්ථානය මේ වනවිට සරණාගතයන් පදිංචි ස්ථානයක් බවට පත් වී ඇති බැවින්, එය නැවත සමූපකාර ක්ෂේත්‍රයට අත් කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

මේ වන විට මෙම ගොඩනැගිල්ල ශ්‍රී ලංකා යුධ හමුදාව සතු ව ඇති බැවින්, නැවත එය ලබා ගැනීම සඳහා ඉල්ලීමක් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සමූපකාර සංවර්ධන කොමසාරිස්ට උපදෙස් දෙන ලදි.

## 2.7 වෙන්නප්පුව සමූපකාර සමිතියේ අධ්‍යක්ෂ ධුරය පිළිබඳව ගැටළුව- ගරු නිරෝෂන් පෙරේරා මහතා

වෙන්නප්පුව සමූපකාර සමිතියේ නිලවරණය මීළඟ සතියේ පැවැත්වෙන බවත්, එහිදි තෝරා ගනු ලබන අධ්‍යක්ෂධුරයට අදාලව රුපියල් 50,000/- ක තැන්පතුවක් රැඳවීමේ නියමය අසාධාරණ බව ගරු මන්ත්‍රීතුමා විසින් පෙන්වා දෙන ලදී.

සාකච්ඡා කර විසඳුමක් ලබා දෙන ලෙස රාජ්‍ය අමාත්‍ය ගරු ලසන්ත අලගියවන්න මහතා විසින් සමූපකාර සංවර්ධන කොමසාරිස්ට උපදෙස් ලබා දෙන ලදි.

## 2.8 රුවන්වැල්ල සමූපකාර සමිතිය යළි නඟා සිටුවීම - ගරු සුදත් මංජුල මහතා

රුවන්වැල්ල සමූපකාර සමිතිය කොමසාරිස්වරයෙකුගේ පාලන කාලයේත්, අධ්‍යක්ෂ මණ්ඩලයේ පාලන සමයේත් පාඩු ලබමින් වැටුප් ගෙවිය නොහැකි තත්වයේ දැවැන්ත පසුබෑමකට ලක් ව ඇති බව දැනුම් දුන් ගරු මන්ත්‍රීතුමා අධ්‍යක්ෂ මණ්ඩලයට සංවර්ධන නිලධාරින් දෙදෙනෙකු වත් පත් කර නැවත නඟා සිටුවන ලෙසට ඉල්ලීමක් කරන ලදී.

මෙම ගැටළුව පිළිබඳව විමර්ශණයක් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සමූපකාර සංවර්ධන කොමසාරිස් වෙත උපදෙස් දෙන ලදි.

## 2.9 හිඟුරක්ගොඩ වෙළඳ සංකීර්ණය සහ වී මෝල දියුණු කිරීම - ගරු අමරකීර්ති අතුකෝරළ මහතා

දැනට වල් බිහිවී ඇති හිඟුරක්ගොඩ වෙළඳ සංකීර්ණය වසා දැමීමකින් තොරව වැඩි දියුණු කිරීමටත්, වී මෝල නවීකරණය කිරීමටත් කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් දෙන ලදී. ගරු මන්ත්‍රීතුමා විසින් කරන ලද ඉල්ලීමට අනුව, ඒ සඳහා ආයෝජකයින්ගෙන් අභිප්‍රාය කැඳවීමක් කරන ලෙසද දැනුම් දෙන ලදී.

**3** කාරක සභාව ප.ව. 3.15 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

**වරාය හා නාවික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමුවැනි රැස්වීම - 2020 දෙසැම්බර් 02**

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා (සභාපති)
ගරු ජයන්ත සමරවීර මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු සුජිත් සංජය පෙරේරා මහතා

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු රෝහණ දිසානායක මහතා
ගරු ශාන්ත බණ්ඩාර මහතා
ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා
ගරු සුදත් මංජුල මහතා
ගරු කුමාරසිරි රත්නායක මහතා
ගරු අජිත් රාජපක්ෂ මහතා
ගරු ගුණතිලක රාජපක්ෂ මහතා
ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
ගරු මධුර විතානගේ මහතා
ගරු වීරසුමන වීරසිංහ මහතා
ගරු සමන්ප්‍රිය හේරත් මහතා
ගරු මර්ජාන් ෆලීල් මහතා

**1. අමාත්‍යාංශයීය කටයුතු පිළිබඳ සාකච්ඡාව**

**1.1. මාතර දිස්ත්‍රික්කයේ වරාය පුහුණු මධ්‍යස්ථානය වසා දැමීම - ගරු වීරසුමන වීරසිංහ මහතා**

මාතර දිස්ත්‍රික්කයේ තිබූ වරාය පුහුණු මධ්‍යස්ථානය නැවත ආරම්භ කරන්නේ නම් ගාල්ල, හම්බන්තොට වරායයන්ට අවශ්‍ය පුහුණු කටයුතු සඳහා භාවිතා කිරීමටත්, විදේශ රැකියා අවස්ථා ලබා ගැනීමටත් හැකි බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

2021 ජනවාරි මස සිට නැව් සංස්ථාව, වෙළඳ නාවික අංශය සමඟ ඒකාබද්ධව මහපොළ පුහුණු මධ්‍යස්ථානය සම්බන්ධ කරගෙන නාවිකයන් පුහුණු කිරීමේ යෝජනාවක් ඇති බැවින්, මෙහි කටයුතු නැවත ඇරඹීම සඳහා, මේ පිළිබඳව ස්ථානීය පරීක්ෂාවක් කර සවිස්තරාත්මක වාර්තාවක් මීළඟ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවට යොමු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් වරාය අධිකාරියේ සභාපති වෙත උපදෙස් දෙන ලදි.

## 1.2. ගරු අජිත් රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කළ යෝජනා

### 1.2.1. චීන රජය සමඟ ඇති කර ගත් ගිවිසුම් පිළිබඳ නීතිමය තත්වය

හම්බන්තොට වරාය, චීන සමාගමට විකුණන අවස්ථාවේදී චීන සමාගම් විසින් පවරා ගැනීම සඳහා හඳුනාගත් ගොවි ජනපද වල ඉඩම් නැවත විවිධ පුද්ගලයින් විසින් වෙනත් ව්‍යාපාර සඳහා යොදා ගන්නා අයුරු දක්නට ලැබෙන බැවින්, එම ඉඩම් සම්බන්ධව නිශ්චිතභාවයක් නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට අවධාරණය කරන ලදී.

ගරු අමාත්‍යවරුන් සහ ප්‍රදේශයේ රාජ්‍ය නිලධාරීන් සමඟ ඉදිරියේදී පැවැත්වෙන සාකච්ඡාවකදී වරාය අධිකාරිය සතු ඉඩම් සම්බන්ධව සලකා බැලෙන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.2.2. හම්බන්තොට වරාය නැවත ශ්‍රී ලංකාවට ලබා ගැනීම

හම්බන්තොට වරාය නැවත ශ්‍රී ලංකාවට ලබා ගැනීම සඳහා යම් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමේ හැකියාව පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් විමසීමක් කරන ලදී.

වෙනත් රටක් සමඟ ඇතිකර ගත් ගිවිසුමක් බැවින් නැවත ලබාගැනීම පිළිබඳව දැනට සලකා බැලිය නොහැකි බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.2.3. පාසැල් දරුවන්ට හම්බන්තොට වරාය නැරඹීමේ පහසුකම

පාසැල් දරුවන්ට හම්බන්තොට වරාය නැරඹීමට බාධාවක් නොමැති අතර කොළඹ කාර්යාලයට ඒ සම්බන්ධ ඉල්ලීම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 1.3. ගරු මධුර විතානගේ මහතා විසින් ඉදිරිපත් කළ යෝජනා

### 1.3.1. චීන රජය සමඟ ඇති කර ගත් ගිවිසුම් පිළිබඳ නීතිමය තත්වය

හම්බන්තොට වරාය බදු දීමේදී ලැබුණු මුදල් වලින් ණය ගෙවීමක් සිදුවී නොමැති බවත් ඒවා රාජ්‍ය භාණ්ඩාගාරයට බැර කරනු ලැබුවේද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මුදල් මහා භාණ්ඩාගාරයට බැර කර ඇති අතර ණය ගෙවීම තවදුරටත් මුදල් අමාත්‍යාංශය හරහා සිදුවන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දන්වන ලදී.

හම්බන්තොට වරාය බදුදීමේදී යම් ගැටළුසහගත හදිසි අවශ්‍යතාවයක් හෝ ව්‍යසනයකදී ශ්‍රී ලංකා රජයට රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් කළ හැකි මැදිහත්වීම පිළිබඳව විමර්ශනයක් කර ඇත්ද යන්නත් වාණිජමය වශයෙන් රටට සිදුවන බලපෑම් කවර ආකාරයේද යන්නත් පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

චීන සමාගම් පිළිබඳව ශ්‍රී ලංකා රජයට දැඩි ලෙස මැදිහත්වීමක් සිදු කිරීමට නොහැකි බවත් නමුත් අත්‍යාවශ්‍ය හදිසි අවස්ථාවකදී අවශ්‍ය මැදිහත්වීම සිදු කළ හැකි බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දන්වන ලදී.

මෙම ගිවිසුමට අදාලව ප්‍රධාන භූමියෙන් වෙන්ව ඇති දූපතේ හිමිකාරීත්වය පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

ගිවිසුම මගින් දූපත ලබා දී ඇති බවත් එය ආපසු ලබා ගැනීම පිළිබඳව ඉල්ලීමක් කරන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දන්වන ලදී.

### 1.3.2. වරාය නැගෙනහිර පර්යන්තය

මෙම පර්යන්තයේ කටයුතු සඳහා 51% අයිතිය ශ්‍රී ලංකා රජයට හිමි වන පරිදි ආයෝජකයෙකුට ලබා දෙන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ගරු සුජිත් සංජය පෙරේරා මහතාද මෙම පර්යන්තයේ ඉදිරි අනාගතය පිළිබඳ පැහැදිලි ප්‍රකාශයක් කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරන ලදී.

ජෝන් කීල්ස් සමාගම යටතේ ඇති (SAGT) ආයතනය හා සීඅයිසීටී (CICT) වැනි ආයතනයන්හි කාර්ය මණ්ඩල සංඛ්‍යාව වරාය අධිකාරියේ කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාවත් සාපේක්ෂව ඉතා අඩුවුවත් එම ආයතන විශාල ආදායමක් ලබන බවද ගරු මධුර විතානගේ මහතා විසින් කාරක සභාවට දන්වන ලදී.

ක්‍රමානුකූලව සේවක සංඛ්‍යාව අඩු කර වරාය අධිකාරිය කාර්යක්ෂමතාවය වැඩි කිරීමේ වැඩ පිළිවෙලක් ඇති කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

එසේම වර්ෂ තුනකට වරක් සිදුවන වැටුප් වැඩි කිරීමේ ප්‍රතිපත්තිය අනුව වර්ෂ 2021 දී සේවක වැටුප් වැඩි කිරීමට නියමිත බවද දැනුම් දෙන ලදී.

චීන සමාගම් සමඟ සම්බන්ධව පැවති දඹුල්ල ප්‍රදේශයේ දේශීය සමාගමක බස් රථ හා අනෙකුත් වාහන එකලස් කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට අභිප්‍රාය පළ කර ඇති අතර එම කාර්ය සම්බන්ධීකරණය කරන ආකාරය පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විමසීමක් කරන ලදී.

ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

එමෙන්ම ත්‍රිකුණාමලය සහ ඔළුවිල් වරායන්හි ආයෝජනය කිරීමට කැමැත්තක් දක්වන ආයෝජකයින්ට ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කළ හැකි බවද ගරු සභාපතිතුමා විසින් සියළුම ගරු මන්ත්‍රීවරුන්ට දැනුම් දෙන ලදී.

### 1.3.3. කන්කසන්තුරේ, ඔලුවිල් වරාය සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග

2019 වර්ෂය වන විට මිලියන 18 ක් පමණ ආදායම් ඉපැයූ කන්කසන්තුරේ වරාය සහ ඔලුවිල් වරාය සම්බන්ධව ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග කවරේදැයි ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

ගාල්ල කන්කසන්තුරේ සහ ඔලුවිල් වරාය සම්බන්ධව ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක් මීළඟ උපදේශක කාරක සභාවට යොමු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් දෙන ලදි.

ඔලුවිල් වරාය ඉදිකළ ස්ථානය වරායකට සුදුසු නොවන බවත් වරාය අධිකාරිය මෙම වගකීමෙන් නිදහස් විය යුතු බවත් ගරු රාජ්‍ය ඇමතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.3.4. කොළොන්නාව දුම්රිය මාර්ගය අවට පදිංචිකරුවන්ගේ ගැටළු

මීතොටමුල්ල, කොළොන්නාව, බ්ලූමැන්ඩල් වැනි ප්‍රදේශවල රජයේ ඉඩම් විශාල වශයෙන් භාවිතා කර වරායට පැමිණෙන කන්ටේනර් ගමන් කිරීම නිසා සාමාන්‍ය මහා මාර්ගයේ ඇති අධික වාහන තදබදය මග හැරලීමට දුම්රිය මාර්ග ඉදිකිරීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

මෙම ඉඩම් පිළිබඳව අයිතිය හිමි නාගරික සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡා කල බවත්, ඉදිරියේදී අදාළ ප්‍රගතිය වාර්තා කළ හැකි බවත්, රාජ්‍ය අමාත්‍ය ගරු ජයන්ත සමරවීර මහතා විසින් දැනුම් දෙන ලදී.

## 1.4. වරාය නගරය (Port City) ව්‍යාපෘතියේ රැකියා අවස්ථා - ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

මෙම ව්‍යාපෘතිය අතිගරු ජනාධිපතිතුමා යටතේ ක්‍රියාත්මක වන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

නමුත් සීඅයිසීටී (CICT), එස්ජීටී(SAGT) සහ වරාය නගරය (Port City) යන ආයතනවල රැකියා අවස්ථා ඇතිවීමේදී ගරු මන්ත්‍රීවරුන්ට ප්‍රමුඛත්වයක් ලබාදීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දන්වා සිටින ලදී.

## 1.5. ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා විසින් ඉදිරිපත් කළ යෝජනා

### 1.5.1. තලෙයි මන්නාරම්-රාමේෂ්වරම් තොටුපල

භාණ්ඩ හා මගී ප්‍රවාහනය සඳහා රාමේෂ්වරම් පාලම ඉදි කිරීමේ කටයුතු වල අවශ්‍යතාව සහ මඩකලපුව කුඩා වරායක් ඉදි කිරීම සුදුසු බව කාරක සභාවට ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

2001 වර්ෂයේ සිට ශ්‍රී ලංකාව සහ ඉන්දියාවේ තූත්තුකුඩිය නගරය අතර තිබූ භාණ්ඩ ප්‍රවාහන සේවාව නැවතී තිබෙන අතර එම සේවාව නැවත ආරම්භ කිරීමට යෝජනා ඉදිරිපත් කරන බව අධ්‍යක්ෂ ජනරාල් (වෙළඳ නෞකා) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පවතින කොවිඩ් වසංගතය හමුවේ දැනට ආරම්භ කිරීමට නොහැකි වුව ද, ඉදිරියේදී ආරක්ෂක අංශය සමඟ සාකාච්ඡා කර, ඒ පිළිබඳව සළකා බලන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 1.5.2. ත්‍රිකුණාමලය වරාය අවට ඉඩම් පිළිබඳ ගැටළු

ත්‍රිකුණාමලය වරාය අවට ඉඩම් අනවසරයෙන් වසර 30 ක් ඉක්මවා අත්පත් කරගෙන සිටින අය සම්බන්ධව පරීක්ෂා කරන බවත්, ඒ අනුව රජයේ ඉඩම් වරාය අධිකාරියට පවරා ගැනීම සම්බන්ධව ඉදිරියේදී සළකා බලන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 1.6. කැළණි ගඟේ භාණ්ඩ ප්‍රවාහනය - ගරු සුදත් මංජුල මහතා

අතීතයේ දී කැළණි ගඟ භාවිතා කර උඩරටටත් පහතරටටත් ලන්දේසීන් විසින් භාණ්ඩ ප්‍රවාහනය කර ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දන්වා සිටින ලදී. කැළණි ගඟේ භාන්ඩ ප්‍රවාහනය සඳහා භාවිතා කිරීම ගැන අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

**2.** කාරක සභාව පෙ.ව. 11.00 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

**සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමු වැනි රැස්වීම- 2020 දෙසැම්බර් 02**

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ගරු ප්‍රසන්න රණතුංග මහතා(සභාපති)
ගරු එම්. උදයකුමාර් මහතා
ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
ගරු ඩයනා ගමගේ මහත්මිය

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු අංගජන් රාමනාදන් මහතා
ගරු චන්දිම වීරක්කොඩි මහතා
ගරු ශාන්ත බණ්ඩාර මහතා
ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු මිලාන් ජයතිලක මහතා
ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා
ගරු චාමර සම්පත් දසනායක මහතා
ගරු අනුප පස්කුවල් මහතා
ගරු සුදත් මංජුල මහතා
ගරු මායාදුන්න චින්තක මහතා
ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා
ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
ගරු මධුර විතානගේ මහතා
ගරු තවරාජා කලෙයි අරසන් මහතා

**නිවාඩු පිළිබඳ යෝජනා**

ගරු නිපුණ රණවක මහතා

## 1. වෙනත් කටයුතු

### 1.1. ගරු චන්දිම වීරක්කොඩි මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

#### 1.1.1. සංචාරක කර්මාන්තයට නුසුදුසු වන නමුත් ආකර්ෂණයක් ඇති ස්ථානයන්හි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

"දෙවැට" වැනි සංචාරකයන් නිතර පැමිණෙන ස්ථානයන් ආකර්ෂනීය අන්දමට සංවර්ධනය කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

#### 1.1.2. ගිංතොට පාලම අසළ සිට බූස්ස තෙක් දිවෙන පිටිවැල්ල ප්‍රදේශය සංචාරක පුරවරයක් ලෙස නම් කිරීම

මෙම සංචාරක ස්ථානය වැඩිදියුණු කිරීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

#### 1.1.3. කබලාන ප්‍රදේශය සඳහා හඳුනා ගත් කාල සීමාවක් සඳහා බලපත්‍රයක් ලබා දීම (Seasonal Licensing)

වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවේ හා සංචාරක අධිකාරියේ නීතිමය අවශ්‍යතා මත යම් යම් ගැටලු පවතින බවත් මේ සම්බන්ධව අවධානය යොමු කරන බවත් ශ්‍රී ලංකා සංවර්ධන අධිකාරියේ සභාපතිනිය විසින් දැනුම් දෙන ලදී.

#### 1.1.4. විදේශීය සර්ෆින් උපදේශකවරුන් සඳහා සහතික ක්‍රමයක් ලබා දීම

සර්ෆින් උපදේශකවරුන් සඳහා රෙගුලාසි හඳුන්වා දීමට බලාපොරොත්තු වන බවත් විදේශීය සර්ෆින් උපදේශකවරුන් සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදයක් ඇති කිරීම වඩා උචිත බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

#### 1.1.5. උණවටුන සංචාරක පොලිස් ඒකකය පිහිටුවීම සම්බන්ධ ගැටලු

රාජ්‍ය සේවයේ පත්වීම් ලබාදෙන උපාධිධාරීන් යොදා ගෙන සංචාරක පොලිස් විශේෂ ඒකකයක් පිහිටුවීමේ සැලසුම් සකස් කරන බව ගරු සභාපතිතුමා විසින් දන්වන ලදී.

යටිතල පහසුකම් සැපයීමේ හැකියාවක් පවතින නමුත් නවාතැන් පහසුකම් සැපයීම දුෂ්කර බව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සභාපතිනිය විසින් ප්‍රකාශ කරන ලදී.

සංචාරකයින්ට සිදුවන හිරිහැර පිළිබඳ වාර්තා කිරීමට කාන්තා පොලිස් නිළධාරින්ගේ හිඟයක් පවතින බවත් යම් සිදුවීමක් පිළිබඳ පැමිණිලි කර පිටව යන විදේශිකයන්ට ඒ පිළිබඳ පසුවිපරම් කිරීමේ හැකියාවක් නොමැතිවීම විශාල අඩුපාඩුවක් බවත් තවදුරටත් දැනුම් දෙන ලදී.

### 1.1.6. ගාල්ල දිස්ත්‍රික්කයේ පානීය ජල ගැටලුව

මහ ගාල්ල ජල යෝජනා ක්‍රමයේ ඊළඟ අදියර හා බද්දේගම ජල යෝජනා ක්‍රමයේ ඊළඟ අදියර යන ව්‍යාපෘති දෙකම ක්‍රියාත්මක කළ යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී. ජලසම්පාදන අමාත්‍යතුමන් ද මෙම ජල ගැටලුව පිළිබඳ දැනුවත් කරන ලෙස ඉල්ලා සිටින ලදී.

මේ පිළිබඳව අවධානය යොමු කරන බවට ගරු සභාපතිතුමා විසින් දන්වන ලදී.

### 1.1.7. උණවටුන අතුරු මාර්ග 2 (by-pass roads) සෑදීම

සංචාරක ක්ෂේත්‍රයට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට සම්බන්ධවන අනෙකුත් අමාත්‍යාංශ එක් වී පාලන කමිටුවක් ඇතිකර මෙවැනි කටයුතු සිදු කිරීමට කටයුතු කරන බව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙහි අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දන්වන ලදී.

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන් සංචාරක කර්මාන්තයට සබැදි සංවර්ධනය විය යුතු මාර්ග පිළිබඳ විස්තර ඉල්ලුම් කර ඇති බවත් යථෝක්ත මාර්ගය පිළිබඳ ව්‍යාපෘති වාර්තාව ද ලබා දෙන ලෙස අමාත්‍යාංශ ලේකම් විසින් ගරු මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටින ලදී.

ඉහත ආකාරයට සංවර්ධන කටයුතු මහාමාර්ග අමාත්‍යාංශය හා එක්ව සිදු කිරීමට අපේක්ෂිත බැවින් මෙම මාර්ග ව්‍යාපෘති හැකි ඉක්මණින් ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා ගරු මන්ත්‍රීතුමා වෙත දන්වා සිටින ලදී.

### 1.1.8. සංචාරක කලාප හඳුනා ගැනීම යාවත්කාලීන කිරීම හා කොග්ගල හා තල්පෙ සංචාරක කලාප ලෙස නම් කිරීම සම්බන්ධ යෝජනාව

මේ සම්බන්ධව කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් නිලධාරීන්ට දන්වන ලදී.

## 1.2. ගරු ඩයනා ගමගේ මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.2.1. පළමු පන්තියේ හෝ ව්‍යාපාරික පන්තියේ ටිකට්පත් ලබා ගත් පුද්ගලයින් සඳහා වෙන් වූ පැමිණීමේ හා පිටවීමේ පර්යන්ත තිබීමේ අවශ්‍යතාව

ප්‍රභූ හා පළමු පන්තියේ හෝ ව්‍යාපාරික පන්තියේ ගමන් ගන්නා පුද්ගලයින් සඳහා වෙන් කළ පෝළිම් ලබා දීම සඳහා මේ වන විටත් කටයුතු කර ඇති බවත් අනාගතයේ දී ගුවන්තොටුපළ විවෘත කළ පසු පළමු පන්තියේ සහ ව්‍යාපාරික පන්තියේ පැමිණෙන්නන් සඳහා වෙන් කළ කොටස් දෙකක් වෙන් කෙරෙන බවත් ගුවන් තොටුපළ හා ගුවන් සේවා සමාගම් සභාපති විසින් දැනුම් දෙන ලදී.

මත්තල ගුවන් තොටුපළෙහි ආරම්භ කරන මව්බිමට නැවත පැමිණෙන්නන් සඳහා විශේෂිත වූ රතු වැනලය (Red Channel for Repatriation) හා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි ආරම්භ කරන සංචාරකයින් සඳහා විශේෂිත වූ කොළ වැනලය (Green Channel) ඉදිරියේ දී ක්‍රියාත්මක වනු ඇති බව ද දැනුම් දෙන ලදී.

### 1.2.2. ආගමන විගමන නිළධාරීන්ගේ ආකල්ප සංවර්ධනය විය යුතු බව

ආගමන හා විගමන නිලධාරීන් ගුවන්තොටුපළේ රාජකාරී ඉටුකරන ආකාරය නිසා රටේ ප්‍රතිරූපය දැඩි ලෙස බිඳ වැටෙන බවත් මේ සම්බන්ධව ආරක්ෂක අමාත්‍යාංශය, ආගමන විගමන පාලක හා ආගමන විගමන නිළධාරීන්ගේ වෘත්තීය සමිති සමඟ පවත්වන සාකච්ඡා මඟින් වඩා ඵලදායී විසඳුමකට පැමිණිය හැකි වනු ඇතැයිද ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.2.3. ගුවන් තොටුපළ කාර්ය මණ්ඩලය විදේශගතව රැකියාවන්හි නිරත ශ්‍රමිකයින් සමඟ කටයුතු කිරීම

විදේශ ශ්‍රමිකයන් පිළිබඳව සොයා බැලීම සඳහා විදේශ රැකියා නියුක්ති කාර්යාංශයට අයත් විශේෂිත ඒකකයක් පිහිටුවා ඇති බව ගුවන් තොටුපළ හා ගුවන් සේවා සමාගම් සභාපති විසින් දන්වා සිටින ලදී.

ගරු මන්ත්‍රීතුමිය පැවසූ ආකාරයේ පහත් සැළකීම් පිළිබඳ පැමිණිලි පවතින බවත් එමනිසා මේ සම්බන්ධව වෙනම සාකච්ඡා කළ යුතු බවත් සභාපති විසින් දැනුම් දෙන ලදී.

### 1.2.4. විදෙස් සංචාරකයින්ගේ ආරක්ෂාව සහතික කිරීම හා සංචාරක පොලිස් ඒකක පිහිටුවීම

මිරිස්ස ප්‍රදේශයේ විදේශික කාන්තාවකට තරුණ පිරිසක් මඟින් අතවර කිරීම සහ පොලිස් ස්ථානයට පැමිණිලි කරන අවස්ථාවේදී සිදුවූ සිද්ධීන් සම්බන්ධව සඳහන් කරමින් සංචාරය කිරීමට ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින්ට නිදහස හා ආරක්ෂාව ලබා දිය යුතු බව ගරු මන්ත්‍රීතුමිය විසින් සඳහන් කරන ලදී.

ඉතිහාසයේ ප්‍රථමවරට සංචාරක කර්මාන්තය සඳහා පොලිස් නියෝජ්‍ය පොලිස්පතිවරයකු පත්කර ඇති බවත් චාරිකා සඳහා වෙන් වූ පරිගනක යෙදුම් වැඩසටහනක් (Travel App) නිර්මාණය කර ඇති අතර එහි එක් විශේෂාංගයක් ලෙස හදිසි අවස්ථාවකදී ළඟම ඇති පොලීසිය සම්බන්ධ කරගැනීමට හදිසි බොත්තමක් ද (Emergency Button) නිර්මාණය කර ඇති බව තවදුරටත් පවසන ලදී.

### 1.2.5. ශ්‍රී ලංකාව තුළ රාත්‍රී ආර්ථිකයක් ඇති කිරීමේ අවශ්‍යතාව, මත්පැන් බලපත්‍ර ලබා දීම හා සංචාරකයින් හට මත්පැන් ලබා ගැනීමේ පහසුකම් ඇති කිරීම

මෙම කරුණ පිළිබඳව අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමිය විසින් දැනුම් දෙන ලදී.

### 1.2.6. සංචාරකයන් සඳහා රාත්‍රී ආර්ථික (Night Economy) පහසුකම් ලබා ගැනීමට නොහැකිවීම

සංචාරකයන් සඳහා ප්‍රසිද්ධ රටවල රාත්‍රී ආර්ථිකයක් (Night Economy) දක්නට ඇතත් ශ්‍රී ලංකාවේ රාත්‍රී 9.00 පසුවන විට කිසිඳු පහසුකමක් ලබා ගත නොහැකි බව ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.3. ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.3.1. කෝවිඩ් සමය තුළ සංචාරක කර්මාන්තයේ නිරතවන අයට සහන ලබා දීම පිළිබඳව

සංචාරක ව්‍යාපාරයේ නිරතවූ පුද්ගලයන්ගේ ආර්ථිකය දැඩි ලෙස කඩා වැටී ඇති බැවින් රජයෙන් යම් සහනයක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමිය විසින් ඉල්ලීමක් කරන ලදී

රජයෙන් ලබා දුන් රුපියල් 5000ක මුදලට අමතරව සංචාරක මණ්ඩලය මඟින් රුපියල් 10000-20000 අතර මුදල් ලබා දීම මේ වනවිට අවසන් කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දන්වන ලදී.

### 1.3.2. ගාල්ල සංචාරක පුරවරයේ සංචාරක ව්‍යාපාරයට සහායවන ජනතාව මුහුණ දෙන පානීය ජල ගැටලුව

මහාමාර්ග ප්‍රතිසංස්කරණය සහ ජල සම්පාදන ව්‍යාපෘති ඉදිකිරීම අතර සම්බන්ධීකරණයක් අවශ්‍ය බවද ගරු මන්ත්‍රීතුමිය විසින් දැනුම් දෙන ලදී.

මහාමාර්ග අමාත්‍යාංශය මඟින් සංචාරක පුරවරයන්හි මාර්ග සංවර්ධනය කිරීමට මූල්‍ය ප්‍රතිපාදන ලබා දී ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ව්‍යාපෘතියක් මඟින් පානීය ජල ගැටලුවට විසඳුම් ලබා ගැනීමේ හැකියාව ගැන අවධානය යොමු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙහි අධ්‍යක්ෂ ජනරාල්වරියට උපදෙස් ලබා දෙන ලදී.

## 1.4. ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.4.1. මඩකලපු දිස්ත්‍රික්කය සඳහා උපායමාර්ගික සංචාරක සංවර්ධන සැලැස්මක් ඇති කිරීමේ අවශ්‍යතාව

මඩකලපු වරාය වටා වූ ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා මේ වන විටත් සැළසුම් සකස් කර ඇති බවත් ඒ සඳහා අනුග්‍රහ දක්වන ආයතනයන්ගේ සහාය ද ලබා ගත හැකි බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

හඳුනා ගත් ප්‍රදේශ අතුරින් ප්‍රමුඛතා ලැයිස්තුවක් සකස් කර මේ සම්බන්ධව කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සංචාරක සංවර්ධන අධිකාරියේ සභාපතිනියට දැනුම් දෙන ලදී.

### 1.4.2. උතුරු නැගෙනහිර සඳහා ක්‍රමවත් සංචාරක සැලැස්මක් සෑදීම සඳහා කමිටුවක් ඇති කිරීම

ගරු සභාපතිතුමා මෙම යෝජනාව හා එකඟ වූ අතර මේ වන විට සංචාරක ආකර්ෂණය සඳහා හඳුනාගෙන ඇති ස්ථාන 4956ක් පමණ සංචාරකයින් සඳහා ප්‍රවර්ධනය කිරීම සඳහා කටයුතු කරමින් සිටින බව ගරු සභාපතිතුමා විසින් දන්වන ලදී.

උතුර නැගෙනහිර පිහිටි විශාල භූමින් නිසි පරිදි කළමනාකරණය කර සංචාරකයන් ආකර්ශනය කර ගත හැකි බවද දැනුම් දෙන ලදී.

**1.4.3. උතුරු නැගෙනහිර සංචාරක කර්මාන්තය දියුණු කිරීම සඳහා තලෙයිමන්නාරම් සිට රාමේෂ්වරම් දක්වා පාරු (Ferry Service) ගමන් ඇති කිරීම**

මඩකලපුවට ගමන් කිරීමට ඇති දුෂ්කරතා නිසා බොහෝ සංචාරකයන් පැමිණීමට මැලිවන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම මුහුදු ප්‍රවාහන මාර්ගය දියුණු කිරීම මගින් උතුර නැගෙනහිර සංචාරක ස්ථාන සඳහා සංචාරකයන් ගෙන්වා ගත හැකි බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

**1.4.4. යාපනය ගුවන්තොටුපළ නියමාකාරයෙන් ස්ථාපිත කිරීම හා මඩකළපු ශාඛාවක් ඇති කිරීම**

මඩකලපුව බලා ගමන් කරන ගුවන් යානයකට අයකළ යුතු මුදල ඉතා වැඩි බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මඩකලපුවට තරමක් විශාල ගුවන් යානයක් ගමන් කළ හැකි වන අන්දමට සංවර්ධනයක් කළ හැකි නම් සංචාරකයන්ගේ ආකර්ශනය ලබා ගත හැකි බව ගරු මන්ත්‍රීතුමා විසින් සඳහන් කරන ලදී.

**1.4.5. බලපත්‍ර රහිතව මත්පැන් අලෙවි කිරීම පිළිබඳ ක්‍රමවේදයක් සකස් කිරීම**

මෙම කරුණ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**1.5. ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**

**1.5.1. සංචාරක මණ්ඩලයේ නැවත ලියාපදිංචි ගාස්තු සම්බන්ධව සහනයක් සැලසීම**

නැවත ලියාපදිංචි වීමේ ගාස්තු අය කිරීම වසරක් දක්වා අත්හිටුවා ඇති බව සංචාරක සංවර්ධන අධිකාරියේ සභාපතිනිය විසින් දන්වන ලදී.

මේ වසර සඳහා සාමාජික ගාස්තු ගෙවූ පුද්ගලයින් සඳහා ඊළඟ වසරේ ලියාපදිංචිය අවශ්‍ය නොවන බව ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් දන්වන ලදී.

**1.5.2. කොවිඩ් සඳහා එන්නතක් භාවිතා කිරීමට බොහෝ රටවල් සූදානම් බැවින් එහි වාසිය ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයට යොදා ගැනීම**

මේ සම්බන්ධව සෞඛ්‍යය අමාත්‍යාංශයෙන් අවශ්‍ය උපදෙස් ලබා ගෙන ගුවන්තොටුපළ නැවත විවෘත කිරීම සම්බන්ධව සාකච්ඡා කරනු ඇති බව ගරු සභාපතිතුමා විසින් දන්වන ලදී.

**1.6. විදේශවලින් පැමිණෙන ශ්‍රී ලාංකිකයින්හට නිරෝධායනය සඳහා අධික ගාස්තු අයකරන හෝටල් ලබා දීම සම්බන්ධව ගරු මධුර විතානගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව**

මෙය හමුදාපතිවරයාගේ පාලනයෙන් සිදු කරන කාර්යයක් බවත් ගුවන්තොටුපළට ආසන්න කාමර ගණන වැඩි හෝටල් එහිදී හඳුනා ගෙන ඇති බවත් ගුවන් තොටුපළ හා ගුවන් සේවා සමාගම් සභාපති විසින් දැනුම් දෙන ලදී.

කොවිඩ් කාර්යයසාධක කමිටුවේ දී මේ සම්බන්ධව කටයුතු කරන බැවින් මේ පිළිබඳව එම කමිටුවට සහභාගීවන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ලෙස මේ සම්බන්ධව එහිදී කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ඉල්ලා සිටින ලදී.

**1.7. උතුරු පළාතේ සංචාරක කටයුතු පිළිබඳව ගරු අංගජන් රාමනාදන් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**

**1.7.1. පලාලි ගුවන්තොටුපළ වසා දැමීම පිළිබඳව**

මෙම ගුවන්තොටුපළ මාර්තු මාසයේදී ගුවන් ගමන් නවතා දැමූ බවත් මේ වනවිට නැවත ජාත්‍යන්තර ගුවන් ගමන් ආරම්භ වනතුරු  නඩත්තු කටයුතු පමණක් පවත්වා ගෙන යන බවත් ගුවන් තොටුපළ හා ගුවන් සේවා සමාගම් සභාපති විසින් සඳහන් කරන ලදී.

ඉන්දියානු රජය ගුවන්තොටුපළ සංවර්ධන කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබාදීමට එකඟ වූ බවත් මේ සම්බන්ධව සාකච්ඡා තවදුරටත් පවත්වා ගෙන යන බවත් රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් සඳහන් කරන ලදී. මේ සඳහා ගිවිසුමක්  සකස් කර ඇති බවත් සඳහන් කරන ලදී.

**1.7.2. උතුරු නැගෙනහිර සඳහා සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමේ සැලැස්ම**

මේ පිළිබඳව අවධානය යොමු කළ යුතු බැවින් මේ සම්බන්ධයෙන් වෙනම සාකච්ඡාවක් සිදු කළ යුතු බව ගරු සභාපතිතුමා විසින් දන්වන ලදී.

**1.8. ගරු මායාදුන්න චින්තක අමල් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**

**1.8.1. කල්පිටිය සංචාරක කලාපය සංවර්ධනය කිරීම සම්බන්ධව**

කුච්චමනි ප්‍රදේශය සඳහා, එක්සත් රාජධානිය සමඟ ඇමරිකානු ඩොලර් මිලියන 417 ක අධි සුඛෝපභෝගී  හෝටල් ව්‍යාපෘතියක් (High-End Hotel Project) සඳහා ගිවිසුම් අත්සන් කිරීමට නියමිත බව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සභාපතිනිය විසින් දැනුම් දෙන ලදී.

කල්පිටිය ඉතා ආකර්ශණීය සංචාරක ගමනාන්තයක් බැවින් එම ප්‍රදේශය පිළිබඳ මනා සැලැස්මක් නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සිදු කරන බවද  ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සභාපතිනිය විසින් දැනුම් දෙන ලදී.

කල්පිටිය සඳහා නිශ්චිත සැලැස්මක් සැදිය යුතු බවත් ඒ සඳහා සුදුසු ආකාරයකට ක්‍රියාත්මක වන ලෙසත් ගරු සභාපතිතුමා විසින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සභාපතිනිය හට උපදෙස් ලබා දෙන ලදී.

දැනට සකස් කර ඇති සැලැස්ම පිළිබඳව සාකච්ඡාවක් එම ප්‍රදේශයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ද නාගරික සංවර්ධන අධිකාරිය ද සහභාගි කර ගනිමින් සිදු කරන ලෙස ගරු සභාපතිතුමා විසින්උපදෙස් දෙන ලදී.

**1.8.2. පාලවිය ගුවන්තොටුපළක් ලෙස සංවර්ධනය කිරීම සම්බන්ධව**

කාලයක සිට මෙම ගුවන් තොටුපළක් සෑදීමේ යෝජනාව සාකච්ඡාවක් පවතින බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

**1.9. ගරු සුදත් මංජුල මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**

**1.9.1. රුවන්වැල්ල ප්‍රදේශය සංචාරක නගරයක් ලෙස සංවර්ධනය කිරීම**

ව්‍යාපෘති යෝජනා අමාත්‍යාංශය වෙත ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් දන්වන ලදී.

**1.9.2. කිතුල්ගල ප්‍රදේශය සඳහා කේබල් කාර් ව්‍යාපෘතියක් ලබා දීම**

මෙම ව්‍යාපෘතිය මගින් සංචාරකයන් ආකර්ශනය කර ගත හැකි බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

**1.10. ගරු අනූප පස්කුවල් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**

**1.10.1. සබරගමුව පළාත සඳහා සංචාරක කර්මාන්ත සඳහා සකස් කර ඇති ව්‍යාපෘති**

සංචාරක සංවර්ධන අධිකාරිය සම්බන්ධීකරණය කර පළාත් මට්ටමින් සාකච්ඡා කර සංවර්ධන සැලසුමක් සකස් කරන ලෙසත් අදාළ දිස්ත්‍රික් ලේකම්ට එය ඉදිරිපත් කරන ලෙසත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**1.10.2. මතුගම, අගලවත්ත, බුලත්සිංහල කලාපය සඳහා සංචාරක සැලැස්මක් සකස් කර ගැනීම**

මේ පිළිබඳව ලිඛිතව යොමු කරන ලෙසත් එවිට මීළඟ උපදේශක කාරක සභාවේදී ඒ සඳහා පිළිතුරක් ලබා දිය හැකි බවත් ගරු සභාපතිතුමා විසින් දන්වන ලදී.

**2.** කාරක සභාව පස්වරු 3.30ට 2021 ජනවාරි 20 වැනි දින දක්වා කල් තබන ලදී.

---

**පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමු වැනි රැස්වීම - 2020 දෙසැම්බර් 03**

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ගරු මහින්ද අමරවීර මහතා (සභාපති)
ගරු කිංස් නෙල්සන් මහතා
ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා
ගරු මංජුලා දිසානායක මහත්මිය

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු ජානක වක්කුඹුර මහතා
ගරු ඩී. බී. හේරත් මහතා
ගරු ජගත් පුෂ්පකුමාර මහතා
ගරු රෝහණ දිසානායක මහතා
ගරු ෆයිසාල් කාසිම් මහතා
ගරු කේ. කාදර් මස්තාන් මහතා
ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
ගරු වේලු කුමාර් මහතා
ගරු වරුණ ලියනගේ මහතා
ගරු අමරකීර්ති අතුකෝරළ මහතා
ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා
ගරු අජිත් රාජපක්ෂ මහතා
ගරු ගුණතිලක රාජපක්ෂ මහතා
ගරු ඩී. වීරසිංහ මහතා
ගරු වීරසුමන වීරසිංහ මහතා
ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතා

**1. ගරු සභාපතිතුමාගේ නිවේදන :-**

දිවයින පුරා පිහිටි ගංගා 103 ක පවිත්‍රතාව රැක ගැනීම වෙනුවෙන් "සුරකිමු ගංගා" නමින් විශේෂ ව්‍යාපෘතියක් 2021 වර්ෂයේ සිට ආරම්භ කෙරෙන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2. ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා**

**2.1. කටුපොල් වගාව සම්බන්ධ ගැටළු - ගරු වීරසුමන වීරසිංහ මහතා**

**2.1.1. කටුපොල් වගාව**

කටුපොල් වගාව තහනම් කිරීමට නීතිමය පියවර ගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**2.1.2. ජල මූලාශ්‍ර රැකීම**

ජල මූලාශ්‍ර රැකීමේ වැඩපිළිවෙළක් සකස් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

**2.2. වාරියපොළ පොල් ඉඩම් තුළ වැලි නිස්සාරණය කිරීම සහ පොල් ඉඩම් කැබලි කිරීම - ගරු ඩී. බී. හේරත් මහතා**

**2.2.1. වාරියපොළ පොල් ඉඩම් තුළ වැලි නිස්සාරණය කිරීම**

වයඹ පළාතේ වාරියපොළ ප්‍රදේශයේ වටිනා පොල් ඉඩම් තුළ වැලි නිස්සාරණය කිරීම මඟින් විශාල පරිසර හානියක් සිදු වී ඇති බව ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙවැනි නීති විරෝධි ක්‍රියා සම්බන්ධයෙන් අවධානය යොමු කර වැලි නිස්සාරණය සිදු කරනු ලබන පොල් ඉඩම් සඳහා බලපත්‍ර ලබා දීම අත්හිටුවන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

### 2.2.2. පොල් ඉඩම් කැබලි කිරීම

පොල් ඉඩම් කැබලි කර වෙන්දේසි කිරීම නැවැත්වීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 2.3. ෆයිනස් ගස් ඉවත් කිරීම සම්බන්ධ ගැටළු - ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා

හන්තාන වැනි ප්‍රදේශවල ෆයිනස් ගස් කපා ඉවත් කර එම ඉඩම් අත්හැර යාමේ නීතිවිරෝධි කටයුත්තක් ක්‍රියාත්මක වන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පරිසර සංවිධාන සහ ප්‍රාදේශීය කමිටු සඳහා මෙම ඉඩම් වල වෙනත් අතුරු වගා සහ වන වගා කිරීමට  අවස්ථාව සලසා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ෆයිනස් වගාව ඉවත්වන භූමිවල එම ප්‍රදේශයට අදාළ වන වගාවක් කිරීමට යෝජිත බවත් එම වගා කටයුතු සිදු කරන කණ්ඩායම් සහ දිස්ත්‍රික් සංවර්ධන කමිටුව සඳහා අමාත්‍යාංශයේ සහයෝගය ලබා දෙන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 2.4. හැඩ ඔය ආශ්‍රිතව වැලි ගොඩ දැමීම - ගරු ඩී. වීරසිංහ මහතා

හැඩ ඔය ආශ්‍රිතව වංචනිකව වැලි ගොඩ දැමීම නිසා සිදුවන පරිසර හානිය සහ පුරාවිද්‍යාත්මක හානිය පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

ශ්‍රී ලංකාවේ ගොඩනැගිලි ඉදි කිරීම් සඳහා අවශ්‍යා අමුද්‍රව්‍යා සැපයීමේ ක්‍රියාවලිය  විධිමත් කිරීමේ අරමුණින් ස්ථාපිත කර ඇති ජනාධිපති කාර්ය සාධක බලකායේ වාර්තාව ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිත බව  අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදි.

## 2.5. පොතුවිල් ප්‍රදේශයේ වැලි ගොඩ දැමීමේ ගැටළු - ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා

පොතුවිල් ප්‍රදේශයේ උස් ස්ථානවල වැලි ගොඩ දැමීම නිසා මතු වී ඇති පාරිසරික ගැටළුව පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ස්ථානීය පරීක්ෂාවක් සිදු කර සතියක් තුළ වාර්තාවක් සකස් කර ඉදිරිපත් කරන බව මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.6. වැලි ප්‍රවාහනයේ දී අතරමැදියන් විසින් අධික ලාභයක් ලබා ගැනීම - ගරු අමරකීර්ති අතුකෝරළ මහතා**

මනම්පිටියේ සිට රටේ විවිධ ප්‍රදේශවලට වැලි ප්‍රවාහනයේදී අතරමැදියන් විසින් අධික ලාභයක් ලබා ගැනීම ගැටළු සහගත බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

වැලි ප්‍රවාහන කටයුතු විධිමත් කිරීමට මංකඩ ක්‍රමය නැවත ඇති කර ප්‍රමුඛතා ක්‍රමය ඉවත් කළ බවත් අධික ලාභ ලැබීම සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.7. මහනුවර උතුර ජල සම්පාදන යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වීම - ගරු ගුණතිලක රාජපක්ෂ මහතා**

මෙම යෝජනා ක්‍රමය අනුව කපන ලද කාණු පිරවීමට අවශ්‍ය පස් සැපයීමේ විශාල ජාවාරමක් සිදු වන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සඳහා අවධානය යොමු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**2.8. සුළු පරිමාණ කර්මාන්තකරුවන්ට සිදුවන අසාධාරණ - ගරු අජිත් රාජපක්ෂ මහතා**

සමස්ථ පාරිසරික ගැටළු පිළිබඳව අධ්‍යයනයන් සිදු නොකර පහළ මට්ටමේ නිලධාරීන් විසින් තීරණ ගැනීම නිසා සුළු පරිමාණ කර්මාන්තකරුවන්ට අසාධාරණයක් සිදුවන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම කරුණ පිළිබඳව අධ්‍යයනය කර තීරණ ගැනීමට ක්‍රියා කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.9. මාතලේ, නාලන්ද, පල්ලෙපොල ප්‍රදේශයන්හි ආක්‍රමණික යෝධ නිදිකුම්බා ශාඛය සම්බන්ධ ගැටළුව - ගරු රෝහණ දිසානායක මහතා**

කටු සහිත ආක්‍රමණික යෝධ නිදිකුම්බා ශාඛය කුඹුරු දක්වා පැතිරී තිබීම මත ගොවියන් විශාල ගැටළුවකට මුහුණ දී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම ගැටළුව සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා බව මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.10. කිතුල්කොටේ, වැල්ලවාය, තණමල්විල ප්‍රදේශ වල වැලි ගොඩ දැමීම - ගරු ජගත් පුෂ්පකුමාර මහතා**

වැලි ගොඩ දැමීම හේතුවෙන් වගා කටයුතු සිදු කරන ජලාශ ආශ්‍රිත ඉඩම් විනාශ වීම නිසා රතුළූණු, බී ළූණු සහ මාළු මිරිස් අස්වැන්න රටට අහිමි වී ඇති බවත්, පසුගිය වසර 10 තුළ වැලි ගොඩ දැමීමේ බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලියේ දුර්වලතා පැවති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

මෙම ප්‍රදේශවල බලපත්‍ර ලබාදීම තාවකාලිකව අත්හිටුවා නිසි අධ්‍යයනයක් සිදුකර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

## 2.11. පාරම්පරික මැටි කර්මාන්තයේ සහ ගඩොල් කර්මාන්තයේ ගැටළු - ගරු මංජුලා දිසානායක මහත්මිය

### 2.11.1. පාරම්පරික මැටි කර්මාන්තයේ සහ ගඩොල් කර්මාන්තයේ ගැටළු

පාරම්පරික මැටි කර්මාන්තයේ සහ ගඩොල් කර්මාන්තයේ යෙදෙන ජනතාව අමුද්‍රව්‍ය ලෙස ගංගා ආශ්‍රිතව පස් ලබා ගැනීමේ දුෂ්කරතාවයකට ලක් වී ඇති බව ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

මෙම කර්මාන්ත සඳහා නීතිමය බාධාවකින් තොරව අමුද්‍රව්‍ය ලබා ගැනීමට අවස්ථාව ඉදිරියේදී සලසන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 2.11.2. කුරුණෑගල බඩගමුව කැලය අපවිත්‍ර කිරීම

මෙම කැලය අපවිත්‍ර කිරීමක් සිදුවන බව ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම වනයේ ඇති තොරතුරු කේන්ද්‍රය ආශ්‍රිතව ජනතාවට ගිමන් නිවා ගැනීමට ස්ථානයක් සකස් කර දෙන ලෙසද ගරු මන්ත්‍රීතුමිය විසින් ඉල්ලීමක් කරන ලදී.

බඩගමුව කැලය වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශයට අයත් බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 2.12. ඉරනමඩු ජලාශය ආශ්‍රිත ගැටළු - ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

ඉරනමඩු ජලාශය ආශ්‍රිතව වැලි ගොඩ දැමීම නිසා තිරිවියාර් ප්‍රදේශයට මුහුදු වතුර ඇදී එන තත්වයක් දක්වා බරපතල වී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

සතියක් ඇතුළත මෙම ගැටළුව පිළිබඳව වාර්තාවක් ගරු මන්ත්‍රීතුමාටත් එහි පිටපත් කාරක සභාවටත් ලබා දෙන ලෙස භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ නිලධාරින්ට ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

පොලීසිය යම් කටයුතුවලට මැදිහත් වන්නේදැයි පරීක්ෂා කිරීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 2.13. නින්දවුර් ප්‍රදේශයේ ස්වාභාවික ශක්ති ව්‍යාපෘති සමාගමේ ගැටළු - ගරු ෆයිසාල් කාසිම් මහතා

විදුලිය නිපදවන ස්වාභාවික ශක්ති ව්‍යාපෘති සමාගමේ (Bio Energy Private Limited) කටයුතු නිසා ඇතිවී තිබෙන පරිසර ගැටළු සම්බන්ධයෙන් මෙතෙක් විසඳුමක් ගෙන නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම ව්‍යාපෘතියේ බලපත්‍රය තාවකාලිකව අවලංගු කර විමර්ශනයක් පවත්වා නිසි ක්‍රියාමාර්ග ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් මධ්‍යම පරිසර අධිකාරියේ සභාපතිට උපදෙස් ලබා දෙන ලදි.

**2.14. අවශේෂ කැලෑ - ගරු වරුණ ලියනගේ මහතා**

අවශේෂ කැලෑ සම්බන්ධයෙන් මෑතකදී නිකුත් කර ඇති උපදෙස් පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

අවශේෂ කැලෑ පිළිබඳව නිශ්චිතව හඳුනාගැනීමට අධ්‍යයනයන් සිදු කරන බව අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.** කාරක සභාව 2020.12.03 දින පෙ.ව. 11.30 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

**වනජීවී හා වන සංරක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමු වැනි රැස්වීම - 2020 දෙසැම්බර් 03**

**පැමිණ සිටි සාමාජික මන්ත්‍රීන්**

ගරු සී.බී. රත්නායක මහතා (සභාපති)
ගරු විමලවීර දිසානායක මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු කපිල අතුකෝරල මහතා
ගරු චාමර සම්පත් දසනායක මහතා
ගරු කුමාරසිරි රත්නායක මහතා

**පැමිණ සිටි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු විජිත බේරුගොඩ මහතා
ගරු රොෂාන් රණසිංහ මහතා
ගරු ජානක වක්කුඹුර මහතා
ගරු සිරිපාල ගම්ලත් මහතා
ගරු තේනුක විදානගමගේ මහතා
ගරු ඩී. බී. හේරත් මහතා
ගරු ජගත් පුෂ්පකුමාර මහතා
ගරු රෝහණ දිසානායක මහතා
ගරු එම්. එස්. තවුෆික් මහතා
ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
ගරු අ. අරවින්ද් කුමාර් මහතා
ගරු වේලු කුමාර් මහතා
ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු වරුණ ලියනගේ මහතා
ගරු අමරකීර්ති අතුකෝරළ මහතා
ගරු තිසකුට්ටි ආරච්චි මහතා

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා
ගරු කිංස් නෙල්සන් මහතා
ගරු සුදත් මංජුල මහතා
ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා
ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා
ගරු අජිත් රාජපක්ෂ මහතා
ගරු ගුණතිලක රාජපක්ෂ මහතා
ගරු ඩී. වීරසිංහ මහතා
ගරු තවරාජා කලෙයි අරසන් මහතා
ගරු මංජුලා දිසානායක මහත්මිය
ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතා

**1. අමාත්‍යාංශයීය කටයුතු පිළිබඳ සාකච්ඡාව**

අමාත්‍යාංශයේ වගකීම් සහ කාර්යභාරය මෙන්ම විශාල භූමි ප්‍රමාණයක් සීමිත කාර්ය මණ්ඩලයක් මඟින් නඩත්තු කිරීමේ දී ඇති වන ගැටලු පිළිබඳව ගරු සභාපතිතුමා විසින් දීර්ඝ විස්තරයක් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මිනිස් ක්‍රියාකාරකම් නිසා වන සම්පත හා පොදුවේ පරිසරයට සිදුවන හානි ද නිලධාරීන්ට මුහුණ දීමට සිදුවන දුෂ්කරතා පිළිබඳව ද ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට පැහැදිලි කරන ලදී.

අමාත්‍යාංශය මඟින් තමා ඉදිරියේ දී සිදු කරන්නට බලාපොරොත්තු වන වැඩපිළිවෙළ පිළිබඳවද ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට විස්තර කරන ලදි.

**2. ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා**

**2.1. වන භූමි කලාපය තුළ ගවයින් තෘණ උලා කෑම සම්බන්ධයෙන් පවතින බාධා - ගරු ඩී. බී. හේරත් මහතා**

දේශීය කිරි ගොවීන්ගේ ගවයන් වනබිම්වලට ඇතුල්වීමේදී වනජීවී දෙපාර්තමේන්තුව සමඟ ඇති වන ගැටුම් මඟහරවා ගැනීම සඳහා මැදිහත් වන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මහවැලි අමාත්‍යාංශය යටතේ පවතිත කන්දකඩුව යන ගොවිපළ තෘණ උලා කෑම සඳහා නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම කරුණ සම්බන්ධව පරීක්ෂණයක් සිදු කර කඩිනමින් පිළිතුරක් ලබා දීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම්ට උපදෙස් ලබා දෙන ලදී.

**2.2. ඇල්ල රාවණා ඇල්ල අභය භූමි කලාපයේ මහා පරිමාණ හෝටල් සංකීර්ණයක් ඉදිකිරීම- ගරු චාමර සම්පත් දසනායක මහතා**

ඇල්ල රාවණා ඇල්ල ප්‍රදේශයේ නීතිවිරෝධී ලෙස ඉදිකරන විශාල හෝටල් සංකීර්ණය ඉදිකිරීමේ කටයුතු වැළැක්වීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

මේ පිළිබඳ පරීක්ෂණයක් පවත්වා වාර්තා කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම්ට සහ වන සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල්ට උපදෙස් ලබා දෙන ලදී.

## 2.3. ගරු රොෂාන් රණසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 2.3.1. යක්කුරේ ගම්මානය සඳහා වන මාර්ගය ලබා ගැනීම

වන භූමිය හරහා වැටී ඇති යක්කුරේ ගම්මානය සඳහා වන මාර්ග අයිතිය ජනතාවට ලබා දීම සඳහා විසඳුමක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

මෙම කරුණ පිළිබඳව විමර්ශනය කිරීමට කමිටුවක් පත්කර සතියක් ඇතුළත වාර්තා කරන ලෙසත් කුඹුරු ඉඩම් නැවත අත්පත් කරගැනීමේ දී ඒවා පිළිබඳව පරීක්ෂණයක් කර කඩිනම් පියවර ගන්නා ලෙසත් ගරු සභාපතිතුමා විසින් රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත උපදෙස් ලබා දෙන ලදී.

### 2.3.2. ප්‍රදේශයේ මිරිදිය ධීවර කර්මාන්තයේ නියුතු ජලාශ ප්‍රදේශය නිදහස් කර ගැනීම

මිරිදිය ධීවර කර්මාන්තයේ නියුතු ජලාශ ප්‍රදේශය ජී.පී.එස්. තාක්ෂණය මඟින් හඳුනාගෙන එම ප්‍රදේශ ධීවර කර්මාන්තය සඳහා නිදහස් කිරීමට කරන ලද නියෝගය ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

නියෝග ක්‍රියාත්මක නොවීම පිළිබඳව අවධානය යොමු කර ක්‍රියා කරන ලෙස ගරු සභාපතිතුමා විසින් රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ට දැනුම් දෙන ලදී.

මෙම කරුණ සම්බන්ධ වාර්තාවක් ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශයේ ලේකම්ට උපදෙස් ලබා දෙන ලදී.

### 2.3.3. වන ජීවී කලාපවල පවත්නා කුඹුරු ඉඩම් අයිතිය ලබා දීම

වැලිකන්ද ප්‍රදේශයේ, මැදිරිගිරිය ගොඩපොත්ත වැනි ප්‍රදේශයන්හි වන ජීවී කලාප තුළ ඇති කුඹුරු ඉඩම්වල සාම්ප්‍රදායිකව ගොවිතැන් කිරීමෙහි නිරත ජනතාව වෙත එම කුඹුරු ඉඩම් අයිතිය ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 2.4. ත්‍රිකුණාමලයේ කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ආලන්කුලම් යන ප්‍රදේශයේ වගා ඉඩම් අයිතිය ලබා දීම - ගරු එම්. එස්. තවුෆික් මහතා

ත්‍රිකුණාමලයේ කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ආලන්කුලම් ප්‍රදේශයේ වගා ඉඩම් වනජීවී කලාප මායිම් වලට ඇතුළත් වීම හේතුවෙන් එම ගම්වැසියන් මුහුණ පා සිටින ගැටළු සඳහා විසඳුමක් ලබා ගැනීමේ හැකියාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මෙම කරුණ සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම්ට උපදෙස් ලබා දෙන ලදී.

**2.5. යක්කුරේ මාර්ගය ජනතාවට විවෘත කිරීම සම්බන්ධයෙන් පාරිසරික වාර්තාවක් ලබා ගැනීම - ගරු ඩී. වීරසිංහ මහතා**

මෙම කරුණ සම්බන්ධයෙන් පරිසර සංවිධාන හෝ වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය විසින් පාරිසරික ඇගයීම් වාර්තාවක් පිළියෙළ කර තිබේද යන්න සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මෙම කරුණ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකර අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.6. අලි වැට සම්පූර්ණ කිරීම - ගරු අමරකීර්ති අතුකෝරළ මහතා**

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සිදුවන වල් අලි ගම් වැදීම සඳහා පිළියමක් ලෙස ඇලහැර අලි වැට කණු යොදා සම්පූර්ණ කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**2.7. උතුරු - නැගෙනහිර යුධ වාතාවරණය තුළ තමන්ගේ වාසභූමි වලින් ඉවත්වූ ජනතාව නැවත පදිංචි කිරීම සහ වෙනත් කරුණු - ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා**

**2.7.1. අම්පාර දිස්ත්‍රික්කයට අයත් පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඇති කනගර් ග්‍රාමය නිදහස් කිරීම**

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඇතුළුවීමට තහංචි පනවා ඇති උතුරු - නැගෙනහිර අම්පාර දිස්ත්‍රික්කයට අයත් පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කනගර් ග්‍රාමය එම ජනතාවට නැවත ලබා දීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**2.7.2. වවුනියාව නෙඩුංකේනිහි ඇති විඩ්ත්තනාර් මලෙයි පෞරාණික ශිව කෝවිලට යන මාර්ගය**

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඇතුළුවීමට තහංචි පනවා ඇති එම මාර්ගය ජනතාවට විවෘත කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**2.7.3. වවුනියාව දිස්ත්‍රික්කයේ වෙඩිවයිත්තකල්, නාවලර් පන්නෙයි ප්‍රදේශය සම්පූර්ණයෙන් නිදහස් කිරීම**

වවුනියාව දිස්ත්‍රික්කයේ වෙඩිවයිත්තකල්, නාවලර් පන්නෙයි ප්‍රදේශය සම්පූර්ණයෙන් නිදහස් කළ යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

**2.7.4. මන්නාරම මුසලි ප්‍රදේශයේ ජනතාව එහි ඇති ඔය ආශ්‍රිතව වසර 40 ක් පමණ ධීවර කටයුතුවල නිරත වීම**

මුසලි ප්‍රදේශයේ ජනතාව එහි ඇති ඔය ආශ්‍රිතව ධීවර වෘත්තියේ යෙදීමේදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඔවුන් අත්අඩංගුවට ගෙන නඩු පැවරීමට කටයුතු කිරීමේ ගැටළුව විසඳන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 2.7.5. මුලතිව් දිස්ත්‍රික්කයේ ඇති මඩ ඉඩම් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මායිම්වලට ඇතුළත් කර තිබීම

මුලතිව් දිස්ත්‍රික්කයේ මඩ ඉඩම් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මායිම්වලට ඇතුළත් කර ඇති බැවින් එම ඉඩම් නිදහස් කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 2.7.6. කිලිනොච්චි - තේරාවිල ප්‍රදේශයේ පුන්නෙයි නීරාවි ග්‍රාමය තුළ ඇති පැරණි සොහොන් භූමිය

කිලිනොච්චි - තේරාවිල ප්‍රදේශයේ පුන්නෙයි නීරාවි ග්‍රාමයේ විල්පත්තුව වනය තුළ ඇති පැරණි සොහොන් භූමිය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් නිදහස් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 2.8. මදු ඇටවීම වැනි ම්ලේච්ඡ ක්‍රම භාවිතයෙන් සතුන් ඝාතනය වැළැක්වීම - ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතා

ඉතා ම්ලේච්ඡ ආකාරයෙන් සතුන් දඩයම් කිරීම හා සත්ත්ව ඝාතනය සම්බන්ධ නීති දැඩි කළ යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මීට අදාළ නීති සම්පාදන කටයුතු සඳහා ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතා සහ අදාළ පාර්ශවයන් වෙත අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම් වෙත උපදෙස් ලබා දෙන ලදී.

## 2.9. ගරු කුමාරසිරි රත්නායක මහතා විසින් කරන ලද යෝජනා

### 2.9.1. ඔක්කම්පිටිය ඉලුප්පිටිය දක්වා අලි වැට ඉදිකිරීම හා අගල් කැපීම

ඔක්කම්පිටිය සිට ඉලුප්පිටිය දක්වා කිලෝ මීටර් 3.8 ක පමණ ප්‍රමාණයක් සඳහා අලි වැට සෑදීමට හැකි ඉක්මණින් ප්‍රතිපාදන නිකුත් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ සම්බන්ධව පිළිතුරක් ලබා දීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම්ට දැනුම් දෙන ලදී.

### 2.9.2. වැව් ප්‍රතිසංස්කරණ කටයුතු

වන භූමි කලාප තුළ හා පිටත ඇති වැව් ප්‍රතිසංස්කරණය හා නව වැව් ඉදි කිරීමේ දී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් අවශ්‍ය වන නිරවුල් කිරීම් සඳහා කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

වැව් ප්‍රතිසංස්කරණය සඳහා අවශ්‍ය පසුබිම සකස් කිරීමට විස්තර ඇතුළත් ඉල්ලීමක් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීතුමාට දැනුම් දෙන ලදී.

### 2.9.3. රක්ෂිත ප්‍රදේශයන්හි හේන් වගාව සම්බන්ධව

අවශේෂ කැලෑ ගැසට් නිවේදනයක් මගින් නැවත නිදහස් කිරීම සඳහා කටයුතු කිරීමට සූදානම් වී ඇති අවස්ථාවේ හේන් ගොවිතැන් කර ඇති ඉඩම්වල රක්ෂිත කණු නැවත සිටුවීමට කටයුතු කර තිබීම සම්බන්ධව අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම කරුණු පිළිබඳව වාර්තාවක් කැඳවන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශයේ ලේකම්ට උපදෙස් ලබා දෙන ලදී.

## 2.10. හීලෑ අලි පනත යාවත්කාලීන කිරීම සහ වෙනත් කරුණු - ගරු වසන්ත යාපා බණ්ඩාර මහතා

### 2.10.1. හීලෑ අලි පනත යාවත්කාලීන කිරීම

දළදා පෙරහැර වැනි සංස්කෘතික අංගයන් පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය හීලෑ අලි සංචිතයෙහි අවශ්‍යතාව සහ ඒ සඳහා හීලෑ අලි පනත සංශෝධනය කිරීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

හීලෑ අලි පනතට අවශ්‍ය සංශෝධනයන් කර ඒ අනුව සංස්කෘතික අංගයන් පවත්වා ගෙන යාමට අදාළ කටයුතු ඉදිරියේ දී සූදානම් කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 2.10.2. මහනුවර දිස්ත්‍රික්කයේ ඇති හුදකලා ගම්මාන සම්බන්ධව

මීමුරේ, උඩගල දෙබොක්ක, ගලමුදුන, යහන්ගල වැනි හුදකලා ගම්මනාවල පවතින අති දුෂ්කරතා හේතුවෙන් ගම්වැසියන් එම ප්‍රදේශවලින් ඉවත් වී වෙනත් ස්ථානවල පදිංචි වීමට කැමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඒ අනුව වනබිම් ප්‍රදේශ මැද පිහිටා ඇති ගම්බිම් නිදහස් කර එම ගම්වැසියන්ට පහළ භූමීන් ලබා දීම පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා ගරු මන්ත්‍රීතුමා වෙත අවස්ථාව සලසා දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශයේ ලේකම් වෙත දැනුම් දෙන ලදී.

### 2.10.3. රිලවුන් ගහණය සම්බන්ධව

රිලා ගහණය සම්බන්ධව විධිමත් පාලනයක් සිදු කිරීමේ වැදගත්කම පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම කරුණ පිළිබඳව කටයුතු කරමින් සිටින බැවින් ගරු මන්ත්‍රීතුමාගේ යෝජනා අමාත්‍යාංශය වෙත ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 2.11. ලාහුගල පොතුවිල් වන භූමි මායිම් නිරවුල්කරණය සහ තෘණ උලා කෑම සඳහා භූමීන් ලබා දීම - ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා

### 2.11.1. ලාහුගල පොතුවිල් වන භූමි මායිම් නිරවුල්කරණය

ලාහුගල පොතුවිල් මායිම් නිරවුල්ව යොදා නොමැති බවත් මේ සම්බන්ධව මෙතෙක් නිශ්චිත තීරණයක් ගෙන නොමැති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කමිටුවක් පත් කර ඉහත කාරණය පිළිබඳ වාර්තාවක් ඊළඟ සභාවාරයේ දී ගරු මන්ත්‍රීතුමාට ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් වන සංරක්ෂණ ජනරාල්ට උපදෙස් ලබා දෙන ලදී.

### 2.11.2. තෘණ උලා කෑම සඳහා භූමීන් ලබා දීම

තෘණ උලා කෑම සඳහා භූමීන් ලබා දීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ පිළිබඳව අවශ්‍ය කටයුතු කිරීමට සූදානම් බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 2.12. මහ විල්ලුව ජලාශ සංචාරක නිකේතන භූමිය නිදහස් කර ගැනීම සහ ඉලුඹකන්ද එනසාල් වගාව - ගරු ජානක වක්කුඹුර මහතා

### 2.12.1. මහ විල්ලුව ජලාශ සංචාරක නිකේතන භූමිය නිදහස් කර ගැනීම

මන්නාරම දිස්ත්‍රික්කයේ කුණ්ඩච්චි ප්‍රදේශයේ මහ විල්ලුව ජලාශය අසළ වන සංරක්ෂණ කලාපයට අයත් වැව්ලි අමාත්‍යාංශයේ සංචාරක නිකේතන භූමිය නිදහස් කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

අදාළ ප්‍රදේශය දැක්වෙන සිතියමක් ද සමඟ මේ සම්බන්ධ ඉල්ලීමක් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීතුමාට දැනුම් දෙන ලදී.

එම සිතියම් අධ්‍යයනය කර ඒ පිළිබඳ වාර්තාවක් ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම්වට උපදෙස් ලබා දෙන ලදී.

### 2.12.2. ඉලුඹකන්ද එනසාල් වගාව

කලවාන, ඉලුඹකන්ද ප්‍රදේශයේ ඇති අක්කර 1200ක එනසාල් වගාවෙන් ලැබෙන ඵලදාව නෙළා ගැනීමට නිසි ක්‍රමවේදයක් සලසා දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම කලවාන එනසාල් වගාව සම්බන්ධව ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීතුමාට දැනුම් දෙන ලදී.

## 2.13. කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පූනකරි ප්‍රා.ලේ.කොට්ඨාශයේ මුක්කොම්බන් ග්‍රාමයේ අක්කර 06 ක් නිදහස් කරගැනීම සහ වෙනත් කරුණු - ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

### 2.13.1. කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පූනකරි ප්‍රා.ලේ.කොට්ඨාශයේ මුක්කොම්බන් ග්‍රාමයේ අක්කර 06 ක් නිදහස් කරගැනීම

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පූනකරි ප්‍රා.ලේ.කොට්ඨාශයේ මුක්කොම්බන් ග්‍රාමයේ ජනතාව දීර්ඝ කාලයක් පවත්වාගෙන එන පාරම්පරික ගව සවාරි ක්‍රීඩාව පැවැත්වීම සඳහා වෙන්කරන ලද අක්කර 6ක ක්‍රිඩාංගණය වන සංරක්ෂිත මායිම්වලට ඇතුළත් කර ඇති බැවින් එම ඉඩම ජනතාවට නිදහස් කරදෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 2.13.2. කිලිනොච්චි දිස්ත්‍රික්කයේ වට්ටකච්චි ප්‍රා.ලේ.කොට්ඨාශයේ ඉලද්තලිර් ක්‍රීඩා සංගමයට අක්කර 02 ක් නිදහස් කරගැනීම

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ වට්ටකච්චි ප්‍රා.ලේ.කොට්ඨාශයේ ඉලද්තලිර් ක්‍රීඩා සංගමයට ලබාදී තිබූ අක්කර 06 ක ඉඩම දැනට වන සංරක්ෂිත මායිම්වලට ඇතුළත් කර ඇති බැවින් එම ඉඩමෙන් අක්කර 02 ක් හෝ ජනතාවට නිදහස් කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 2.13.3. කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ආනවිලුද්දාන්කුලම් ප්‍රදේශයේ ඇති අක්කර 300 ක මඩ ඉඩම් ගොවීන්ට නිදහස් කිරීම

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ආනවිලුද්දාන්කුලම් ප්‍රදේශයේ ඇති අක්කර 300 ක මඩ ඉඩම් ගොවීන්ට නිදහස් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 2.13.4. සුන්ඩික්කුලම සහ යාපනය අතර ඇති කරියල්වයල් කුඹුරු ඉඩම් නිදහස් කරගැනීම

මීට පෙර වගා කටයුතු සිදු කළ සුන්ඩික්කුලම සහ යාපනය අතර ඇති කරියල්වයල් කුඹුරු ඉඩම් වනජීවී සංරක්ෂිත මායම් වලට ඇතුළත් වී ඇති බැවින් එහි අක්කර 280 ක් ගොවීන්ට නිදහස් කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ කරුණු පිළිබඳ යුධ හමුදාපති සමඟ සාකච්ඡා කර වාර්තාවක් සකසා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

## 2.14. හම්බන්තොට යෝජිත අලි කළමනාකරණ (Managed Elephant Reserve - MER) රක්ෂිතය සඳහා යෝජිත ඉඩම් ගැසට් කිරීම සහ වෙනත් කරුණු - ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

### 2.14.1. හම්බන්තොට යෝජිත අලි කළමනාකරණ (Managed Elephant Reserve - MER) රක්ෂිතය සඳහා යෝජිත ඉඩම් ගැසට් කිරීම

මහවැලි අමාත්‍යාංශයට හා රජයට අයත් ඉඩම් සහිත හම්බන්තොට යෝජිත අලි කළමනාකරණ (Managed Elephant Reserve - MER) රක්ෂිතය සඳහා යෝජිත ඉඩම් කඩිනමින් ගැසට් කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 2.14.2. පාරම්පරික හේන් වගාව

හේන් ගොවිතැන් සිදු කරන ජනතාවට මාස 6 ක් සඳහා ගොවිතැන් කිරීමට අවසර ලබා දෙන බවත් එම භූමිවලින් ඉවත් වන නිසා වන අලීන්ගේ වාස භූමි එයින් අහිමි නොවන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

එම මාස 6න් පසුව ගොවීන් එම ප්‍රදේශවලින් ඉවත් වන්නේ ද යන්න වනජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් අවධානයෙන් සිටිය යුතු බව ද ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

### 2.14.3. සිතුල්පව්ව අභයභූමි කලාපය

සිතුල්පව්ව කොච්චිපතාන /කටගමුව මාර්ගයෙහි කාපට් අතුරා දෙන ලෙසත් එම ප්‍රදේශයේ සැරිසරන වන ඇතා සිතුල්පව්ව කලාපයෙන් වෙනත් ස්ථානයකට ඉවත් කර දෙන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

එම ඇතා ඒ කලාපයෙන් ඉවත් කිරීම සදාචාරාත්මක නොවන බැවින් උපාංගයක් යොදා සත්ත්වයාගේ ගමන් මාර්ග විමර්ශනය කර ජනතාවට යම් තර්ජනයක් ඇති විය හැකි අවස්ථාවලදී එම ඇතා එතැනින් ඉවත් කිරීමට කටයුතු කර ඇති බවත් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ජනවාරි මාසයේදී යාල කටගමුව ප්‍රවේශය නවීකරණය කිරීමටත් ලුණුගම්වෙහෙර කලාපය, යාල 5 කොටස ලෙස නම් කර සංචාරකයින් සඳහා ඉඩ හැරීමට තීරණය කර ඇති බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ගුවන්තොටුපළෙහි විවෘත කිරීමට අපේක්ෂිත කවුළුවක් මඟින් සංචාරකයින් සඳහා ජාතික උද්‍යාන පහ නැරඹීම සඳහා ප්‍රවේශපත් ලබා ගැනීමේ ක්‍රමවේදයක් (Online Booking) (උද්‍යාන සටහන් කරන ලද සිතියම්ද සහිතව) හා මාර්ගගත ප්‍රවේශපත් වෙන් කිරීමේ ක්‍රමවේදයක් ඇති කිරීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම අභයභූමි කලාප තුළ ඇති සංචාරක බංගලා, පෞද්ගලික රාජ්‍ය හවුල්කාරිත්ව ව්‍යාපෘතියක් (Private Public Partnership –PPP) ලෙස අලුත්වැඩියා කිරීමට හා පහසුකම් වර්ධනය කිරීමට අදහස් කරන බවත්, පටලන්ගල යන ස්ථානයේ ආහාර ලබා

ගැනීමට අපානශාලාවක් නවීකරණය කර පවත්වා ගෙන යාමට කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 2.15. ගොවිබිම්වලින් ඉවත් කිරීම - ගරු කින්ස් නෙල්සන් මහතා

තමන්කඩුව, වැලිකන්ද, ලංකාපුර යන කොට්ඨාශවල කුඹුරු අක්කර 1500 ක් පමණ වගා කළ ජනතාව එම වගා බිම්වලින් ඉවත් කර ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ පිළිබඳ අවධානය යොමු කර ඊළඟ සභාවාරයට පෙර වාර්තා කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම්ට දැනුම් දෙන ලදී.

## 2.16. බඩගමුව රක්ෂිතය (කොස්කැලේ) මායිම්ව පිහිටි කුඩා වෙළඳසැල් ඉවත් කිරීම හා අක්‍රියව පවතින වන සංරක්ෂණ දෙපාර්තමේන්තු තොරතුරු කේන්ද්‍රය සහ වෙනත් කරුණු - ගරු මංජුලා දිසානායක මහත්මිය

### 2.16.1. බඩගමුව රක්ෂිතය (කොස්කැලේ) මායිම්ව පිහිටි කුඩා වෙළඳසැල් ඉවත් කිරීම හා අක්‍රියව පවතින වන සංරක්ෂණ දෙපාර්තමේන්තු තොරතුරු කේන්ද්‍රය

මෙම කඩ රක්ෂිත මායිමෙන් ඉවත් කිරීම මඟින් වෙළඳසැල් පවත්වා ගෙන ගිය ජනතාවට සිදුවන දුෂ්කරතා පිළිබඳ යම් පියවරක් ගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමිය විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම කාරණය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කර විසඳුමක් ලබා ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.
තොරතුරු කේන්ද්‍ර ගොඩනැගිල්ල ආශ්‍රිතව පරිසරයට හානියක් සිදු නොවන ආකාරයෙන් ගිමන්හලක් හා පැළ විකිණීමේ ස්ථානයක් සෑදීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම්ට දැනුම් දෙන ලදී.

### 2.16.2. බඩගමුව පෞරාණික වැව ප්‍රතිසංස්කරණය කිරීම

මෙය වාරි සෞභාග්‍යා වැඩසටහනට ඇතුළත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීතුමියට දැනුම් දෙන ලදී.

### 2.16.3. ඉබ්බාගමුව, තලංගමුව වසමට අයත් දික්ගල කන්දෙහි බහුකාර්යය කුළුණක් ඉදිකිරීම

මෙම කුළුණ පරිසර හිතකාමී ලෙස (ස්වභාවික තුරුලතා යොදා ගෙන) ඉදිකරන බවට වූ කොන්දේසිය සමඟ අවසර ලබා දීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් වන සංරක්ෂණ ජනරාල්ට දැනුම් දෙන ලදි.

## 2.17. මොරගහකන්ද ජලාශය ආශ්‍රිත හුදකලා වී ඇති ගම්මාන - ගරු රෝහණ දිසානායක මහතා

වන අලි කරදර හේතුවෙන් දුෂ්කරතා වලට මුහුණපාන මොරගහකන්ද ජලාශය ආශ්‍රිත මොරගොල්ල සහ ගල්බොඩ යන ජනාවාස එම ප්‍රදේශයෙන් ඉවත් කිරීමේ හැකියාව පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

වාරිමාර්ග අමාත්‍යාංශයට අයත් එම ජනාවාස විතැන් කිරීමේ කාර්යය ආරම්භ කළ පසු ඒ සඳහා උපකාර කළ හැකි බවත් ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 2.18. පේරමඩුව ප්‍රදේශයේ වන අලි ප්‍රහාරයක් නිසා ජීවිතක්ෂයට පත් වූ පුද්ගලයින් දෙදෙනෙක් සඳහා වන්දි ලබා ගැනීම - ගරු සිරිපාල ගම්ලත් මහතා

එම කටයුත්ත කඩිනම් කරන ලෙස වන්දි කමිටුව වෙත දන්වන මෙන් ගරු සභාපතිතුමා විසින් වන සංරක්ෂණ ජනරාල්ට උපදෙස් ලබා දෙන ලදී.

## 2.19. ආසිකුලම් ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ අක්කර 50ක පමණ උඳු වගා භූමිය නිදහස් කර ගැනීම සහ වෙනත් කරුණු - ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

### 2.19.1. ආසිකුලම් ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ අක්කර 50ක පමණ උඳු වගා භූමිය නිදහස් කර ගැනීම

වවුනියා දිස්ත්‍රික්කයේ, වවුනියා නගර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, ආසිකුලම්ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ වසර 30ක පමණ කාලයක සිට උඳු වගා කරන අක්කර 50ක පමණ භූමිවල වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන පැල සිටුවීම් තාවකාලිකව හෝ නතර කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ පිළිබඳ අදාළ නිලධාරියාගෙන් විමසන ලෙස ගරු සභාපතිතුමා විසින් වන සංරක්ෂණ ජනරාල්ට උපදෙස් ලබා දෙන ලදී.

### 2.19.2. මන්නාරම දිස්ත්‍රික්කයේ පල්ලි මුනෛ, පරපාන්කන්දල්, වංගාලෛ වැනි ගම්මාන වන භූමි කලාප තුළට ඇතුළත් කිරීම

වන භූමි කලාප වලට ඇතුළත් වන පල්ලි මුනෛ, පරපාන්කන්දල් සහ වංගාලෛ ගම්මාන නැවත ජනතාවට ලබා දීම සම්බන්ධව මෙතෙක් ක්‍රියාත්මක වී නැති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ පිළිබඳ විමසීමක් කර ජනවාරි මාසය වන විට පිළිතුරක් ලබා දීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 2.20. බිබිල ප්‍රාදේශිය සභාව විසින් කැලි කසල පුවක්පැලේ රක්ෂිතයට බැහැර කිරීම සහ වෙනත් කරුණු - ගරු විජිත බේරුගොඩ මහතා

### 2.20.1. බිබිල ප්‍රාදේශිය සභාව විසින් කැලි කසල පුවක්පැලේ රක්ෂිතයට බැහැර කිරීම

බිබිල ප්‍රාදේශිය සභාව විසින් වසර 20 ක පමණ කාලයක් තිස්සේ කැලි කසල බැහැර කිරිමට යොදා ගන්නා අක්කර 20 ක පමණ භූමි ප්‍රමාණය එම කාර්යය සඳහා විධිමත් පරිදි නිදහස් කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

එම යෝජනාව ලිඛිතව ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීතුමාට දැනුම් දෙන ලදී.

### 2.20.2. මැදගම ප්‍රදේශිය සභාවේ කසළ අංගනය හා තඹාන පැපිලියාන 3 කණුව කසළ අංගනය සඳහා භූමිය ලබා ගැනීම

### 2.20.3. මැදගම, බැදියාව වසමේ, තිත්තවැල් කිවුල, අක්කර 60 ගම්මානයට යන මාර්ගයේ මරණාධාර සමිතිය ගොඩනැඟීමට බිම් ප්‍රමාණයක් ලබා ගැනීම

### 2.20.4. සියඹලාණ්ඩුව, අඹේලන්ද ගම්මානය සඳහා වන මාර්ගය සකස් කර ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීම

### 2.20.5. අලුත්වෙල, ගලහබැද්ද සුසාන භූමිය සඳහා බිම් කොටස් වෙන් කර ගැනීම

### 2.20.6. මැදගම, තිත්තවැල් කිවුල, කොලොන්ගස්කඩ සුසාන භූමිය සඳහා බිම් කොටස් වෙන් කර ගැනීම

මෙම කරුණු ඉඩම් පරිහරණ කමිටුවට ද ඉදිරිපත් කරන ලෙසත් අමාත්‍යාංශය මට්ටමින් මේ සම්බන්ධව ගත හැකි සුදුසු ක්‍රියාමාර්ග කඩිනමින් ගන්නා බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 2.21. බෝගහපැලැස්ස රක්ෂිත වනය - ගරු තිසකුට්ටි ආරච්චි මහතා

හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මහලන්ද ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ බෝගහපැලැස්ස රක්ෂිතයට අයත් ඉඩම් අවිධිමත් වගාව හා පදිංචිය සඳහා යොදා ගෙන ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඒ අනුව, වගාවන්ට හා ජලාශ සඳහා මෙම ඉඩම් නිසි ආකාරයෙන් බෙදා දීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ඉඩම් බෙදිය යුතු ආකාරය පිළිබඳ නිසි වාර්තාවක් වන සංරක්ෂණ ජනරාල්ට හා අමාත්‍යාංශ ලේකම්ට ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීතුමාට දැනුම් දෙන ලදි.

එම වාර්තාවේ කරුණු විමසා බලා මේ සම්බන්ධව වාර්තාවක් සකස් කර ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් වන සංරක්ෂණ ජනරාල්ට හා අමාත්‍යාංශ ලේකම්ට උපදෙස් ලබා දෙන ලදී.

## 2.22. නැවත වගා කිරීම අරඹන ඉඩම් නිදහස් කර ගැනීම සහ වෙනත් කරුණු - ගරු කපිල අතුකෝරල මහතා

### 2.22.1. නැවත වගා කිරීම අරඹන ඉඩම් නිදහස් කර ගැනීම

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ත්‍රස්තවාදී කලබල හේතුවෙන් අතහැර නැවත වගා කිරීම ආරම්භ කර ඇති ඉඩම් වගා කටයුතු සඳහා නිදහස් කිරීමට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ  මැදිහත් වීම අපේක්ෂා කරන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 2.22.2. කන්තලේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තු කාර්යාලය

මෙම කාර්යාලය වෙත ළඟා වීමට ප්‍රවේශ මාර්ගය සකසා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම යෝජනාව කිලෝ මීටර් ලක්ෂයේ වැඩසටහනට ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 2.22.3. කන්තලේ ප්‍රදේශයේ ගව ගහණය සඳහා ඉඩකඩ වෙන් කිරීම

මේ සඳහා සුදුසු ඉඩම් තෝරා ගෙන ඒ සඳහා යෝජනාවක් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 2.22.4. ත්‍රිකුණාමලය දිස්ත්‍රික් වන සංරක්ෂණ නිලධාරීන්ගේ ආරක්ෂාව සඳහා කටයුතු කිරීම හා වාහන පහසුකම් ලබා දෙන ලෙස ඉල්ලීම

මී ළඟ වර්ෂයේ සිට වාහන පහසුකම් හා අනෙකුත් පහසුකම් ලබා දීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 2.22.5. වන ක්ෂේත්‍ර නිලධාරීන්ගේ හා බීට්ටු වන නිලධාරීන්ගේ වැටුප් වර්ධකයන්

වන සංරක්ෂණ නිලධාරීන්ට අවශ්‍යතාව අනුව අවදානම් දීමනා ලබා දීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

රාජකාරිය නිසි පරිදි ඉටු කරන නිලධාරීන්ගේ සේවය ඇගයීමේ වැඩපිළිවෙලක් සකස් කරන බවත් එසේ ඉටු නොකරන නිලධාරීන් සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගන්නා බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 2.23. කෑගැල්ල දිස්ත්‍රික්කයේ සල්ගල රක්ෂිතය තුළ කාලයක් තිස්සේ සිදුවන වන විනාශය හා මත්පැන් ජාවාරම  සහ වෙනත් කරුණු - ගරු සුදත් මංජුල මහතා

### 2.23.1. කෑගැල්ල දිස්ත්‍රික්කයේ සල්ගල රක්ෂිතය තුළ කාලයක් තිස්සේ සිදුවන වන විනාශය හා මත්පැන් ජාවාරම

මෙම රක්ෂිතයේ ආරක්ෂාව උදෙසා ගලපිටමඩ නගරය කේන්ද්‍ර කර ගනිමින් පොලිස් මුරපොළක් ඇති කළ යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

සංචාරක පොලිස් ඒකකයක් පිහිටුවන ලෙස ඉල්ලීමක් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ නිලධාරීන්ට දැනුම් දෙන ලදී.

#### 2.23.2. සල්ගල අවට රිලවුන් නිසා සිදුවන වගා විනාශය වැළැක්වීම

සල්ගල අවට රිලවුන් නිසා සිදුවන වගා විනාශය වැළැක්වීමට සතුන් වෙනත් ප්‍රදේශයකට යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම කරුණට ප්‍රමුඛත්වයක් ලබා දී කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 2.24. උඩවලව රක්ෂිතයට අයත් තෘණ වගාව සඳහා ලබා දී ඇති භූමිය සහ වෙනත් කරුණු - ගරු වරුණ ලියනගේ මහතා

#### 2.24.1. උඩවලව රක්ෂිතයට අයත් තෘණ වගාව සඳහා ලබා දී ඇති භූමිය

වැලිගෙපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හඳගිරිය යන ප්‍රදේශයේ තෘණ වගාව සඳහා  උඩවලව රක්ෂිතයට මුදා හැර ඇති බිම් කොටස භාවිතා නොකරන බැවින් එය නැවත රක්ෂිතයට එක් කර ගන්නා ලෙසත් ගම්මානයට ඇතුළු වී ඇති අලි නැවත රක්ෂිතයට යොමු කරන ලෙසත් ඉල්ලීමක් කරන ලදී.

මේ පිළිබඳ පරීක්ෂණයක් කර අවශ්‍ය පියවර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

#### 2.24.2. උඩවලව ඇත් අතුරු සෙවණ නැවත විවෘත කරන ලෙස ඉල්ලීම

කොවිඩ් 19 වසංගත වැළැක්වීමේ සෞඛ්‍යය මාර්ගෝපදේශ අනුව වසා දමා ඇති උඩවලව ඇත් අතුරු සෙවණ සෞඛ්‍යය උපදෙස් පිළිපදිමින් නැවත විවෘත කිරීමේ හැකියාව පිළිබඳ අවධානය යොමු කර කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

#### 2.24.3. පට්ටිපොළ සිට ඔහිය වෙත ප්‍රවේශ වන මාර්ගයේ ප්‍රවේශපත් නිකුත් කිරීම

ප්‍රවේශපත් නිකුත් කිරීම පිළිබඳ කරුණු විමසා බලා මුදල් අය කිරීමක් සිදුවේ නම් එය ඉවත් කිරීම පිළිබඳව සළකා බැලිය හැකි බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 2.25. ගොවි ජනතාව මුහුණදෙන වන අලි ගැටළුව - ගරු තවරාජා කලෙයි අරසන් මහතා

සමන්තුරෙයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මල්ලියතීවු සහ නාවිදමොලි ප්‍රාදේශීය ලේකම් කොඨාශයේ වීරච්චෝලෙයි යන ග්‍රාමයන්වල අලි වැටවල් තැනීමට කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ සම්බන්ධව ලිඛිත ඉල්ලීමක් ලබා දෙන ලෙසත් ඒ පිළිබඳ අවධානය යොමු කළ හැකි බවත් රාජ්‍ය අමාත්‍ය ගරු විමලවීර දිසානායක මහතා විසින් දැනුම් දෙන ලදී.

## 2.26. අලි වැට ක්‍රියාත්මක නොවීම සහ වෙනත් කරුණු - ගරු ජගත් පුෂ්පකුමාර මහතා

### 2.26.1. හම්බෙගමුව, රතබලාගම සහ බලහරුව ප්‍රදේශවල අලි වැට ක්‍රියාත්මක නොවීම

නඩත්තු කටයුතු සඳහා පැවති මානව සම්පත් හිඟය මේ වනවිට අවම වෙමින් පවතින බැවින් අලි වැට නඩත්තු කටයුතු සිදු කළ හැකි බව වන සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී

### 2.26.2. වන අලින්ට පවතින ආහාර හිඟය

වන අලින්ගේ ආහාර හිඟයට විසඳුමක් ලෙස අක්කර 100ක් පමණ ප්‍රදේශයක් අලින්ගේ ආහාර වගා කිරීමට වෙන් කිරීමට ඇති හැකියාව පිළිබඳ ගරු මන්ත්‍රීතුමා විසින් විමසන ලද අතර මේ සම්බන්ධව ප්‍රායෝගික විසඳුමක් ගත යුතු බවට යෝජනා කරන ලදී.

### 2.26.3. අවශේෂ කැළෑ තුළ මායිම් වෙන් කර ගනිමින් කැළෑ එළි කිරීම

බුත්තල ප්‍රදේශයේ සිදුවන වන විනාශය සම්බන්ධව පරීක්ෂණයක් සිදු කරන ලෙස පොලිස්පතිගෙන් ඉල්ලීමක් කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 2.26.4. දහයියාගල අභය භූමිය

2002 වර්ෂයේ දී දහයියාගල අභය භූමියක් ලෙස ගැසට් කරන අවස්ථාව වන විට එම භූමියේ පදිංචි වී සිටි බලපත්‍රලාභීන්ට හා ඔප්පු හිමි අයට වන්දියක් හෝ ලබා දී සහනයක් සලසා දෙන ලෙස යෝජනා කරන ලදී

මේ පිළිබඳව එම ප්‍රදේශයට ගොස් විමර්ශනයක් කර අවශ්‍ය කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම්වට උපදෙස් ලබා දෙන ලදී.

**3.** කාරක සභාව ප.ව. 2.00 ට 2021 ජනවාරි 08 වැනි දින පෙ.ව. 10.30 දක්වා කල් තබන ලදී.

---

## ප්‍රවාහන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
## පළමුවැනි රැස්වීම - 2020 දෙසැම්බර් 04

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ගරු ගාමිණී ලොකුගේ මහතා (සභාපති)
ගරු දිලුම් අමුණුගම මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු අශෝක් අබේසිංහ මහතා
ගරු මොහමඩ් මුසම්මිල් මහතා
ගරු මධුර විතානගේ මහතා

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු අංගජන් රාමනාදන් මහතා
ගරු පියංකර ජයරත්න මහතා
ගරු එස්. වියාලේන්ද්‍රන් මහතා
ගරු රෝහණ දිසානායක මහතා
ගරු කේ. කාදර් මස්තාන් මහතා
ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
ගරු අමරකීර්ති අතුකෝරළ මහතා
ගරු උදයන කිරිදිගොඩ මහතා
ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා
ගරු මිලාන් ජයතිලක මහතා
ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා
ගරු එච්. නන්දසේන මහතා
ගරු අසංක නවරත්න මහතා
ගරු සුදත් මංජුල මහතා
ගරු මායාදුන්න චින්තක අමල් මහතා
ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා
ගරු ගුණතිලක රාජපක්ෂ මහතා
ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා
ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
ගරු මංජුලා දිසානායක මහත්මිය
ගරු ඩයනා ගමගේ මහත්මිය

## 1. අමාත්‍යාංශයීය කටයුතු පිළිබඳ සාකච්ඡාව

### 1.1. ගම්පහ දිස්ත්‍රික්කයේ අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නිට්ටඹුව බස් ඩිපෝව සහ වෙනත් කරුණු - ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

#### 1.1.1. ගම්පහ දිස්ත්‍රික්කයේ අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නිට්ටඹුව බස් ඩිපෝව

මෙම බස් ඩිපෝවට අයත් ප්‍රයෝජනයට නොගත් භූමි ප්‍රදේශය ඵලදායී සංවර්ධන කාර්යයක් සඳහා යොදා ගන්නා ලෙසත් එම ඩිපෝව සංවර්ධනය කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

බස් ඩිපෝ නවීකරණ ව්‍යාපෘතිය යටතේ මෙම බස් ඩිපෝව ද සංවර්ධනය කරන බව රාජ්‍ය අමාත්‍ය, ගරු දිලුම් අමුණුගම මහතා විසින් දැනුම් දෙන ලදී.

#### 1.1.2. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ආයතනවල යටිතල පහසුකම් වැඩිදියුණු කර කාර්ය මණ්ඩල සුභසාධන කටයුතු සඳහා පහසුකම් ඇති කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.1.3. ග්‍රාමීය බස් සේවය වැඩිදියුණු කිරීම

ගම්පහ දිස්ත්‍රික්කයේ අත්තනගල්ල, දොම්පේ සහ මීරිගම වැනි ඉතාමත් ග්‍රාමීය ප්‍රදේශවල ජනතාවගේ ගමනාගමන අවශ්‍යතා සඳහා කුඩා බස් රථ යොදවා ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.1.4. විදුලි දුම්රිය ව්‍යාපෘතිය

වේයන්ගොඩ නගරය හරහා යෝජිත විදුලි දුම්රිය සේවාව පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

වේයන්ගොඩ නගරයද ඇතුළත්ව කළුතර නගරයේ සිට රඹුක්කන දක්වා විදුලි දුම්රිය සේවයක් ඇති කිරීමට සැලැස්මක් ඇති බව දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් දැනුම් දෙන ලදී.

### 1.1.5. ගම්පහ - වේයන්ගොඩ ප්‍රදේශය තුළ පටු දුම්රිය ස්ථාන පුළුල් කිරීම

මෙම ප්‍රදේශයට අයත් හීන්දෙනිය, පට්ටිගොඩ සහ දාරළුව වැනි දුම්රිය ස්ථාන පුළුල් කර සංවර්ධනය කර දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 1.2. බස් ඩිපෝ සංවර්ධනය කිරීම සහ වෙනත් කරුණු - ගරු අශෝක් අබේසිංහ මහතා

### 1.2.1. බස් ඩිපෝ සංවර්ධනය කිරීම

බස් ඩිපෝවල සේවයේ නියුතු කාර්ය මණ්ඩලයට අදාළ සුභසාධන කටයුතු දියුණු කර සේවක කාර්යක්ෂමතාවය ඇතිවන අයුරින් දිවයින පුරා ඇති ඩිපෝ සංවර්ධනය කිරීමට කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.2.2. ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තියක් සකස් කිරීම

2018 දී ආරම්භ කරන ලද ප්‍රවාහන ප්‍රතිපත්තියෙහි වැඩ කටයුතු අවසන් කර ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය හඳුන්වා දීමට කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.2.3. දේශපාලන පළිගැනීම් නැවැත්වීම

රාජ්‍ය පාලන බල හුවමාරුවත් සමඟ අමාත්‍යාංශයට අයත් ආයතනවල සිදුවන දේශපාලන පළිගැනීම් නැවැත්වීමට කටයුතු කර දේශපාලන පලිගැනීම්වලදී අසාධාරණයට ලක්වූවන්ට ගෙවීමට වෙන්කර ඇති ප්‍රතිපාදන තුළින් සහන සලසන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

2020 වසරේදී සිදු වූ රාජ්‍ය බල හුවමාරුවේදී කිසිදු දේශපාලන පළිගැනීමක් ඇතිවීමට ඉඩ නොදුන් බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.2.4. ජාතික ප්‍රවාහන කොමිසමේ අධ්‍යක්ෂ මණ්ඩලය පත්කිරීම සම්බන්ධ ගැටළු

අධ්‍යක්ෂ මණ්ඩලය පත් කළ යුත්තේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත හෙයින් පත්කර ඇති මණ්ඩලය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුනේද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

### 1.2.5. පෞද්ගලික බස් රථ මාර්ග අවසරපත් ලබාදීමේ අක්‍රමිකතා

ටෙන්ඩර් ක්‍රියාවලියකින් තොරව අයථා ලෙස බස් රථ ධාවන මාර්ග අවසර පත් ලබා දී ඇති හෙයින් පරීක්ෂණයක් පවත්වන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.2.6. දුම්රිය ස්ථාන නවීකරණය කිරීම

පෞද්ගලික ආයතන සම්බන්ධ කරගෙන දුම්රිය ස්ථාන නවීකරණයට පියවර ගන්නා මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම කාර්යය සඳහා පෞද්ගලික අංශය සම්බන්ධ කරගැනීමට දැනටමත් කටයුතු කරමින් පවතින බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

කොටුව දුම්රිය ස්ථානයද මේ ආකාරයට නවීකරණය කරන බවද ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය සම්බන්ධයෙන්ද ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

### 1.2.7. දුම්රිය කෞතුකාගාරයක් ස්ථාපනය කිරීම

වැඩ ආරම්භ කර ඇති මරදාන දුම්රිය කෞතුකාගාරය ඉදිකිරීමේ වත්මන් තත්ත්වය පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් ඉදිකිරීම් කටයුතු කරගෙන යන බව දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් දැනුම් දෙන ලදී.

සැහැල්ලු දුම්රිය ප්‍රවාහන ව්‍යාපෘතිය (Light Rail Transit System Project) හැර ආරම්භ කර ඇති සියලුම ව්‍යාපෘතීන්හි කටයුතු සිදුකරගෙන යන බව ගරු සභාපතිතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

## 1.3. අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැබිතිගොල්ලෑව බස් ඩිපෝව සංවර්ධනය කිරීම සහ වෙනත් කරුණු - ගරු එච්. නන්දසේන මහතා

### 1.3.1. කැබිතිගොල්ලෑව බස් ඩිපෝව සංවර්ධනය කිරීම

මෙම ඩිපෝව කඩිනම් වැඩපිළිවෙලක් යටතේ සංවර්ධනය කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

බස් ඩිපෝ නවීකරණ ව්‍යාපෘතිය යටතේ කැබිතිගොල්ලෑව බස් ඩිපෝව ද සංවර්ධනය කරන බව රාජ්‍ය අමාත්‍ය, ගරු දිලුම් අමුණුගම මහතා විසින් දැනුම් දෙන ලදී.

### 1.3.2. අනුරාධපුර දිස්ත්‍රික්කයේ බස් ඩිපෝවල කාර්ය මණ්ඩල හිඟය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ බස් ඩිපෝවල රියදුරු, කොන්දොස්තර, ඉංජිනේරු කාර්ය මණ්ඩලය හිඟ බැවින් අළුතින් සේවක පිරිස් බඳවා ගන්නා මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

අමාත්‍යාංශයේ මැදිහත්වීම මත ඉදිරියේදී ප්‍රවාහන ක්ෂේත්‍රය සම්බන්ධ ගැටළු සාකච්ඡා කර විසඳුම් ලබාදීම සඳහා ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහභාගීත්වයෙන් දිස්ත්‍රික් ප්‍රවාහන කමිටු පිහිටුවීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.3.3. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් අනුරාධපුරය, මැදවච්චිය කාර්මික වැඩපොළ සංවර්ධනය කිරීම

කලින් බස්රථ නිපදවූ මෙම වැඩපොළ දැනට ක්‍රියාත්මක නොවන බැවින් ඒවා ඵලදායී කාර්යයක් සඳහා යොදා ගන්නා මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

පවතින කොන්දොස්තර සහ රියදුරු පුරප්පාඩු පිරවීම සඳහා භාරසිය දෙනෙකු පුහුණු කර ඇති බව රාජ්‍ය අමාත්‍ය, ගරු දිලුම් අමුණුගම මහතා විසින් දැනුම් දෙන ලදී.

බස් ඩිපෝ නවීකරණ ව්‍යාපෘතිය යටතේ දැනට ඩිපෝවල සේවක සංඛ්‍යාව හා තනතුරු, ගොඩනැගිලි, ධාවනය වන බස්රථ, අබලි බස් රථ සම්බන්ධ ක්ෂේත්‍ර සමීක්ෂණයක් සිදුකරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

සමීක්ෂණයේ ප්‍රතිඵල මත පළමුවෙන්ම බස් ඩිපෝ දහයක් සංවර්ධනය කරන බව ගරු සභාපතිතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

## 1.4. දුම්රිය මාර්ග නවීකරණය ඇතුළු ප්‍රවාහන ක්ෂේත්‍රයේ දැනට ක්‍රියාත්මක හා යෝජිත ව්‍යාපෘති සම්බන්ධ තොරතුරු ලබා ගැනීමේ දුෂ්කරතා සහ වෙනත් කරුණු - ගරු මධුර විතානගේ මහතා

### 1.4.1. ප්‍රවාහන ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක හා යෝජිත ව්‍යාපෘති වල තොරතුරු ලබා ගැනීම

ප්‍රවාහන ක්ෂේත්‍රයේ දැනට ක්‍රියාත්මක හා යෝජිත ව්‍යාපෘතිවල තොරතුරු ලබාගැනීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකසන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.4.2. කොළඹ දිස්ත්‍රික්කයේ මීතොටමුල්ල බස් ඩිපෝව

මෙම ඩිපෝව සංවර්ධනය කර දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.4.3. කොළඹ නගර සීමාවේ ජල මාර්ග හරහා මගී ප්‍රවාහන සේවාවක් ඇති කිරීම

මාර්ග තදබදය අවම කිරීම සඳහා ජල මාර්ග සම්බන්ධිත ප්‍රවාහන සේවාවක් අරඹන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

භාවිතයට ගන්නා මගීන්ගේ සුරක්ෂිතතාවය හා යොදා ගන්නා නාවික යාත්‍රාවල ප්‍රමිතියද සැලකිල්ලට ගෙන මේ සඳහා යොමුවිය යුතු බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLRDC) සමඟ සාකච්ඡා කිරීමට පියවර ගන්නා බවත් ගරු මන්ත්‍රීතුමාටද සම්බන්ධ වන ලෙසත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.4.4. භාණ්ඩ ප්‍රවාහනය බස් රථ මාර්ගයෙන් සිදු කිරීම

කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ පෞද්ගලික භාණ්ඩ ප්‍රවාහන සමාගම් වෙත භාණ්ඩ ප්‍රවාහනයට දැඩි ඉල්ලුමක් ඇති බැවින් බස් රථ උපයෝගී කොටගෙන භාණ්ඩ හුවමාරුව සඳහා ක්‍රමවේදයක් ඇති කිරීමේ හැකියාව පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.
මේ පිළිබඳව දැනට ප්‍රචලිත ප්‍රධාන පෞද්ගලික සමාගම් සමඟ සාකච්ඡා කර බස් ඩිපෝ ද සම්බන්ධ කරගෙන ක්‍රියාත්මක වීමට සැලසුම් කර ඇති බව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

### 1.4.5. සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය (Light Rail Transit System Project)

මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

ශක්‍යතා අධ්‍යයනයන් සිදුකර බත්තරමුල්ල - කොටුව යා කෙරෙන ලෙස නාගරික සංවර්ධන අධිකාරිය යටතේ ඉදිකිරීමට යෝජිත ව්‍යාපෘතිය නතර කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මොරටුව, හෝමාගම, කඩවත හා රාගම නගරවලින් ආරම්භ කෙරෙන ව්‍යාපෘතීන් ඉදිකිරීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් රජය විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමට නියමිත බවද ගරු සභාපතිතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

### 1.4.6. බස් ඩිපෝවල කාර්ය මණ්ඩල සඳහා උසස්වීම් ලබාදීම

බස් ඩිපෝ සහ කාර්යාලවල අවම පිරිසිදු කිරීම් සහ නඩත්තු කිරීම් සිදු කළ යුතු බවටත් සේවකයන්ගේ ආකල්ප සංවර්ධනය කළයුතු බවටත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

අධ්‍යාපන මට්ටම හා පළපුරුද්ද පිළිබඳව සලකා උසස්වීම් ලබාදීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 1.5. මඩකලපුව දිස්ත්‍රික්කයේ දුම්රිය ගේට්ටු මුරකරුවන්ගේ සේවය ස්ථිර කිරීම සහ වෙනත් කරුණු - ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

### 1.5.1. මඩකලපුව දිස්ත්‍රික්කයේ දුම්රිය ගේට්ටුකරුවන්ගේ ගැටළු

2013 වසරේ සිට සේවය කරනු ලබන මෙම සේවකයන් ස්ථිර සේවයට අනුයුක්ත කර ගැනීමේ හැකියාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

සේවා මුර ක්‍රමය යටතේ තාවකාලික පදනම මත එක් දුම්රිය ගේට්ටුවක් සඳහා සේවකයන් තිදෙනෙකු යොදවා ඇති බවත් පොලිස් දෙපාර්තමේන්තුවෙන් දීමනාවක් ලබා දෙන බවත් ගරු අශෝක් අබේසිංහ මහතා විසින් දැනුම් දෙන ලදී.

ගේට්ටුකරුවන් දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය කර ගැනීමේ හැකියාවක් නොමැති බවද 2023 වසරේදී සේවය අහිමි වන බවද දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

### 1.5.2. කොටුව - පොළොන්නරුව දුම්රිය මඩකලපුව දක්වා ධාවනය කිරීම

දැනට පොළොන්නරු දුම්රිය ස්ථානයෙන් ගමන් ආරම්භ කරනු ලබන දුම්රිය මඩකලපුව දුම්රිය ස්ථානයෙන් ආරම්භ කිරීමේ හැකියාව සම්බන්ධයෙන් සලකා බලන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 1.6. මහනුවර දිස්ත්‍රික්කයේ මහනුවර නගරයේ ද්විත්ව දුම්රිය මාර්ග ව්‍යාපෘතිය සහ වෙනත් කරුණු - ගරු උදයන කිරිදිගොඩ මහතා

### 1.6.1. මහනුවර දිස්ත්‍රික්කයේ මහනුවර නගරයේ ද්විත්ව දුම්රිය මාර්ග ව්‍යාපෘතිය

අතරමැදි කොටස් කිහිපයක් පමණක් නිමකර ඇති ද්විත්ව දුම්රිය මාර්ග සංවර්ධන වැඩසටහන ඉතාමත් මන්දගාමීව සිදුවන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මලාපවාහන මාර්ගයක ඉතිරිව ඇති වැඩ කොටසක් නිම වූ වහාම මෙම ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු කඩිනමින් සිදුකරන බව දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් දැනුම් දෙන ලදී.

### 1.6.2. මහනුවර දිස්ත්‍රික්කයේ සරසවි උයන දුම්රිය ස්ථානය

මෙම දුම්රිය ස්ථානයට යාබදව පේරාදෙණිය විශ්ව විද්‍යාලය ඇතුළු රජයේ ප්‍රධාන ආයතන කිහිපයක් පවතින හෙයින් පවතින භූමිය භාවිතා කර දුම්රිය මඟින්ගේ වාහන නවතා තබා යෑමට (PARK & RIDE) හැකි වන ලෙස නැවතුම්පොළක් සහිතව සංවර්ධනය කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.6.3. රියදුරු බලපත්‍ර ලබාදීම විමධ්‍යගත කිරීම

අක්‍රමිකතා හා තදබදය වැළැක්වීම සඳහා පළාත් කිහිපයකට රියදුරු බලපත්‍ර ලබාදීම විමධ්‍යගත කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ සම්බන්ධයෙන් නව සැලැස්මක් මත පුළුල් වැඩසටහනක් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිත බව රාජ්‍ය අමාත්‍ය, ගරු දිලුම් අමුණුගම මහතා විසින් දැනුම් දෙන ලදී.

රියදුරු බලපත්‍ර මුද්‍රණය යුධ හමුදාව විසින් සිදු කරනුයේ එහි එක් පියවරක් ලෙස බවද ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

වෛද්‍ය සහතිකය ලබාගැනීමට මාර්ගගත ක්‍රමය (e – channeling) යටතේ ඉල්ලුම් කළ හැකි බව ද ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.6.4. පාසල් දරුවන් ප්‍රවාහනය සම්බන්ධයෙන් නියාමන ක්‍රමවේදයක් සැකසීම

පාසල් දරුවන්ගේ සුරක්ෂිතභාවය හා මාර්ග තදබදය අවම වන ලෙස පාසැල් දරුවන් ප්‍රවාහනය සඳහා සුදුසු ක්‍රමවේදයක් සකසන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ඉදිරියේදී පාසැල් දරුවන් ප්‍රවාහනය සම්බන්ධයෙන් සුදුසු නියාමන ක්‍රමවේදයක් සකසන බව රාජ්‍ය අමාත්‍ය, ගරු දිලුම් අමුණුගම මහතා විසින් දැනුම් දෙන ලදී.

## 1.7. කිලිනොච්චි දිස්ත්‍රික්කයේ බස් ඩිපෝව සංවර්ධනය කිරීම සහ වෙනත් කරුණු - ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

### 1.7.1. කිලිනොච්චි දිස්ත්‍රික්කයේ බස් ඩිපෝව සංවර්ධනය කිරීම

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ එක් ඩිපෝවක් පමණක් ඇති අතර, එහි පහසුකම්වල බොහෝ අඩුපාඩු ඇති බවත් ස්ථිර කළමණාකරුවෙක් සේවයේ නොමැති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

යුධ ගැටුම් හේතුවෙන් හානි වූ ගොඩනැගිල්ලක පවත්වාගෙන යන මෙම බස් ඩිපෝව පරීක්ෂා කල බවත්, නව ගොඩනැගිල්ලක් ඉදි කිරීමට සැලසුම් සකස් කර ඇති බවත් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

### 1.7.2. කිලිනොච්චි දිස්ත්‍රික්කයේ විධිමත් බස් රථ ගමනාගමන සේවාවක් නොමැති වීම

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ නිසි බස්රථ ගමනාගමන සේවාවක් ක්‍රියාත්මක නොවන බවත්, මලයාලපුරම් පල්ලිකුඩා සහ වලෛපාඩු යන දුර ගමන් සඳහා බස් සේවාවන් නොමැති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

කිලිනොච්චිය බස් ඩිපෝව සඳහා එම දිස්ත්‍රික්කයෙන් රියැදුරන් සහ කොන්දොස්තරවරුන් පත් කිරීම තුළින් ප්‍රශ්නය විසඳිය හැකි බවත් තනිදොර සහිත බස් රථ සේවයෙහි යෙදීම මගින් එම ප්‍රදේශයේ අභ්‍යන්තර ගමනාගමන අවශ්‍යතා සම්පූර්ණ කළ හැකි බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ගරු ප්‍රවාහන අමාත්‍යතුමාගේ යෝජනාවක් අනුව 2020 වසරේදී අළුත්වැඩියා කරන ලද බස් රථ 200 න් කිළිනොච්චි ඩිපෝව සඳහා අවශ්‍ය බස් රථ ලබාදෙන බව රාජ්‍ය අමාත්‍ය, ගරු දිලුම් අමුණුගම මහතා විසින් දැනුම් දෙන ලදී.

### 1.7.3. කිලිනොච්චි දිස්ත්‍රික්කය සඳහා ප්‍රධාන බස් නැවතුම්පොළක් ඉදි කිරීම

කිලිනොච්චි බස් නැවතුම්පළෙහි ඉදිකිරීම් කටයුතු නවතා දැමීම සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.7.4. කිලිනොච්චි දිස්ත්‍රික්කයේ දුම්රිය හරස් මාර්ග සංවර්ධනය

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ දුම්රිය හරස් මාර්ගයන්හි සිදුවන අනතුරු සංඛ්‍යාව වැඩි වී තිබෙන බැවින් හරස් මාර්ග සඳහා ගේට්ටු සවි කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 1.8. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය - ගරු එස්.වියාලේන්ද්‍රන් මහතා

නැගෙනහිර පළාතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ ස්ථාපිත ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය රුපියල් 38,000 ක කුලී පදනම මත කල්මුණේ ප්‍රදේශයේ ඇති ගොඩනැගිල්ලක ක්‍රියාත්මකව පවතින බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එම කාර්යාලය ස්ථාපිත කිරීම සඳහා මඩකලපුව ප්‍රදේශයේ සුදුසු ඉඩමක් වෙන්කර ඇති අතර අවශ්‍ය පහසුකම් ද ලබාදිය හැකි බැවින් එහි ස්ථාපිත කිරීමට කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 1.9. කොළඹ කොටුව සහ යාපනය නගර අතර දුම්රිය ප්‍රවේශපත්‍ර ගාස්තු සංශෝධනය සහ වෙනත් කරුණු - ගරු අංගජන් රාමනාදන් මහතා

### 1.9.1. කොටුව - යාපනය දුම්රිය ප්‍රවේශපත්‍ර ගාස්තු සංශෝධනය කිරීම

වෙනත් දුම්රිය ගමනාන්ත ප්‍රවේශපත්‍ර ගාස්තු හා සැසඳීමේදී යාපනය දුම්රිය ගාස්තු වැඩි අගයක් ගෙන ඇති හෙයින් ගාස්තු අඩු කිරීමේ හැකියාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මෙම ගාස්තුව අඩු කිරීමේ හැකියාවක් නොමැති බව දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.9.2. කොටුව - යාපනය ගමනාන්තය සඳහා වායුසමීකරණ මැදිරි සහිත දුම්රියක් යෙදවීම

මෙම මාර්ගයේ මඟීන්ගේ පහසුව සඳහා වායු සමීකරණ මැදිරි සහිත දුම්රියක් යොදවන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ඇනවුම්කර ඇති දුම්රිය කට්ටල ලැබුණ පසු සේවයේ යෙදවීමට හැකි බව දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් දැනුම් දෙන ලදී.

### 1.9.3. කොටුව - යාපනය දුම්රිය ගමන් මාර්ගයේ හරස් මාර්ගවල ගේට්ටු ඇති කිරීම

සෑම හරස් මාර්ගයකටම ගේට්ටු ඇති කිරීම තුළින් දුම්රිය ගමන් වේගය අඩාල වන නමුත් දැනට ගේට්ටු ඇති ස්ථානවල සිට නොමැති හරස් මාර්ග දක්වා දුම්රිය මාර්ගයට

සමාන්තරව මහා මාර්ගයන් ඇති කිරීමට හැකි බව සාමාන්‍යාධිකාරී විසින් දැනුම් දෙන ලදී.

### 1.9.4. යාපනය දිස්ත්‍රික්කයේ ඩෙල්ෆ්ට්, අනලතිව්, සහ එලවතිව් දූපත්වාසීන්ගේ ප්‍රවාහන අවශ්‍යතා සඳහා බස් රථ යෙදවීම

මෙම දූපත්වාසීන්ගේ ප්‍රවාහන අවශ්‍යතා සඳහා බස් රථ ලබා දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

අබලන් බස්රථ වෙනුවට නව බස්රථ ලබාදිය හැකි බැවින් බස් රථ ධාවනය සම්බන්ධ යෝජනා පිළිබඳව ගරු මන්ත්‍රීතුමා සමඟ සාකච්ඡා කරන මෙන් ගරු සභාපතිතුමා විසින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපති වෙත උපදෙස් ලබා දෙන ලදී.

රාජ්‍ය අමාත්‍යාංශය මගින් සෑම දිස්ත්‍රික්කයක් සඳහාම සම්බන්ධීකරණ නිලධාරියකු පත් කර ඇති බැවින් ගරු මන්ත්‍රීතුමන්ලාගේ යෝජනා, ගැටළු ඉදිරිපත් කිරීමේ හැකියාව ඇති බව රාජ්‍ය අමාත්‍ය, ගරු දිලුම් අමුණුගම මහතා විසින් දැනුම් දෙන ලදී.

## 1.10. මන්නාරම, වව්නියාව සහ මුලතිව් බස් ඩිපෝවල කාර්ය මණ්ඩල හිඟය - ගරු කේ. කාදර් මස්තාන් මහතා

මෙම බස් ඩිපෝවල බස්රථ සහ කාර්යාලයීය කාර්ය මණ්ඩල පුරප්පාඩු පවතින හෙයින් නව කාර්ය මණ්ඩල බඳවා ගැනීමේදී අදාළ දිස්ත්‍රික්ක වලින්ම බඳවා ගැනීම් කටයුතු සිදු කිරීමෙන් ගැටළු අවම කරගත හැකි බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

දැනට කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීම් නොකරන බවත් ඉදිරි බඳවා ගැනීම් සඳහා පුවත්පත් දැන්වීම් පළකරන හෙයින් දිස්ත්‍රික්කවල සුදුසුකම් ඇති පුද්ගලයන් යොමු කරන මෙන් රාජ්‍ය අමාත්‍ය, ගරු දිලුම් අමුණුගම මහතා විසින් ගරු මන්ත්‍රීතුමාගෙන් ඉල්ලීමක් කරන ලදි.

රාජ්‍ය අමාත්‍යාංශය වෙතින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කටයුතු සඳහා නිලධාරියෙකු යොදවා ඇති හෙයින් ගරු මන්ත්‍රීතුමන්ලාගේ ගැටළු ඉදිරිපත් කිරීමේ හැකියාව පවතින බවද ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

## 1.11. උතුරු පළාත් ඩිපෝව සඳහා ස්ථිර කළමනාකරුවෙක් පත් කිරීම හා වෙනත් ගැටළු - ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා

### 1.11.1. උතුරු පළාත් ඩිපෝව සඳහා ස්ථිර කළමනාකරුවෙක් පත් කිරීම

ඩිපෝව සඳහා දැනට තාවකාලික පදනම මත කළමණාකරුවෙක් පත් කර ඇති හෙයින් ස්ථිර කළමණාකරුවෙක් පත් කිරීමට කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

### 1.11.2. උතුරු පළාත් ඩිපෝවල අවිධිමත්ව සිදු කෙරෙන කාර්ය මණ්ඩල පත් කිරීම

සුදුසුකම් නොමැති බව පවසමින් පසුගිය කාලයේ ලබාදුන් පත්වීම් අත්හිටුවා 2019 වසරේ අගභාගයේ නව පත්වීම් ලෙස රැකියා ගත කල පුද්ගලයන්ද සුදුසුකම් නොමැති අය බව පෙනී යන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

දේශපාලනය අනුව පත්වීම් ලබා නොදී සුදුසුකම් මත පත්වීම් ලබාදීමට කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් තවදුරටත් ඉල්ලීමක් කරන ලදී.

### 1.11.3. උතුරු පළාතේ බස් ඩිපෝ රියදුරන් සහ රිය සහායකයින් සම්බන්ධයෙන් විනය පරීක්ෂණ පැවැත්වීම සම්බන්ධ ගැටළු

උතුරු පළාත් ඩිපෝ රියදුරන් සහ රිය සහයකයින් විසින් සිදුකරන ලබන රිය අනතුරු සහ වෙනත් අනිසි ක්‍රියා සම්බන්ධයෙන් පවත්වනු ලබන විනය පරීක්ෂණ විධිමත් ලෙස සිදු නොකරන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල ප්‍රධාන කාර්යාලය මගින් ලබාදෙනු ලබන විනය පරීක්ෂණ තීන්දු සඳහා දීර්ඝ කාලයක් ගතවන බැවින් සහ අගතියට පත් පාර්ශවකරු භාෂාව, කාලය සහ ආර්ථික වශයෙන් ගැටළුකාරී තත්වයන්ට මුහුණ දෙන බැවින් දේශපාලන බලපෑමකින් තොරව විනය පරීක්ෂණ පවත්වන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.11.4. උතුරු පළාතේ බලපැවැත්වෙන ස්ථාන මාරු

කාර්ය මණ්ඩල ස්ථානමාරුවීම් විධිමත් ලෙස සිදු කිරීමට කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ගරු මන්ත්‍රීතුමන්ලාගේ ප්‍රදේශවල පවතින ප්‍රවාහන ගැටළු රාජ්‍ය අමාත්‍යාංශය වෙතින් පත් කර ඇති දිස්ත්‍රික්ක සම්බන්ධීකරණ නිලධාරීන් සඳහා යොමු කිරීම තුළින් කඩිනමින් විසඳුම් ලබා ගත හැකි බව රාජ්‍ය අමාත්‍ය ගරු දිලුම් අමුණුගම මහතා විසින් දැනුම් දෙන ලදී.

## 1.12. යෝජිත දඹුල්ල හබරණ දුම්රිය මාර්ගය සහ වෙනත් ගැටළු - ගරු අමරකීර්ති අතුකෝරළ මහතා

### 1.12.1. යෝජිත දඹුල්ල හබරණ දුම්රිය මාර්ගය

ඉදිවෙමින් පවතින මෙම දුම්රිය මාර්ගය හේතුවෙන් තිඹිරිගස්වැව සහ හබරණ ප්‍රදේශයේ විශාල නිවාස ප්‍රමාණයක් අහිමි වන හෙයින් මීට පෙර සැලසුම් කර තිබූ මාර්ග සැලසුම අනුව ඉදිකිරීම් කටයුතු කරන මෙන් ප්‍රදේශවාසීන් ඉල්ලීමක් කර ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.12.2. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පලුගස්දමන වඩිච්චලේ ප්‍රදේශයේ මාර්ගය දුම්රිය දෙපාර්තමේන්තුව විසින් අවහිර කිරීමේ ගැටළුව

වසර 50 ක පමණ සිට භාවිතා කරන මෙම මාර්ගයේ වාහන ගමනාගමනයට බාධාවන ලෙස කොන්ක්‍රීට් කණු යොදා අවහිර කර ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

නිවාස 4 ට යොමුව ඇති මෙම මාර්ගය දුම්රිය මාර්ගය ආසන්නයේ පැවතීම අනතුරුදායක බැවින් එය දුම්රිය මාර්ගයට ඇතින් දැමීම සඳහා අදාළ පරිපාලන

ආයතනයට බදු පදනම මත ලබා දිය හැකි බව දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.12.3. හිඟුරක්ගොඩ දුම්රිය ස්ථානය අවට පදිංචිකරුවන්ගේ බදු ගෙවීමේ දුෂ්කරතා

වසර ගණනාවක සිට පදිංචිව සිටින මෙම ජනතාවට බදු ගෙවීමේ හැකියාව නොමැති ආර්ථික දුෂ්කරතා මත ජීවත්වෙන හෙයින් විසඳුමක් ලබාදෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.12.4. කොටුව සහ පොළොන්නරුව සීඝ්‍රගාමී දුම්රිය මඩකලපුව දක්වා ධාවනය කරවීම

මේ සඳහා ගරුතර මහසංඝරත්නය හා වෙළඳ සංගමය වෙතින් ඉල්ලීම් ලැබී ඇති හෙයින් මඩකලපුව දක්වා ධාවනය කිරීමට කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 1.13. යෝජිත කුරුණෑගල දුම්රිය මාර්ගය සහ වෙනත් කරුණු - ගරු රෝහණ දිසානායක මහතා

### 1.13.1. යෝජිත දඹුල්ල කුරුණෑගල දුම්රිය මාර්ගය

ශක්‍යතා අධ්‍යයනයක් කර මැනුම් කටයුතු අවසන් කර ඇති බවත් මාර්ගය ඉදිකිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට රජය තවමත් තීරණය කර නොමැති බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම ව්‍යාපෘතිය හේතුවෙන් දේපළ අහිමිවන ජනතාවට වන්දි ලබාදීමේ ක්‍රමවේදය පිළිබඳව නිශ්චිතව පැහැදිලි තීරණයක් ප්‍රදේශවාසීන්ට ලබාදෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් තවදුරටත් ඉල්ලීමක් කරන ලදී.

මහා භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර මීළඟ කාරක සභාවේදී පිළිතුරු ලබා දෙන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.13.2. දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම් බදු ගැනීම

මාතලේ නුවර දුම්රිය මාර්ගයට සමාන්තරව දිවෙන මහා මාර්ගයේ සහ අළුතෙන් ඉදිවෙන මාර්ගයන්හි දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් රක්ෂිතයන්හි ඉඩම් බදු ගැනීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් ගැටළු පවතින බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එම මාර්ගයන් අවට රක්ෂිත සම්බන්ධයෙන් මැදිහත්වීමට ඇති පහසුම ක්‍රමය වනුයේ අදාළ පරිපාලන ආයතනය තුළින් බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.13.3. දිස්ත්‍රික් සංවර්ධන කමිටු

දිස්ත්‍රික් ප්‍රවාහන කමිටුව මගින් ප්‍රදේශයේ පවතින ප්‍රවාහන ගැටළු පිළිබඳව තීරණ ගැනීමට අදහස් කරන බව රාජ්‍ය අමාත්‍ය, ගරු දිලුම් අමුණුගම මහතා විසින් දැනුම් දෙන ලදී.

## 1.14. බස් ඩිපෝ සහ දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම් එලදායී කාර්යයකට යොමු කිරීම සහ වෙනත් ගැටළු - ගරු වසන්ත යාපා බණ්ඩාර මහතා

### 1.14.1. බස් ඩිපෝ සහ දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම් එලදායී කාර්යයකට යොමු කිරීම

බස් ඩිපෝ සහ දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම් ආර්ථිකමය වශයෙන් එලදායී ව්‍යාපෘතීන් ඇති කිරීම සඳහා යොදවන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම ආයතන සතු දේපළ බදු පදනම මත ආයෝජන සඳහා විවෘත කිරිමට ඉදිරියේදී පුවත්පත් දැන්වීම් පළ කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.14.2. ධාවනයට නුසුදුසු බස් රථ එලදායී කාර්යයකට යොදා ගැනීම

මෙම බස් රථ වෙළඳ අමාත්‍යාංශයෙන් ඇති කරනු ලබන කිව් ෂොප් (Q- Shop) වැනි එලදායී ව්‍යාපෘතියකට යෙදවීමේ හැකියාව පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් විමසීමක් කරන ලදී.

දැනටමත් මෙම බස් රථ පුස්තකාල ලෙස එකලස්කර පාසල් 12 ක් සඳහා ලබා දී ඇති බව රාජ්‍ය අමාත්‍ය, ගරු දිලුම් අමුණුගම මහතා විසින් දැනුම් දෙන ලදී.

## 1.15. බස් ඩිපෝවල තනතුරු ලබා දීමේ අක්‍රමිකතා සහ වෙනත් කරුණු - ගරු මිලාන් ජයතිලක මහතා

### 1.15.1. බස් ඩිපෝවල තනතුරු ලබා දීමේ අක්‍රමිකතා

රාජ්‍ය පාලන බලය වෙනස්වීමත් සමඟ බස් ඩිපෝවල පරිපාලන තනතුරු සඳහා නුසුදුසු පුද්ගලයන් පත්වන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙවර දේශපාලන හේතූන් මත උසස්වීම් ලබා නොදුන් බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී. උසස්වීම් ලබා දීම සහ වැටුප් වැඩි කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් ඇති කරන බව රාජ්‍ය අමාත්‍ය, ගරු දිලුම් අමුණුගම මහතා විසින් දැනුම් දෙන ලදී.

### 1.15.2. ගම්පහ දිස්ත්‍රික්කයේ දොම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කිරිදිවැල බස් නැවතුම්පලේ කඩසාප්පු බදු දීම

කඩ සාප්පු බදුදීම සඳහා කරන ලද ටෙන්ඩර් කටයුතු අක්‍රමිකතා හා විනිවිදභාවයෙන් තොරව අසාධාරණව සිදුකර ඇති හෙයින් නැවත ටෙන්ඩර් කැඳවන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

නැවත අලුතින් ටෙන්ඩර් කැඳවීමට බලාපොරොත්තු වන බවත් ඒ අනුව උඩුමහළ සඳහා අවශ්‍ය විදුලිය ලබා දීමට කටයුතු කරන බවත් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

### 1.15.3. ගම්පහ දිස්ත්‍රික්කයේ ග්‍රාමීය ප්‍රදේශ සඳහා කුඩා ප්‍රමාණයේ බස් රථ ලබාගැනීම

ග්‍රාමීය ප්‍රදේශවල මාර්ග සඳහා කුඩා ප්‍රමාණයේ බස් රථ ලබාදීමට කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම ඉල්ලීම ඉටු කිරීමට කටයුතු කරන බව රාජ්‍ය අමාත්‍ය ගරු දිලුම් අමුණුගම මහතා විසින් දැනුම් දෙන ලදී.

### 1.15.4. ත්‍රීරෝද රථ නැවතුම්පොළවල් නියාමනය සඳහා ක්‍රමවේදයක් සැකසීම

ත්‍රීරෝද රථ නැවතුම්පොළවල දෛනික ජීවනෝපාය කරගත් විශාල පිරිසක් සිටින හෙයින් ඔවුන්ගේ රැකියා සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා නියාමන ක්‍රමවේදයක් ඇති කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

සැකසීමට යෝජිත ප්‍රවාහන ප්‍රඥප්තිය තුළ ත්‍රීරෝද රථ නියාමනය සම්බන්ධවද ඇතුළත්ව ඇති බව ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

## 1.16. සැහැල්ලු වාහන බලපත්‍ර සඳහා රෝහලෙන් වෛද්‍ය සහතික ලබා ගැනීම සහ වෙනත් කරුණු - ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

### 1.16.1. සැහැල්ලු වාහන රියදුරු බලපත්‍ර සඳහා රෝහලෙන් වෛද්‍ය සහතික ලබා ගැනීම

සෞඛ්‍ය අංශයෙන් සුදුසු ක්‍රමවේදයක් සකසා ගැනීමට නොහැකි වූ නිසා ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයෙන්ම වෛද්‍ය සහතික ලබාගත යුතු බවත් මාර්ගගත ක්‍රමය භාවිතා කර ඉල්ලුම් කළ හැකි බවත් රාජ්‍ය අමාත්‍ය ගරු දිලුම් අමුණුගම මහතා වීසින් දැනුම් දෙන ලදී.

### 1.16.2. බෙලිඅත්ත කතරගම දුම්රිය මාර්ගය

පවතින ගැටළු විසඳාගෙන ඉදිරි කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 1.17. කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල උතුර හා කුරුණෑගල දකුණ බස් ඩිපෝ සංවර්ධනය කිරීම හා වෙනත් කරුණු - ගරු මංජුලා දිසානායක මහත්මිය

### 1.17.1. කුරුණෑගල උතුර හා කුරුණෑගල දකුණ බස් ඩිපෝ සංවර්ධනය කිරීම

මෙම බස් ඩිපෝ අවම පහසුකම් මත ක්‍රියාත්මක වන හෙයින් අවශ්‍ය පහසුකම් ඇති කර සංවර්ධනය කරන මෙන් ගරු මන්ත්‍රීතුමිය විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.17.2. ග්‍රාමීය මාර්ග සඳහා නව බස් රථ ලබා ගැනීම

මෙම ප්‍රදේශවල ග්‍රාමීය මාර්ග සංවර්ධනය වීම නිසා ජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීම සඳහා නව බස් රථ ලබා දීමට කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රීතුමිය විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.17.3. ඩිපෝව ඉදිරිපිට කඩහිමියන් සඳහා ස්ථිර ගොඩනැගිලි ලබාදීම

මාර්ග සංවර්ධනය සඳහා බඩගමුව රක්ෂිතය සීමාවේ ස්ථාපිතව තිබූ කඩ ඉවත් කිරීම නිසා ඔවුන්ට ඩිපෝව ඉදිරිපිට ස්ථාපිත කරන ලද කඩ (ව්‍යාපාරික ස්ථාන) සඳහා ස්ථිර ගොඩනැගිලි ලබාදීමේ හැකියාව පිළිබඳව ගරු මන්ත්‍රීතුමිය විසින් විමසීමක් කරන ලදී

බස් රථ ධාවන ආදායමෙන් පමණක් බස් ඩිපෝ නඩත්තු කළ නොහැකි හෙයින් ඩිපෝ 107 සඳහා අයත් ඉඩම් තුළ ඉන්ධන පිරවුම්හලක් ඉදි කිරීමට යෝජිත බවද වාහනවල ධාවන තත්ත්වයන් පරීක්ෂාවට (MOT සහතික ලබාදීමට) ආයතන පිහිටුවීමට යෝජිත බවද රාජ්‍ය අමාත්‍ය ගරු දිලුම් අමුණුගම මහතා විසින් දැනුම් දෙන ලදී.

මේ සඳහා සැලසුම් සකස් කිරීමෙන් පසු ඉතිරිවන ඉඩම් සුදුසු වාණිජ ව්‍යාපාර සඳහා ලාභ බෙදා ගැනීමේ පදනම මත සුදුසු ආයෝජකයින්ට ලබාදීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.18. ගල්ගමුව දුම්රිය ස්ථානයට අයත් ඉඩමෙන් කොටසක් ප්‍රාදේශීය සභාව වෙත බදු පදනම මත ලබා ගැනීම සහ වෙනත් කරුණු - ගරු අසංක නවරත්න මහතා

### 1.18.1. ගල්ගමුව දුම්රිය ස්ථානයට අයත් ඉඩම ප්‍රාදේශීය සභාව වෙත බදු පදනම මත ලබා ගැනීම

ගල්ගමුව ප්‍රාදේශීය සභාව විසින් දුම්රිය ස්ථානයේ ඉඩමෙන් කොටසක් පොළ භූමිය ලෙස සංවර්ධනය කර ඇති හෙයින් එම ඉඩම් කොටස බදු පදනම මත ලබාදෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.18.2. ගල්ගමුව බස් ඩිපෝව සංවර්ධනය කිරීම

මෙම බස් ඩිපෝව සංවර්ධනය කර දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.18.3. පාසැල් සිසුන් ප්‍රවාහනයේ නියුතු සංගම්වල නියෝජිතයන්ට සාකච්ඡාවක් ලබාදීම

පාසැල් සිසුන් ප්‍රවාහනයේ නියුතු සංගම්වල ගැටළු සාකච්ඡා කිරීම සඳහා අවස්ථාව ලබා දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 1.19. පුත්තලම අරුවක්කාලුව දුම්රිය මාර්ගය සහ වෙනත් කරුණු - ගරු මායාදුන්න චින්තක අමල් මහතා

### 1.19.1. පුත්තලම අරුවක්කාලුව දුම්රිය මාර්ගය

මෙම දුම්රිය මාර්ගය රජයට පවරා ගැනීමට කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

හුණුගල් ප්‍රවාහනය කරනු ලබන මෙම මාර්ගය වසර 30 කට බදු දී ඇති බව දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් දැනුම් දෙන ලදී.

අපද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සඳහා මෙම මාර්ගයේ දිග තවත් කිලෝමීටර් දෙකකින් වැඩි කිරීමට යෝජිත බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.19.2. පුත්තලම බස් ඩිපෝව සංවර්ධනය කිරීම

මෙම බස් ඩිපෝවේ යටිතල පහසුකම් දියුණු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන බව රාජ්‍ය අමාත්‍ය ගරු දිලුම් අමුණුගම මහතා විසින් දැනුම් දෙන ලදී.

බස් ඩිපෝවල භූමිය සකස් කිරීම සඳහා ගරු මන්ත්‍රීතුමන්ලා මාර්ග සංවර්ධන යෝජනාවන් මහා මාර්ග සංවර්ධන අමාත්‍යාංශයට යොමුකරන විට ඩිපෝවල සංවර්ධනය කළ යුතු ප්‍රමාණයද ඇතුළත් කර මහාමාර්ග අමාත්‍යාංශයට යෝජනා ඉදිරිපත් කරන ලෙස ගරු රාජ්‍ය අමාත්‍යතුමා, ප්‍රදේශයේ මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලීමක් කරන ලදී.

### 1.19.3. බස්රථ සඳහා අමතර කොටස් ලබා ගැනීමේදී මුහුණ දෙන ගැටළු

ප්‍රමාදවීමකින් තොරව අමතර කොටස් ලබාගෙන බස් රථ නිසි පරිදි ධාවනය සඳහා ඩිපෝ කළමනාකාරීත්වයට උපදෙස් ලබා දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

අදාළ අමතර කොටස් ලබාගෙන බස් රථ අළුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දී ඇති බව ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

## 1.20. කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපලේ කුලී රථ සේවාව (Taxi Service) රාජ්‍ය අංශය තුළින් ක්‍රියාත්මක කිරීම සහ වෙනත් කරුණු - ගරු ඩයනා ගමගේ මහත්මිය

### 1.20.1. කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපළ කුලී රථ සේවාව (Taxi Service) රාජ්‍ය අංශය තුළින් ක්‍රියාත්මක කිරීම

දැනට ක්‍රියාත්මක පෞද්ගලික කුලී රථ සේවාවන් මගින් විදේශිකයන්ට අපචාර හා අක්‍රමිකතාවලට මුහුණපෑමට සිදුවීම රටේ ප්‍රතිරූපය විනාශවීමට හේතුවී ඇති හෙයින් රාජ්‍ය අංශයේ මැදිහත්වීම මත කුලී රථ සේවය පවත්වාගෙන යාමේ හැකියාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමිය විසින් විමසීමක් කරන ලදී.

මෙහිදී සිදුවන අක්‍රමිකතා හා අපචාරයන් වැළැක්වීම සම්බන්ධයෙන් සංචාරක මණ්ඩලය විසින් අධීක්ෂණය කළයුතු බැවින් මේ සම්බන්ධයෙන් සංචාරක අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන බව රාජ්‍ය අමාත්‍ය ගරු දිලුම් අමුණුගම මහතා විසින් දැනුම් දෙන ලදී.

### 1.20.2. පොදු ප්‍රවාහන සේවාව ශක්තිමත් කිරීම

කොළඹ නගර සීමාවේ පවතින දැඩි වාහන තදබදයට හා වායු දූෂණය අවම කිරීම සඳහා පොදු ප්‍රවාහන සේවාව සඳහා තට්ටු දෙකකින් යුත් බස් රථ යෙදවීමේ හැකියාව පිළිබඳව ගරු මන්ත්‍රීතුමිය විසින් විමසීමක් කරන ලදී.

### 1.20.3. ලොරි රථ කොළඹ නගර සීමාවට ඇතුල්වීම අවම කිරීම

එළවළු සහ මාළු ප්‍රවාහනය වෙනුවෙන් කොළම නගර සීමාවට දෛනිකව ලොරි රථ පහලොස්දාහක් (15,000) පමණ ඇතුළු වන හෙයින් මේ සඳහා දුම්රිය යොදා ගැනීමේ හැකියාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාවෙන් විමසීමක් කරන ලදී.

ඉදිරියේදී මේ සම්බන්ධයෙන් පියවර ගන්නා බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.20.4. කොළඹ නගරයේ මගී ප්‍රවාහනය සඳහා ට්‍රෑම් කාර් යොදා ගැනීම

මේ සඳහා ආයෝජකයන් සොයාගත හැකි හෙයින් ට්‍රෑම් කාර් සේවාවක් අරඹන මෙන් ගරු මන්ත්‍රීතුමිය විසින් ඉල්ලීමක් කරන ලදී.

සුදුසු ආයෝජකයන් අමාත්‍යාංශය වෙත යොමු කරන මෙන් රාජ්‍ය අමාත්‍ය ගරු දිලුම් අමුණුගම මහතා විසින් ගරු මන්ත්‍රීතුමිය වෙත උපදෙස් ලබාදෙන ලදී.

### 1.20.5. කොළඹ නගර සීමාවේ ත්‍රීරෝද රථ රියදුරන් හඳුනාගැනීම සඳහා ක්‍රමවේදයක් සැකසීම

මෙම ත්‍රීරෝද රථ රියදුරන් සඳහා හැඳුනුම්පතක් නිකුත් කිරීමටත් නිල ඇඳුමක් හඳුන්වාදීමටත් කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රීතුමිය විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.20.6. නව බස් මාර්ග ධාවන බලපත්‍ර නිකුත් කිරීමේදී සීසීටීවී කැමරා පද්ධතියක් සවි කිරීම අනිවාර්ය කිරීම

බස් මගීන්ට සිදුවන අපහසුතා අවම කිරීම සඳහා නව බස් මාර්ග ධාවන බලපත්‍ර (Route Permit) නිකුත් කිරීමේදී කැමරා පද්ධතියක් බස් රථ තුළ සවි කිරීම අනිවාර්ය කිරීමට පියවර ගන්නා මෙන් ගරු මන්ත්‍රීතුමිය විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.20.7. බස් රථවල ආසන ගණන අනුව මගීන් ප්‍රවාහනය කිරීම

බස් රථ තුළ නිසි වාතාශ්‍රයක් නොමැතිව වැඩි මගීන් පිරිසක් ප්‍රවාහනය කිරීම වැළැක්වීම සඳහා සුදුසු ක්‍රමවේදයක අවශ්‍යතාවය පිළිබඳව ගරු මන්ත්‍රීතුමිය විසින් විමසීමක් කරන ලදී.

බස් ගාස්තු ඉහළ දමා ඇති බවත් ඒ අනුව ආසන ප්‍රමාණය අනුව මගීන් ප්‍රවාහනය කිරීම අනිවාර්ය බවත් රාජ්‍ය අමාත්‍ය ගරු දිලුම් අමුණුගම මහතා විසින් දැනුම් දෙන ලදී.

මෙම නීතිය කඩ කරන බස් රථ රියදුරන් අත්අඩංගුවට ගන්නා ලෙස පොලිස් ස්ථාන වෙත උපදෙස් ලබා දී ඇති බව ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

**1.21. අවිස්සාවේල්ල, රුවන්වැල්ල නගරයේ උප බස් ඩිපෝවක් ස්ථාපනය කිරීම සහ වෙනත් කරුණු - ගරු සුදත් මංජුල මහතා**

**1.21.1. රුවන්වැල්ල නගරයේ උප බස් ඩිපෝවක් ස්ථාපනය කිරීම**

මේ සම්බන්ධයෙන් ක්ෂෙත්‍ර පරීක්ෂාවක් සිදුකර තීරණයක් ගන්නා බව රාජ්‍ය අමාත්‍ය ගරු දිලුම් අමුණුගම මහතා විසින් දැනුම් දෙන ලදී.

**1.21.2. කොළඹ සිට රුවන්වැල්ල නගරය දක්වා කැළණි ගඟ හරහා ප්‍රවාහන ක්‍රමවේදයක් සැකසීම**

මාර්ග තදබදය අවම කිරීම සඳහා කැළණි ගඟ හරහා රුවන්වැල්ල දක්වා ජල ප්‍රවාහන මාධ්‍යයක් ඇරඹීමේ හැකියාව පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී. පිහිටුවීමට යෝජිත දිස්ත්‍රික් ප්‍රවාහන කමිටුව හරහා සාකච්ඡා කිරීමට හැකි බව රාජ්‍ය අමාත්‍ය ගරු දිලුම් අමුණුගම මහතා විසින් දැනුම් දෙන ලදී.

**2.** කාරක සභාව ප.ව. 4.20 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

**අධිකරණ කටයුතු පිළිබඳඅමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමු වැනි රැස්වීම - 2020 දෙසැම්බර් 5**

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ගරු එම්. යූ. එම්. අලි සබ්රි මහතා (සභාපති)
ගරු ලොහාන් රත්වත්තේ මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා
ගරු සාගර කාරියවසම් මහතා

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු එම්. එස්. තවුෆික් මහතා
ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු උදයන කිරිදිගොඩ මහතා
ගරු සුදත් මංජුල මහතා
ගරු ගුණතිලක රාජපක්ෂ මහතා
ගරු මධුර විතානගේ මහතා
ගරු වීරසුමන වීරසිංහ මහතා
ගරු සමන්ප්‍රිය හේරත් මහතා
ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතා
ගරු ඩයනා ගමගේ මහත්මිය

**1. අමාත්‍යාංශයීය කටයුතු පිළිබඳ සාකච්ඡාව**

## 1.1. බන්ධනාගාර වෙත ලබා දෙන ඖෂධ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් පාලනයක් ඇති කිරීම සහ වෙනත් කරුණු - ගරු ලොහාන් රත්වත්තේ මහතා

### 1.1.1. බන්ධනාගාර වෙත ලබා දෙන ඖෂධ සම්බන්ධයෙන් අමාත්‍යාංශය පාලනයක් ඇති කිරීම

බන්ධනාගාරවලට ලබා දෙන ඖෂධ සෞඛ්‍ය අමාත්‍යාංශය සෘජුවම බන්ධනාගාර රෝහල වෙත ලබා දී ඇති බැවින්, මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය මගින් යම් නියාමනයක් සිදු කළ යුතු බව රාජ්‍ය අමාත්‍ය, ගරු ලොහාන් රත්වත්තේ මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.
මේ සම්බන්ධයෙන් යම් යාන්ත්‍රණයක් ඇති කළ යුතු බවත්, බන්ධනාගාරයට පිටතින් ඖෂධ ගබඩා ඇති කළ යුතු බවත් බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් දැනුම් දෙන ලදි.

මේ සඳහා ගරු සභාපතිතුමා එකඟ වූ අතර ලිඛිත යෝජනාවක් ලෙස අමාත්‍යාංශයට භාර දෙන ලෙස දැනුම් දෙන ලදි.

### 1.1.2. සිරභාරයේ සිටින දරුවන් නිදහස් කිරීම

සිරභාරයේ සිටින දරුවන් නිදහස් කිරීමේ ක්‍රමවේදයක් සකස් කරන ලෙස රාජ්‍ය අමාත්‍ය, ගරු ලොහාන් රත්වත්තේ මහතා විසින් කාරක සභාව වෙත දන්වා සිටින ලදි.

මේ සම්බන්ධයෙන් ක්‍රමවේදයක් සකස් කරමින් පවතින බව අධිකරණ අමාත්‍යාංශයේ ප්‍රධාන උපදේශක, ජනාධිපති නීතිඥ යූ. ආර්. ද සිල්වා මහතා විසින් කාරක සභාවට දන්වා සිටින ලදි.

### 1.1.3. සිරකරුවන් නිදහස් කිරීම

බන්ධනාගාරවල තදබදය අවම කිරීම සඳහා නිදහස් කළ හැකි සිරකරුවන් හඳුනාගෙන නිදහස් කිරීමට ක්‍රියාකරන බව රාජ්‍ය අමාත්‍ය, ගරු ලොහාන් රත්වත්තේ මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 1.1.4. මහර බන්ධනාගාරයේ ඇති වූ සිද්ධිය

මහර බන්ධනාගාරයේ ඇති වූ සිද්ධිය පාලනය කිරීමට අනුගමනය කළ ක්‍රියාමාර්ග පිළිබඳව සහ ඉදිරි ඉලක්ක පිළිබඳව කාරක සභාවට දැනුම් දෙන ලදි.

මහර බන්ධනාගාරයේ වෛද්‍යවරයාගේ ක්‍රියාකලාපය පිළිබඳව සාධාරණ සැක මතු වී ඇති බැවින් ඒ පිළිබඳව පරීක්ෂණයක් සිදු කරන බව රාජ්‍ය අමාත්‍ය, ගරු ලොහාන් රත්වත්තේ මහතා විසින් දැනුම් දෙන ලදි.

### 1.1.5. මත්ද්‍රව්‍ය සම්බන්ධ චෝදනා යටතේ බන්ධනාගාරගත කිරීම

මත්ද්‍රව්‍ය පිළිබඳ චෝදනා යටතේ වැරදිකරුවන් බන්ධනාගාරගත කිරීම හෝ පුනරුත්ථාපනය කිරීම හෝ නිදහස් කිරීම සම්බන්ධයෙන් ආරක්ෂක අංශ සම්බන්ධීකරණය කිරීමේ නව ක්‍රමවේදයක් ඇති කරන බව රාජ්‍ය අමාත්‍ය, ගරු ලොහාන් රත්වත්තේ මහතා විසින් දැනුම් දෙන ලදි.

මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදිකරුවන් පිළිබඳව කටයුතු කිරීමේදී ප්‍රදේශයේ සෞඛ්‍ය අධිකාරීන් සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය කරන බවත් අමාත්‍යාංශයේ උපදේශක විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 1.1.6. ප්‍රජා විශෝධන පනත

ප්‍රජා විශෝධන පනතේ 7 වන වගන්තිය සංශෝධනය කර වරදකරුවන්ගේ එකඟතාවයක් නොමැති වුවද පුද්ගලයන් ප්‍රජා විශෝධනයට යොමු කිරීමට බලාපොරොත්තු වන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 1.1.7. බන්ධනාගාර නිලධාරීන්ගේ ස්ථාන මාරු

සේවා ස්ථානවල වැඩි කාලයක් රැඳී සිටින නිලධාරීන්ට ස්ථාන මාරු ලබා දීමට සහ බන්ධනාගාරවලට තාක්ෂණික උපකරණ සවි කිරීම සඳහා කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව බන්ධනාගාර කොමසාරිස් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

## 1.2. හෙරොයින් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනීම් සහ වෙනත් කරුණු - ගරු මධුර විතානගේ මහතා

### 1.2.1. හෙරොයින් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනීම්වලදී අයථා අන්දමින් කටයුතු කරන නිලධාරීන් සම්බන්ධයෙන් සුදුසු නීති සකස් කිරීම

හෙරොයින් සම්බන්ධ අත් අඩංගුවට ගැනීම් වලදී අයථා අන්දමින් කටයුතු කරන නිලධාරීන් සම්බන්ධයෙන් සුදුසු නීති සකස් කළ යුතු බව ගරු මධුර විතානගේ මහතා විසින් කාරක සභාවට යෝජනා කරන ලද අතර ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතාද මෙම කරුණ සම්බන්ධයෙන් අදහස් දක්වන ලදි.

වැරදි කරන නිලධාරීන්ට දඬුවම් දීම සඳහා සාමාන්‍යය නීති නොව, විශේෂ නීති සකස් කළ යුතු බව ගරු සාගර කාරියවසම් මහතාද කාරක සභාවට දන්වා සිටින ලදි.

නව පුනරුත්ථාපන මධ්‍යස්ථාන ඉදිකිරීම, සමාව දීම, නව නීති සකස් කිරීම ආදී සියලු කරුණු සලකා බලමින් බන්ධනාගාර සම්බන්ධ ක්‍රියාවලිය සිදු කරන බවට ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

වැරදි කරන නිලධාරීන්ට දඬුවම් දීම සම්බන්ධව අනිත් රටවල් වල ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ අධ්‍යයනය කරන ලෙස නීතිපති දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇති බවද දැනුම් දෙන ලදි.

### 1.2.2. උසාවිවල දඩ මුදල් පළාත් පාලන ආයතනවලට නොලැබීම

මෙම මුදල් අදාළ පළාත් සභාවට ලැබෙන බවත් අධිකරණ පද්ධතිය ඩිජිටල්කරණය කිරීමේ ක්‍රියාවලියේදී මෙම මුදල් අධිකරණවලට සහ පළාත් පාලන ආයතනවලට ලැබෙන ලෙස අදාල පද්ධතිය මඟින් සකස් කෙරෙනු ඇති බවත් අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 1.2.3. පළාත් පාලන ආයතන සඳහා සමථකරණය කිරීමේ බලය ලබාදීම

පළාත් පාලන ආයතනවල සමථ මණ්ඩල ආකාරයෙන් විසඳිය හැකි නඩු රාශියක් පවතින බවත්, එබැවින් පළාත් පාලන ආයතන සඳහා සමථකරණය කිරීමේ බලය වැනි යම් බලයක් ලබාදීම සුදුසු බවත් සමථකරණ ක්‍රියාවලිය අසමත් වුවහොත් පමණක් අධිකරණය වෙත අදාළ ගැටලු යොමු කළ හැකි බවත්, ගරු මධුර විතානගේ මහතා විසින් කාරක සභාව වෙත යෝජනා කරන ලදී.

මෙය වැදගත් යෝජනාවක් බැවින් එය ලිඛිතව ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

### 1.2.4. රාජ්‍ය නිලධාරින්ගෙන් සාක්ෂි ලබා ගැනීමේ ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම කිරීම

රාජ්‍ය නිලධාරින් විසින් සාක්ෂි ලබා දීමේ ක්‍රියාවලියේදී ගමනාගමනය සඳහා විශාල කාලයක් වැය වන බැවින් මේ සඳහා ස්කයිප් වැනි තාක්ෂණ ක්‍රමයක් භාවිතා කිරීම මඟින් වඩා කාර්යක්ෂම සේවාවක් ලබා දීම සඳහා යෝග්‍ය බව ගරු මධුර විතානගේ මහතා විසින් කාරක සභාව වෙත යෝජනා කරන ලදී.

මෙය ඉතා වැදගත් ක්‍රියාවලියක් බවත් දැනට යූඑන්ඩීපී (UNDP) ආයතනය සමග නියමු ව්‍යාපෘතියක් ලෙස කොළඹ අධිකරණයේ මෙය ක්‍රියාත්මක වෙමින් පවතින බවත් අධිකරණ අමාත්‍යාංශයේ ප්‍රධාන උපදේශක, ජනාධිපති නීතිඥ යූ. ආර්. ද සිල්වා මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

## 1.3. මාතර දිස්ත්‍රික්කයේ අධිකරණ සම්බන්ධ යෝජනා සහ වෙනත් කරුණු - ගරු වීරසුමන වීරසිංහ මහතා

### 1.3.1. මාතර දිස්ත්‍රික්කයේ අධිකරණ සම්බන්ධ යෝජනා

ඉදි කිරීම් අවසන් කර ඇති මාතර අධිකරණ සංකීර්ණය ඉක්මනින් විවෘත කිරීමටත්, ඉඩමක් වෙන්කර ඇති මොරවක අධිකරණය ඉදිකිරීම සම්බන්ධයෙන් කඩිනම් පියවර ගන්නා ලෙසත් ගරු වීරසුමන වීරසිංහ මහතා විසින් කාරක සභාවට යෝජනා කරන ලදි.

මාතර අධිකරණ සංකීර්ණය ඉක්මනින් විවෘත කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාව වෙත දැනුම් දෙන ලදි.

### 1.3.2. මාතර බන්ධනාගාරය වෙනත් ස්ථානයක ස්ථාපනය කිරීම

මාතර බන්ධනාගාරය වෙනත් ස්ථානයක ස්ථාපනය කිරීම සම්බන්ධයෙන් පිටබැද්දර ප්‍රදේශයේ ඉඩමක් අත්පත් කරගෙන ඇති නමුත් මෙහි කිසිම කටයුත්තක් ආරම්භ කර නොමැති බව ගරු වීරසුමන වීරසිංහ මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

බන්ධනාගාර ප්‍රතිසංස්කරණ සඳහා නව බන්ධනාගාර ඇති කිරීම වැනි කරුණු සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමා සමඟ සාකච්ඡා කර නව සැලැස්මක් සකස් කර ඇති බවත්, බන්ධනාගාර පමණක් නොව අමාත්‍යාංශයේ සියළු කරුණු සලකා සමස්ථ

කාරණා සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට සැලසුම් කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 1.3.3. ළමා අධිකරණ පිහිටුවීම සහ ළමුන්ගේ නඩු විභාග කිරීම

දකුණු පළාත පිළිබඳව සලකා බැලීමේදී ළමා නිවාසවල දෙමාපියන් අහිමි ළමුන්, රිමාන්ඩ් ළමුන් සහ දඬුවම් විඳින ළමුන් යන කොටස් තුනම එකට සිටීම සුදුසු තත්වයක් නොවන බවත් එක් පළාතකට එක් ළමා අධිකරණයක් බැගින් හෝ ඇති කරන ලෙසත් ගරු වීරසුමන වීරසිංහ මහතා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදි.

එම අධිකරණ ඉදිකරන තෙක් ළමයින්ගේ නඩු වෙනම ඇසීම සඳහා එක් මසක නිශ්චිත දවසක් හෝ වරුවක් හෝ වෙන් කරන ලෙසත් ගරු වීරසුමන වීරසිංහ මහතා විසින් ඉල්ලීමක් කරන ලදි.

මෙය වැදගත්, ප්‍රමුඛතාවය ලබාදිය යුතු යෝජනාවක් බවත්, මේ වන විටත් එක් පළාතක් සඳහා එක් ළමා අධිකරණයක් පිහිටුවීමට යෝජනා කර ඇති බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 1.3.4. පරිවාස නිලධාරීන් සඳහා සාම විනිසුරු පත්වීම් ලබා දීම

පරිවාස හා ළමා ආරක්ෂක දෙපාර්තමේන්තුව යටතේ සිටින පරිවාස නිලධාරීන් දරුවන් කුලවැද්දීමේ කටයුතු සිදු කරන බවත් ඒ සඳහා සාම විනිසුරු පත්වීම් ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති බවත් මෙම කටයුත්ත නැවත සලකා බලා පත්වීම් ලබා දීමට කටයුතු කරන ලෙසත් ගරු වීරසුමන වීරසිංහ මහතා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදි.

මෙය යෝජනාවක් ලෙස ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

### 1.3.5. පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව සහ ප්‍රජා විශෝධන දෙපාර්තමේන්තුව නිසි ලෙස ක්‍රියාත්මක කිරීම

පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව සහ ප්‍රජා විශෝධන දෙපාර්තමේන්තුව නිසි ලෙස ක්‍රියාත්මක වන්නේ නම් මෙලෙස බන්ධනාගාරවල තදබදයක් ඇතිවීම යම් තරමකට හෝ අඩු කර ගත හැකි බව ගරු මන්ත්‍රිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.
මේ පිළිබඳව මහේස්ත්‍රාත්තුමා විසින් කටයුතු කළ යුතු බැවින් අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත දන්වා සිටින බවත්, මේ සම්බන්ධ අවශ්‍ය නීති සකසන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

## 1.4. කින්නියා ප්‍රදේශයේ සංචාරක අධිකරණයක් පිහිටුවීම - ගරු එම්. එස්. තවුෆික් මහතා

කින්නියා ප්‍රදේශයේ ජනතාවට අධිකරණ කටයුතු සඳහා කිලෝමීටර 20-25 දුරින් ඇති ත්‍රිකුණාමලය අධිකරණය වෙත යාමට සිදුව ඇති බැවින් එම ප්‍රදේශය සඳහා සතියකට දින දෙකක් හෝ ක්‍රියාත්මක වන සංචාරක අධිකරණයක් ඇති කරන ලෙස ගරු එම්. එස්. තවුෆික් මහතා විසින් කාරක සභාවට දැනුම් දුන් අතර මේ වන විට මේ සඳහා සුදුසු ස්ථානයක් තෝරා ගෙන ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් වැඩි දුරටත් දැනුම් දෙන ලදි.

මේ සම්බන්ධ ලිඛිත යෝජනාවක් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි. එම යෝජනාව පිළිබඳව නව අධිකරණ ස්ථාපනය කිරීමේදී සලකා බලන ලෙස ගරු සභාපතිතුමා විසින් අධිකරණ අමාත්‍යාංශයේ අධ්‍යක්ෂක (සංවර්ධන) වෙත දැනුම් දෙන ලදි.

## 1.5. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ නඩු පවරා ඇති පිරිසකට සහනයක් ලබා ගැනීම - ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

යුද්ධය පැවති කාලයේදී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ නඩු පවරා වසර පහළොවක් පමණ තිස්සේ නඩු විභාග වෙමින් පවතින සිරකරුවන්ට සහනයක් ලබාදීම පිළිබඳ ගරු අධිකරණ අමාත්‍යතුමා, නීතිපතිතුමා සහ අතිගරු ජනාධිපතිතුමා සමග සාකච්ඡා කරන ලෙස ගරු චාල්ස් නිර්මලනාදන් මහතා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදි.

මෙය දේශපාලනමය තීරණයක් ගත යුතු සිද්ධියක් බව ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා විසින් කාරක සභාවට පවසන ලදී.

මේ සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමා වෙත ලිඛිත ඉල්ලීමක් සිදු කරන ලෙසත්, එහි පිටපත් ගරු අග්‍රාමාත්‍යතුමා සහ තමා වෙත යොමු කරන ලෙසත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි. මීට අමතරව අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත ද මෙය ලිඛිතව දැනුම් දෙන ලෙසත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

## 1.6. මහනුවර දිස්ත්‍රික්කයේ අධිකරණ සම්බන්ධ යෝජනා සහ වෙනත් කරුණු - ගරු උදයන කිරිඳිගොඩ මහතා

### 1.6.1. මහනුවර අධිකරණ සංකීර්ණයේ නඩත්තු කටයුතු නිසි පරිදි සිදු නොකිරීම

මහනුවර අධිකරණ සංකීර්ණයේ නඩත්තු කටයුතු නිසි පරිදි පරිදි සිදු නොවන බව ගරු උදයන කිරිඳිගොඩ මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

මේ සම්බන්ධයෙන් කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

### 1.6.2. මහනුවර සහ තෙල්දෙණිය අධිකරණ පාත්‍රතාව සම්බන්ධ ගැටළුව

මහනුවර නීතිඥ සංගමයේ හිටපු සභාපති නීතිඥ සංගමයේ අනුදැනුමකින් තොරව, අධිකරණ සේවා කොමිෂන් සභාව සමග සාකච්ඡාකර, තෙල්දෙණිය අධිකරණය වෙත වැඩි අධිකරණ බලයක් ලබා දී ඇති බවත්, එමගින් ජනතාව පීඩාවට ලක්වී ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

අධිකරණ පාත්‍රතාව සමාලෝචනය කිරීම සඳහා සමයවර්ධන විනිසුරුතුමාගේ සභාපතිත්වයෙන් යුතු කමිටුවක් දැනටමත් පත් කර ඇති බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 1.6.3. බන්ධනාගාර සිරමැදිරි ආශ්‍රිතව අතිරේක මහේස්ත්‍රාත්වරයෙකු පත් කිරීම

බන්ධනාගාරවල රිමාන්ඩ් කාලය දීර්ඝ කිරීම සඳහා සිරකරුවන් අධිකරණ වෙත රැගෙනයාම වෙනුවට ඒ සඳහා සිරමැදිරි ආශ්‍රිතව අතිරේක මහේස්ත්‍රාත්වරයෙකු පත් කිරීම සුදුසු බව ගරු උදයන කිරිඳිගොඩ මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

බන්ධනාගාරවල වෙනම මැදිරියක ස්කයිප් තාක්ෂණය ඔස්සේ සිරකරුවන්ව සම්බන්ධ කර ගැනීමට කටයුතු කරන බව අධිකරණ අමාත්‍යාංශයේ ප්‍රධාන උපදේශක, ජනාධිපති නීතිඥ යූ. ආර්. ද සිල්වා මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 1.6.4. මහනුවර කනිෂ්ඨ නීතිඥවරුන් සඳහා කාර්යාල සංකීර්ණයක් ගොඩනැගීමට භූමියක් නිදහස් කර ගැනීම

මහනුවර කනිෂ්ඨ නීතිඥවරුන් සඳහා ඔවුන්ගේ පුද්ගලික වියදමින් කාර්යාල සංකීර්ණයක් ඉදිකිරීම සඳහා දැනට විනිශ්චයකාරවරුන්ගේ නිල නිවසක් සඳහා වෙන්කර ඇති භූමිය නිදහස් කර දෙන ලෙස ගරු උදයන කිරිඳිගොඩ මහතා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදි.

මෙම ඉඩම විනිශ්චයකාරවරුන්ගේ නිල නිවසක් සඳහා වෙන්කර ඇති බැවින් නීතිඥවරුන් සඳහා වෙනත් ඉඩමක් ගැනීම සුදුසු බව රාජ්‍ය අමාත්‍ය, ගරු ලොහාන් රත්වත්තේ මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 1.6.5. පොලිස් ස්ථානයක් සඳහා නීතිඥවරුන් පත් කිරීම

පොලිස් ස්ථානයක් සඳහා නීතිඥවරුන් දෙදෙනෙකු පමණ සුදුසු තනතුරක් සහිතව පත් කර දෙන ලෙස ගරු උදයන කිරිඳිගොඩ මහතා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදි.

මෙය වැදගත් යෝජනාවක් බවත්, මේ පිළිබඳ සාකච්ඡා කරන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 1.6.6. නිල නොලත් මහේස්ත්‍රාත්වරුන් පත් කිරීම

නිල නොලත් මහේස්ත්‍රාත්වරුන් පත් කිරීම පිළිබඳව ද සලකා බලන ලෙස ගරු උදයන කිරිඳිගොඩ මහතා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදි.

මෙම කරුණ සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකඟතාවය පළ කරන ලදි.

## 1.7. වාණිජ මහාධිකරණයේ නඩු කටයුතු සහ වෙනත් කරුණු - ගරු සාගර කාරියවසම් මහතා

### 1.7.1. වාණිජ මහාධිකරණයේ නඩු සම්බන්ධ ගැටළු

ඉහළ මට්ටමේ වාණිජ කටයුතු කඩිනම් කිරීම සඳහා, විශේෂයෙන් ආයෝජකයාගේ විශ්වාසය ගොඩනැගීම සඳහා වාණිජ මහාධිකරණ පිහිටුවන ලද නමුත්, මෙම අධිකරණයේ නඩු ඇසීම සඳහා සලකා බලා ඇති නිර්ණායකය වනුයේ නඩුවේ වටිනාකම වන බැවින් මෙය අසාර්ථක වී ඇති බව ගරු සාගර කාරියවසම් මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

මෙය විදේශ ආයෝජකයන් සඳහා සුදුසු තත්වයක් නොවන බවත්, එම නිසා නව නිර්ණායක සෑදීමේ අවශ්‍යතාවයක් පවතින බවත් ගරු සාගර කාරියවසම් මහතා විසින්

කාරක සභාවට දැනුම් දෙන ලදි. බේරුම්කරණ ක්‍රියාවලිය සඳහා වෙනම මහාධිකරණ පිහිටුවීම යෝග්‍ය වනු ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා එකඟ වූ අතර, මේ සඳහා අතුරු විසඳුමක් ලෙස, විශේෂ මහාධිකරණවල නඩු අසන ආකාරයෙන් නඩුවේ වැදගත්කම අනුව එදිනෙදා නඩු විභාග කිරීම සිදු කළ හැකි බවත්, ගරු අගවිනිසුරුතුමා මේ සමග සම්බන්ධ වීම සඳහා විශේෂ යාන්ත්‍රණයක් සැකසිය යුතු බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 1.7.2. නීතිඥවරුන්ට තම සේවාදායකයින් හමුවීම සඳහා අධිකරණ ආශ්‍රිතව උපදේශක කාමර සකසා දීම

නීතිඥවරුන්ට තම සේවාදායකයින් හමුවීම සඳහා අධිකරණ ආශ්‍රිතව උපදේශක කාමර කිහිපයක් සකසා දීම පිළිබඳ යෝජනාවක් ගරු සාගර කාරියවසම් මහතා විසින් කාරක සභාවට ඉදිරිපත් කරන ලදී.

නාගරික සංවර්ධන අධිකාරියේ කොළඹ සංවර්ධන සැලැස්ම සඳහා වෘත්තිකයන්ට මුදල් ගෙවා ලබා ගත හැකි කුටි සම්බන්ධව යෝජනාවක් ඉදිරිපත් කර ඇති බවත්, මේ සම්බන්ධව තම අදහස් ලබා දිය හැකි බවත් ගරු මධුර විතානගේ මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

## 1.8. රෝහල්වලට අනුයුක්ත මරණ පරීක්ෂකවරුන් සම්බන්ධ ගැටළු සහ වෙනත් කරුණු - ගරු සුදත් මංජුල මහතා

### 1.8.1. රෝහල්වලට අනුයුක්ත මරණ පරීක්ෂකවරුන් සම්බන්ධ ගැටළු

රෝහල්වලට අනුයුක්ත මරණ පරීක්ෂකවරුන් සඳහා මෙම වසංගත තත්වය හමුවේ ආරක්ෂක ඇඳුම් හෝ සෞඛ්‍යාරක්ෂාව සම්බන්ධ උපදෙස් මාලාවක් ලැබී නොමැති බව ගරු සුදත් මංජුල මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

මේ සම්බන්ධයෙන් උපදෙස් පත්‍රිකාවක් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් ලබා දී ඇති බවත්, ආරක්ෂක ඇඳුම් ලබා ගැනීම පිළිබඳ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇති බැවින් එම ඇඳුම් ඉක්මණින් ලබා දීමට ක්‍රියාත්මක වන බවත් අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

මෙම උපදෙස් මාලාව ලබා දී නොමැති නම් එය අධිකරණ වෛද්‍ය නිලධාරීන් මගින් ලබා දීම සඳහා කටයුතු කිරීමට සූදානම් බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් එම ආරක්ෂිත ඇඳුම් අධිකරණ අමාත්‍යාංශය වෙත ලබාදී ඇති බව අධිකරණ අමාත්‍යාංශ අතිරේක ලේකම් (නීති) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි. මෙම ආරක්ෂිත ඇඳුම් ලබා දීමට වහා ක්‍රියාත්මක වන ලෙසත්, අධිකරණ රෙජිස්ට්‍රාර්වරුන් හරහා ලබා දීම වඩා සුදුසු බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

#### 1.8.2. රුවන්වැල්ල දිසා අධිකරණයේ ගැටළු

රුවන්වැල්ල දිසා අධිකරණය නව ගොඩනැගිල්ලක් වෙත ගෙන ගිය නමුත් මෙහි අධිකරණ නිලධාරීන්, නීතිඥවරුන් සහ සේවාලාභීන්ට ගැටළු රාශියක් ඇති වී තිබෙන බව ගරු සුදත් මංජුල මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

මේ පිළිබඳ අමාත්‍යාංශ නිලධාරී දැනුවත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 1.9. බන්ධනාගාරගත අයකු සම්බන්ධ දැනුම් දීම - ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා

ගංජා සම්බන්ධයෙන් වඩමාරච්චි ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන, දැනට තංගල්ලේ බන්ධනාගාරගතව සිටින සෙල්වරාසා උදයසිවම් නමැති පුද්ගලයා පිළිබඳව සලකා බලන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදි.

මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශයෙන් මැදිහත්වීමක් සිදුකළ නොහැකි බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

### 1.10. හදිසි මරණ පරීක්ෂකවරයෙකු පත් කිරීම - ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

හාරිස්පත්තුව ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂකවරයෙකු නොමැති නිසා දැනට තාවකාලික පත්වීමක් හෝ ලබා දෙන ලෙස ගරු ගුණතිලක රාජපක්ෂ මහතා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදි.

ලබන ජනවාරි මාසයේදී මීට අදාළ බඳවා ගැනීම සඳහා ගැසට් පත්‍රය පළ කරනු ලබන බවත් ඊට පෙර අවශ්‍යතාවයක් පවතී නම් තාවකාලික පත්වීමක් ලබා දීම සඳහා ඉල්ලීමක් සිදු කරන ලෙසත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

### 1.11. සාමදාන විනිසුරුවරුන්හට පත්වීම් ලබා දීම - ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

සාමදාන විනිසුරුවරුන් සඳහා ඉල්ලීම් කර ඇතත් මේ වන තෙක් පත්වීම ලැබී නැති බව ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 1.12. බන්ධනාගාර තුල ජීවත් වන දරුවන් සම්බන්ධ ගැටළු සහ වෙනත් කරුණු - ගරු ඩයනා ගමගේ මහත්මිය

#### 1.12.1. බන්ධනාගාර තුල ජීවත් වන දරුවන් සම්බන්ධ ගැටළු

මව්වරුන් බන්ධනාගාර ගත වීම හේතුවෙන් දරුවන්ටද බන්ධනාගාර ආශ්‍රිතව ජීවත් වීමට සිදු වීම කිසිසේත් සුදුසු නොවන තත්ත්වයක් බැවින් මෙවැනි දරුවන් සිටින බන්ධනාගාරගත මව්වරුන් වෙනම අංශයක රැඳවීම වඩා සුදුසු වනු ඇති බවත් ගරු ඩයනා ගමගේ මහත්මිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

දැනට ලංකාව තුළ සියළුම බන්ධනාගාරවල අධිකරණ නියෝග මත ළමුන් තිස් පස් දෙනෙකු සිටින බවත්, දරුවාගේ භාරකාරත්වය ගැනීමට කිසිවකු නොසිටින අවස්ථාවකදී දරුවාට වඩාත් සුරක්ෂිතතාවයක් ලැබෙන (Best Interest of Child) ප්‍රඥප්තිය අනුව වයස අවුරුදු 5 දක්වා දරුවන් මව සමග බන්ධනාගාරයේ සිටීමට අවස්ථාව දෙනු ලබන බවත් බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

අවුරුදු පහෙන් පසුව එම දරුවන් ළමා නිවාස වෙත යොමු කරනු ලබන බවත්, දැනට බන්ධනාගාර කිහිපයක දිවා සුරැකුම් මධ්‍යස්ථානය ඉදි කර ඇති නමුත් දරුවන්ට මෙම තත්වය හිතකර නොවන බවත් බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 1.12.2. සුළු වැරදි සම්බන්ධයෙන් දරුවන් සමඟ බන්ධනාගාරගතව සිටින මව්වරුන් සම්බන්ධව සුදුසු ක්‍රියාමාර්ග ගැනීම

දඩ මුදලක් ගෙවා ගැනීමට නොහැකි වීම වැනි සුළු වැරදි සම්බන්ධයෙන් දරුවන් සමඟ බන්ධනාගාරගතව සිටින මව්වරුන් ද බොහොමයක් සිටින බව ගරු ඩයනා ගමගේ මහත්මිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

මේ සම්බන්ධව ඉතා පුළුල් ක්‍රමයක් හඳුන්වා දී තිබෙන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

අමාත්‍යාංශය ඇප ලබාදීම සඳහා ඉදිරිපත්වීම සුදුසු නැති බවත්, මේ වනවිටත් දඩ මුදල් ගෙවා ගත නොහැකි පුද්ගලයින් සමග බැඳුම්කරයක් අත්සන් කර ඔවුන් නිදහස් කරන ලෙස අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් මහේස්ත්‍රාත්වරුන්ට දැනුම් දී ඇති බව අධිකරණ අමාත්‍යාංශයේ ප්‍රධාන උපදේශක, ජනාධිපති නීතිඥ යූ. ආර්. ද සිල්වා මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

මීට අමතරව සුළු වැරදි සඳහා දරුවන් සමඟ කාන්තාවන් බන්ධනාගාර ගත කිරීම නොකරන ලෙස පොලිසි දැනුවත් කර ඇති බවත්, මෙහිදී මෙවැනි වැරදිකරුවන් අදාළ බැඳුම්කරයක් අත්සන් කර නිදහස් කිරීමේ බලය පොලිස් ස්ථාන භාර නිලධාරීන්ටද ලබාදී ඇති බවත් යූ. ආර්. ද සිල්වා මහතා විසින් වැඩිදුරටත් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 1.12.3. බන්ධනාගාරවල කාන්තාවන්ට නිසි සනීපාරක්ෂක පහසුකම් නොමැති වීම

බන්ධනාගාරවල කාන්තාවන්ට නිසි සනීපාරක්ෂක පහසුකම් නොමැති බව ගරු ඩයනා ගමගේ මහත්මිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

මෙම කරුණ සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා එකඟ වන ලදි.

**2.** කාරක සභාව 2020.12.05 වන දින මධ්‍යාහ්න 12.00 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

**මුදල් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමු වැනි රැස්වීම - 2020 දෙසැම්බර් 07**

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ගරු මහින්ද රාජපක්ෂ මහතා (සභාපති)
ගරු ශෙහාන් සේමසිංහ මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු ජගත් කුමාර මහතා
ගරු එම්.ඩබ්ලිව්.ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා
ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා
**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු ගාමිණී ලොකුගේ මහතා
ගරු එස්. වියාලේන්ද්‍රන් මහතා
ගරු මොහමඩ් මුසම්මිල් මහතා
ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා
ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා
ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා
ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා
ගරු ඩී. වීරසිංහ මහතා

**1. අමාත්‍යාංශයීය කටයුතු පිළිබඳ සාකච්ඡාව**

**1.1.** මෙවර අයවැයෙන් යෝජනා කර ඇති ඇතැම් යෝජනා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් දැනටමත් කටයුතු කර ඇති බවත් සෙසු යෝජනා ඉදිරි වර්ෂයේ මුල් කාලයේදීම ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බවත් අමාත්‍යාංශයේ ලේකම්, එස්.ආර්. ආටිගල මහතා විසින් දැනුම් දෙන ලදි.

එමෙන්ම 2020 වර්ෂය තුළදී මුදල් අමාත්‍යාංශය විසින් සිදු කරන ලද වැඩසහටහන් සහ ව්‍යාපෘති සම්බන්ධයෙන් ද ඔහු විසින් පැහැදිලි කරන ලදි.

**1.2. "වැඩ සමඟ යළි ගමට" වැඩසටහන සහ වෙනත් කරුණු - ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා**

**1.2.1. "වැඩ සමඟ යළි ගමට" වැඩසටහන**

මෙරට මහජනතාව අතරින් ග්‍රාමීය හා අර්ධ නාගරිකයන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීමේ අරමුණින් මෙම වසරේ දෙසැම්බර් මස 14 වන දින ආරම්භ කිරීමට නියමිත "වැඩ සමඟ යළි ගමට" වැඩසටහන සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදි.

මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ජනතාව සමඟ සාකච්ඡා කර ඔවුන්ගේ සැබෑ අවශ්‍යතා හඳුනාගෙන ඒ අනුව ප්‍රමුඛතාව ලබා දීමට කටයුතු කළ යුතු බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

### 1.2.2. "ශ්‍රී ලංකාවේ සංචාරක ක්ෂේත්‍රයේ පුනර්ජීවනය" (Revival of Tourism Sector in Sri Lanka) නම් සංකල්ප පත්‍රිකාව

සංචාරක කර්මාන්තයෙන් මෙරට ආදායමට ලබා දෙන දායකත්වය, කර්මාන්තය තුළ ඇති ගැටළු සහ විසඳුම් යෝජනා සම්බන්ධයෙන් "ශ්‍රී ලංකාවේ සංචාරක ක්ෂේත්‍රයේ පුනර්ජීවනය" (Revival of Tourism Sector in Sri Lanka) නමින් සංකල්ප පත්‍රිකාවක් තමා විසින් ගරු සංචාරක අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කළ බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදි.

### 1.2.3. ගරු අමාත්‍යවරු හා නිලධාරින් ඇගයීම

වර්තමානයේ පවතින අසීරු තත්ත්වය යටතේ ඉතාම සාර්ථක හා කාර්යක්ෂම ලෙස කටයුතු කරන ගරු මුදල් අමාත්‍යතුමා, ගරු රාජ්‍ය අමාත්‍යවරු, අමාත්‍යාංශ ලේකම්වරු සහ මුදල් අමාත්‍යාංශයේ හා ඒ යටතේ වන ආයතනවල නිලධාරීන් ඇගයීමට ලක් කරන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදි.

## 1.3. සංචාරක කර්මාන්තය ඉහළ නැංවීම - ගරු ගාමිණී ලොකුගේ මහතා

සංචාරක කර්මාන්තය දැඩි පසුබෑමකට ලක්වී ඇති බැවින් එය ඉහළ නැංවීමට ක්‍රමවේදයක් හඳුන්වා දීම සිදු කළ යුතු බව ගරු අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදි.

මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන බව අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදි.

## 1.4. සමෘද්ධි නිලධාරින්ගේ විශ්‍රාම වැටුප සහ වෙනත් කරුණු - ගරු ජගත් කුමාර මහතා

### 1.4.1. සමෘද්ධි නිලධාරින්ගේ විශ්‍රාම වැටුප

2014 වර්ෂයේ සිට සමෘද්ධි නිලධාරින් වෙනුවෙන් විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීමට කටයුතු කළ නමුත් එය මේ වනතෙක් සාර්ථක කර ගැනීමට නොහැකි වූ බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

සමෘද්ධි නිලධාරින්ට අදාළ ගැටළු සම්බන්ධයෙන් ගරු රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා සහ අදාළ නිලධාරින් සමඟ සාකච්ඡා කළ බවත් එයින් වැඩි ප්‍රමාණයක් කඩිනමින් විසඳීමට කටයුතු කරන බවත් රාජ්‍ය අමාත්‍ය, ගරු ශෙහාන් සේමසිංහ මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

සෙසු ගැටළු සම්බන්ධයෙන් ගරු මුදල් අමාත්‍යතුමා සමඟ අවසන් සාකච්ඡාවකට යොමු වීමට බලාපොරොත්තු වන බවත් ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් තවදුරටත් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 1.4.2. සමෘද්ධි හා කෘෂි ක්ෂේත්‍ර නිලධාරින් සඳහා ඡන්දය ඉල්ලීමේ අයිතිවාසිකම

සමෘද්ධි ක්ෂේත්‍ර නිලධාරින් හා කෘෂි ක්ෂේත්‍ර නිලධාරින් සඳහා ඡන්දය ඉල්ලීමේ අයිතිවාසිකම ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

මේ සඳහා ගරු කෘෂිකර්ම අමාත්‍යතුමා සහ ගරු මුදල් අමාත්‍යතුමා විසින් ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කළ යුතු බව රාජ්‍ය අමාත්‍ය, ගරු ශෙහාන් සේමසිංහ මහතා විසින් දැනුම් දෙන ලදි.

ක්ෂේත්‍ර නිලධාරින්ට ජන්ද ඉල්ලීමේ හිමිකම ලබා දීම සම්බන්ධයෙන් පළාත් පාලන පනතෙහි සංශෝධනයක් සිදු කෙරෙන බව ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා විසින් දැනුම් දෙන ලදි.

**1.4.3. පසුගිය රජය විසින් විශ්‍රාම වැටුප් ලාභීන්ට ලබා දුන් සහනය**

පසුගිය රජය විසින් විශ්‍රාම වැටුප් ලාභීන්ට ලබා දුන් සහනය වත්මන් රජය විසින් අහිමි කළ බවට නඟන චෝදනාව සම්බන්ධයෙන් පැහැදිලි කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

2016 වසරේ සිට 2020 වසර දක්වා රු. 10,000/- ක මුදලක් කොටස් වශයෙන් රාජ්‍ය සේවකයින්ගේ වැටුපට එකතු කිරීමට ගත් තීරණය අනුව 2016 වසරෙන් පසු විශ්‍රාම ගත් රජයේ සේවකයින් 2020 වසරේදී විශ්‍රාම ගියා සේ සලකා විශ්‍රාම වැටුප සංශෝධනය කරන බවට පසුගිය රජය විසින් ප්‍රකාශ කර ඇති බව අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදි.

නමුත් 2016 වසරට පෙර විශ්‍රාම ගිය රාජ්‍ය සේවකයින් විශාල ප්‍රමාණයක් සිටින බැවින් මෙමඟින් විෂමතාවයක් මතුවන බවත් දැනටමත් විශ්‍රාමිකයන්ගේ වැඩි වූ වැටුප් ගෙවීම සඳහා රජය විසින් විශාල වැය බරක් දරන බවත් අමාත්‍යාංශයේ ලේකම් විසින් පැහැදිලි කරන ලදි.

**2.** කාරක සභාව 2020.12.07 වන දින පෙ.ව. 11.00 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

**මහාමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමුවැනි රැස්වීම - 2020 දෙසැම්බර් 07**

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (සභාපති)
ගරු නිමල් ලන්සා මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා
ගරු අමරකීර්ති අතුකෝරළ මහතා
ගරු එච්. නන්දසේන මහතා

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු රොෂාන් රණසිංහ මහතා
ගරු තේනුක විදානගමගේ මහතා
ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු ජගත් පුෂ්පකුමාර මහතා
ගරු චන්දිම වීරක්කොඩි මහතා
ගරු ජේ.සී.අලවතුවල මහතා
ගරු ෆයිසාල් කාසිම් මහතා
ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු සම්පත් අතුකෝරල මහතා
ගරු තිසකුට්ටි ආරච්චි මහතා
ගරු ජගත් කුමාර මහතා
ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා
ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා
ගරු අසංක නවරත්න මහතා
ගරු නලින් ප්‍රනාන්දු මහතා
ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා
ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
ගරු ගාමිණී වලේබොඩ මහතා
ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය
ගරු මධුර විතානගේ මහතා
ගරු ඩී. වීරසිංහ මහතා
ගරු සමන්ප්‍රිය හේරත් මහතා

## 1. වෙනත් කටයුතු

### 1.1 ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

#### 1.1.1. නුවරඑළිය දිස්ත්‍රික්කයේ සංවර්ධනය කිරීමට ආරම්භ කර අතරමග නතර කර ඇති මාර්ග සංවර්ධනය කිරීම

නුවරඑළිය දිස්ත්‍රික්කයේ වැඩ අවසන් නොකළ මෙවැනි මාර්ග කිහිපයක් ඇති බැවින් එම මාර්ග සංවර්ධනය කර දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

මාර්ග පිළිබඳ ලැයිස්තුවක් ලබාදෙන මෙන් ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීතුමා වෙත දන්වා සිටින ලදී.

#### 1.1.2. නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ කැටබුලාව එල්ලෙන පාලම සංවර්ධනය කිරීම

ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කර දැනට අතරමග නතර කර ඇති මෙම පාලමේ ඉතිරි වැඩ නිමකර ජනතාවගේ පහසුව සඳහා කඩිනමින් විවෘත කිරීමට අවධානය යොමු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

## 1.2. ගරු ඩිලාන් පෙරේරා මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.2.1. බදුල්ල - නුවර රජ මාවත සංවර්ධනය කිරීම

මෙම මාර්ගයේ ඌව පරණගම නගරයේ සිට නුවර දක්වා ඇති කිලෝමීටර් 26 ප්‍රමාණය වැඩ නිමකර සංවර්ධනය කර දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.

2014 වසරේදී මේ මාර්ගය සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර ඇති බවත් පරීක්ෂා කර ඇති බවත් ඉදිරි පියවර ගනු ලබන බවත් අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.2.2. බදුල්ල දිස්ත්‍රික්කයේ අයිරෝඩ් (iROAD) මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මාර්ග සංවර්ධනය

බදුල්ල දිස්ත්‍රික්කයේ අයිරෝඩ් ( iROAD ) මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කිරීමට ආරම්භ කර අතරමග නතර කර ඇති මාර්ග කොටස් සංවර්ධනය කර දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

මාර්ගය සංවර්ධනය ලබාගත් ටෙන්ඩර්කරුවන් කිහිප දෙනෙකු නිසා ගැටළු මතු වූ බවත් ඉතා කඩිනමින් සංවර්ධන කටයුතු අවසන් කිරීම සඳහා පියවර ගන්නා බවත් අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දන්වා සිටින ලදී.

## 1.3. ගාල්ල දිස්ත්‍රික්කයේ යක්කලමුල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ ඇති මාර්ග සංවර්ධනය - ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල සීමාවට අයත් අබලන් මාර්ග කිහිපයක් ඇති හෙයින් ජනතාවගේ පහසුව සඳහා මෙම මාර්ග සංවර්ධනය කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

## 1.4. ගරු චන්දිම වීරක්කොඩි මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.4.1. හබරාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රුමස්සල උණවටුන යා කරන මාර්ගය අලුත්වැඩියා කර ගැනීම

සංචාරක කලාපයට සම්බන්ධ මෙම මාර්ගය අබලන්ව ඇති හෙයින් සංවර්ධනය කර දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.

මෙම මාර්ගය ඉදිරියේදී අලුත්වැඩියා කටයුතු කර සංවර්ධනය කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.4.2. දිස්ත්‍රික්කයේ ෆ්‍රෙඩ්රුක්වත්ත සුනාමි ගම්මානය ආශ්‍රිත මාර්ග සංවර්ධනය කිරීම

දහසක පමණ ජනතාවක් පදිංචි ෆ්‍රෙඩ්රුක්වත්ත සුනාමි ගම්මානයේ මාර්ග අලුත්වැඩියා කර දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.

### 1.4.3. ගාල්ල දිස්ත්‍රික්කයේ දොඩංගොඩ පාලම ප්‍රතිසංස්කරණය කිරීම

දැනට අබලන්ව ඇති දොඩංගොඩ පාලම ප්‍රතිසංස්කරණයට පියවර ගන්නා මෙන්ද පාලම පළල් කිරීමේ හැකියාව පිළිබඳව සොයා බලන මෙන්ද ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.

### 1.4.4. ගාල්ල දිස්ත්‍රික්කයේ වක්වැල්ල පාලම ප්‍රතිසංස්කරණය කිරීම

මෙම පාලම ගොඩනැංවීමේදී ඇති වගකීම් කාලයත් ඉක්මවා ඇති හෙයින් ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන මෙන්ද පාලම අසල කුණු රොඩු එක් රැස්වන හෙයින් ඒවා ඉවත් කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකසන ලෙසද ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.4.5. ගාල්ල නගරයේ සිට අධිවේගී පිවිසුම දක්වා ඇති මාර්ගය සංවර්ධනය කිරීම

මෙම පිවිසුම් මාර්ගය පටු පළලකින් යුක්ත හෙයින් හා දෙපස ඉදිකර ඇති වෙළඳ ආයතන නිසා මාර්ග තදබදය ඇතිව ඇති හෙයින් මාර්ගය පළල් කිරීමටත් වෙළඳ ආයතන වෙනත් ස්ථානයක ස්ථාපනය කිරීමට කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

ගාල්ල ප්‍රධාන සංචාරක පුරවරයක් හෙයින් මෙම මාර්ගය සංවර්ධනය කිරීම ඉතාමත් අත්‍යවශ්‍ය කටයුත්තක් හෙයින් ඉදිරි වැඩපිළිවෙල පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය, සංචාරක අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර තීරණයක් ගැනීමට කටයුතු කරන මෙන් ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම්ට උපදෙස් ලබාදෙන ලදී.

### 1.4.6. ගාල්ල දිස්ත්‍රික්කයේ ඉමදූව වැලිවිට මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම

මෙම මාර්ගය අබලන් තත්ත්වයේ පවතින හෙයින් සංවර්ධනය කිරීමට කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

### 1.4.7. මාර්ගයන් කාපට් කිරීමට පෙර පානීය ජල නළ එළීම

මාර්ගයන් සංවර්ධනය කල පසු අනාගතයේදී ජල නළ එළීම සඳහා නැවත එම මාර්ගයන්ට හානි කිරීමට සිදුවන හෙයින් සංවර්ධන කටයුතු ඇරඹීමට පෙර මුදල් ගෙවීමකින් තොරව නළ එළීම සඳහා අවස්ථාව මාර්ග ආශ්‍රිත ප්‍රදේශවාසීන්ට සැලසීමට පියවර ගන්නා මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.

### 1.4.8. ගාල්ල දිස්ත්‍රික්කයේ කරාපිටිය මාතෘ රෝහල අසල මාර්ගය

කරාපිටිය මාතෘ රෝහල විවෘතවීමත් සමග කරාපිටියේ විශාල මාර්ග තදබදයක් ඇතිවෙන හෙයින් මාතෘ රෝහල අසල මාර්ගය පළල් කිරීමට කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

#### 1.4.9. ගිංතොට වක්වැල්ල මාර්ගය සංවර්ධනය කිරීම

සෞඛ්‍ය මධ්‍යස්ථානය, සමෘද්ධි කාර්යාලය, පල්ලිය පිහිටා ඇති කලාපයේ මීටර 70 පමණ වන මාර්ගය සංවර්ධනය කිරීම තුළින් ජනතාවට ප්‍රතිලාභ ලැබෙන හෙයින් ප්‍රමුඛතාවය ලබා දී සංවර්ධනය කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

### 1.5. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගම්මානවල පිවිසුම් මාර්ග සංවර්ධනය කිරීම - ගරු එච්. නන්දසේන මහතා

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය ප්‍රදේශවල මාර්ග සංවර්ධනය වී නොමැති හෙයින් සෑම ගම්මානයක් සඳහා ඇති පිවිසුම් මාර්ග සංවර්ධනය කර දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.6. ගරු සම්පත් අතුකෝරළ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

#### 1.6.1. හිනිදුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම

හිනිදුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නෙලුව, තවලම, නාගොඩ, හිනිදුම ග්‍රාමීය දුෂ්කර ප්‍රදේශ බවත් මෙම ප්‍රදේශවල මාර්ග සංවර්ධනය කර දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.

#### 1.6.2. ගිං ගඟ හරහා පාලම් 3ක් ගොඩ නැගීම

නෙලුව, කැටගොඩ සහ නාගොඩ ප්‍රදේශ කේන්ද්‍ර කරගෙන ගිංගඟ හරහා පාලම් 3 ක් ගොඩනැගීම තුළින් ප්‍රදේශයේ ජනතාවගේ ගමනාගමනයට වඩා පහසුවක් වන හෙයින් ඉදිරි කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.

#### 1.6.3. මාදු ගඟ හරහා ඉදිකිරීමට යෝජිත මාදුව පාලම

දීර්ඝ කාලයක් සිට ඉදි කිරීමට යෝජිතව ඇති මාදු ගඟ හරහා මාදුව පාලම ගොඩ නංවන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.

මෙම පාලම ගොඩනැංවීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට නියමිත බවත් ඒ අනුව ව්‍යාපෘතිය සඳහා ටෙන්ඩර් කැඳවීමට ඉදිරියේදී ක්‍රියාකල හැකි බවත් අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දන්වන ලදී.

#### 1.6.4. මාර්ග සංවර්ධනයට අවශ්‍ය අමුද්‍රව්‍ය හිඟය

ප්‍රාදේශීයව මාර්ග සංවර්ධනයට හා නඩත්තුව සඳහා අවශ්‍ය ඒබීසී වර්ගයේ කලුගල් බොරළු හිඟව පවතින හෙයින් මාර්ග සංවර්ධන කටයුතු ප්‍රමාදවීමේ තත්ත්වයක් පවතින බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.6.5. මාර්ගයේ දෙපස පඳුරු ශාක වැවීම නිසා මාර්ග නඩත්තු කිරීමේ අපහසුතාවය

තම ප්‍රදේශයේ ආක්‍රමණික ශාක වර්ගයන් මාර්ගයේ දෙපස වැවෙන බවත් ඒවා විනාශ කලත් නැවත වැවෙන හෙයින් ස්ථිරව විනාශ කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයක අවශ්‍යතාවය ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට ඉදිරිපත් කරන ලදී.

### 1.6.6. සංවර්ධනය කරන මාර්ග නඩත්තුව සඳහා ප්‍රාදේශීය සභා මට්ටමින් නඩත්තු ඒකක ඇති කිරීම

මාර්ග සංවර්ධන අධිකාරියට අමතරව සංවර්ධනය කරන මාර්ග දෛනිකව අවශ්‍යතා අනුව නඩත්තුව සඳහා ප්‍රාදේශීය සභාවල ආදායම අනුව අපහසුව ඇති හෙයින් ප්‍රාදේශීය සභා කිහිපයක් ඒකාබද්ධ වන ලෙස එම සේවකයන්ව යොදාගෙන උපකරණ ලබාදී නඩත්තු ඒකක ඇති කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

## 1.7. බත්තරමුල්ල නගරය හා කොස්වත්ත යා කෙරෙන මාර්ගයේ වැඩ නිම කිරීම- ගරු ජගත් කුමාර මහතා

සෙත්සිරිපාය හා උඩුමුල්ල හරහා බත්තරමුල්ල නගරය හා කොස්වත්ත නගරය යා කෙරෙන පරිදි ඉදිවෙන මාර්ගයේ වැඩ දැනට නතර කර ඇති හෙයින් ප්‍රදේශවාසීන්ට මාර්ගය භාවිතයට නොහැකිව අමතර දුරක් යාමට සිදුව ඇති බවත් මෙම මාර්ගයේ වැඩ කටයුතු අවසන් කිරීමට කඩිනමින් ක්‍රියාදාමයක් ගන්නා මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.

මෙම මාර්ගයේ වැඩ නිම කිරීමට උඩුමුල්ල සිට කොස්වත්ත දක්වා ඉඩම් පවරා ගැනීමේ කටයුතු සිදුකළ යුතු බව අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දන්වා සිටින ලදී.

ඉඩම් පවරා ගැනීම් සිදුවන තෙක් ගරු මන්ත්‍රීතුමා යෝජනා කරන පරිදි ප්‍රදේශවාසීන්ගේ ගමනාගමනයට අත්‍යවශ්‍ය වන මාර්ගයේ කොටස සංවර්ධනය කරන මෙන් ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

## 1.8. ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.8.1. යටියන්තොට මැතිවරණ කොට්ඨාශයේ මාර්ග සංවර්ධනය

යටියන්තොට ප්‍රාදේශීය සභාවට ලබාදුන් කිලෝමීටර් 15 මාර්ග ව්‍යාපෘතිය තවමත් ඇස්තමේන්තු කර නොමැති බවත් දුෂ්කර ප්‍රදේශයක් හෙයින් මාර්ග සංවර්ධනය කර දෙන මෙන් ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාවට දන්වා සිටින ලදී.

සතියක් ඇතුළත සංවර්ධන කටයුතු ආරම්භ කරන බව අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දන්වා සිටින ලදී.

### 1.8.2. වරාවල නගරය හරහා දිවෙන අවිස්සාවේල්ල කෑගල්ල මාර්ගය සංවර්ධනය කිරීම

වරාවල බුලත්කොහුපිටිය නගර හරහා කෑගල්ල සහ අවිස්සාවේල්ල නගර යා කෙරෙන අතුරු මාර්ගයක් ලෙස භාවිතයට ගන්නා මෙම මාර්ගයේ ඉතිරි සංවර්ධන වැඩ

කටයුතු නිම කරදෙන මෙන් ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

එමෙන්ම වාහන දෙකකට මාරුවිය හැකි පරිදි මාර්ගයේ පළල වැඩි කිරීමට කටයුතු කරන මෙන්ද නොමිලයේ ඉඩම් ලබාදීමට ඉඩම්ලාභීන් මනාපය ප්‍රකාශ කර ඇති බවද ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාව වෙත දන්වා සිටින ලදී.

**1.8.3. බී ශ්‍රේණියේ මාර්ග සංවර්ධනය**

බී ශ්‍රේණියේ මාර්ග සංවර්ධනයේදී වාහන දෙකකට මාරුවිය හැකි පරිදි මාර්ගයේ පළල වැඩි කිරීමට කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

**1.8.4. කෑගල්ල දිස්ත්‍රික්කයේ යටියන්තොට නගරයේ පාලම ප්‍රතිසංස්කරණය කිරීම**

අබලන්ව පවතින යටියන්තොට නගරයේ ප්‍රධාන පාලම ප්‍රතිසංස්කරණය කර දෙන මෙන් ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

මෙම පාලම පරීක්ෂාකර අවශ්‍ය කටයුතු කරන බව අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.9. නව පාලම් ස්ථාපිත කළ ස්ථානවල අබලන් පරණ පාලම් ඉවත් කිරීම - ගරු නලින් ප්‍රනාන්දු මහතා**

නව පාලම් ස්ථාපිත කල ස්ථානයන්හි ඉවත් නොකර ඇති පරණ අබලන් පාලම් භාවිතයට ජනතාව යොමුව ඇති හෙයින් ප්‍රතිපත්තිමය වශයෙන් ගන්නා වූ පියවර පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

ඉවත් කරනු ලබන කොටස් ප්‍රයෝජනයට ගෙන වෙනත් ස්ථානවල පාලම් ඇති කර ඇති බවත් ඉවත් කිරීම ආර්ථිකමය ලෙස ඵලදායී නොවන හෙයින් සමහර ස්ථානවල පැරණි පාලම් ඇති බව අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දන්වා සිටින ලදී.

**1.10. ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**

**1.10.1. ගම්පහ දිස්ත්‍රික්කයේ අත්තනගල්ල ප්‍රදේශයේ මාර්ග පළල් කිරීම**

අත්තනගල්ල ප්‍රදේශයේ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් සංවර්ධනය කළයුතු පටු මාර්ග කිහිපයක් පවතින හෙයින් වාහන ගමනාගමනයට පහසුවන ලෙස අනතුරු අවම වීම සඳහා මෙම මාර්ගයන්හි පළල මංතීරු දෙකක් වන ලෙස සංවර්ධනය කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.

මෙම ගැටළුව අයිරෝඩ් (iROAD) ව්‍යාපෘතියේ මාර්ගයන් සහ කඳුකර ප්‍රදේශයේ මාර්ගයන්හි පවතින හෙයින් වැඩි පළලකින් යුත් සුදුසු ස්ථාන හඳුනාගෙන වාහන මාරුවීම සඳහා ද්විත්ව තීරු ලෙස සංවර්ධනය කිරීම සඳහා කටයුතු කරන මෙන් ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම්වරයාට උපදෙස් ලබා දෙන ලදී.

### 1.10.2. කොළඹ නුවර මාර්ගයේ පස්යාල මංසන්ධියේ ගුවන් පාලමක් ඇති කිරීම

වාහන තදබදය අවම කිරීම සඳහා කොළඹ නුවර මාර්ගයේ පස්යාල මංසන්ධියේ ගුවන් පාලමක් ඇති කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

### 1.10.3. සංවර්ධනය කරන මාර්ගයන්හි දෙපස සෝදාපාලුව වැලැක්වීම

මහාමාර්ග සංවර්ධනයේදී උසකින් යුක්තව කාපට් යෙදීම නිසා මාර්ගයේ දෙපස කාපට් යොදන මට්ටමට සමතලා කිරීම සඳහා යොදන පස් ස්ථරය සෝදාපාලුවට ලක්වීමෙන් මගී ජනතාව අනතුරුදායක තත්ත්වයට පත්ව ඇති බවට නිරන්තර පැමිණිලි ලැබී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දන්වා සිටින ලදී.

එබැවින් මාර්ගයන්හි දෙපස සංරක්ෂණය කිරීමට සුදුසු ක්‍රමවේදයක අවශ්‍යතාවය පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවේ අවධානයට යොමු කරන ලදී.

### 1.10.4. මාර්ග සංවර්ධනයේදී පාලම් පිවිසුම් තුළට වාහන ඇතුළු කිරීමේදී රියදුරන්ට සිදුවන අපහසුතා

මහා මාර්ග සංවර්ධනයේදී පාලම් ඇති ස්ථානවල පාලමට ඇතුළුවීමේ දෙපස ප්‍රවේශයන් පහත් මට්ටමක තිබීම හා පාලම පටුවීම නිසා විරුද්ධ පැත්තෙන් වාහන පිවිසුම පිළිබඳව නොපෙනෙන තත්ත්වයක් ඇතිවන හෙයින් රියදුරන්ට වාහන හසුරුවා ගැනීමට ගැටළු ඇතිවී තිබෙන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දන්වා සිටින ලදී.

### 1.10.5. ගම්පහ දිස්ත්‍රික්කයේ අත්තනගල්ල, ඌරපොල දික්කන්ද මාර්ගය (බස් මාර්ග අංක 231)

2014 වසරේ සිට මෙම මාර්ගයේ කාපට් යොදා සංවර්ධනය කළත් බෝක්කු ඇති ස්ථානද නිසිලෙස පළල් කර සංවර්ධනය කරන මෙන්ද මාර්ගය දෙපස ස්වභාවික මතුව ඇති ගල් ඉවත් කර නියමිත පළලකින් යුක්තව මාර්ගයේ සංවර්ධන කටයුතු අවසන් කර දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

### 1.10.6. බස්නාහිර පළාත් සභාව විසින් සංවර්ධනය කරන ලද ගම්පහ දිස්ත්‍රික්කයේ හල්ගම්පිටිය ප්‍රාදේශීය මාර්ගය

බස්නාහිර පළාත් සභාව විසින් සංවර්ධනය කළ මෙම මාර්ගයේ පටු පළල නිසා නිතර අනතුරු වන හෙයින් මාර්ගය පළල් කර සංවර්ධනය කර දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

මාර්ගයන් පළල් කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ දී ගැටළු ඇතිවන හෙයින් පොදුවේ පටු මාර්ගයන් සංවර්ධනයේදී එම මාර්ගයන්හි වැඩි පළලකින් යුත් ස්ථාන තෝරාගෙන සුදුසු දුර ප්‍රමාණයක් නිශ්චිත කර වාහන මාරුවීම සඳහා මාර්ග පුළුල් කිරීමට කටයුතු කරන මෙන් ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශයේ ලේකම්ට උපදෙස් ලබා දෙන ලදී.

### 1.10.7. කඩවත නුවර අධිවේගී මාර්ගයේ අත්තනගල්ල ප්‍රදේශයේ සංවර්ධන කටයුතු

අත්තනගල්ල ප්‍රදේශයට අදාළ සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් වර්තමාන තත්ත්වය පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

එමෙන්ම මීරිගම ප්‍රදේශය දක්වා සමහර ප්‍රදේශ නිතර ජලගැලීම්වලට ලක්වන හෙයින් කණු මතින් මාර්ගය ඉදි කිරීමට යෝජනා වී තිබුණ බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ගරු මන්ත්‍රීතුමා සඳහන් කරන ප්‍රදේශයේ වැඩ කටයුතු සම්බන්ධයෙන් යම්කිසි අතපසුවීමක් ඇති බවත් කොන්ත්‍රාත්කරු වෙත මුදල් ගෙවීම අත්හිටුවා ඇති බවද විගණන විමසුමක්ද යොමුව ඇති බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දන්වා සිටින ලදී.

### 1.10.8. නුවර කොළඹ ප්‍රධාන මාර්ගයේ යක්කල ප්‍රදේශයේ බස් මගී ආවරණ ඉදි කිරීම

මෙම ප්‍රදේශයේ බස් මගී ආවරණ නොමැති වීමෙන් මගී ජනතාවගේ අපහසුතා අවම කිරීම සඳහා බස් මගී ආවරණ ඉදිකර දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

### 1.10.9. ගම්පහ දිස්ත්‍රික්කයේ වාරණ රජමහා විහාර පාරට සමාන්තරව ඇවිදින මංතීරුවක් ඉදි කිරීම

මෙම මාර්ගයට සමාන්තරව ඇවිදින මංතීරුවක් ඇති කර දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

## 1.11. ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.11.1. යාපනය දිස්ත්‍රික්කයේ දූපත් වාසීන් සඳහා ප්‍රවාහන පහසුකම්

එලුවතිව් සහ නෙදුන්තිව් දූපත්වාසීන්ට මුහුදු සැතපුම් 12 නාවුක මාර්ගයේ ප්‍රවාහන පහසුකම් සඳහා යොදවා ඇති නාවුක යාත්‍රාව අබලන්ව නිතර අක්‍රීය වන හෙයින් නව යාත්‍රාවක් ලබාදෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සාකච්ඡා වූ බවත් නව යාත්‍රාවක් මිලදී ගැනීමට විශාල මුදලක් වැයවන හෙයින් අබලන් යාත්‍රා අළුත්වැඩියා කර ඉතාමත් කඩිනමින් නාවුක ගමනාගමනය සඳහා යොදවන බවත් අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.11.2. පාලම් ඉදි කිරීමේ ව්‍යාපෘතිය

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ඉදි කරන ලද පාලම් 12 ක ප්‍රමිතිය සම්බන්ධයෙන් හා කොන්ත්‍රාත්කරුවන්ගේ අක්‍රමිකතා සම්බන්ධයෙන් පැමිණිලි ලැබී ඇති හෙයින්

පරීක්ෂණයක් සිදු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

## 1.12. ගරු ජේ.සී.අලවතුවල මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.12.1. කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාවතගම බරන්දාව බී ශ්‍රේණියේ මාර්ගය සංවර්ධනය කිරීම

මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු මන්දගාමීව සිදුවන හෙයින් කඩිනමින් වැඩ අවසන් කිරීමට කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

මෙම මාර්ගයේ සංවර්ධන වැඩ නිම කිරීමට ඉදිරි පියවර ගන්නා බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.12.2. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගනේවත්ත හරහා කුඹුක්ගැටේ වාරියපොල මාර්ගය සංවර්ධනය කිරීම

අබලන් තත්ත්වයේ පවතින කිලෝමීටර් 22 කින් යුක්ත බී ශ්‍රේණියේ මෙම මාර්ගය සංවර්ධනය කර දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.

ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇති බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දන්වා සිටින ලදී.

## 1.13. ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.13.1. මඩකලපුව දිස්ත්‍රික්කයේ මන්ඩූර් නගරය සඳහා නව පාලමක් ඇති කිරීම

මඩකලපුව දිස්ත්‍රික්කයේ තිස්පන්දහසක පමණ ජනගහණයක් වාසය කරන මන්ඩූර් දූපත් ප්‍රදේශය යාවෙන ලෙස පාලමක් ඇති කිරීමේ වර්තමාන තත්ත්වය පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

### 1.13.2. මන්ඩූර් පාලම නොමැති වීම නිසා ප්‍රවාහන අවශ්‍යතා සඳහා යොදවා ඇති අබලන් පාරු වෙනුවට නව පාරු 2ක් ලබාගැනීම

මන්ඩූර් දූපත්වාසීන් සඳහා ප්‍රවාහන පහසුකම් සැලසීමට යොදා ඇති පාරු දැඩි ලෙස අබලන්ව ඇති හෙයින් ඒ සඳහා නව පාරු 2 ක් යොදවන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.

### 1.13.3. තලෙයිමන්නාරම දූපත අතර ප්‍රවාහනය

මගී ප්‍රවාහනයට සහ භාණ්ඩ ප්‍රවාහනය සඳහා සංචාරක අමාත්‍යාංශය හා වරාය හා නාවික අමාත්‍යාංශය එක්ව ඒකාබද්ධ වැඩපිළිවෙලක් ලෙස මාර්ගය ඉදි කිරීමේ හැකියාව පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් විමසීමක් කරන ලදී.

### 1.13.4. මඩකලපුව දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධනය

කිලෝමීටර් ලක්ෂයේ මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධනය කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.

## 1.14. ගරු ජගත් පුෂ්පකුමාර මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.14.1. මොනරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය සියඹලාගම රන්දෙනිය මාර්ගය

මෙම මාර්ගයේ සංවර්ධන වැඩ නතරව ඇති හෙයින් වැඩ අවසන් කර දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදි.

### 1.14.2. මොනරාගල දිස්ත්‍රික්කයේ පැලවත්ත හිගුරකඩුව මාර්ගය

බී ශ්‍රේණියේ මාර්ගය වන මෙහි සංවර්ධනය කිරීම සඳහා කිලෝමීටර් 17 ඇති හෙයින් වැඩ කටයුතු නිමකරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.

එමෙන්ම පී 57 මාර්ගයේ ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

### 1.14.3. තණමල්විල වේලිඔය දක්වා ඇති මාර්ගය බලංගොඩ නගරය දක්වා දීර්ඝ කිරීම

අයිරෝඩ් **(iRoad)** ව්‍යාපෘතිය යටතේ ගොඩනගන ලද මෙම මාර්ගය බලංගොඩ දක්වා දීර්ඝ කිරීම තුළින් කතරගම නගරයට යාම සඳහා ඉතාමත් පහසුවන හෙයින් ඒ සම්බන්ධයෙන් කාරක සභාවේ අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

## 1.15. ගරු අමරකීර්ති අතුකෝරළ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.15.1. පොලොන්නරුව අරලගංවිල කන්දේගම මාර්ගය

මෙම මාර්ගයේ ඉතාමත් අබලන් කිලෝමීටර් 15 ක් ඇති බවත් කොන්ත්‍රාත්කරු හා පවතින නීතිමය ගැටළු නිසා සංවර්ධන වැඩ කටයුතු නතරව ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දන්වා සිටින ලදී.

කොන්ත්‍රාත්කරුගේ වැඩ නිම කිරීමේ අසාර්ථකභාවය මත නීතිමය ක්‍රියාමාර්ග ගත් බවත් මෙම කොන්ත්‍රාත්කරු සමඟ එකඟතාවයකට පැමිණ කඩිනමින් මාර්ගයේ වැඩ නිම කිරීමට කටයුතු කරන බව අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දන්වා සිටින ලදී.

### 1.15.2. වැලිකන්ද - සෝමාවතිය මාර්ගය

මෙම මාර්ගය කිලෝමීටර් 15 පමණ දැඩි ලෙස අබලන්ව පවතින හෙයින් ප්‍රතිසංස්කරණය කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.

### 1.15.3. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධන කොන්ත්‍රාත්කරුවන්ගේ පවතින අක්‍රමිකතා

සංවර්ධන වැඩ කටයුතු ලබාගෙන ඇති කොන්ත්‍රාත්කරුවන්ගේ නොසැලකිලිමත්කම නිසා මාර්ග සංවර්ධන කටයුතු ඉතාමත් මන්දගාමීව සිදුවන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දන්වා සිටින ලදී.

මේ යටතේ ඇලහැර කොට්ඨාශයේ මාර්ග 4 සහ හිඟුරක්ගොඩ කොට්ඨාශයේ මාර්ග 3 පවතින බවද අවශ්‍ය බොරළු හිඟතාවයක් පවතින බව කොන්ත්‍රාත්කරුවන් පවසන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දන්වා සිටින ලදී.

ගැටළු විසඳා අවශ්‍ය පරිදි කඩිනමින් මෙම මාර්ග සංවර්ධනය කිරීමට කටයුතු කරන බවද සක්‍රියව ප්‍රාදේශීය මාර්ග සංවර්ධන ගැටළු සඳහා මැදිහත්වන ලෙසද ගරු මන්ත්‍රීතුමාට උපදෙස් ලබාදෙන ලදී.

## 1.16. ගරු ඩී. වීරසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.16.1. අම්පාර නුවර පාර සංවර්ධන කටයුතු

මෙම මාර්ගයේ මංගලගම සිට මහඔය දක්වා කිලෝමීටර් 27ක් සංවර්ධනය කළයුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දන්වා සිටින ලදී.

මෙම මාර්ගය මඩකලපුව දිස්ත්‍රික්කයේ ජනතාව සඳහා ද වැදගත් හෙයින් සංවර්ධනය කර දෙන මෙන් ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා විසින් කාරක සභාවට දන්වා සිටින ලදී.

### 1.16.2. බිබිල අම්පාර මාර්ගයේ සංවර්ධන කටයුතු

මෙම මාර්ගයේ පොල්වත්ත හන්දියේ සිට ඇති කිලෝමීටර් 13 ක ප්‍රමාණය සංවර්ධන කර දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

### 1.16.3. අයිරෝඩ් (iRoad) ව්‍යාපෘතියේ මාර්ගයන්හි පළල අඩි 12 දක්වා වැඩි කිරීම

දැනට කාපට් යොදනුයේ අඩි 09ට හෙයින් වාහන 02ක් මාරුවිය හැකි ලෙස අඩි 12 දක්වා මාර්ගය පළල් කර සංවර්ධනය කිරීමේ හැකියාව පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

අයිරෝඩ් (iRoad) මාර්ග ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කරනුයේ අඩි 9 බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

අම්පාර දඹන කිනවත්ත මාර්ගය අඩි 12 පළලකින් යුක්ත වුවත් අයිරෝඩ් ව්‍යාපෘතිය යටතේ අඩි 9 පළල වන ලෙස සංවර්ධනය කිරීම පිළිබඳව ප්‍රදේශවාසීන්ගෙන් විරෝධයක් එල්ල වූ බවද ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දන්වා සිටින ලදී.

අයිරෝඩ් ව්‍යාපෘතිය යටතේ දැනට තිබෙන මාර්ගයේ පළල අඩි 10 හෝ 12 යුක්ත වුවහොත් එම ප්‍රමාණයම සංවර්ධනය කල යුතු බවත් අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දන්වන ලදී.

## 1.17. ගරු මධුර විතානගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.17.1. නගර අලංකරණය සඳහා අලංකරණ ඒකකයක් ඇති කිරීම

පලාත් පාලන ආයතන වලට නගර අලංකරණ අධිකාරිය සතු ප්‍රදේශවලට මැදිහත් වීමට බලයක් නොමැති බැවින් නගර අලංකරණ අධිකාරියේ ඒකකයක් පළාත් පාලක ආයතනවල පිහිටුවීමේ අවශ්‍යතාවය පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එමෙන්ම රාජගිරිය ගුවන් පාලමේ පහල කොටස අලංකරණයට ප්‍රතිපාදන වෙන්ව ඇතත් නිසි ලෙස අලංකරණය නොවීමේ ගැටළුවක් පවතින බවද ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.17.2. මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගයන්හි කාණු පද්ධතිය නඩත්තු කිරීම වෙනුවෙන් පළාත් පාලන ආයතන සේවකයන් සඳහා දීමනාවක් ලබාදීම

නාගරික ප්‍රදේශවල කාණු පද්ධතිවල සිදුවන අවහිරවීම් මත හා ජනතාවගේ පැමිණිලි අනුව මෙම කාණු පද්ධති පළාත් පාලන ආයතන විසින් දෛනිකව පිරිසිදු කර නඩත්තු කරන හෙයින් එම ආයතන සේවකයන් වෙත දෛනික දීමනාවක් ලබාදීමේ හැකියාව පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

### 1.17.3. ආයතන හා පුද්ගලයන් විසින් මාර්ගයන්ට සිදුකරන හානි වැලැක්වීමට ඒකකයක් ඇති කිරීම

සංවර්ධනය කර අවසන් වූ මාර්ගයන් වෙත වෙනත් රජයේ හා විශේෂයෙන් පෞද්ගලික වෙළඳ දැන්වීම් හා ආයතන හා පුද්ගලයන් විසින් හානි පමුණුවන හෙයින් විමර්ශනය හා පරීක්ෂාවට දැනට නව රැකියා ලබාදීමේ වැඩ පිලිවෙල යටතේ වෙනම ඒකකයක් ඇති කිරීමේ හැකියාව පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

එමෙන්ම කාණු පද්ධතිවලට අපවිත්‍ර ජලය මුදා හැරීම හා අපද්‍රව්‍ය මුදාහැරීම නැවැත්වීමටද මෙම ඒකකය යොදා ගත හැකි බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට තවදුරටත් දැනුම් දෙන ලදී.

#### 1.17.4. ආයතන හා මාර්ග සංවර්ධන අධිකාරිය සතු රක්ෂිත හා ඉඩම් වෙනත් පාර්ශවයන් විසින් පරිහරණය කිරීම

අධිකාරිය සතු රක්ෂිත හා ඉඩම් වෙනත් ආයතන හා පුද්ගලයන් විසින් පවරාගෙන හෝ ඇතුල් වී වෙනත් කටයුතු සිදු කිරීම නැවැත්වීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සැකසිය යුතු බවට ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.

කොළඹ දිස්ත්‍රික්කයේ රාජගිරිය බුත්ගමුව මාර්ගයේ එච් එස් බී සි බැංකු (HSBC) ගොඩනැගිල්ල අසළ පාරේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් මාර්ග සංවර්ධන අධිකාරිය සතු රක්ෂිතයට ඇතුල්වී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් දන්වා සිටින ලදී.

### 1.18. ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

#### 1.18.1. බදුල්ල දිස්ත්‍රික්කයේ අයිරෝඩ් (iRoad) ව්‍යාපෘති

බදුල්ල දිස්ත්‍රික්කයේ ආරම්භ කර ඇති අයිරෝඩ් ව්‍යාපෘති යටතේ මාර්ග සංවර්ධන කටයුතු අතරමග ඇණහිට ඇති බැවින් සංවර්ධන කටයුතු කඩිනමින් නිම කිරීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් යොදන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

#### 1.18.2. මාර්ග සංවර්ධන කටයුතු වල නියැලී සිටින කොන්ත්‍රාත්කරුවන්ගේ ක්‍රියාකලාපය

බදුල්ල දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධන කටයුතුවල යෙදී සිටින කොන්ත්‍රාත්කරුවන්ගේ අදක්ෂතාවය හා නොසැලකිලිමත්භාවය හේතුවෙන් මාර්ග සංවර්ධනය මන්දගාමීව සිදුවන බවත් සමහර ස්ථානවල අඩපණව ඇති බවත් ගරු මන්ත්‍රීතුමා කාරක සභාවට දන්වා සිටින ලදී.

#### 1.18.3. බදුල්ල දිස්ත්‍රික්කයේ බල්ලකැටුව දොඩංගොඩ මාර්ගය

බල්ලකැටුව දොඩංගොඩ මාර්ගය බුත්තල නගරය දක්වා සංවර්ධනය කරදෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

#### 1.18.4. පාලම් ඉදි කිරීමේ ව්‍යාපෘතිය

පාලම් ඉදිකිරීමේ හා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති සම්බන්ධව තීරණ ක්‍රියාත්මකවීම පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් විමසීමක් කරන ලදී. මෙම ව්‍යාපෘතීන් සඳහා පළාත් සභාවේ දායකත්වය පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

#### 1.18.5. මාර්ග සංවර්ධන ඇස්තමේන්තු සකස් කිරීමේදී කාණු පද්ධති එක්කර ඇස්තමේන්තු සකස් කිරීම

බදුල්ල දිස්ත්‍රික්කයේ බොහෝමයක් කඳු සහිත මාර්ග හෙයින් සෝදාපාලුව නිසා මාර්ගයන්ට සිදුවන හානිය වැළැක්වීම සඳහා ක්‍රමවත්ව ජලය බැසයාම සිදුවිය යුතු හෙයින් කාණු පද්ධති ඇති කිරීමට යන මාර්ග සංවර්ධන ඇස්තමේන්තුවලට ඇතුළත් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

### 1.18.6. සංවර්ධන කරන ලද මාර්ගයන්ට වෙනත් ආයතනවලින් සිදුකරන හානි

ජල සම්පාදන මණ්ඩලය විසින් ජල නළ එළීමට සහ වෙනත් පෞද්ගලික සන්නිවේදන ආයතන විසින් සංවර්ධනය කරන ලද මාර්ගයන්ට හානි සිදු කරන හෙයින් එම ආයතනයන් සමග ඒකාබද්ධ වැඩපිළිවෙලක් ඇති කර ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් විමසීමක් කරන ලදී.

## 1.19. ගරු ෆයිසාල් කාසිම් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.19.1. මඩකලපුව දිස්ත්‍රික්යේ කල්මුනේ මධ්‍යම කඳවුර මාර්ගය (Central Camp Road)

කුඩා පාලමක් සහිත කල්මුනේ මධ්‍යම කඳවුර මාර්ගය අබලන්ව ඇති බවත් ගංවතුර අවස්ථාවලදී යටවන හෙයින් ප්‍රතිසංස්කරණය කර දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාව වෙතින් ඉල්ලීමක් කරන ලදී.

### 1.19.2. කල්මුනේ, සමන්තුරේ පාලම ප්‍රතිසංකරණය කිරීම

සමන්තුරේ නගරයේ ප්‍රතිසංස්කරණය කිරීමට තිබූ පාලම් දෙකෙන් එක් පාලමක වැඩ නිමකර ඇති බවත් අනෙක් පාලම වාහන දෙකකට මාරුවිය හැකි ලෙස මාර්ගයේ පළල වැඩි කර ප්‍රතිසංස්කරණය කර දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

## 1.20. ගරු ගාමිණී වලේබොඩ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.20.1. රත්නපුර දිස්ත්‍රික්කයේ අයිරෝඩ් (iRoad) ව්‍යාපෘති යටතේ සංවර්ධනය වන මාර්ග

රත්නපුර දිස්ත්‍රික්කයේ අයිරෝඩ් (iRoad) ව්‍යාපෘතිය යටතේ ආරම්භ කරන ලද මාර්ග වල වැඩ අතරමග නතර කර දමා ඇති හෙයින් වැඩ කටයුතු අවසන් කිරීමට ක්‍රියාමාර්ගයක් ගන්නා මෙන් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

කිලෝමීටර් ලක්ෂයේ වැඩ සටහන යටතේ, වැඩ නිමකර නොමැති මාර්ගයන්හි වැඩ නිම කිරීමට කටයුතු කරන බව අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.20.2. බලංගොඩ - කල්තොට මාර්ගය

මෙම මාර්ගය සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන සංවර්ධන කටයුතු කර දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

කිලෝමීටර් ලක්ෂයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කඩිනමින් සංවර්ධනය කරන බව අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.21. ගරු රොෂාන් රණසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

#### 1.21.1. පොලොන්නරුව, අරලගංවිල කන්දේගම මාර්ගය

කොන්ත්‍රාත්කරුගේ වැඩ නිම කිරීමේ අසාර්ථකභාවය මත නීතිමය ක්‍රියාමාර්ග ගත් බවත් මෙම කොන්ත්‍රාත්කරු සමඟ එකඟතාවයකට පැමිණ කඩිනමින් මාර්ගයේ වැඩ නිම කිරීමට කටයුතු කරන බව අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දන්වා සිටින ලදී.

#### 1.21.2. පොලොන්නරුව- හබරණ මාර්ගය

මෙම මාර්ගයේ සංවර්ධන වැඩ නිම කිරීමට ඉදිරි පියවර ගන්නා බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.** කාරක සභාව ප.ව.3.30 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

**සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**දෙවැනි රැස්වීම - 2021 පෙබරවාරි 9**

**පැමිණ සිටි කාරක සභික මන්ත්‍රීන්**

ගරු ප්‍රසන්න රණතුංග මහතා(සභාපති)
ගරු ඩී. වී. චානක මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු එම්. උදයකුමාර් මහතා
ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා
ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
ගරු ඩයනා ගමගේ මහත්මිය

**පැමිණ සිටි කාරක සභික නොවන මන්ත්‍රීන්**

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා
ගරු චන්දිම වීරක්කොඩි මහතා
ගරු ෆයිසාල් කාසිම් මහතා
ගරු මනූෂ නානායක්කාර මහතා
ගරු ජයන්ත කැටගොඩ මහතා
ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු වරුණ ලියනගේ මහතා
ගරු අමරකීර්ති අතුකෝරළ මහතා
ගරු සම්පත් අතුකෝරල මහතා
ගරු උදයන කිරිඳිගොඩ මහතා
ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා
ගරු අජිත් රාජපක්ෂ මහතා
ගරු ගුණතිලක රාජපක්ෂ මහතා
ගරු වීරසුමන වීරසිංහ මහතා
ගරු මර්ජාන් ෆලීල් මහතා

## 1. වාර්ෂික වාර්තා සලකා බැලීම

සලකා බැලීමෙන් අනතුරුව, සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව, පාර්ලිමේන්තුව විසින් කාරක සභාව වෙත යොමු කරන ලද පහත සඳහන් වාර්ෂික වාර්තාවලට එකඟ වූ අතර ඒ පිළිබඳව වාර්තාව, කාරක සභාවේ සභාපති ගරු ප්‍රසන්න රණතුංග මහතා විසින් පාර්ලිමේන්තුවට පිළිගැන්විය යුතු යයි ද තීරණය කළාය.

- **1.1.** 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්
- **1.2.** 2018 වර්ෂය සඳහා සංචාරක සංවර්ධන අරමුදලේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්
- **1.3.** 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ වාර්ෂික වාර්තාව

## 2. කාර්ය සටහන්වලින් පැන නඟින කරුණු

### 2.1. ගාල්ල සංචාරක පුරවරයේ සංචාරක ව්‍යාපාරයට සහායවන ජනතාව මුහුණ දෙන පානීය ජල ගැටලුව - ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය

මේ පිළිබඳව ජල සම්පාදන අමාත්‍යාංශයට දන්වා පිළිතුරක් ලබාගෙන මීළඟ කාරක සභාවට ඉදිරිපත් කරන  ලෙස ගරු සභාපතිතුමා විසින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙහි වැඩබලන අධ්‍යක්ෂ ජනරාල්වරියට උපදෙස් ලබා දෙන ලදී.

### 2.2. මඩකලපු දිස්ත්‍රික්කය සඳහා උපායමාර්ගික සංචාරක සංවර්ධන සැළැස්මක් නොමැතිකම හා ඇති කිරීමේ අවශ්‍යතාව - ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

මුළු ව්‍යාපෘතියම ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් ප්‍රතිපාදනයන්හි ගැටළුවක් ඇතත් ව්‍යාපෘතියේ තෝරාගත් කොටස් ක්‍රියාත්මක කිරීම අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ සිදුවන බව අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 3. වෙනත් කටයුතු

### 3.1. ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

#### 3.1.1. දේද්දුව ප්‍රදේශය සඳහා යෝජනා කර ඇති ජපන් ව්‍යාපෘතිය

මෙම ප්‍රදේශය සඳහා යෝජනා කර ඇති ජපාන රජයේ අනුග්‍රහය මත සිදුවීමට නියමිත ජල යෝජනා ව්‍යාපෘතියේ ප්‍රගතිය ගරු මන්ත්‍රීතුමිය විසින් විමසන ලදී. අක්කර 1700 ක්වූ වර්ග ප්‍රමාණයක යෝජනාවට වඩා අඩු වර්ග ප්‍රමාණයකට අනුමැතිය ලැබී ඇති බැවින් සම්පූර්ණ ප්‍රමාණයටම අනුමැතිය ලැබුවිට එය ක්‍රියාත්මක කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

#### 3.1.2. බෙන්තොට පාලම අසල කුණු කසල දමන ලද ප්‍රදේශය

බෙන්තොට පාලම් දෙක මැද තිබෙන විශාල භූමි ප්‍රදේශයේ දමා තිබෙන කුණු කසල ඉවත් කර එම ප්‍රදේශය නව නගර සැලැස්මක් අනුව නගර අලංකරණය කිරීමට තීරණය

කර තිබෙන බැවින් ගරු මන්ත්‍රීතුමිය විසින් මේ සඳහා අවශ්‍ය සහය ලබා දෙන මෙන් ඉල්ලා සිටින ලදී.

### 3.1.3. බෙන්තොට සාදා නිම කළ සංචාරක සාප්පු සංකීර්ණය

බෙන්තොට ප්‍රදේශයේ ඇති සාප්පු සංකීර්ණයේ කඩසාප්පු ලබා දීමේදී ප්‍රදේශයේ පදිංචිකරුවන්ට ප්‍රමුඛත්වය ලබා දෙන මෙන් ගරු මන්ත්‍රීතුමිය විසින් ඉල්ලීමක් කරන ලදී.

විසඳුමක් ලබාගෙන මීළඟ සභාවාරයට දැනුම් දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශයේ ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලයට උපදෙස් ලබා දෙන ලදී.

## 3.2. ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 3.2.1. හික්කඩුව සංචාරක පුරවරයක් ලෙස නම් කිරීම

හික්කඩුව සංචාරක පුරවරයක් ලෙස නම් කිරීම පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය හා සංචාරක අමාත්‍යාංශය සමඟ සාකච්ඡාවක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

සංචාරක සංවර්ධන අධිකාරිය විසින් මේ වනවිට සංචාරක පුරවරයන් ලෙස නම් කිරීමට ස්ථාන 5 ක් හඳුනාගෙන ඇති බවත්, එම ස්ථාන 5 අතරට හික්කඩුව ප්‍රදේශය ඇතුළත් කළ හැකි බවත් අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

### 3.2.2. සංචාරක සංවර්ධන කටයුතු පිළිබඳව අදාල ප්‍රදේශයේ දේශපාලන අධිකාරිය දැනුවත් කරන ලෙස කරන ලද ඉල්ලීම

සංචාරක සංවර්ධන කටයුතු පිළිබඳ එම ප්‍රදේශයේ දේශපාලන අධිකාරිය දැනුවත් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී. ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මන්ත්‍රීතුමා ද එම ඉල්ලීම කරන ලදී.

අදාළ දැනුම්දීම කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

## 3.3. ගරු චන්දිම වීරක්කොඩි මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 3.3.1. සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිය සහ එහි පවතින නීතිරීති

ගාල්ල ප්‍රදේශයේ බොහෝ සංචාරක නවාතැන් ලෙස පවත්වාගෙන යන්නේ නිවාස ලෙස තනන ලද ස්ථාන බැවින් එම ස්ථාන සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කිරීමට නොහැකි වී තිබෙන්නේ අධිකාරියේ පවතින දැඩි නීතිරීති නිසා බව ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල් විසින් මෙම කරුණ සම්බන්ධව පැහැදිලි කිරීමක් කරන ලදී.

### 3.3.2. සංචාරක හෝටල්වල විදුලි බිල

සංචාරක හෝටල්වලට අධික පිරිවැයක් දැරීමට සිදුවන විදුලි බිල අඩු කිරීමට ඔවුන්ට සූර්ය බලශක්තිය හඳුන්වා දී එය ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

සූර්ය බලශක්තිය පාවිච්චි කරන අය සඳහා සම්පූර්ණ බැංකු ණයක් ලබාදීමට අවශ්‍ය ක්‍රමවේදයක් සකස් කරන ලෙස කැබිනට් රැස්වීමකදී මුදල් අමාත්‍යාංශයට දැන්වූ බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දන්වන ලද අතර එම අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව පිළිබඳ සංචාරක කර්මාන්තයේ නිරත පුද්ගලයන් දැනුවත් කරන ලෙස අමාත්‍යාංශයේ ලේකම්වරයාට දැනුම් දෙන ලදී.

### 3.3.3. රුමස්සල කන්දේ සිට උණවටුන මුහුදු තීරයට පැමිණීම සඳහා ඇති මාර්ගය පිළිසකර කිරීම

මූල්‍යමය පහසුකම් ලබාදුන් රුමස්සල කන්දේ සිට උණවටුන මුහුදු තීරයට යාමට ඇති මාර්ගය මෙතෙක් පිළිසකර කටයුතු සිදු වී නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

දකුණු පළාත් සභාවේ ප්‍රධාන ලේකම් විසින් මෙම පාර මාර්ග ලක්ෂයේ වැඩසටහනට ඇතුළත් කර සාදා දෙන බව ලිඛිතව දන්වා ඇති බව අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 3.4. ගරු උදයන කිරිදිගොඩ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 3.4.1. මධ්‍යම පළාත තුළ සංචාරක කර්මාන්තය ආශ්‍රිත ගැටළු

හේවාහැට ආසනයේ බෙල්වුඩ් ප්‍රදේශයේ මුතුකෙලියාව වැව ආශ්‍රිත ප්‍රදේශය සහ ලංකාවේ පළමු තේ පැළය සිටවූ ලූල්කඳුර වතුයාය ආශ්‍රිත ප්‍රදේශය සහ මීමුරේ ප්‍රදේශයේ සංචාරක කර්මාන්තය සඳහා ඇති වැදගත්කම උපායමාර්ගිකව හඳුනාගෙන එම ප්‍රදේශ සංවර්ධනය කිරීමට කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

ඉහත සඳහන් ප්‍රදේශ ඇතුළත් කර මහනුවර දිස්ත්‍රික්කය සඳහා සංචාරක සැලැස්මක් සාදා එය සංචාරක අමාත්‍යාංශයට ලැබීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 3.4.2. ශ්‍රී ලංකාව පිළිබඳ සංචාරකයන් දැනුවත් වන වෙබ් ද්වාර (Web Portal) හා වෙබ් අඩවි යාවත්කාලීන කිරීම

වෙබ් ද්වාර (Web Portal) සහ (බුකිං ඩොට් කොම්) booking.com වැනි වෙබ් අඩවිවල සඳහන් වී ඇති සංචාරක නවාතැන් ස්ථානයන්හි වෙබ් අඩවි සහ වෙබ් ද්වාර (Web Portal) යාවත්කාලීන කර නොමැති බවත් ඒවා සම්බන්ධව නියාමනයන් කරන ලෙසත් ඉල්ලා සිටින ලදී.

## 3.5. ගරු ජයන්ත කැටගොඩ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 3.5.1. වාද්දුව ප්‍රදේශයේ සංචාරක හෝටල් සඳහා මත්පැන් බලපත්‍ර ලබා ගැනීමේ ගැටළු

වාද්දුව ප්‍රදේශයේ සංචාරක හෝටල්වලට මත්පැන් බලපත්‍ර ලබාදීමේදී අදාළ අංශ එක් එක් පාර්ශවයන්ට විවිධ ආකාරයෙන් සැලකීම නිසා එම සංචාරක හෝටල් බලවත් අසීරුතාවයකට මුහුණ දී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 3.6. ගරු ගුණතිලක රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 3.6.1. උඩරට නැටුම් පුහුණු කරන කලායතනයට අනුග්‍රහය ලබාදීම

සංචාරකයන්ගේ ද ආකර්ශනය දිනාගෙන ඇති මහනුවර හාරිස්පත්තුව ප්‍රදේශයේ පිහිටි උඩරට නැටුම් කලායතනයට රජයේ අනුග්‍රහය ලබාදෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.6.2. දඹුල්ල රජමහා විහාරය සහ හාරිස්පත්තුව යා කෙරෙන උමඟ

මෙම ස්ථානය  සංවර්ධනය කර දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

දිස්ත්‍රික් සංවර්ධන කමිටුව හරහා ද ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

දිස්ත්‍රික්ක 25 සඳහාම සංචාරක සංවර්ධන සැලසුම් නිර්මාණය කර අදාළ දිස්ත්‍රික් සංවර්ධන කමිටු හරහා අනුමැතිය ලබාගැනීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් නිලධාරීන්ට උපදෙස් ලබාදෙන ලදී. සැලසුම් සඳහා ප්‍රදේශයේ අදාළ දේශපාලන නියෝජිතයන්ට අදහස් දැක්වීමට අවස්ථාවක් ලබාදෙන බව ද දැනුම් දෙන ලදී.

## 3.7. ගරු වීරසුමන වීරසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 3.7.1. දෙනියාය සංචාරක කලාපය

දෙනියාය සංචාරක කලාපයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය සැලැස්මක් සාදා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සංවර්ධන සැලැස්මක් ඉදිරිපත් කළ බව අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරිය විසින් දැනුම් දෙන ලදී.

### 3.7.2. මිරිස්ස සංචාරක කලාපය

වනජීවී දෙපාර්තමේන්තුව මඟින් අසාධාරණ මුදල් අයකිරීම් ගැන සලකා බලන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

මිරිස්ස සඳහා සැලැස්මක් සකස් කරන ලෙස වනජීවී දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කර ඇති බව අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරිය විසින් දැනුම් දෙන ලදී.

සියළුම කරුණු දිස්ත්‍රික් කමිටුවේ සභාපතිට සහ දිස්ත්‍රික් ලේකම්ට දැනුම් දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබාදෙන ලදී.

## 3.8. ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 3.8.1. ඇල්ල ප්‍රදේශයේ කිසිදු සැලැස්මක් නැතිව සිදුවන සංවර්ධනයන්

ඇල්ල ප්‍රදේශයේ කිසිදු පාලනයකින් හා කිසිදු සැලැස්මකින් තොරව සිදු කරන සංචාරක සංවර්ධනයන් පිළිබඳව කාරක සභාවේ අවධානයට යොමු කළ අතර මේ සඳහා යම් මැදිහත්වීමක් හෝ මාර්ගෝපදේශයක් ලබාදෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

## 3.9. ගරු සම්පත් අතුකෝරල මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 3.9.1. ලංකාගම හා නෙළුව ආශ්‍රිත ප්‍රදේශයන්හි සංචාරක කර්මාන්තය දියුණු කිරීම සඳහා ඇති ගැටළු

මුහුදු කලාපයට පැමිණෙන සංචාරකයින් වැඩි දින ගණනාවක් ගාලු දිස්ත්‍රික්කය තුළ රඳවා ගැනීම සඳහා ලංකාගම හා නෙළුව ආශ්‍රිත ප්‍රදේශයන්හි සංචාරක ආකර්ෂණය ඇති ස්ථාන සංවර්ධනය කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසත් ගිංගඟ, ලංකාගම සහ සිංහරාජය වෙනම සංචාරක කලාපයක් ලෙස නම් කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ සංචාරක විෂය පිළිබඳ දිස්ත්‍රික් අනු කමිටුව සහ පළාත් සංචාරක අධිකාරියත් සමඟ සම්බන්ධ වී ගාලු ප්‍රදේශය සඳහා වෙනම සංචාරක සැලැස්මක් සාදන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 3.10. ගරු අමරකීර්ති අතුකෝරළ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 3.10.1. පොලොන්නරුව සංචාරක හෝටල් පාසල

නාගරික සංවර්ධන අධිකාරියට අයත් " පිබිදෙමු පොළොන්නරුව" වැඩසටහන යටතේ ඉදිකරන ලද ගොඩනැගිල්ල සංචාරක හෝටල් පාසැලක් සඳහා යොදාගත හැකි බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දන්වන ලදී.

මෙම ගොඩනැගිල්ල සංචාරක අමාත්‍යාංශයට ලබා දෙන ලෙස නාගරික සංවර්ධන අධිකාරියෙන් ලිඛිත ඉල්ලීමක් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශයේ නිලධාරීන්ට දැනුම් දෙන ලදී.

### 3.10.2. අංගම්මැඩිල්ල පිවිසුම් මාර්ගය

වස්ගමුව වනෝද්‍යානයට ඇතුළු වන පිවිසුම් මාර්ගයක් වන අංගම්මැඩිල්ල පිවිසුම් මාර්ගය මේ වනතෙක් වනජීවී දෙපාර්තමේන්තුවෙන් නිදහස් කර ගැනීමට නොහැකි වී

ඇති බැවින් මේ සඳහා මැදිහත්වීමක් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

මේ සම්බන්ධයෙන් සියළු විස්තර ලිඛිතව ලබා දෙන්නේ නම් වනජීවී දෙපාර්තමේන්තුවට දන්වා මැදිහත් වීමක් කළ හැකි බව අමාත්‍යාංශයේ ලේකම් විසින් දන්වන ලදී.

### 3.10.3. ගිරිතලේ වැව රවුම සඳහා ඇවිදීමේ මංතීරුවක් ලබා ගැනීම

ගිරිතලේ වැව රවුමේ ඇවිදීමේ මංතීරුවක් සාදා දෙන ලෙස ඉල්ලීමක් ගරු මන්ත්‍රීතුමා විසින් සිදු කරන ලදී.

මොරගහකන්ද ව්‍යාපෘතිය සමඟ අක්කර 1500 ක භූමි ප්‍රමාණයක් මහවැලි අධිකාරිය විසින් සංචාරක අමාත්‍යාංශයට ලබා දී ඇති බවත් එම භූමි ප්‍රදේශය සංචාරක කලාපයක් ලෙස සංවර්ධනය කිරීමට කටයුතු කරගෙන යන බව අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී

### 3.10.4. කන්දෙගම ප්‍රදේශයේ ඇති දානිගල (Alien Mountain) සංචාරක පුරවරයක් ලෙස සංවර්ධනය කිරීම සම්බන්ධව

මෙම කඳු පන්තිය ආශ්‍රිත ප්‍රදේශය සංචාරක ආකර්ශනයක් ඇති කලාපයක් ලෙස සංවර්ධනය කිරීමට අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටින ලදී.

### 3.10.5. පොළොන්නරුව සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා නිර්මාණය කර ඇති ඉදිරිපත් කිරීම

තමන්කඩුව ප්‍රාදේශීය සභාව විසින් පොළොන්නරුව ප්‍රදේශයේ සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා ඉදිරිපත් කිරීමක් (Presentation) සාදා ඇති බවත්, එය යූ ටියුබ් (youtube) වැනි වෙබ් අඩවි මගින් ප්‍රසිද්ධ කිරීමට සහයක් ලබා දෙන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

පළාත් සංචාරක අධිකාරියේ අධ්‍යක්ෂ හරහා සංචාරක අමාත්‍යාංශයට මෙය යොමු කරන ලෙස අමාත්‍යාංශයේ ලේකම් විසින් දන්වන ලදී.

### 3.10.6. හබරණ ප්‍රදේශයේ ඇති සුවිසාල ගොඩනැගිල්ල

පළාත් සභාවෙන් සාදන හබරණ ප්‍රදේශයේ ඇති අති සුඛෝපභෝගී ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශනය ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා ඉල්ලා සිටින ලදී.

පෞද්ගලික අංශයේ ආයෝජකයකු හට ලබාදී මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් කර ගැනීමට දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේදී තීරණයක් ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

## 3.11. ගරු වරුණ ලියනගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 3.11.1. උඩවලව සංචාරකයින් ප්‍රවාහනය කරන ජීප් රථ රියදුරන් මුහුණපාන ගැටළු

උඩවලව ප්‍රදේශයේ සංචාරකයින් ප්‍රවාහනය කරන ජීප් රථ නවීකරණය කිරීම හේතුවෙන් පාරේ ගමන් කරන විට එම ජීප් රථ සඳහා පොලීසිය විසින් දඩ ගැසීම සිදුකරන බවත්, එබැවින් උඩවලව, ඇඹිලිපිටිය හා තණමල්විල පොලිස් ස්ථාන වලට දන්වා මේ ගැටලුව විසඳා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

මෙම ගැටළුව සම්බන්ධයෙන් නියෝජ්‍ය පොලිස්පති (සංචාරක) දැනුවත් කර විසඳුමක් ලබා දීමට කටයුතු කරන බව අමාත්‍යාංශයේ ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී.

### 3.11.2. නුවරඑළිය සිට හපුතලේට පැමිණෙන මාර්ගය භාවිතා කිරීමේදී අය කරනු ලබන දඩ මුදල

නුවරඑළිය සිට හපුතලේට සහ ඔහිය හරහා ලෝකාන්තයට පැමිණෙන මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ගය භාවිතා කිරීමේදී වනජීවී දෙපාර්තමේන්තුවෙන් මුදල් අය කිරීමක් සිදුකරන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම ගැටලුව දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේදී සාකච්ඡා කර විසඳා ගතයුතු බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

### 3.11.3. දහයියාගල රක්ෂිතය එළි කිරීම නිසා ඇති වන ගැටලුව සම්බන්ධව

උඩවලව දහයියාගල රක්ෂිතය හරහා ලාහුගල බෝගහපට්ටිය ප්‍රදේශයට පැමිණෙන අලි ඇතුන් මේ වනවිට දහයියාගල රක්ෂිතය එළි පෙහෙලි කරමින් පැවතීම නිසා දැඩි අපහසුතාවයකට පත්ව ඇති බවත්, රක්ෂිතය එළි පෙහෙළි කිරීම වනජීවී දෙපාර්තමේන්තුව මැදිහත්වී නවතා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.11.4. ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින් සඳහා කරනු ලබන පී.සී.ආර්. පරීක්ෂණ

මෙරටට පැමිණෙන විට සංචාරකයින් හට පී.සී.ආර්. පරීක්ෂණ තුනකට මුහුණදීමට සිදුවී ඇති බැවින් එම පී.සී.ආර්. පරීක්ෂණ ප්‍රමාණය අඩු කර හෝ සංචාරකයින් නවාතැන් ගන්නා හෝටලයේ නිරෝධායනය විය යුතු දින ගණන අඩුකර දෙන මෙන් සංචාරකයින් ගරු මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටි බව ඔහු ගරු සභාපතිතුමාගේ අවධානයට යොමු කරන ලදී.

සංචාරකයින්ගෙන් මහජනතාවටත් මහජනතාවගෙන් සංචාරකයින්ටත් මෙම වෛරසය බෝ වීම වළක්වා ගැනීමට සෞඛ්‍ය අමාත්‍යාංශය ලබා දී ඇති සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුව ක්‍රියා කළයුතු නමුත් මේ වනවිට ඇතැම් රීතීන් ලිහිල් කර ඇති බව ගරු අමාත්‍යතුමා විසින් දන්වා සිටින ලදී.

## 3.12. ගරු ෆයිසාල් කාසීම් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 3.12.1. ජයභූමි ප්‍රදානයන් ලෙස ලැබුණු ඉඩම්

ජයභූමි ප්‍රදානයන් ලෙස ලැබුණු ඉඩම්වල පිහිටි ආරුගම්බේ ප්‍රදේශයේ සංචාරක නවාතැන්පළවල් සංචාරක අධිකාරියේ ලියාපදිංචි වීමට නොහැකි වී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් දන්වන ලදී.

මේ වනවිට ලියාපදිංචි කිරීමේදී අනුගමනය කරන නිර්ණායක ලිහිල් කර ඇති බවත්, ලියාපදිංචි කිරීමේදී ඉඩමේ අයිතිය සැලකිල්ලට නොගන්නා බව සංචාරක සංවර්ධන අධිකාරියේ වැඩ බලන අධ්‍යක්ෂවරිය විසින් දන්වා සිටින ලදී.

### 3.12.2. මත්පැන් බලපත්‍ර

සංචාරක හෝටල් සඳහා අවම වශයෙන් දිනකට මත්පැන් බෝතල් 50ක් වත් විකිණීමට හැකිවන ආකාරයේ බලපත්‍රයක් ලබා දීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

මෙම යෝජනාව මේ වනවිටත් සුරාබදු දෙපාර්තමේන්තුවට ලබා දී ඇති බව වැඩබලන අධ්‍යක්ෂ ජනරාල්වරිය දැනුම් දෙන ලදී.

### 3.12.3. ආරුගම්බේ ප්‍රදේශයේ බෝට්ටු නවතා තැබීම පිළිබඳව

ආරුගම්බේ සංචාරක කලාපයේ බෝට්ටු ගාල් කිරීම සඳහා වෙනම ස්ථානයක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ආරුගම්බේ සංචාරක කලාපය සඳහා සංචාරක සැලැස්මක් සකස් කර ඇති බැවින් එම කරුණ පිළිබඳව පැවැත්වෙන සාකච්ඡාවට සහභාගි වන ලෙස ගරු සභාපතිතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.12.4. ආරුගම්බේ ප්‍රදේශයේ සිදුවන මුහුදු ඛාදනය පිළිබඳව

ආරුගම්බේ ප්‍රදේශයේ සිදුවන මුහුදු ඛාදනය නිසා එම ප්‍රදේශයේ මුහුදු තීරයේ සංචාරක කර්මාන්තයේ නියැලෙන පුද්ගලයින් දැඩි අසීරුතාවයකට පත්ව ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් දන්වා සිටින ලදී.

මෙම ගැටලුව පිළිබඳ මුහුදු සංරක්ෂණ අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් හට දන්වා ක්‍රියාමාර්ගයක් ගන්නා බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දන්වා සිටින ලදී.

## 4. කාරක සභාව පස්වරු 12.15 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

**අධිකරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**විශේෂ රැස්වීම - 2021 පෙබරවාරි 10**

**පැමිණ සිටි සාමාජික මන්ත්‍රීන්**

ගරු එම්. යූ. එම්. අලි සබ්රි මහතා (සභාපති)
ගරු ලොහාන් රත්වත්තේ මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා
ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා
ගරු සාගර කාරියවසම් මහතා

**පැමිණ සිටි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු ලසන්ත අලගියවන්න මහතා
ගරු ජගත් පුෂ්පකුමාර මහතා
ගරු චන්දිම වීරක්කොඩි මහතා
ගරු රෝහණ දිසානායක මහතා
ගරු ශාන්ත බණ්ඩාර මහතා
ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු උදයන කිරිදිගොඩ මහතා
ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා
ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා
ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා
ගරු මධුර විතානගේ මහතා
ගරු වීරසුමන වීරසිංහ මහතා
ගරු තවරාජා කලෙයි අරසන් මහතා
ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතා
ගරු මර්ජාන් ෆලීල් මහතා

**1.** ගරු සභාපතිතුමා විසින් විශේෂ කාරක සභා රැස්වීමට පැමිණ සිටි කාරක සභික මන්ත්‍රීන්, සියලු මන්ත්‍රීවරුන්, මහාචාර්ය දියනාත් සමරසිංහ මහතා, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ අපරාධ විද්‍යාව සහ අපරාධ යුක්තිය පිළිබඳ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය නෙරංජි විජේවර්ධන මහත්මිය, කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එම්. ඒ. එම්. හකීම් මහතා සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ තාක්ෂණික විශේෂඥ ශෂිනි කුලනායක මහත්මිය සහ අමාත්‍යාංශයේ සහ සෙසු ආයතනවල නිළධාරීන් පිළිගැනීමට කටයුතු කළ අතර, කාරක සභාවේ අරමුණ සහ කාර්යභාරය ද කෙටියෙන් පැහැදිලි කරන ලදී.

**1.1. පාර්ලිමේන්තුවේ සහකාර මහලේකම් ටිකිරි ජයතිලක මහතා**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සිව්වැනි වගන්තිය මගින් ජනතාවගේ ව්‍යවස්ථාදායක සහ යම් ආකාරයක අධිකරණ බලතල පාර්ලිමේන්තුවට පවරා දී ඇති බව සහකාර මහලේකම් විසින් සඳහන් කරන ලදී. අධිකරණ අමාත්‍යතුමා විධායකය නියෝජනය කරන බව ඔහු වැඩිදුරටත් සඳහන් කරන ලදී.

වේගයෙන් වර්ධනය වන මහජන අවශ්‍යතා හේතුවෙන් “දඬුවම් නියම කිරීමේ” ක්‍රියාවලිය කෙරෙහි මෙම කමිටුවේ අවධානය දැනටමත් යොමු වී ඇති බව ජයතිලක මහතා විසින් ප්‍රකාශ කරන ලදී. දඬුවම් නියම කිරීමේ අරමුණු පහෙන් එකක් වන පුනරුත්ථාපනය කිරීම කෙරෙහි අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියේ අනෙකුත් අංශ මෙන් අවධානයක් යොමු වී නොමැති බවද පුනරුත්ථාපනය කිරීමේදී සාම්ප්‍රදායික දඬුවම් ක්‍රම අසාර්ථක බව ඔප්පු වී ඇති බවද තවදුරටත් සඳහන් කරන ලදී.

සාම්ප්‍රදායික දඬුවම් ක්‍රමවලට සාපේක්ෂව සුළු වැරදි සම්බන්ධයෙන් ප්‍රජා විශෝධන නියෝග නිකුත් කිරීම වඩාත් ඵලදායී වනු ඇතැයිද සඳහන් කරන ලදී. අවසාන වශයෙන් විශේෂ කමිටුවක් පිහිටුවීමට යෝජනා කරන ලදී.

## 1.2. අධිකරණ අමාත්‍ය ගරු එම්. යූ. එම්. අලි සබ්රි මහතා

අපරාධ යුක්තිය පසිඳලීම සඳහා පූර්ණකාලීන අමාත්‍ය අනු කමිටු තුනක් දැනටමත් ක්‍රියාත්මක වන බවත් අපරාධ නීති ප්‍රතිසංස්කරණ කිරීම එක් කමිටුවක් බවත් ප්‍රකාශ කරන ලදී.

බන්ධනාගාරවල පවතින තදබදය පිළිබඳව අවධානය යොමු කරන ලදී. බහුතරයක් රිමාන්ඩ් සිරකරුවන් බවද සඳහන් කරන ලදී. රිමාන්ඩ් භාරයේ සිටින සිරකරුවන්ගෙන් 52% ක් මත්ද්‍රව්‍ය සම්බන්ධ අපරාධ සම්බන්ධයෙන් චෝදනා ලබා ඇති අතර ඔවුන්ගෙන් 90% ක් මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් හෝ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් බව ඔහු වැඩිදුරටත් සඳහන් කරන ලදී.

පවතින සංකීර්ණ ගැටළු සඳහා ප්‍රජා පාදක විශෝධන ක්‍රමය මගින් පුනරුත්ථාපනය කිරීම පිළිබඳව අවධානය යොමු කරමින් සිටින බවද ප්‍රකාශ කරන ලදී.

අදාළ ආයතනවල ප්‍රමාදයන් සහ නොසැලකිලිමත්කමට අමතරව මහාධිකරණයේ මත්ද්‍රව්‍ය සම්බන්ධ නඩු ගොඩගැසීම හේතුවෙන් සාමාන්‍ය ජනතාව වෙත යුක්තිය පසිඳලීම මන්දගාමී වී ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

තීරණ ගැනීමේ ක්‍රියාවලියට වැඩි පිරිසක් සම්බන්ධ කර ගැනීම සඳහා පාර්ලිමේන්තු උපදේශක කාරක සභාව ඉතා වැදගත් වන බව ගරු අමාත්‍යතුමා විසින් සඳහන් කරන ලදී.

අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියේ පරිවර්තනයේ ආරම්භක අදියර ලෙස දඬුවම් නියම කිරීමේ ක්‍රියාවලිය ප්‍රතිසංස්කරණය කරන බව ඔහු විසින් පවසන ලදී. එබැවින් කාරක සභාවේ මූලික පියවර ලෙස ප්‍රජා පාදක විශෝධන ක්‍රමය ශක්තිමත් කිරීම හා ප්‍රචලිත කිරීම පිළිබඳව කමිටුව සොයා බලන බවත් මෙය බන්ධනාගාරගත කිරීමට විකල්පයක් ලෙස හා පුනරුත්ථාපනයේ කොටසක් ලෙස භාවිතයට ගැනෙන බවත් ගරු අමාත්‍යවරයා විසින් ප්‍රකාශ කරන ලදී.

## 1.3. රාජ්‍ය අමාත්‍ය ගරු ලොහාන් රත්වත්තේ මහතා

වැලිකඩ බන්ධනාගාර සංකීර්ණය විශාල ඉඩකඩකින් යුතු හොරණ ප්‍රදේශයට මාරු කිරීම සඳහා රාජ්‍ය අමාත්‍යාංශය කටයුතු කරමින් පවතින බව ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් සඳහන් කරන ලදී. යෝජිත බන්ධනාගාර සංකීර්ණය තුළ ආරක්ෂක බන්ධනාගාර, රිමාන්ඩ් බන්ධනාගාර, වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක්, පුනරුත්ථාපන

මධ්‍යස්ථානයක්, ක්‍රීඩා මධ්‍යස්ථානයක් සහ කාන්තා රිමාන්ඩ් බන්ධනාගාර වලින් සමන්විත වන බව ද ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

**1.4. ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා**

රජයේ රස පරීක්ෂක වාර්තාවකින් තොරව මහේස්ත්‍රාත් අධිකරණයේ චෝදනා පත්‍රයක් ගොනු කළ නොහැකි වීම සහ මහේස්ත්‍රාත් අධිකරණවල නඩු අවහිර වී ඇති හෙයින් රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රමාදය පිළිබඳව ද සොයා බැලිය යුතු බව ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් පෙන්වා දෙන ලදී.

“මගේ දැනුමට අනුව, ප්‍රිවී කවුන්සිලය හෝ ශ්‍රේෂ්ඨාධිකරණය කිසි විටෙකත් අහිංසක පුද්ගලයෙකු චූදිතයෙකු බවට පත් කර නැත” යනුවෙන්ද ඔහු විසින් ප්‍රකාශ කරන ලදී. දේශපාලන නායකයින් සහ නිලධාරීන්ගෙන් සමන්විත ස්ථර දෙකට අමතරව නීති විශාරදයින්ගෙන් සමන්විත තවත් එක් ස්ථරයක් ඇතුළත් කිරීමට ඔහු යෝජනා කරන ලදී.

**1.5. ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතා**

සාපරාධී අපරාධකරුවන් සමාජ චක්‍රයකින් සෑදී ඇති බව ද මෙම චක්‍රයේ ක්‍රියාකාරීත්වය නැවැත්විය යුතු බවද ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**1.6. ගරු වීරසුමන වීරසිංහ මහතා**

හය වන ශ්‍රේණියේ සිට දහතුන් වන ශ්‍රේණිය දක්වා පාසල් විෂය නිර්දේශයට විෂයයක් ලෙස නීතිය, අපරාධ සහ දඬුවම් ඇතුළත් කිරීමට ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

ළමා හා තරුණ වැරදිකරුවන්ගේ පුනරුත්ථාපන ක්‍රියාවලිය ද මෙම ප්‍රජා පාදක විශෝධන ක්‍රමයට ඇතුළත් කළ හැකි බව ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් පෙන්වා දෙන ලදී.

**2. අමාත්‍යාංශයීය කටයුතු හා සම්බන්ධ කරුණු**

**2.1. අධිකරණ වල ඇති තදබදය - ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා**

නඩුව විභාගයට ගන්නා නිශ්චිත වේලාව ජනතාවට දැනගැනීම සඳහා ක්‍රමවේදයක් නොමැති බැවින් අධිකරණය නිතරම ජනාකීර්ණ වන බව ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**2.2. ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතාගේ යෝජනා**

**2.2.1 2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ ඇප ලබා ගැනීම**

උක්ත පනත යටතේ සිදුකරන ලද වරදක් සම්බන්ධයෙන් ඇප ලබා දීමේ බලය අභියාචනාධිකරණයට ලබා දී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම පනතේ අදාළ විධිවිධාන සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට ප්‍රකාශ කළ අතර ගරු අමාත්‍ය (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතාගේ සභාපතිත්වයෙන් යුත් කැබිනට් මණ්ඩලයේ ව්‍යවස්ථාදායක අනු කමිටුව ඒකමතිකව නිර්දේශ කරන ලද්දේ මෙම පනත යටතේ ඇප ලබා දීමට මහේස්ත්‍රාත්වරයාට බලය ලබා දෙන ලෙස බවද ප්‍රකාශ කරන ලදී.

### 2.2.2 අනුරාධපුර බන්ධනාගාර සංකීර්ණය වෙනත් ස්ථානයක ස්ථානගත කිරීම

වැලිකඩ සහ මහර බන්ධනාගාර මෙන්ම අනුරාධපුර බන්ධනාගාරයේ ද අධික තදබදයක් පවතින බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී. එබැවින් අනුරාධපුර බන්ධනාගාර සංකීර්ණය ඔයාමඩුව ප්‍රදේශයේ ස්ථාපනය කිරීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

## 2.3. ගරු චන්දිම වීරක්කොඩි මහතාගේ යෝජනා

### 2.3.1. ගාල්ල උසාවි සංකීර්ණයේ යාබද ඉඩම අත්පත් කර ගැනීම

ගාල්ල උසාවි සංකීර්ණයේ යාබද ඉඩම අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

උක්ත කරුණ සම්බන්ධයෙන් ගාල්ල දිස්ත්‍රික්කයේ නීතිඥයන් සහ නාගරික සංවර්ධන අධිකාරියේ සහභාගීත්වයෙන් යුතුව පැවැත්වූ රැස්වීමකදී මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය කටයුතු කළ යුතු බවට තීරණය කරන ලද බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

### 2.3.2. ගාල්ල දෙවන මහාධිකරණය පිළිබද යෝජනාව

ගාල්ල දෙවන මහාධිකරණය සඳහා නව පරිශ්‍රයක් ඉදිකරන තෙක් එය තාවකාලිකව ස්ථානගත කිරීමට ස්ථානයක් යෝජනා කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

සුප්‍රසිද්ධ අමරසූරිය බංගලාව මෙම කර්තව්‍යය සඳහා තාවකාලිකව භාවිතා කළ හැකි බව ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදි.එම යෝජිත ස්ථානයට ගොස් නිරීක්ෂණය කර වාර්තා කරන ලෙස අමාත්‍යාංශයේ ලේකම් වෙත උපදෙස් ලබා දෙන ලදි.

### 2.3.3. ගාල්ලේ බන්ධනාගාර බූස්ස ප්‍රදේශයේ ස්ථානගත කිරීම

බූස්ස ප්‍රදේශයේ අධිකරණය ස්ථානගත කිරීමට යෝජිත ස්ථානය පෙර පැවති තුරඟ තරඟ පිටියක් බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී. ගාල්ල ප්‍රදේශයේ කිසිදු පාසලක නිසි පරිදි ක්‍රීඩාංගනයක් නොමැති හෙයින් එම තුරඟ තරඟ පිටිය පාසල් ක්‍රීඩාංගනයක් බවට පත්කිරීමේ හැකියාව පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසා සිටින ලදී.

එම යෝජනාව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව හරහා ඉදිරිපත් කළහොත් එය සලකා බැලිය හැකි බව ගරු අමාත්‍යවරයා විසින් ප්‍රකාශ කරන ලදි.

### 2.3.4. 2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ ඇප ලබා ගැනීම

උක්ත පනත යටතේ සිදුකරන ලද වරදක් සම්බන්ධයෙන් ඇප ලබා දීමේ බලය අභියාචනාධිකරණයට ලබා දී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම පනතේ අදාළ විධිවිධාන සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී. ගරු අමාත්‍ය (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතාගේ සභාපතිත්වයෙන් යුත් කැබිනට් මණ්ඩලයේ ව්‍යවස්ථාදායක අනු කමිටුව ඒකමතිකව නිර්දේශ කරන ලද්දේ මෙම පනත යටතේ ඇප ලබා දීමට මහේස්ත්‍රාත්වරයාට බලය ලබා දෙන ලෙස බවද සඳහන් කරන ලදී.

### 2.3.5. විනිසුරුවරුන් සහ රජයේ නීතිඥයන් සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ නිල නිවාස ලබා දීම

ග්‍රාමීය ප්‍රදේශවල සේවය කරන නීතිපති දෙපාර්තමේන්තුවේ විනිසුරුවරුන් සහ රජයේ නීතිඥයන්ට නවාතැන් පහසුකම් නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී. ඔවුන් සඳහා මහල් නිවාස ඉදිකිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

ඔවුන් සඳහා සුහුරු නිවාස ඉදිකිරීමට අමාත්‍යාංශය දැනටමත් තීරණය කර ඇති බව ගරු අමාත්‍යතුමා විසින් පවසන ලදී.

## 2.4. ගරු ජී. ජී. පොන්නම්බලම් මහතාගේ යෝජනා

### 2.4.1. බන්ධනාගාර නැවත ස්ථානගත කිරීම හා ඒකාබද්ධ කිරීම

දිවයිනේ බන්ධනාගාර වෙනත් ස්ථානයන්හි ස්ථානගත කිරීම ගැන ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

ප්‍රධාන අවධානය ලබා දී ඇත්තේ හොරණ බන්ධනාගාර සංකීර්ණ ව්‍යාපෘතියට බව ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

## 2.5. ගරු වසන්ත යාපා බණ්ඩාර මහතාගේ යෝජනා

### 2.5.1. "එක නීතියක්: එක රටක්" ප්‍රතිපත්තිය

පුද්ගලික නීති වශයෙන් සැලකෙන උඩරට නීතිය මුස්ලිම් නීතිය තේසවලාමේ නීතිය ආදියෙහි පවතින වෙනස්කම් සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් අදහස් ප්‍රකාශ කරන ලදී. එම සාම්ප්‍රදායික නීති වල විවාහය සම්බන්ධයෙන් පවතින විෂමතා ඉවත් කිරීම සිදු කළ යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී. තවද විවාහ වීමට අදාළ අවම වයස සම්බන්ධයෙන් පවතින සාම්ප්‍රදායික නීති නොසලකා රටටම බලපැවැත්වෙන පරිදි නීති සංශෝධනය කළ යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී. තවද කාති උසාවි සඳහා කාන්තා නිලධාරීන් පත් කිරීම කෙරෙහි ද අවධානය යොමු කරන ලෙසට ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

විවාහය සම්බන්ධයෙන් අවම වයස පිළිබඳව කැබිනට් පත්‍රිකාවක් නොවැම්බර් මාසයේදී ඉදිරිපත් කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි. මහාචාර්ය ජී. එල්. පීරිස් මහතාගේ සභාපතිත්වයෙන් යුත් කැබිනට් මණ්ඩලයේ ව්‍යවස්ථාදායක අනු කමිටුව විවාහය සඳහා අවම වයස ලෙස වයස අවුරුදු 18 සුදුසු බව නිර්දේශ කර ඇත. කාන්තාවන් කාතිවරු ලෙස පත් කිරීම සහ විවාහ වීමේ අවම වයස් සීමාව සඳහා මුස්ලිම් සමාජය එකඟ වී තිබෙන බව බවද ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**2.6. තණමල්විල ප්‍රදේශයේ මහේස්ත්‍රාත් අධිකරණයක් පිහිටුවීම - ගරු ජගත් පුෂ්පකුමාර මහතා**

තණමල්විල පදිංචි පදිංචිකරුවන් හට බලංගොඩ මහේස්ත්‍රාත් අධිකරණයට පැමිණීම සඳහා කිලෝමීටර් 72ක දුරක් පවතින බවත් එයට විසඳුමක් ලෙස තණමල්විල මහේස්ත්‍රාත් අධිකරණය පිහිටුවන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

**2.7. ගරු වීරසුමන වීරසිංහ මහතාගේ යෝජනා**

**2.7.1. මොරවක මහේස්ත්‍රාත් අධිකරණය වෙනත් ස්ථානයක ස්ථානගත කිරීම**

මොරවක මහේස්ත්‍රාත් අධිකරණය ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ කිසිදු එකඟතාවයකින් තොරව සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ අනුමැතියකින් තොරව වෙනත් ස්ථානයකට ස්ථානගත ප්‍රාදේශීය ලේකම් විසින් ස්ථානයක් යෝජනා කර ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රකාශ කරන ලදි. යෝජිත ස්ථානය ඓතිහාසික “ගැටබරු” රාජමහා විහාරයේ සිට මීටර් 200 ක් දුරින් පිහිටා ඇති අතර එහි වාර්ෂික ඇසළ පෙරහැර සමයේදී අධිකරණ කටයුතු වලට දැඩි ලෙස බාධා එල්ල වනු ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් සඳහන් කරන ලදි. කෙසේ වෙතත්, මොරවක මහේස්ත්‍රාත් අධිකරණය වෙනත් ස්ථානයකට ගෙන යාම සඳහා අක්කර 3.5 ත් 4 ත් අතර වපසරියක් සහිත වෙනත් ඉඩමක් ද යෝජනා කරන ලදී. එබැවින් මොරවක උසාවි සංකීර්ණය ඉදිකිරීම සඳහා එම ඉඩම භාවිතා කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

ගරු අමාත්‍යතුමා අමාත්‍යංශයේ ලේකම්තුමා සමග සාකච්ඡා කොට,මොරවක මහේස්ත්‍රාත් අධිකරණය වෙනත් ස්ථානයක ස්ථානගත කිරීම් සඳහා ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ ද සහභාගිත්වයෙන් යුතුව රැස්වීමක් පවත්වා මෙම ස්ථානගත කිරීම් සඳහා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා ගත යුතු බව සඳහන් කරන ලදී.

**2.7.2. මාතර බන්ධනාගාරය වෙනත් ස්ථානයක ස්ථානගත කිරීම**

මීට වසර හතකට පෙර මොරවක ඉඩමක් මේ සඳහා අත්පත් කර ගෙන බන්ධනාගාර දෙපාර්තමේන්තුවට ලබා දී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එම ස්ථානයේ මාතර බන්ධනාගාරය ඉදිකිරීම සඳහා යොදා ගන්නා ලෙස ගරු අමාත්‍යතුමා විසින් රාජ්‍ය අමාත්‍යතුමාට උපදෙස් ලබා දෙන ලදී.

**2.8. එකම පුද්ගලයා නැවත නැවත පොලිස් අත්අඩංගුවට ගැනීම - ගරු රෝහණ දිසානායක මහතා**

සුරාබදු, මත්ද්‍රව්‍ය ප්‍රවාහනය සහ මත්ද්‍රව්‍ය සම්බන්ධ අපරාධ සම්බන්ධයෙන් පොලිස් නිලධාරීන්ට ලබා දී ඇති ඉලක්ක හේතුවෙන් එක් නඩුවක වූදිතයෙකු වූ පුද්ගලයෙකු

කිසිදු පදනමක් නොමැතිව නැවත නැවත අත්අඩංගුවට ගන්නා බව ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

මේ පිළිබඳව පරීක්ෂණයක් සිදු කරන ලෙස ගරු අමාත්‍යතුමා විසින් නියෝජ්‍ය පොලිස්පති වෙත උපදෙස් ලබා දෙන ලදී.

## 2.9. ඉංග්‍රීසි මාධ්‍යයෙන් නීති විද්‍යාල විභාග පැවැත්වීම - ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

නීති විද්‍යාල විභාග ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වීමට ගත් තීරණය පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

අගවිනිසුරුතුමාගේ මූලිකත්වයෙන් යුතු නීති අධ්‍යාපන කවුන්සිලය මගින් නීති අධ්‍යාපනය පිළිබඳව නීතිරීති සම්පාදනය කරන අතර අධිකරණ අමාත්‍යතුමාට සිදු කළ හැක්කේ එම නීතිරීති වලට අනුමැතිය ලබා දීම පමණක් බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

නීති විද්‍යාල ප්‍රවේශ විභාගයේ කිසිදු වෙනසක් සිදු කර නොමැති බව ගරු අමාත්‍යතුමා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී. නීති විද්‍යාලයේ දේශන ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලබන අතර අවසාන විභාග සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ මාධ්‍ය වලින් පවත්වනු ලැබෙන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

සෑම වසරකම නව නීතිඥයින් 1200 ක් පමණ බඳවා ගන්නා බවත් බහුතරය විදේශීය විශ්ව විද්‍යාල වලින් බවත් ගරු අමාත්‍යතුමා විසින් පවසන ලදී. ඇතැම් විදේශීය විශ්ව විද්‍යාල මඟින් ශ්‍රී ලාංකික සිසුන් සඳහා ගැලපෙන පරිදි සාදන ලද පාඨමාලා කිහිපයක් ඉදිරිපත් කර ඇති අතර ඇතැම් පාඨමාලා වල ගුණාත්මකභාවය ගැටළුවක් බව ගරු අමාත්‍යතුමා විසින් සඳහන් කරන ලදී.

නීතිවේදී උපාධියෙහි ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට උපදෙස් දීම අවශ්‍ය බව ගරු සුසිල් ප්‍රේම්ජයන්ත මහතා විසින් දැනුම් දෙන ලදී. දැනටමත් නිකුත් කර ඇති ප්‍රතිඵල වෙනස් කිරීම පිළිබඳව සිසුන් පැමිණිලි කරන බැවින් විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන උපාධියේ ගුණාත්මකභාවය පරීක්ෂා කරන ලෙස ගරු අමාත්‍යතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 2.10. ගරු උදයන කිරිඳිගොඩ මහතාගේ යෝජනා

### 2.10.1. මහනුවර උසාවි සංකීර්ණයක් සහ නීතිඥයින් සඳහා කාර්යාල සංකීර්ණයක් ඉදිකිරීම

ප්‍රමාද වන විට තක්සේරු ගාස්තුව වැඩි වන බැවින් මහනුවර අධිකරණ සංකීර්ණය සහ නීතිඥයින් සඳහා කාර්යාල සංකීර්ණයක් ඉදිකිරීමට යෝජනා කර ඇති ඉඩම පිළිබඳ ගැටළුව විසඳන ලෙස ඉල්ලීමක් කරන ලදී.

## 3. ක්‍රියාකාරී කමිටුව පත් කිරීම

රැස්වීම කැඳවන ලද අරමුණ සඳහා ක්‍රියාකාරී කමිටුවක් පත් කර ගැනීමට අවශ්‍ය බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී. කමිටුවේ ක්‍රියා පටිපාටිය හා ඉදිරි ගමන පිළිබඳව ගරු සභාපතිතුමා වෙත උපදෙස් දීම, නිලධාරීන් සහ පාර්ශවකරුවන් පොදු

අරමුණු සඳහා මෙහෙයවීම සහ බලමුලු ගැන්වීම සහ ලේඛන හා වාචික සාක්ෂි කැඳවීම සහ අවශ්‍ය අනෙකුත් තොරතුරු කැඳවීම ඇතුළු අරමුණු මෙහෙයවීම සඳහා පාර්ලිමේන්තුවේ සහකාර මහ ලේකම් ටිකිරි කේ. ජයතිලක මහතාව ගරු සභාපතිතුමා විසින් පත් කරන ලදි.

අනතුරුව නීතිපති දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පොලිසිය, අධිකරණ අමාත්‍යාංශය, අධිකරණ සේවා කොමිෂන් සභාව, බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන්ගේ පුනරුත්ථාපනය රාජ්‍ය අමාත්‍යාංශය, බන්ධනාගාර දෙපාර්තමේන්තුව, ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව, සාක්ෂිකරුවන් හා වින්දිතයින් ආරක්ෂා කිරීමේ ජාතික අධිකාරිය, ශ්‍රී ලංකා නීතිඥ සංගමය යන ආයතනයන්ගෙන් පැමිණි නිලධාරීන්හට මෙම කමිටුව සඳහා නියෝජිතයින් පත් කරන ලෙස ඉල්ලීමක් කරන ලදී.

කාරක සභාවට තාක්ෂණික උපදෙස් ලබාදීම සඳහා මහාචාර්ය දියනාත් සමරසිංහ මහතා, ජනාධිපති නීතිඥ ප්‍රසාන්ත ලාල් ද අල්විස් මහතා, ආචාර්ය නෙරංජී විජේවර්ධන මහත්මිය, එම්.ඒ.එම්. හකීම් මහතා සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන ගරු සභාපතිතුමා විසින් පත් කරන ලදී.

කාරක වාර්තාව මාස දෙකක් ඇතුළත ලබා දෙන ලෙසත්, ඒ අතරතුර අතුරු වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසත් ගරු සභාපතිතුමා විසින් ක්‍රියාකාරී කමිටුවට උපදෙස් ලබා දෙන ලදි.
ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා ලිඛිතව අමාත්‍යාංශීය උපදේශක කාරක සභා කාර්යාංශයට විද්‍යුත් තැපැලෙන් යොමු කළ හැකි බව දන්වා සිටින ලදී.

**4.** කාරක සභාව ප.ව. 12.45 ට කල් තබන ලදි.

---

**කෘෂිකර්ම කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**දෙවැනි රැස්වීම - 2021 පෙබරවාරි 11**

**පැමිණ සිටි සාමාජික මන්ත්‍රීන්**

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා (සභාපති)
ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු එස්. වියාලේන්ද්‍රන් මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු ඩී.බී. හේරත් මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
ගරු උදයකාන්ත ගුණතිලක මහතා
ගරු කුලසිංහම් තිලීපන් මහතා
ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

**පැමිණ සිටි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු මහින්ද අමරවීර මහතා
ගරු චන්දිම වීරක්කොඩි මහතා
ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු අමරකීර්ති අතුකෝරල මහතා
ගරු සම්පත් අතුකෝරල මහතා
ගරු සංජීව එදිරිමාන්න මහතා
ගරු ලලිත් එල්ලාවල මහතා
ගරු උදයන කිරිඳිගොඩ මහතා
ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා
ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය
ගරු මිලාන් ජයතිලක මහතා
ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා
ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා
ගරු අසංක නවරත්න මහතා
ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය
ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා
ගරු අජිත් රාජපක්ෂ මහතා
ගරු ගාමිණී වලේබොඩ මහතා
ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය
ගරු ඩී. වීරසිංහ මහතා
ගරු වීරසුමන වීරසිංහ මහතා
ගරු සමන්ප්‍රිය හේරත් මහතා
ගරු තවරාජා කලෙයි අරසන් මහතා
ගරු මංජුලා දිසානායක මහත්මිය
ගරු ඩයනා ගමගේ මහත්මිය

**1. වාර්ෂික වාර්තා සලකා බැලීම**

පාර්ලිමේන්තුව විසින් යොමු කරන ලද පහත සඳහන් වාර්ෂික වාර්තාවලට කාරක සභාව එකඟ වූ අතර ඒ පිළිබඳ වාර්තාව, සභාපති ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා විසින් පාර්ලිමේන්තුවට පිළිගැන්විය යුතු යයි ද තීරණය කළාය.

**1.1.** 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

**1.2.** 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

**1.3.** 2018 වර්ෂය සඳහා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ වාර්ෂික වාර්තාව

**2. කාර්ය සටහන්වලින් පැන නඟින කරුණු :-**

**2.1 බීජ අල සහනාධාර නොලැබීම - ගරු ඩග්ලස් දේවානන්ද මහතා**

දෙපාර්තමේන්තුවට ලබාගත් බීජ අල කොටසක් නරක්වීම හේතුවෙන් ඒ වෙනුවට මූල්‍යමය සහනාධාර ලබාදීමට කටයුතු කළ බව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

**2.2 රහංගල ගොවිපළ කෘෂිකර්ම අමාත්‍යාංශයට පවරා ගැනීමට කටයුතු කිරීම - ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**

මෙම ගොවිපළ පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

**2.3 කුඹුරු ඉඩම් ගොඩකිරීම නතර කිරීමට අවශ්‍ය පියවර ගැනීම - ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා**

කාරක සභාව මෙම කරුණ සලකා බලන ලදි.

**2.4 ගම්පහ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා මධ්‍යස්ථානය ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කිරීම - ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා**

මෙම ගොවිජන සේවා මධ්‍යස්ථානය සංවර්ධනය කිරීමේ කටයුතු කඩිනම් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් රාජ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) වෙත උපදෙස් ලබා දෙන ලදි.

සියළුම ගොවිජන සේවා මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්ට උපදෙස් ලබා දෙන ලදි.

**2.5 අත්තනගල්ල ප්‍රදේශයේ හරක් හොරකම මැඩ පැවැත්වීම සඳහා කටයුතු කිරීම - ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා**

මෙම කරුණ සම්බන්ධයෙන් පොලිස්පතිතුමා සමඟ සාකච්ඡාවක් පැවැත්වීමට කටයුතු සකස් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත උපදෙස් ලබා දෙන ලදි.

**2.6 කෝට්ටේ ගොවිජන සේවා මධ්‍යස්ථානයට පහසුකම් ලබාදීම - ගරු මධුර විතානගේ මහතා**

මෙම ගොවිජන සේවා මධ්‍යස්ථානයේ අතිරික්ත නිලධාරීන්ට ස්ථාන මාරුවීම් ලබාදීම හා අවශ්‍ය පහසුකම් ලබාදීමට කඩිනම් පියවර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්ට උපදෙස් ලබා දෙන ලදි.

**3. ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා**

**3.1 අලව්ව හා නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පළතුරු ගම්මාන 20 ක් ආරම්භ කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කළ ඉල්ලීම** (යෝජනා අංක - 50) - ගරු ශාන්ත බණ්ඩාර මහතා

මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති වාර්තාවේ පිටපතක් ගරු මන්ත්‍රීතුමාට යැවීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදි.

මෙම වර්ෂය තුළ ලැබෙන ප්‍රතිපාදන අනුව පළතුරු ගම්මාන ඇරඹීමේ යෝජනාව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන බවට දැනුම් දෙන ලදී.

## 4. වෙනත් කටයුතු

### 4.1 ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

#### 4.1.1 වගා නොකරන කුඹුරු ඉඩමක් ගොඩකර ක්‍රීඩා පිටියක් සෑදීම සඳහා අවසර ලබා ගැනීම

ප්‍රාදේශීය සභාව සතු ඉතා දීර්ඝ කාලයක් වගා නොකරන ලද කුඹුරු ඉඩමක් ගොඩකර ක්‍රීඩා පිටියක් සෑදීමට අවසර ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීතුමාට දැනුම් දෙන ලදි.

#### 4.1.2 ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු පෙතියාකන්ද අක්කර 200 ක (LRC) ඉඩම ගොවිපලක් ලෙස සංවර්ධනය කිරීම

සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

රජයට අයත් හිස් ඉඩම් තම ප්‍රදේශයේ තිබේ නම්, ඒවා වගා කටයුතු සඳහා යොදා ගැනීමට හැකි බැවින් ඒ පිළිබඳව අමාත්‍යාංශය දැනුවත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සියළුම ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලීමක් කරන ලදි.

#### 4.1.3 ගොවිජන සේවා මධ්‍යස්ථානවලට අවශ්‍ය යන්ත්‍රෝපකරණ පහසුකම් ලබා දීම

ගොවිජන සේවා මධ්‍යස්ථානවලට අවශ්‍ය ගොයම් කපන යන්ත්‍ර, වියලන යන්ත්‍ර, බැකෝ යන්ත්‍ර යනාදිය ලබාදීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

තෝරාගත් ගොවිජන සේවා මධ්‍යස්ථාන 47 කට අවශ්‍ය පහසුකම් ලබාදීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

#### 4.1.4 කලගෙඩිහේන මාර්ගය දෙපස රඹුටන් වෙළඳාමේ නියුතු වෙළෙන්දන් සඳහා ස්ථිර කඩ කාමර සකසාදීම

මේ පිළිබඳව ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

#### 4.1.5 බුලත් ගොවියන් ආරක්ෂා කිරීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙලක් සකස් කිරීම

කෘෂි රක්ෂණ මණ්ඩලය සමඟ සාකච්ඡා කර බුලත් ගොවීන් සඳහා රක්ෂණ ක්‍රමයක් හඳුන්වාදීමට කටයුතු කරන බවත්, ඒ සම්බන්ධයෙන් ගොවීන් සමඟ සාකච්ඡා කර

අවශ්‍ය තොරතුරු ලබාගන්නා ලෙසත් ගරු සභාපතිතුමා විසින් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් ලබා දෙන ලදි.

#### 4.1.6 කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් ස්ථාන මාරු කිරීම

එම නිලධාරීන්ගේ ස්ථාන මාරුකිරීම් අවලංගු කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

නගරවල සිටින නිලධාරීන් කෘෂිකාර්මික ප්‍රදේශවලට ස්ථානමාරු කිරීමට කටයුතු කර ඇති බැවින් එම පියවර වෙනස් කළ නොහැකි බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

#### 4.1.7 වේයන්ගොඩ ආර්ථික මධ්‍යස්ථානය ක්‍රමවත් වැඩපිළිවෙලක් යටතට ගෙන ඒම

වේයන්ගොඩ ආර්ථික මධ්‍යස්ථානය දැනට හුවමාරු මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක නොවීම පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් කරුණු දක්වන ලදි.

දිවයිනේ සියලුම ආර්ථික මධ්‍යස්ථානවල සංකල්පය වෙනස් කර ක්‍රමවත් වැඩපිළිවෙලක් යටතට ගෙන ඒමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

#### 4.1.8 වාරණ මාර්ගය දෙපස අනවසර ඉදිකිරීම්

මෙම ස්ථානයට සංවර්ධන නිලධාරීවරයා යොමු කර අවශ්‍ය නිරීක්ෂණ සිදුකර දැනුම් දීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්ට උපදෙස් ලබා දෙන ලදි.

### 4.2 පුරන් කුඹුරුවල පොල් වගා කිරීම සඳහා අවසර ලබා ගැනීම - ගරු මුදිතා ලියනගේ මහත්මිය

මුහුදු ජලය එකතුවන දකුණු පළාතේ කුඹුරුවල පොල් වගා කිරීමට යෝජනාවක් ඉදිරිපත්ව ඇතත්, දිවයිනේ වෙනත් ප්‍රදේශවලට එය බල නොපාන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 4.3 අඹේපුස්ස, මීරිගම බීජ ගොවිපල සංවර්ධනය කිරීම - ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

මෙම ගොවිපළ සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මෙම වසරේදී ලබාදීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

### 4.4 ගරු වීරසුමන වීරසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

#### 4.4.1 වීරපාන රජයේ ගොවිපල බීජ ගොවිපලක් ලෙස සංවර්ධනය කිරීම

රැකියා විරහිත තරුණයන් 100 දෙනෙකුගේ පමණ විස්තර ලබාදීමට කටයුතු කරන්නේ නම්, ඔවුන්ට වගා කිරීමට අවශ්‍ය සියළුම පහසුකම් ලබා දී බීජ නිෂ්පාදන අමාත්‍යාංශය විසින් මිලට ගැනීමට කටයුතු කළ හැකි බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

### 4.4.2 දෙනියාය ප්‍රදේශයේ හිස් ඉඩම් වගා කටයුතු සඳහා යොදා ගැනීම

උඩරට ප්‍රදේශයේ කාලගුණයම පවතින දෙනියාය ප්‍රදේශයේ වගා නොකරන හිස් ඉඩම් විශාල ප්‍රමාණයක් ඇති බැවින් එම ඉඩම් වලද සුදුසු භෝග වගා කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා විසින් තවදුරටත් ඉල්ලීම් කරන ලදි.

පස පරීක්ෂා කර වගාව සඳහා සුදුසු භෝග හඳුන්වාදීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් ලබා දෙන ලදි.

## 4.5 බතලගොඩ ගොවිපලේ ස්ථිර කරන ලද කාර්ය මණ්ඩලය සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් ලබාගැනීම - ගරු මංජුලා දිසානායක මහත්මිය

මෙම කරුණ සම්බන්ධයෙන් දැනටමත් අමාත්‍ය මණ්ඩල සංදේශයක් භාරදී ඇති බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

## 4.6 ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.6.1 බඩ ඉරිඟු මිල දී ගැනීමට යාන්ත්‍රණයක් සැකසීම

මේ සඳහා යාන්ත්‍රණයක් සැකසීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 4.6.2 විලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වගා නොකළ ඉඩම් කෘෂි කර්මාන්තය සඳහා යෙදවීම

හඳුනාගත් ඉඩම් පිළිබඳ විස්තර ලබා දෙන ලෙස ඉල්ලීමක් කරන ලද අතර, වගා කටයුතු සඳහා යොදාගැනීමට අවශ්‍ය සියලු පහසුකම් සැපයීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

එම ඉඩම් පිළිබඳ සියලු තොරතුරු ලබාගෙන නවීකරණ ව්‍යාපෘතිය යටතේ අවශ්‍ය කටයුතු සැලසුම් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අතිරේක ලේකම් (කෘෂි තාක්ෂණ) වෙත උපදෙස් ලබා දෙන ලදි.

## 4.7 පොළොන්නරුව, දියබෙදුම ප්‍රදේශයට ගොවිජන සේවා මධ්‍යස්ථානයක් ලබා ගැනීම - ගරු අමරකීර්ති අතුකෝරළ මහතා

මෙම කරුණ ගැන අවධානය යොමු කර මධ්‍යස්ථානය ඉදි කිරීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්ට උපදෙස් ලබා දෙන ලදි.

**4.8 බුලත්කොහුපිටිය ප්‍රදේශයට නව ගොවිජන සේවා මධ්‍යස්ථානයක් ලබා ගැනීම සහ දැනට පවතින මධ්‍යස්ථානවල අඩුපාඩු සපුරාගැනීම - ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය**

මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් වෙත උපදෙස් ලබා දෙන ලදි.

**4.9 ගරු සමන්ප්‍රිය හේරත් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**

**4.9.1 කුලියාපිටිය හොරොම්බාව ප්‍රදේශයේ වී වගා හානි**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ වී වගා හානි සම්බන්ධයෙන් පරීක්ෂා කර අවශ්‍ය පියවර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් සහ ගොවිජන සේවා කොමසාරිස් වෙත උපදෙස් ලබා දෙන ලදි.

**4.9.2 කුරුණෑගල ප්‍රදේශයේ පුරන් කුඹුරු සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීම**

සංවර්ධන කටයුතු සඳහා යොදා නොගන්නා පුරන් කුඹුරු වහාම පවරා ගෙන කෘෂිකාර්මික කටයුතු සඳහා යොදාගන්නා ලෙස සංවර්ධන නිලධාරීන් දැනුවත් කරමින් චක්‍රලේඛයක් යැවීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්ට උපදෙස් ලබා දෙන ලදි.
වගා නොකරන පුරන් කුඹුරු රජයට පවරා ගැනීමේ ක්‍රමවේදයක් සැකසීමට පියවර ගන්නා ලෙස ගරු මිලාන් ජයතිලක මන්ත්‍රීතුමා විසින් ද ඉල්ලීමක් කරන ලදි

**4.10 ගරු සංජීව එදිරිමාන්න මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**

**4.10.1 කළුතර දිස්ත්‍රික්කයට අනන්‍ය ආර්ථික භෝග හඳුන්වාදීම**

දිවයිනේ සියලුම ගොවිජන සේවා මධ්‍යස්ථානයකටම පස පරීක්ෂා කිරීමේ කට්ටල ලබාදීමට නියමිත අතර පස පරීක්ෂා කර බලා හෙල්ත් සොයිල් කාඩ් (Health Soil Card) ගොවීන්ට ලබාදීමෙන් පස අනුව වගා කළ යුතු භෝග හඳුනාගත හැකි බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

**4.10.2 ග්‍රාමීය ප්‍රදේශවල ගොවි ගැටළු විසඳීම සඳහා ප්‍රාදේශීය නිලධාරීන්ට බලය පැවරීම**

ගොවීන්ගේ ගැටළු විසඳීම සඳහා සෘජුවම අමාත්‍යාංශයට පැමිණීම ගැටළු සහගත බැවින් ප්‍රාදේශීය මට්ටමින් ඒවා විසඳා ගැනීම සඳහා ක්‍රමවේදයක් සකසන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

අමාත්‍යාංශයීය මට්ටමින් බලය රඳවා ගැනීමෙන් කුඹුරු පිරවීම සඳහා අනුමැතිය ලබාගැනීමට නොහැකි වීම හේතුවෙන් පුරන් කුඹුරු ආරක්ෂා වී ඇති බවත්, එලෙස ප්‍රාදේශීය මට්ටමට බලය පැවරීමෙන් කුඹුරු ගොඩ කිරීම සීමාවක් රහිතව සිදුවිය හැකි බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 4.10.3 මුළු දිවයිනේම ගොවිජන සේවා මධ්‍යස්ථාන ආදර්ශ වගා භූමි බවට පත් කිරීම

ගොවිජන සේවා මධ්‍යස්ථාන සංවර්ධනය සඳහා ප්‍රතිපාදන වෙන් වී ඇති බැවින් ඉදිරියේදී නිසි පරිදි සංවර්ධනය කිරීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

## 4.11 ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.11.1 වඳුරන්, රිලවුන්, ඌරන් වැනි සතුන්ගෙන් සිදුවන වගා හානි අවම කිරීම සඳහා ගිනි අවි භාවිතා කිරීම

ගිනි අවි ලබාදීමටත් ඊට අමතරව සතුන් වන්ධ්‍යාකරණයට ලක් කිරීමටත්, විශාල කූඩු සෑදිමට හා කිරණ යවා සතුන් බියවැද්දවීම යනාදී උපක්‍රම භාවිතා කරන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 4.11.2 සිවිල් ආරක්ෂක බලකායක් යොදවා වගාවන්ට සිදුවන සත්ව හානි අවම කිරීම

යුද්ධ හමුදාව හෝ සිවිල් ආරක්ෂක බලකාය යෙදවීම මගින් වගා හානි අවම කරගැනීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

## 4.12 අම්පාර, පාලමුන කෘෂි පුහුණු මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීම - ගරු තවරාජා කලෙයි අරසන් මහතා

අම්පාර දිස්ත්‍රික්කයේ මධ්‍යම රජය යටතේ ක්‍රියාත්මක වූ අඩ්ඩාලච්චේනයි කෘෂි පුහුණු මධ්‍යස්ථානය පාලමුනෙයි ප්‍රදේශයට ගෙන යන ලද නමුත් අවශ්‍ය භූමි ප්‍රමාණය සහ වෙනත් සම්පත් නොමැති බැවින් හාල්මෝලක් පිහිටා තිබූ සවලක්කඩේ රජයේ ඉඩම මේ සඳහා සුදුසු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

අවශ්‍ය පියවර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් ලබා දෙන ලදි.

## 4.13 වව්නියාව ආර්ථික මධ්‍යස්ථානය විවෘත කිරීම - ගරු කුලසිංහම් තිලිපන් මහතා

වවුනියාව දිස්ත්‍රික්කයට අයත් ආර්ථික මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකර දීර්ඝ කාලයක් ගතවී ඇති බැවින් එය විවෘත කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

අවශ්‍ය පියවර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් රාජ්‍ය අමාත්‍ය ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතාට උපදෙස් ලබා දෙන ලදී.

මේ වන විට තොග වෙළඳාම් කටයුතුවල නිරතවන වෙළෙන්දන්ට කඩ කාමර ලබාදීමට කටයුතු කරන ලෙස ගරු චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමා විසින්ද ඉල්ලීමක් කරන ලදි.

**4.14 වව්නියාව, සෙට්ටිකුලම් ගොවිජන සේවා මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම - ගරු චාල්ස් නිර්මලනාදන් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**

වවුනියාව දිස්ත්‍රික්කයට අයත් සෙට්ටිකුලම ගොවිජන සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශය දෙකකට වෙන්කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

අවශ්‍ය පියවර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් ගොවිජන සේවා කොමසාරිස් වෙත උපදෙස් ලබා දෙන ලදි.

**4.15 ගරු ඩයනා ගමගේ මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**

**4.15.1 වැලිඔය ප්‍රදේශයේ පිච්ච මල් වගාව සහ අල්පොන්සු අඹ වගාව ව්‍යාප්ත කිරීම**

පවතින දේශගුණික තත්ත්වය යටතේ පිච්ච මල් සහ අල්පෝන්සු අඹ වගා කිරීම ව්‍යාප්ත කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රිතුමිය විසින් ඉල්ලීමක් කරන ලදි.

**4.15.2 රාජ්‍ය අනුග්‍රය යටතේ කංසා වගා කිරීමට කටයුතු කිරීම**

රාජ්‍ය අනුග්‍රහය යටතේ කංසා වගා කර අපනයනය කිරීමෙන් විදේශ විනිමය ඉහළ නංවා ගත හැකි බවත්, ආයුර්වේදය සඳහා යොදා ගත හැකි බවත් ගරු මන්ත්‍රිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

නීති විරෝධී අයුරින් වගා කරන කංසා නීතියේ රැහැනට හසුකර ගත් පසු ගිනි තබා විනාශ කිරීමට කටයුතු නොකර, ඒවා ආයුර්වේද දෙපාර්තමේන්තුවට භාරදීමට කටයුතු කරන ලෙසද ගරු මන්ත්‍රිතුමිය විසින් ඉල්ලීමක් කරන ලදි.

මේ වනවිට ද ගිනි තබා විනාශ නොකර ආයුර්වේද දෙපාර්තමේන්තුවට භාර දෙන බව රාජ්‍ය අමාත්‍ය ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

**4.15.3 නවීන ක්‍රම භාවිතා කරමින් ශාඛ ප්‍රචාරණය කිරීම**

පර්යේෂණවලින් හඳුනාගෙන ඇති පරිදි එක පැළයකින් පැළ මිලියනයක් සෑදීමට හැකි නවීන ක්‍රම පවතින බැවින් අල වගාව, පලතුරු වගාව සඳහා එම ක්‍රම භාවිතා කිරීමෙන් වියදම අවම කරගත හැකි බව ගරු මන්ත්‍රිතුමිය විසින් පැහැදිලි කරන ලදි.

**4.15.4 නුවරඑළිය දිස්ත්‍රික්කයේ ස්ට්‍රෝබෙරි වගාවේ ඒකාධිකාරයක් පැවතීම**

ගරු මන්ත්‍රිතුමිය සඳහන් කරන ලද කරුණු පිළිබඳව පරීක්ෂා කර අවශ්‍ය පියවර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ට උපදෙස් ලබා දෙන ලදි.

## 4.16 ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.16.1 උමා ඔය ව්‍යාපෘතිය හේතුවෙන් බණ්ඩාරවෙල, වැලිමඩ ප්‍රදේශයන්හි වගා කටයුතු සඳහා ජලය හිඟ වීම

උමා ඔය ව්‍යාපෘතිය නිසා වගා බිම් ඉරි තැලීම හේතුවෙන් ජල මූලාශ්‍ර සිඳීයාමේ තර්ජනයකට ලක්වී ඇති බවත්, වගා කටයුතු සඳහා අවශ්‍ය ජලය ලබා දීමට කටයුතු කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

එම ප්‍රදේශය සංවර්ධන නිලධාරීන් මගින් පරීක්ෂා කර වගා කටයුතු සඳහා ජලය ලබාදීමට ක්‍රමවේදයක් සකසන ලෙස ගරු රාජ්‍ය අමාත්‍ය ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා විසින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්ට උපදෙස් ලබා දෙන ලදි.

ඩ්‍රිප් ඉරිගේෂන් සිස්ටම් (Drip Irrigation System) භාවිතා කිරීමෙන් මෙම ගැටළුවට විසඳුම් ලබාගත හැකි බව අතිරේක ලේකම් (කෘෂි තාක්ෂණ) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 4.16.2 කහගොල්ල කෘෂි පර්යේෂණ ආයතනය සංවර්ධනය කිරීම

ගොවීන් සම්බන්ධ කර ගනිමින් කෘෂි උපයෝගීතා පරීක්ෂණ එම ආයතනයේදී සිදුකළ හැකි බව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

නීතිමය කටයුතු අවසන් වූ විගස එහි සංවර්ධන කටයුතු සිදුකළ හැකි බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

## 4.17 ජපන් අත් ට්‍රැක්ටර් ක්‍රියා විරහිතවීම නිසා ණය මුදල් ගෙවීමේ අපහසුතා - ගරු ඩී.වීරසිංහ මහතා

අම්පාර දිස්ත්‍රික්කයේ ගොවීන්ට බෙදා දුන් අත් ට්‍රැක්ටර්වල ඇති රෝද කැඩීම මගින් ඒවා අක්‍රිය වී ඇති අතර, එම ණය මුදල් නොගෙවීම හේතුවෙන් ගොවීන්ට පොහොර සහනාධාරය ලබා නොදෙන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

එය ලිඛිතව භාරදීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

## 4.18 ගරු චන්දිම වීරක්කොඩි මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.18.1 ගාල්ල හබරාදූව ප්‍රදේශයේ පළතුරු ගම්මාන ඇති කිරීම

සියලු හබරාදූව ප්‍රදේශයේ කුඹුරු ඉඩම්වල එළවළු වගා කිරීමට හා ගංවතුර බලපෑමක් නොමැති ගොඩ ඉඩම්වල පලතුරු වගා කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

තොරතුරු ලබාදීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීතුමාගෙන් ඉල්ලීමක් කළ අතර, මේ පිළිබඳව පරීක්ෂා කරන බලන ලෙස කෘෂිකර්ම

දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයාට උපදෙස් ලබා දෙන ලදි.

### 4.18.2 නිර්මාණාත්මක සැලසුමකට අනුව හබරාදූව දියර කිරි මධ්‍යස්ථානය ඉදි කිරීම

මෙම කරුණ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් අතිරේක ලේකම් (පශු සම්පත් සංවර්ධන) වෙත උපදෙස් ලබා දෙන ලදි.

## 4.19 ගරු සම්පත් අතුකෝරළ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.19.1 වීරපාන ගොවිපල සංවර්ධනය කිරීම සඳහා කටයුතු කිරීම

ගොවිපල සංවර්ධනය සඳහා සහයෝගය ලබා දෙන බව ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීතුමාට දැනුම් දෙන ලදි.

### 4.19.2 නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මගින් නව ගොවිජන සේවා මධ්‍යස්ථානයක් ලබා ගැනීම

නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මඟින් විශාල ප්‍රදේශයක් ආවරණය වන බැවින් ගොවිජන සේවා මධ්‍යස්ථානයක් ලබාදීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

ඉඩමක් ලබා දෙන්නේ නම් නව ගොවිජන සේවා මධ්‍යස්ථානයක් ආරම්භ කළ හැකි බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

## 4.20 ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.20.1 වවුනියාව නගරයේ ඇති කෘෂි වැව ගොඩකිරීම

වවුනියාව නගරයේ ඇති කෘෂි වැව ගොඩකර නගර සභාව එහි උද්‍යානයක් ඉදිකිරීමට සැලසුම් කිරීම සම්බන්ධයෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ (ජලසම්පාදන) විසින් නගර සභාව වෙත ලිඛිතව දැනුම් දී ඇති නමුත් අවශ්‍ය පියවර ගෙන නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

මේ පිළිබඳව පරීක්ෂා කර අවශ්‍ය පියවර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් රාජ්‍ය අමාත්‍ය ගරු එස්. වියාලේන්ද්‍රන් මහතාට සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයාට උපදෙස් ලබා දෙන ලදි.

### 4.20.2 රතුළුනු වගා හානි සඳහා වන්දි මුදල් ලබාගැනීම

යාපනයේ පසුගිය ගංවතුර සමයේ රතුළුනු වගාවට හානි සිදුවී ඇති බැවින් ඒ සඳහා ගොවීන්ට රක්ෂණ වන්දි මුදල් ලබාදෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

මේ පිළිබඳව පරීක්ෂා කර අවශ්‍ය පියවර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් ලබා දෙන ලදි.

රක්ෂණ වන්දි මුදල් ලබාදෙන භෝග අතරට රතුළුනු ඇතුලත් නොවන බව කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 4.20.3 යාපනය ප්‍රදේශයේ කෘෂිකාර්මික කටයුතුවලට බාධා සිදුවීම

යාපනය ප්‍රදේශයේ අනිසි ලෙස ගොඩනැගිලි සහ මාර්ග තැනීම නිසා ජලය බැසයෑම අවහිරවී කෘෂිකාර්මික කටයුතුවලට බාධා සිදුවන බැවින් අවශ්‍ය පියවර ගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙය වාරිමාර්ග අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වුවද මේ පිළිබඳව පරීක්ෂා කර අවශ්‍ය පියවර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයාට උපදෙස් ලබා දෙන ලදි.

## 4.21 ගරු එස්. ශ්‍රීතරන් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.21.1 වට්ටකච්චි රජයේ ගොවිපල සංවර්ධනය කිරීම

එය පළාත් සභාවට අයත් ගොවිපලක් බවත් මේ වනවිට ඉන් කොටසක් සිවිල් ආරක්ෂක බලකාය මගින් පවත්වාගෙන යන බවත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

මෙම ගොවිපල හා ගාල්ල, මාතර දිස්ත්‍රික්කවල ගොවිපලවල් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් අතිරේක ලේකම් (කෘෂි තාක්ෂණ) වෙත උපදෙස් ලබා දෙන ලදි.

උතුරු නැගෙනහිර ප්‍රදේශයේ තරුණයන් යොදාගෙන අලුතින් ගොවිපල ඇරඹීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් ලබා දෙන ලදි.

### 4.21.2 උතුරු ප්‍රදේශයට කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් අනුයුක්ත කිරීම

නව බඳවා ගැනීම් සඳහා මේ වන විටත් ගැසට්පත්‍ර නිකුත් කර ඇති බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

## 4.22 කෑගල්ල, උඩුගොඩ ගොවිපල සංවර්ධනය කිරීම - ගරු උදයකාන්ත ගුණතිලක මහතා

අවශ්‍ය ඉඩම් ලබා දෙන්නේ නම්, ගොවිපල ආරම්භ කළ හැකි බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

**4.23 බණ්ඩාරවෙල විවිධ සේවා සමූපකාර සමිතිය මගින් පවත්වාගෙන යන පොහොර අලෙවිසැලට පොහොර ලබාදීම - ගරු ලලිත් එල්ලාවල මහතා**

මහා පරිමාණ සමාගම් විසින් පොහොර ගබඩා කර ගන්නා බැවින් පොහොර හිඟයක් ඇතිවන බවත්, නව ක්‍රමවේදය අනුව විවෘත වෙළඳපලේ පොහොර අවශ්‍ය ප්‍රමාණයට මිලදී ගැනීමට හැකිවන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

**5.** කාරක සභාව පස්වරු 3.30 ට, 2021 මාර්තු මස 09 වන දින ප.ව. 2.00 දක්වා කල් තබන ලදි.

---

**විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**දෙවැනි රැස්වීම - 2021 පෙබරවාරි 11**

**පැමිණ සිටි සාමාජික මන්ත්‍රීන්**

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (සභාපති)
ගරු තාරක බාලසූරිය මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
ගරු ගාමිණී වලේබොඩ මහතා
ගරු (ආචාර්ය) සුරේන් රාසවන් මහතා

**පැමිණ සිටි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු ජෝන් සෙනෙවිරත්න මහතා
ගරු ඩිලාන් පෙරේරා මහතා
ගරු චන්දිම වීරක්කොඩි මහතා
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
ගරු ෆයිසාල් කාසිම් මහතා
ගරු එම්. එස්. තවුෆික් මහතා
ගරු කේ. කාදර් මස්තාන් මහතා
ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු අජිත් රාජපක්ෂ මහතා
ගරු වීරසුමන වීරසිංහ මහතා
ගරු තවරාජා කලෛයි අරසන් මහතා
ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
ගරු යදාමිණී ගුණවර්ධන මහතා
ගරු ඩයනා ගමගේ මහත්මිය

**1. කාර්ය සටහන්වලින් පැන නගින කරුණු:-**

**1.1. ඉන්දියාවේ සිටින ශ්‍රී ලාංකික සරණාගතයින් මෙරටට ගෙන්වා ගැනීම - ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**

තමන්ගේම ඉල්ලීම පරිදි වියදම් දරා ශ්‍රී ලංකාවට පැමිණීමට එකඟත්වය පළ කරන අයට අදාළ දිස්ත්‍රික් ආදායම් නිලධාරීන් විසින් "පිටවීමේ බලපත්‍ර" නිකුත් කිරීමෙන් පසු

මෙරටට පැමිණීමට හැකියාවක් ඇති බවත්, සෙසු පිරිසට එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහ කොමසාරිස්වරයාගේ මූල්‍ය ආධාර මඟින් සාමාන්‍ය ක්‍රමවේදය යටතේ මෙරටට පැමිණීමට හැකියාව ඇති බවත් විදේශ අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

සරණාගතයින් අතුරින් 40% පමණ පිරිසක් මෙරටට ගෙන්වා ගැනීමට කටයුතු සම්පාදනය කළ නමුත් පවතින කොවිඩ්-19 වෛරස ව්‍යාප්තිය හේතුවෙන් එය ව්‍යර්ථ වූ බව ඔහු විසින් තවදුරටත් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එසේම, මෙම පිරිස සඳහා විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීමේදී ඔවුන්ගේ ලියකියවිලි වල පවතින අඩුපාඩු මත ඇතිවන ගැටලු නිරාකරණය කිරීම සඳහා චෙන්නායි හි පිහිටි ශ්‍රී ලංකා නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලය විසින් කටයුතු කරන බව අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඔවුන්ට අයත් බඩු බාහිරාදිය සමඟ මෙරටට පැමිණීමේ අපහසුතා මගහැරලීමට මුහුදු යාත්‍රා මඟින් කණ්ඩායම් වශයෙන් මෙරටට ගෙන්වා ගැනීමට අවශ්‍ය කටයුතු කරන මෙන් ද ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

**1.2. ඉන්දියානු ධීවර යාත්‍රා මෙරට ධීවර කර්මාන්තයේ යෙදී සිටීම - ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**

ඉන්දියානු ධීවර බෝට්ටු විශාල සංඛ්‍යාවක් මුහුදට පැමිණීම නිසා ශ්‍රී ලංකාවේ ධීවර ප්‍රජාවගේ කටයුතුවලට දැඩි ලෙස බාධාවන බව ගරු චාල්ස් නිර්මලනාදන් මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඉන්දියානු ධීවර අමාත්‍යාංශයේ සහ ශ්‍රී ලංකා ආරක්ෂක අමාත්‍යාංශයේ සහභාගීත්වය සහිතව ඉන්දියානු - ශ්‍රී ලංකා ඒකාබද්ධ කොමිසම විසින් ද මෙම කරුණ ගැන අවධානය යොමු කළ බවට ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.3. මුදල් වංචා කර නීත්‍යානුකූල නොවන ලෙස ඉන්දියාවට පිටවූ පුද්ගලයෙක් ඉන්දියානු රජය විසින් අත්අඩංගුවට ගෙන නිදහස් කිරීම - ගරු ෆයිසාල් කාසිම් මහතා**

මෙම පුද්ගලයා මෙරටට රැගෙන ඒම අධිකරණ නියෝගයක් මත අධිකරණ අමාත්‍යාංශය හරහා සිදු කළ යුතු බැවින් මීට අදාළ විමර්ශන කටයුතු කඩිනමින් සිදු කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස පොලිස් මූලස්ථානය වෙත දැනුම් දී ඇති බව විදේශ අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (දකුණු ආසියා සහ සාර්ක් අංශය) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2. වෙනත් කටයුතු**

**2.1 ප්‍රගති සමාලෝචන වාර්තා ඉදිරිපත් කිරීම**

**2.1.1** ස්පාඤ්ඤය සහ රුමේනියාව යන රටවල තානාපති කාර්යාල පිහිටුවීමට ද, මැඩගස්කරයෙහි කොන්සියුලර් ජනරාල් කාර්යාලයක් පිහිටුවීමට ද, ලිච්ටෙන්ස්ටයින් රට සමඟ රාජ්‍යතාන්ත්‍රික සබඳතා පවත්වා ගැනීමට ද අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දී ඇති බවත්,

**2.1.2** 2021 සිට 2023 දක්වා කාලසීමාව සඳහා "IORA" (Indian Ocean Rim Association) කවුන්සිලයෙහි උප සභාපති ධූරය සඳහා ශ්‍රී ලංකාව නම් කර ඇති බවත්,

**2.1.3** මහජනතාවගේ පහසුව සඳහා මහනුවර ගැටඹේ නගරයේ ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාලයක් පිහිටුවන ලද බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.2 තමිල්නාඩුවේ රාමේෂ්වරම් සහ තලෙයිමන්නාරම අතර තොටුපළ සේවාව - ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**

තමිල්නාඩුවේ රාමේෂ්වරම් සහ තලෙයිමන්නාරම අතර තොටුපළ සේවාවක් ආරම්භ කිරීමට රාජ්‍යතාන්ත්‍රික වශයෙන් ආරම්භ කළ සාකච්ඡාවල ප්‍රගතිය කවරේ ද යන්න සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් විමසීමක් කරන ලදී.

මේ සම්බන්ධයෙන් පරීක්ෂා කර වාර්තා කරන බවට ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.3 අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා නිලධරයකු පත් කිරීම - ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**

ගරු මන්ත්‍රීතුමන්ලාට කරුණු විමසීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධරයකු පත් කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

නිලධාරියෙකු පත්කර කඩිනමින් අවශ්‍ය තොරතුරු ලබා දීමට කටයුතු කරන බව අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.4 ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදා සාමාජිකයන් වෙනුවෙන් සන්නද්ධ හමුදා පනතක් සම්මත කර ගැනීම - ගරු චන්දිම වීරක්කොඩි මහතා**

ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදා සාමාජිකයන් මෙහෙයුම් කටයුතුවල නිරතවීම මත පැනනඟින අවාසි සහගත තත්වයන්ට යුක්තිය ඉටු කිරීම සඳහා, එක්සත් රාජධානියේ විදේශීය මෙහෙයුම් (සේවා පිරිස් සහ ප්‍රවීනයන්ගේ) පනත් කෙටුම්පතට (UK Overseas Operation Draft Bill) අනුරූපීව සන්නද්ධ හමුදා පනතක් සම්මත කර ගත යුතු බවට ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට යෝජනා කරන ලදී.

මෙම කාරණාව විදේශ අමාත්‍යාංශ විෂය පථයට අයත් නොවන බව කරුණු දක්වමින් ගරු රාජ්‍ය අමාත්‍ය තාරක බාලසූරිය මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.5 කොන්සියුලර් සේවාලාභීන්ට කාර්යක්ෂම සේවාවක් ලබා දීම - ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**

ස්වයංක්‍රීයව ක්‍රියාකළ කොන්සියුලර් කටයුතු අංශයේ එම ක්‍රමවේදය ඉවත් කිරීම නිසා සේවාලාභීන්ට දිගු වේලාවක් පෝළිම්වල රැඳී සිටීමට සිදුව ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අන්තර්ජාලය හරහා වේලාවන් වෙන්කර ගත් සේවාලාභින් මෙන්ම අනෙකුත් සේවාලාභින් යන සියලුම දෙනා එකවර කාර්යාලය තුළට පැමිණෙන බැවින් එවැනි තදබදයක් ඇතිවන බව කොන්සියුලර් කටයුතු අංශයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

ඒ අනුව, එම තදබදය අවම කිරීමේ අරමුණින් දිවයින පුරා ශාඛා පද්ධතියක් ඇති කිරීමට දැනටමත් පියවර ගෙන ඇති බවත්, ඒ අනුව කොළඹ ප්‍රදේශයෙන් බැහැරව දිවයිනේ අනෙකුත් ප්‍රදේශවල ශාඛාවන් කිහිපයක් දැනටමත් ස්ථාපිත කර ඇති අතර තවත් ශාඛාවන් කිහිපයක් ස්ථාපිත කිරීමට ද යෝජනා වී ඇති බව ඔහු විසින් තවදුරටත් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අංක හතරක කෙටි සංකේත දුරකථන අංකයක් හරහා සේවාලාභීන් මාර්ගගත ක්‍රමය ඔස්සේ වේලාවන් වෙන්කර ගැනීමට පෙළඹවීම තුළින් වඩා ඵලදායී කාර්යක්ෂම සේවාවක් ලබා දිය හැකි බව ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා විසින් කාරක සභාවට යෝජනා කරන ලදී.

**2.6 නව දිල්ලියේ පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය සඳහා මහ කොමසාරිස්වරයකු පත් කිරීම - ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**

නව දිල්ලියේ පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය සඳහා මහ කොමසාරිස්වරයකු පත් කිරීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මහ කොමසාරිස්වරයා රාජකාරී භාර ගැනීමට නියමිත බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.7 කොවිඩ් එන්නත ලබාගෙන මෙරටට පැමිණෙන විදේශිකයන්/ශ්‍රී ලාංකිකයන් දින 14 ක නිරෝධායනයෙන් නිදහස් කිරීම - ගරු චන්දිම වීරක්කොඩි මහතා**

කොවිඩ් 19 වෛරසය සම්බන්ධයෙන් නව සෞඛ්‍ය මාර්ගෝපදේශ සකස් කිරීමේ දී කොවිඩ් එන්නත ලබාගෙන මෙරටට පැමිණෙන විදේශිකයන්/ශ්‍රී ලාංකිකයන් දින 14 ක නිරෝධායන කාල සීමාවෙන් නිදහස් කිරීම සම්බන්ධයෙන් ද සලකා බලන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

මෙම ඉල්ලීම දැනටමත් ජනාධිපති කාර්ය සාධන බලකාය වෙත යොමු කර ඇති බව ගරු රාජ්‍ය අමාත්‍ය තාරක බාලසූරිය මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.8 විදේශීය තානාපති කාර්යාලවලට අනුයුක්තව සේවය කළ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ නිලධාරීන් ආපසු මෙරටට කැඳවීම- ගරු ඩිලාන් පෙරේරා මහතා**

විදේශීය තානාපති කාර්යාලවලට අනුයුක්තව සේවය කළ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිලධාරීන් හදිසියේම ආපසු මෙරටට කැඳවීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

කොවිඩ් 19 වෛරස ව්‍යාප්තියත් සමඟම මූල්‍ය ප්‍රතිපාදන ගැටලුවක් මත කැබිනට් පත්‍රිකාවක් හරහා එම නිලධාරීන් ආපසු මෙරටට කැඳවා ඇති බවත්, එසේ නමුත් විදේශීය තානාපති කාර්යාල සඳහා නිලධාරීන් බඳවා ගැනීමට බඳවා ගැනීමේ

පරිපාටියක් සකස් කර ක්‍රමවත් පරිදි සිදු කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සම්පාදනය කෙරෙමින් පවතින බවත් විදේශ අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් (මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.9 ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් රජය සහ විපක්ෂය එකඟතාවයකින් කටයුතු කිරීම සම්බන්ධයෙන් එකඟතාවයක් ගොඩ නැඟීම - ගරු ගාමිණී වලේබොඩ මහතා**

විදේශ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී රජය සහ විපක්ෂය යන දෙපාර්ශවයම එකඟතාවයකින් කටයුතු කිරීම අත්‍යාවශ්‍ය බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

විදේශියන්හිදී තම රටේ විදේශ ප්‍රතිපත්තිය විවේචනය කිරීම රටකට හානිදායක වන හෙයින් සෑම රටකම ආණ්ඩුව සහ විපක්ෂය යන දෙපාර්ශවයම විදේශ ප්‍රතිපත්තිය පිළිබඳ එකඟතාවයකින් කටයුතු කළ යුතු බවත්, එවැනි එකඟතාවයන් ඇති කර ගැනීමට අවශ්‍ය මූලික පියවරයන් ගනිමින් පවතින බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.** කාරක සභාව ප.ව 03.30 ට මාර්තු මස 24 වැනි දින දක්වා කල් තබන ලදී.

---

**අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සහ අධිකරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ ඒකාබද්ධ රැස්වීම - 2021 මාර්තු 10**

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

**අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා (සභාපති)
ගරු විජිත බේරුගොඩ මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා
ගරු අනුප පස්කුවල් මහතා
ගරු යදාමිණී ගුණවර්ධන මහතා
ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය

**අධිකරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

ගරු එම්.යූ.එම්. අලි සබ්‍රි මහතා (සභාපති)
ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා
ගරු සාගර කාරියවසම් මහතා

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු ලසන්ත අලගියවන්න මහතා
ගරු එස්. වියාලේන්ද්‍රන් මහතා

ගරු රවුෆ් හකීම් මහතා
ගරු කේ. කාදර් මස්තාන් මහතා
ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා
ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
ගරු වරුණ ලියනගේ මහතා
ගරු අමරකීර්ති අතුකෝරළ මහතා
ගරු කපිල අතුකෝරල මහතා
ගරු අකිල එල්ලාවල මහතා
ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා
ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය
ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා
ගරු එච්. නන්දසේන මහතා
ගරු අසංක නවරත්න මහතා
ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය
ගරු සුදත් මංජුල මහතා
ගරු මායාදුන්න චින්තක අමල් මහතා
ගරු අලි සබ්රි රහීම් මහතා
ගරු කුමාරසිරි රත්නායක මහතා
ගරු අජිත් රාජපක්ෂ මහතා
ගරු ගාමිණී වලේබොඩ මහතා
ගරු ඩී. වීරසිංහ මහතා
ගරු වීරසුමන වීරසිංහ මහතා
ගරු සමන්ප්‍රිය හේරත් මහතා
ගරු තවරාජා කලෛයි අරසන් මහතා
ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
ගරු මංජුලා දිසානායක මහත්මිය
ගරු ඩයනා ගමගේ මහත්මිය

**1. "ශ්‍රී ලංකාවේ නීතිය අධ්‍යාපන විෂයයක් වශයෙන් පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කිරීම" - ටිකිරි කේ. ජයතිලක මහතා, පාර්ලිමේන්තුවේ සහකාර මහ ලේකම්**

ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු කාරක සභා ක්‍රමයේ ආරම්භය සහ වර්තමානයට ගැළපෙන පරිදි මෙම කාරක සභා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් සහකාර මහ ලේකම් විසින් කාරක සභාවට පැහැදිලි කිරීමක් කරන ලදී.

කාරක සභා අවස්ථාවේදී ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා සාකච්ඡා කිරීමට අමතරව කාරක සභාව විසින් යම් රාජ්‍ය ප්‍රතිපත්තිමය කාරණා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම සිදු කළ යුතු බවද ඔහු විසින් වැඩිදුරටත් පැහැදිළි කරන ලදි. ඒ අනුව අදාළ අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ඇති යම්කිසි විෂයයක් සම්බන්ධයෙන් අවධානය යොමු කර එය වර්තමානයට ගැළපෙන ලෙස වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලිය සඳහා සුදුසුම ස්ථානය ලෙස මෙම කාරක සභාව යොදා හැකි බවද සහකාර මහ ලේකම් විසින් තම ඉදිරිපත් කිරීම තුළින් යෝජනා කරන ලදී.

මෙම ක්‍රියාවලියේ ආරම්භයක් ලෙස ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ සහ ගරු අධිකරණ අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි මෙම කාරක සභා රැස්වීම පැවැත්වීමේ අරමුණ සම්බන්ධයෙන් ඔහු විසින් කාරක සභාවට පැහැදිලි කරන ලදී.

**2. කාරක සභා රැස්වීමේ අරමුණ සහ අවශ්‍යතාවය පැහැදිලි කිරීම - ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා, අධිකරණ අමාත්‍යතුමා**

නීතිය පිළිබඳ යම් ප්‍රමාණාත්මක දැනුමක් පාසල් අධ්‍යාපනයට ඇතුළත් කිරීමේ දැඩි අවශ්‍යතාවය සම්බන්ධයෙන් ගරු අධිකරණ අමාත්‍යතුමා විසින් කාරක සභාවට පැහැදිලි කිරීමක් කරන ලදී.

2018 වර්ෂයේදී ද මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමේ කටයුතු ආරම්භ කර ඇති බවත් ඒ අනුව 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා වූ විෂය නිර්දේශයට නීතිය විෂයක් ලෙස ඇතුළත් කිරීමට තීරණය වී ඇති බවත් ගරු අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදි. එහිදී මූලික දැනුමක් ලබා දිය යුතු අංශ ලෙස මාර්ග නීති, ළමා ආරක්ෂාව පිළිබඳ නීති, මූලික අයිතිවාසිකම් පිළිබඳ නීති, පාරිසරික හා පොදු දේපළ පිළිබඳ නීති, මූලික දණ්ඩ නීති, මිනිස් ජාවාරම් සම්බන්ධ නීති, බාලවයස්කාර ලිංගික අපරාධ සම්බන්ධ නීති, වෘක්ෂලතා සහ වනජීවීන්ට අදාළ නීති හඳුනාගෙන ඇති බවද ගරු අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙවැනි ප්‍රතිපත්තිමය කාරණා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීම අදාළ අමාත්‍යතුමා සහ නිලධාරීන්ට සීමා නොවී ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ අදහස් සහ යෝජනාද සමඟින් සිදු කළ යුතු බවද ගරු අමාත්‍යතුමා විසින් යෝජනා කරන ලදී.

**3. කාරක සභා රැස්වීමේ අරමුණ සහ අවශ්‍යතාවය පැහැදිලි කිරීම - ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා, අධ්‍යාපන අමාත්‍යතුමා**

පාසල් විෂය නිර්දේශයට නීතිය විෂයක් ලෙස ඇතුළත් කිරීම සඳහා එකඟතාවයකට එළඹ ඇති බැවින් මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු ක්‍රමවේදය සම්බන්ධයෙන් තීරණය කළ යුතු බව ගරු අධ්‍යාපන අමාත්‍යතුමා සහ ගරු අධිකරණ අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඒ අනුව කාරක සභාව විසින් "ශ්‍රී ලංකාවේ නීතිය විෂයක් ලෙස පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කිරීම" සඳහා වන අනු කාරක සභාවක් පත් කරන ලදී.

**4. ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස්, යෝජනා සහ ඉදිරි මාවත පිළිබඳ සාකච්ඡාව**

**4.1. ඉදිරි මාවත පිළිබඳ සාකච්ඡාව**

"ශ්‍රී ලංකාවේ නීතිය විෂයක් ලෙස පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කිරීම" සඳහා වන අනු කාරක සභාවේ සාමාජිකයන් ලෙස අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා, ගරු රවුෆ් හකීම් මහතා, ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා, ගරු අමරකීර්ති අතුකෝරළ මහතා, ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා, ගරු වීරසුමන වීරසිංහ මහතා, ගරු සාගර කාරියවසම් මහතා, ගරු ඩයනා ගමගේ මහත්මිය පත් කරන ලදි.

එමෙන්ම මෙම අනු කාරක සභාවේ ලේකම් ලෙස පාර්ලිමේන්තුවේ සහකාර මහ ලේකම්, ටිකිරි කේ. ජයතිලක මහතා පත් කරන ලදි. තවද අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සහ අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් මෙම අනු කාරක සභාවේ කටයුතු සඳහා සම්බන්ධ කර ගන්නා ලෙස කාරක සභාව විසින් උපදෙස් ලබා දෙන ලදී.

මෙම අනු කාරක සභාවේ වාර්තාව මාස දෙකක කාලයක් තුළ ඉදිරිපත් කිරීමට සහ ඉන් අනතුරුව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා විද්වත් විශේෂඥ කමිටුවක් පත් කිරීම සඳහාද කාරක සභාව එකඟ විය.

මීට පෙර මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී ඉදිරිපත් වී ඇති ලේඛන ගරු සාමාජික මන්ත්‍රීවරුන්ට ලබා දීමට කටයුතු කරන බව ගරු අධිකරණ අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

## 4.2. ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් සහ යෝජනා

### 4.2.1. ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය

දැනටමත් පුරවැසි අධ්‍යයනය ලෙස විෂයක් පාසල් විෂය නිර්දේශයේ ඇතුළත් වී ඇති බැවින් මෙම නව ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේදී ප්‍රායෝගික ලෙස සිසුන්ට නීතිය ඉගැන්වීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමිය විසින් දැනුම් දෙන ලදී.

### 4.2.2. පෞද්ගලික පාසල් සඳහා මෙම ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම - ගරු ඩයනා ගමගේ මහත්මිය

නීතිය පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කිරීමේ ක්‍රියාවලිය පෞද්ගලික පාසල් සඳහා ද හඳුන්වා දීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමිය විසින් විමසීමක් කරන ලදී.

මේ සඳහා කිසිදු බාධාවක් නොමැති බව ගරු අධ්‍යාපන අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම අවස්ථාවේදී දිනට අදාළ න්‍යාය පත්‍රයේ ඉතිරි කටයුතු ගරු අධ්‍යාපන අමාත්‍යතුමාට සිදු කිරීමට ඉඩ සැලැස්වීම සඳහා ගරු අධිකරණ අමාත්‍යතුමා සහ එම අමාත්‍යාංශයේ නිලධාරීන් රැස්වීමෙන් ඉවත් වන ලදී.

## 5. වාර්ෂික වාර්තා සලකා බැලීම

පාර්ලිමේන්තුව විසින් කාරක සභාව වෙත යොමු කරන ලද පහත සඳහන් වාර්ෂික වාර්තා සලකා බැලීමෙන් අනතුරුව එම වාර්ෂික වාර්තාවලට කාරක සභාව එකඟ වූ අතර ඒ පිළිබඳව කාරක සභාවේ වාර්තාව, කාරක සභාවේ සභාපති ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා විසින් 2021 අප්‍රේල් මස 08 වැනි දින පාර්ලිමේන්තුවට පිළිගැන්විය යුතු යයි ද තීරණය කරන ලදී.

**5.1** 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්

**5.2** 2018 වර්ෂය සඳහා කැළණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්

**5.3** 2018 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්

**5.4** 2018 වර්ෂය සඳහා මොරටුව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්

**5.5** 2018 වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්

**5.6** 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්

**5.7** 2018 වර්ෂය සඳහා කැළණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්

**5.8** 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්

**5.9** 2018 වර්ෂය සඳහා කැළණිය විශ්වවිද්‍යාලයේ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යාතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්

**5.10** 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්

**5.11** 2018 වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්

**5.12** 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්

**5.13** 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්

**5.14** 2018 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛව රසායන, අණුක ජෛවවේදී හා ජෛව තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්

**5.15** 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ස්වාමි විපුලානන්ද සෞන්දර්ය ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්

**5.16** 2018 වර්ෂය සඳහා යාපනය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්

**5.17** 2019 වර්ෂය සඳහා රුහුණු විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්

**5.18** 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්

**5.19** 2019 වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්

**5.20** 2019 වර්ෂය සඳහා වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්

**5.21** 2018 වර්ෂය සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්

**5.22** 2018 වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම්

**5.23** 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව

**5.24** 2019 වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව

**5.25** 2019 වර්ෂය සඳහා මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනයේ වාර්ෂික වාර්තාව හා වාර්ෂික ගිණුම්

**5.26** 2019 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ වාර්ෂික වාර්තාව

## 6. 2020.11.28 දින පැවති රැස්වීමේ කාර්ය සටහන්වලින් පැන නගින කරුණු

### 6.1. වැඩ බලන විදුහල්පතිවරුන්ගේ ගැටළුව - ගරු ලසන්ත අලගියවන්න මහතා (2020.11.28 දිනැති කාර්යය සටහනේ අයිතම අංක 4.1.2)

මේ සම්බන්ධ වර්තමාන තත්ත්වය පිළිබඳ ගරු කුමාරසිරි රත්නායක මහතා විසින් විමසීමක් කරන ලදී.

මේ සම්බන්ධයෙන් ලැබෙන අමාත්‍ය මණ්ඩල තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් පසු එම කොමිෂන් සභාව විසින් ලබා දෙන තීරණය අනුව කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

2012.08.08 වන දින අධිසේවක පදනම මත විදුහල්පතිවරුන් බඳවා ගැනීමේදී සිදුවූ විෂමතාවය සම්බන්ධයෙන් සාධාරණයක් ඉටු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව ගරු එච්. නන්දසේන මහතා විසින් විමසීමක් කරන ලදී.

මෙහිදී ඇතිව තිබෙන ගැටළුකාරී තත්ත්වය සම්බන්ධයෙන් අදාළ සියලු පාර්ශව සමඟ සාකච්ඡා කර අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලෙස ගරු අධ්‍යාපන අමාත්‍යතුමා විසින් ලබා දී ඇති උපදෙස් අනුව කටයුතු කරන බව අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

**6.2. ගුරු උපදේශක සේවය ස්ථාපිත කිරීම - ගරු ලසන්ත අලගියවන්න මහතා (2020.11.28 දිනැති කාර්යය සටහනේ අයිතම අංක 4.1.3)**

ගුරු උපදේශකවරුන් අන්තර්ග්‍රහණය කිරීම සම්බන්ධයෙන් එක් එක් පළාත් සභාවල සේවයේ නියුතු ගුරු උපදේශකවරුන්ගේ පෞද්ගලික ලිපිගොනු අතරින් බස්නාහිර, සබරගමුව, දකුණ හා උතුරුමැද පළාත්වල ලිපිගොනු ඉදිරිපත් කර ඇති බවත් ඒවා පරීක්ෂා කිරීමේ කටයුතු කරමින් සිටින බවත් අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ආයතන) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**6.3. 2020 වසර සඳහා සිසුන් බඳවා ගැනීමේදී විශ්ව විද්‍යාල ප්‍රවේශයේ මතුවී තිබෙන ගැටළු - ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය (2020.11.28 දිනැති කාර්යය සටහනේ අයිතම අංක 4.4.1)**

මෙම ගැටළුව සම්බන්ධයෙන් අභියාචනාධිකරණයේ නඩුවක් විභාග වන බවත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් එම නඩු තීන්දුවට අනුකූලව ක්‍රියා කළ යුතු බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ඉහත තත්ත්වය තුළ අදාළ විශ්ව විද්‍යාලවල උපකුලපතිවරු සහ අදාළ පීඨවල පීඨාධිපතිවරු සමඟ තමා සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති සාකච්ඡා කළ බවත් එහි ප්‍රතිඵලයක් ලෙස මෙම ගැටළුව හේතුවෙන්ම වැඩිපුර 540 ක ශිෂ්‍ය සංඛ්‍යාවක් විශ්ව විද්‍යාලවලට ඇතුළත් කර ගැනීමට ඔවුන් එකඟ වූ බවත් ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මෙම සංඛ්‍යාව වෛද්‍ය විද්‍යාව සඳහා 110 ක් ද දන්ත ශල්‍ය විද්‍යාව සඳහා 30 ක්ද ඉංජිනේරු විද්‍යාව සඳහා 100 ක්ද විද්‍යා විෂයන් ආශ්‍රිතව පවත්වනු ලබන පාඨමාලා සඳහා 150 ක්ද කළමනාකරණය සඳහා 150 ක්ද ලෙස වන බව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

විශ්ව විද්‍යාල සඳහා සිසුන් තෝරා ගැනීමේ පවතින ජාතික ක්‍රමවේදය වෙනස් කිරීමේ හැකියාවක් නොමැති බව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

විශ්ව විද්‍යාල ප්‍රවේශය ලැබීමේදී අසාධාරණයට පත්වූ සිසුන් සඳහා රජයේ වියදමින් රජයේ නොවන විශ්ව විද්‍යාලවල පහසුකම් ලබා දීමට හැකි මාර්ග සම්බන්ධයෙන් අධ්‍යයනය කරන බව අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

ඉදිරියේදී අ.පො.ස. (උ.පෙළ) විභාගය එක් විෂයක් සඳහා ප්‍රශ්න පත්‍ර දෙකක් යටතේ නොපැවැත්වීමට විභාග දෙපාර්තමේන්තුව තීරණය කර ඇති බව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

විශ්ව විද්‍යාල ප්‍රවේශය සම්බන්ධයෙන් ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් ඇති නොවීම සම්බන්ධයෙන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට තම අදහස් හා යෝජනා සම්බන්ධයෙන් සාකච්ඡා කර වාර්තා කිරීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත කමිටුවක් පත් කරන ලෙස ගරු යදාමිණී ගුණවර්ධන මහතා විසින් ඉල්ලීමක් කරන ලදි. මේ සඳහා ගරු සභාපතිතුමා විසින් එකඟතාවය පළ කරන ලදී.

පළමුවරට විශ්ව විද්‍යාල පද්ධතිය තුළ අධ්‍යයන තනතුරු 500 ක් අනුමත කර එම තනතුරු මෙන්ම අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරුද සම්පූර්ණ කිරීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් ලබා ගෙන ඇති බවද ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**6.4. වයඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධව කුලියාපිටියේ මහාචාර්ය ඒකකයක් පිහිටුවීම - ගරු සමන්ප්‍රිය හේරත් මහතා**
**(2020.11.28 දිනැති කාර්යය සටහනේ අයිතම අංක 4.7)**

කුලියාපිටිය රෝහල මේ වනවිට ශික්ෂණ රෝහලක් ලෙස පත්කර ඇති බවත් ඒ ආශ්‍රිතව මෙම රෝහලේ වැඩිදියුණු කිරීමේ කටයුතු සිදු කර මහාචාර්ය ඒකකයක් පිහිටුවීමට අවශ්‍ය පියවර ගන්නා බවත් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

**6.5. පාසැල් වල ස්වේච්ඡා ගුරුවරු ස්ථිර කිරීම - ගරු අනුප පස්කුවල් මහතා**
**(2020.11.28 දිනැති කාර්යය සටහනේ අයිතම අංක 4.10)**

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දීර්ඝ කාලයක් ගුරුවරුන් ලෙස දුෂ්කර පළාත්වල පාසල්වල කටයුතු කරමින් සිටින බැවින් ඔවුන් ගුරු සේවයට බඳවා ගන්නා ලෙස ගරු එච්. නන්දසේන, ගරු කේ.පී.එස්. කුමාරසිරි සහ ගරු කපිල අතුකෝරළ යන මහත්වරුන් විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙහිදී අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් ඇත්නම් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟතාවය මත ස්වේච්ඡා ගුරුවරු ලෙස සේවය කරන අය අතරින් එක් එක් කාණ්ඩය පියවරෙන් පියවර ගුරු සේවයට බඳවා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට හැකි බව අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

**6.6. මුලතිව් ජාතික පාසලේ විදුහල්පතිවරයාගේ ස්ථාන මාරුව - ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
**(2020.11.28 දිනැති කාර්යය සටහනේ අයිතම අංක 4.11)**

මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව ඩබ්.එම්.එන්.ජේ. පුෂ්ප කුමාර මහතා, අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා ආයතන) විසින් දැනුම් දෙන ලදී.

**7. ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා**

**7.1 අංක 3, 4 වෙනි පටුමග, රිච්මන්ඩ් කන්ද පාර, ගාල්ල ලිපිනයේ පදිංචි ඒ.එම්.ඒ. මහීෂා නුවන්ගී සුමනදාස මහත්මියගේ දරුවා ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කර නොගැනීම**
ගරු චන්දිම වීරක්කොඩි මහතා (යෝජනා අංක 20)

**7.2 පොල්ගස්ඕවිට, කිරිගම්පමුණුව පදිංචි ඩී.එම්. රෝහිත කුමාර මහතා විසින් අධ්‍යාපන පරිපාලන සේවය නොලැබීම සම්බන්ධයෙන් කළ ඉල්ලීම**
ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (යෝජනා අංක 32)

**7.3 ගෝනාපිනුවල, වඩුදූව යන ලිපිනයේ පදිංචි ඩබ්ලිව්.ජී. සාම්‍යා මහත්මිය විසින් තම දරුවා ගා/රිච්මන්ඩ් විද්‍යාලයේ පළමු වසරට ඇතුළත් කර ගන්නා ලෙස කළ ඉල්ලීම**
ගරු චන්දිම වීරක්කොඩි මහතා (යෝජනා අංක 37)

**7.4 අලව්ව ජාතික පාසලේ ශ්‍රවණාගාරය සඳහා අවශ්‍ය උපකරණ ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කළ ඉල්ලීම**
ගරු ශාන්ත බණ්ඩාර මහතා (යෝජනා අංක 51)

**7.5 නාරම්මල මයුරපාද ජාතික පාසලට ශ්‍රවණාගාරයක් ඉදි කර දීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කළ ඉල්ලීම**
ගරු ශාන්ත බණ්ඩාර මහතා (යෝජනා අංක 52)

**7.6 බාහිර උපාධිය ලබා දීම පිළිබඳ ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කර එය නැවත ක්‍රියාත්මක කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කළ ඉල්ලීම**
ගරු ශාන්ත බණ්ඩාර මහතා (යෝජනා අංක 53)

**7.7 නව අධ්‍යාපන ක්‍රමයක් සකස් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කළ ඉල්ලීම**
ගරු ශාන්ත බණ්ඩාර මහතා (යෝජනා අංක 54)

**7.8 මහපොළ ශිෂ්‍යාධාර මුදල වැඩි කිරීමටත්, ක්‍රමවත් කිරීමටත් කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කළ ඉල්ලීම**
ගරු ශාන්ත බණ්ඩාර මහතා (යෝජනා අංක 55)

**7.9 නක්කාවත්ත මහින්ද ජාතික පාසලේ ශ්‍රවණාගාරයට උපකරණ ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කළ ඉල්ලීම**
ගරු ශාන්ත බණ්ඩාර මහතා (යෝජනා අංක 56)

**7.10 බෙන්තොට, අඩගංතොට, රන්දාගොඩ පන්සල පාර යන ලිපිනයේ පදිංචි එච්. එන්. ශ්‍රී රංගික මහතා විසින් තම දරුවන් දෙදෙනා ගා/ගාමිණී ජාතික පාසැලේ 3 හා 9 වසරවලට ඇතුළත් කිරීමට සිදුකරන අභියාචනය**
ගරු චන්දිම වීරක්කොඩි මහතා (යෝජනා අංක 65)

**7.11 මතුගම, යටදොළවත්ත යන ලිපිනයේ පදිංචි පළාත් රාජ්‍ය සේවයේ ඉංග්‍රීසි උපගුරුවරියක වන එස්. ටී. නයනා ලුම්බිණී මහත්මිය විසින් ජාතික පාසැලකට ස්ථාන මාරුවක් ඉල්ලා ඉදිරිපත් කළ ඉල්ලීම**
ගරු චන්දිම වීරක්කොඩි මහතා (යෝජනා අංක 66)

**7.12 පිටබැද්දර, ගොරකවෙල, මාර/ශ්‍රී විපුලසාර පිරිවෙන වෙනුවෙන් වෙන් වූ රුපියල් මිලියන 15 ක ප්‍රතිපාදන නැවත ලබා දෙන ලෙස එහි පරිවේණාධිපති පූජ්‍ය සියඹලාගොඩ සුමනසාර ස්වාමීන්වහන්සේගේ ඉල්ලීම**
ගරු බුද්ධික පතිරණ මහතා (යෝජනා අංක 80)

**7.13 ගුරු උපදේශක සේවය ස්ථාපිත කිරීමේ කටයුතු අවසන් කිරීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කරන ලද ඉල්ලීම**
ගරු ලසන්ත අලගියවන්න මහතා (යෝජනා අංක 96)

**7.14 වැඩ බලන විදුහල්පතිවරුන්ගේ ගැටලුව සඳහා ඉදිරිපත් කිරීමට තීරණය වූ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කරන ලද ඉල්ලීම**
ගරු ලසන්ත අලගියවන්න මහතා (යෝජනා අංක 97)

**7.15 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙල පිළිබඳ විමසමින් ගරු මන්ත්‍රීතුමා විසින් කරන ලද ඉල්ලීම**
ගරු ලසන්ත අලගියවන්න මහතා (යෝජනා අංක 99)

**7.16 පාසල් සඳහා ළමුන් ඇතුළත් කිරීමේ චක්‍රලේඛයේ සඳහන් කරුණු පිළිබඳ විමසමින් ගරු මන්ත්‍රීතුමා විසින් කරන ලද ඉල්ලීම**
ගරු ලසන්ත අලගියවන්න මහතා (යෝජනා අංක 100)

**7.17 නිට්ටඹුව සංඝබෝධි විද්‍යාලය සහ හේනෙගම මධ්‍ය විද්‍යාලය සඳහා මානව සම්පත් සහ භෞතික සම්පත් ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කරන ලද ඉල්ලීම**
ගරු ලසන්ත අලගියවන්න මහතා (යෝජනා අංක 101)

මෙම යෝජනා සඳහා වන පිළිතුරු වාර්තා එම යෝජනා ඉදිරිපත් කර ඇති ගරු මන්ත්‍රීවරුන් වෙත යොමු කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**8. වෙනත් කටයුතු**

**8.1 සිසුන් සංඛ්‍යාව අඩු පාසල් සම්බන්ධයෙන් ගනු ලබන තීරණය - ගරු යදාමිණී ගුණවර්ධන මහතා**

මේ වනවිට සිසුන් 50 ට වඩා අඩුවෙන් ඉගෙනුම ලබන පාසල් අතරින් එක් පාසලක් හෝ වසා දැමීමේ තීරණයක් ඉදිරියේදී නොගැනීම සම්බන්ධයෙන් තහවුරු කිරීමේ හැකියාව පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

සිසුන් සංඛ්‍යාව අඩු වීම හේතුකොටගෙන කිසිදු පාසලක් වැසීමේ තීරණයක් ගෙන නොමැති බව අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදි. එමෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පාසල්වලට අවශ්‍ය භෞතික සම්පත් සහ මානව සම්පත් ලබා දීමට කටයුතු කරන බවත් ඔහු විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

**8.2 ගුරුවරුන් බඳවා ගැනීම සඳහා තරඟ විභාග පැවැත්වීම - ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය**

බස්නාහිර පළාත් සභාව තුළ 2017/2018 වර්ෂවල ගුරුවරුන් බඳවා ගැනීම සඳහා පැවති තරඟ විභාගයේ ප්‍රතිඵලවල වලංගුතාවය මෙම වසරේ ජනවාරි මස වනවිට අවසන් බවට දැනුම් දී ඇති බව ගරු මන්ත්‍රීතුමිය විසින් දැනුම් දෙන ලදී.

තරඟ විභාගයක් පැවැත්වීම සඳහා විශාල වියදමක් දරන බැවින් සමත් ලකුණු මට්ටම ඇති සියලු අපේක්ෂකයන් බඳවා ගැනීමෙන් පසු පමණක් නැවත ඇතිවන පුරප්පාඩු සඳහා අලුතින් විභාගයක් පැවත්වීමට කටයුතු කිරීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමිය විසින් යෝජනා කරන ලදී.

අමාත්‍යාංශයේ ලේකම්ගේ ඉල්ලීම අනුව ඉදිරි අධ්‍යාපන අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා රැස්වීම් සඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු 9 දෙනා සහ පළාත් අධ්‍යාපන ලේකම්වරු 9 දෙනා කැඳවීමට ගරු සභාපතිතුමා විසින් අවසර ලබා දෙන ලදි. ගරු යදාමිණී ගුණවර්ධන මහතාගේ ඉල්ලීම පරිදි අවශ්‍යතාවය අනුව ගරු ආණ්ඩුකාරවරුන්ද මෙම කාරක සභා රැස්වීම්වලට කැඳවිය හැකි බවද ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**8.3 පිරිවෙන් අධ්‍යාපනය ලැබූ ස්වාමීන් වහන්සේලාට පාසල්වලට ගුරු පත්වීම් ලබා දීම - ගරු මායාදුන්න චින්තක අමල් මහතා**

මේ තුළින් පිරිවෙන් අධ්‍යාපනය පිරිහීමකට ලක්වන බැවින් පිරිවෙන් අධ්‍යාපනය ලැබූ ස්වාමීන් වහන්සේලාට පාසල් හෝ වෙනත් රාජ්‍ය ආයතනයක කටයුතු කිරීමට කිසිදු අවස්ථාවක් ලබා නොදෙන බව රාජ්‍ය අමාත්‍ය, ගරු විජිත බේරුගොඩ මහතා විසින් දැනුම් දෙන ලදී.

**8.4 ගුරු පුරප්පාඩු පිරවීම - ගරු අමරකීර්ති අතුකෝරළ මහතා**

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දෙමළ සහ මුස්ලිම් පාසල්වල ගුරු හිඟයක් ඇති බැවින් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

රිදීගම කොට්ඨාශයේ ඉබ්බාගමුව අධ්‍යාපන කලාපය තුළ ගුරු පුරප්පාඩු විශාල ප්‍රමාණයක් ඇති නමුත් මෙම වසර තුළ එක් විද්‍යා පීඨ පත්වීමක් හෝ ලැබී නොමැති බව ගරු මංජුලා දිසානායක මහත්මිය විසින් දැනුම් දෙන ලදී.

ගුරු පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් ඉතා ඉක්මණින් කටයුතු කරන බව අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

එමෙන්ම පත්වීම් ලබා දෙන ගුරුවරුන්ට වසර 8ක් ගතවන තෙක් ස්ථාන මාරුවක් ලබා නොදීමට කටයුතු කරන බැවින් එය ක්‍රියාත්මක කිරීම සඳහා සහයෝගය ලබා දෙන ලෙස අමාත්‍යාංශයේ ලේකම් විසින් ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලීමක් කරන ලදී.

තවද එක් එක් පළාත් තුළ ජාතික පාසල්වල, පළාත් සභා පාසල්වල සහ අන්තර් පළාත් පාසල්වල අතිරික්ත හා ඌණතා තුලනය කර ගැනීම සඳහා මැදිහත් වන ලෙසත් අමාත්‍යාංශයේ ලේකම් විසින් ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලීමක් කරන ලදී.

### 8.5 ගුරු සේවයට බඳවා ගන්නා ඩිප්ලෝමාධාරීන්ගේ වයස් සීමාව වැඩි කිරීම - ගරු කපිල අතුකෝරල මහතා

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ නැවතී සේවයේ නියුතු වෙනත් දිස්ත්‍රික්කවල ගුරුවරුන්ට ඇති අඩු පහසුකම් හේතුවෙන් ඔවුන් ස්ථානමාරු ලබා ගැනීමට කටයුතු කරන බවත් මෙය සාධාරණ තත්ත්වයක් බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මීට විසඳුමක් ලෙස මෙම දිස්ත්‍රික්කය තුළින්ම ඩිප්ලෝමාධාරීන් ගුරු සේවයට බඳවා ගැනීම සඳහා ගුරු සේවයට බඳවා ගැනීමේ ඩිප්ලෝමාධාරීන්ගේ වයස් සීමාව අවුරුදු 35 සිට 40 දක්වා වැඩි කිරීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

පොදු ප්‍රතිපත්තියක් ලෙස නොව මෙවැනි විශේෂ තත්ත්වයන් සඳහා පමණක් අදාළ වන ලෙස ගුරු සේවයට බඳවා ගන්නා ඩිප්ලෝමාධාරීන්ගේ වයස් සීමාව අවුරුදු 40 දක්වා වැඩි කිරීමට ගරු සභාපතිතුමා විසින් තම එකඟතාවය පළ කරන ලදී.

ඒ අනුව මේ සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගෙන කටයුතු කරන බව අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

### 8.6 විදුහල්පති තනතුරු පුරප්පාඩු සහ එම පුරප්පාඩු පිරවීම

පුරප්පාඩු වී ඇති විදුහල්පති තනතුරු ඇති පාසල් ලෙස ගරු එච්. නන්දසේන මහතා විසින් මැදවච්චිය මෛත්‍රීපාල සේනානායක ජාතික පාසලද, ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය විසින් රත්නපුර දිස්ත්‍රික්කයේ රක්වාන මැතිවරණ කොට්ඨාශයේ ගොඩකවෙල රාහුල ජාතික පාසලද, ගරු කුමාරසිරි රත්නායක මහතා විසින් මොණරාගල රාජකීය ජාතික පාසලද, ගරු අමරකීර්ති අතුකෝරළ මහතා විසින් හිඟුරක්ගොඩ ආනන්ද බාලිකා ජාතික පාසලද සඳහන් කරන ලදී.

ඒ අනුව මෙම පාසල් සඳහා සුදුසු විදුහල්පතිවරුන් පත් කරන ලෙස ඔවුන් විසින් ඉල්ලීමක් කරන ලදී.

එමෙන්ම මීරිගම ඩී.එස්.සේනානායක පාසලෙහි විදුහල්පතිවරයා මාස කිහිපයකින් විශ්‍රාම යාමට නියමිත බැවින් එහි ඇතිවන පුරප්පාඩුව පිරවීම සම්බන්ධයෙන් කටයුතු කරන ලෙස ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය විසින් ඉල්ලීමක් කරන ලදී.

තවද නක්කාවත්ත ජාතික පාසලෙහි විදුහල්පති ලෙස දැනට සේවය කරන විදුහල්පතිවරයාට ඉදිරියටත් එම පාසලෙහි සේවය කිරීමට අවස්ථාව ලබා දෙන ලෙස ගරු සමන්ප්‍රිය හේරත් මහතා විසින් ඉල්ලීමක් කරන ලදී.

විදුහල්පති තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණ කටයුතු සිදු කර ඇති බවත් ඇතැම් පාසල් සඳහා අප්‍රේල් මස මුල් කාලයේදී පත්වීම් ලබා දීමට කටයුතු කරන බවත් ඩබ්.එම්.එන්.ජේ. පුෂ්ප කුමාර මහතා, අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා ආයතන) විසින් දැනුම් දෙන ලදී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අදාළ පත්වීම් ලබා දෙන බවත් එම පත්වීම් පිළිගැනීමට සිදු වන බවත් අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදි. නමුත් යම් පාසලක පුරප්පාඩු වී ඇති විදුහල්පති තනතුරක් සඳහා වැඩ ආවරණය කිරීමට සුදුසු අයෙක් නම් කරන්නේ නම් ඒ සඳහා ඉල්ලීමක් කරන ලෙස එම විදුහල්පතිවරයාට දැනුම් දෙන ලෙස ඔහු විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

විදුහල්පති පුරප්පාඩු වීම ආසන්න වන විට ඊට මාසයකට පෙර හෝ එම පුරප්පාඩුව සඳහා අලුතින් විදුහල්පතිවරයෙක් පත් කර විදුහලට අනුයුක්ත කිරීම තුළින් බොහෝ ගැටළු මගහරවා ගත හැකි බව ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා විසින් දැනුම් දෙන ලදි.

මේ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව දැනුවත් කර ඇති බව අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

### 8.7 මණ්ඩප ලෙස ක්‍රියාත්මක වන ආයතන විශ්ව විද්‍යාල බවට පත් කිරීම – ගරු කපිල අතුකෝරල මහතා

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පවත්වාගෙන යන මණ්ඩපය විශ්ව විද්‍යාලයක් ලෙස පත් කිරීමට අවශ්‍ය පහසුකම් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙහි පීඨ දෙකක් පමණක් ක්‍රියාත්මක වන බැවින් එය විශ්ව විද්‍යාලයක් බවට පත් කිරීම සම්බන්ධයෙන් දෙවනුව අවධානය යොමු කළ හැකි බවත් ඔහු විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

වවුනියාව දිස්ත්‍රික්කයේ වසර 25 ක් පවත්වාගෙන යන මණ්ඩපය විශ්ව විද්‍යාලයක් බවට පත් කිරීමේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් ගරු යදාමිණී ගුණවර්ධන මහතා විසින් දැනුම් දෙන ලදී.

වවුනියාව දිස්ත්‍රික්කයේ මණ්ඩපය යාපනය විශ්ව විද්‍යාලයෙන් වෙන් කර වෙනම විශ්ව විද්‍යාලයක් බවට පත් කිරීමේ සියලු කටයුතු සිදු කර අවසන් බව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

එමෙන්ම බුත්තල මණ්ඩපය තුළ විශ්ව විද්‍යාලයකට අවශ්‍ය සියලු පහසුකම් තිබූ බැවින් එය විශ්ව විද්‍යාලයක් බවට පත් කිරීමට කටයුතු කරන ලෙස ගරු යදාමිණී ගුණවර්ධන සහ ගරු කුමාරසිරි රත්නායක යන මහත්වරුන් විසින් ඉල්ලීමක් කරන ලදි.

## 8.8 කුරුණෑගල විවෘත විශ්ව විද්‍යාලයේ මණ්ඩපය සඳහා ඉඩපහසුකම් ලබා ගැනීම – ගරු අසංක නවරත්න මහතා

කුරුණෑගල විවෘත විශ්ව විද්‍යාලයේ මණ්ඩපය සඳහා ඉඩපහසුකම් ප්‍රමාණවත් නොවන බවත් වී අලෙවි මණ්ඩලයේ ඉඩමක් ඒ සඳහා ලබා ගැනීම සම්බන්ධයෙන් එකඟතාවයකට එළඹ ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

## 8.9 විශ්ව විද්‍යාලවල අවසන් වසර විභාග පමණක් පැවැත්වීම සහ වෙනත් කරුණු - ගරු ගාමිණී වලේබොඩ මහතා

### 8.9.1 විශ්ව විද්‍යාලවල අවසන් වසර විභාග පමණක් පැවැත්වීම

මේ වනවිට සියලුම විශ්ව විද්‍යාලවල අවසන් වසර විභාග පමණක් පැවැත්වෙන බවත් ඒ හේතුවෙන් අවසන් වසරේ සිසුන් අතරින් පළමු, දෙවන හා තෙවන වසරවල ඇතැම් විෂයන් අසමත් වීම මත නැවත ඒ සඳහා පෙනී සිටීමට සිදුව ඇති සිසුන්ට එම විෂයන්ට පෙනී සිටීමට අවස්ථාවක් නොලැබෙන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදි. ඒ හේතුවෙන් ඔවුන්ට උපාධිධාරීන් ලෙස විශ්ව විද්‍යාලයෙන් පිටවීමේ ප්‍රමාදයක් සිදුවන බවද ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

### 8.9.2 ශිෂ්‍යත්ව විභාගය සමත් සිසුන් සඳහා ආසන්න පදනම මත ජාතික පාසලකට ඇතුළත් කර ගැනීම

5 වසර ශිෂ්‍යත්ව විභාගයේ සමත් ලකුණු මට්ටම සහ ජාතික පාසලකට ඇතුළත් වීම සඳහා වන කඩඉම් ලකුණු මට්ටම අතර සිටින සිසුන් වෙනුවෙන් ආසන්න පදනම මත ජාතික පාසලකට ඇතුළත් කර ගැනීම සඳහා යම්කිසි ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 8.9.3 කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ ජාත්‍යන්තර පාසල් විසින් සම්පූර්ණ ගාස්තු මුදල් අය කිරීම

කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ පසුගිය කාලයේදී බොහෝ ජාත්‍යන්තර පාසල් ක්‍රියාත්මක නොවූ නමුත් සිසුන් වෙනුවෙන් සම්පූර්ණ ගාස්තු මුදල් අය කර ගන්නා බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදි.

## 8.10 පෝෂිත පාසල්වල සිසුන් ආසන්න ද්වීතික පාසලට ඇතුළත් කර නොගැනීම - ගරු සමන්ප්‍රිය හේරත් මහතා

පෝෂිත ප්‍රාථමික පාසල්වල සිසුන් අතරින් ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් සිසුන් පමණක් ආසන්න ද්වීතික පාසලට ඇතුළත් කර ගන්නා නමුත් අසමත් සිසුන් එම පාසලට ඇතුළත් කර නොගැනීම තුළින් එම සිසුන්ට අසාධාරණයක් සිදු වන බව ගරු සමන්ප්‍රිය හේරත් මහතා මහතා විසින් දැනුම් දෙන ලදී.

මෙම ගැටළුකාරී තත්ත්වය සඳහා සමාලෝචන කමිටුවක් මඟින් හෝ විසඳුමක් ලබා ගත යුතු බව එල්.එම්.ඩී. ධර්මසේන මහතා, අතිරේක ලේකම් (පාසල් කටයුතු) විසින් දැනුම් දෙන ලදී.

## 8.11 ජාතික පාසල් ඇති කිරීම - ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ජාතික පාසල් ඇති කිරීමේ පළමු අදියර ලෙස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 123 ක ජාතික පාසල් ඇති කිරීමට ගත් තීරණය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා විසින් විමසීමක් කරන ලදී.

පළමු අදියර ලෙස මෙම තීරණය හොඳින් ක්‍රියාත්මක වන බව අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

දෙවන අදියර යටතේ අලුතින් ඇති කිරීමට තීරණය කර ඇති ජාතික පාසල් 673 සඳහා තවත් පාසල් සංඛ්‍යාවක් ඇතුළත් කිරීමට ඉල්ලීම් කරන බව අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදි. එබැවින් අලුතින් ඇති කළ යුතු ජාතික පාසල් හඳුනාගැනීමේදී ප්‍රාදේශීය සංවර්ධන කමිටුවලදී එකඟතාවයකට පැමිණ තීරණය කරන ලෙස සියලුම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන්ට දැනුම් දුන් බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ඒ අනුව අදාළ සියලු පාර්ශව සමඟ සාකච්ඡා කළ බවත් එහිදී ගරු චන්න ජයසුමන මහතා විසින් හොරොව්පතාන කොට්ඨාශය සඳහා පඬරුල්ලෑව විද්‍යාලය සහ කපුගොල්ලෑව විද්‍යාලය ජාතික පාසල් ලෙස පත් කරන ලෙස ඉල්ලීම් කළ බව ගරු එච්. නන්දසේන මහතා විසින් දැනුම් දෙන ලදී.

ජාතික පාසල් 123 ඇති කිරීමේදී කිසිදු මුස්ලිම් පාසලක් ඇතුළත් වී නොමැති වීම තුළ යම් ගැටළුකාරී තත්ත්වයක් ඇතිව තිබෙන බව ගරු රවුෆ් හකීම් මහතා විසින් දැනුම් දෙන ලදි. එමෙන්ම දෙවන අදියර ක්‍රියාත්මක වන කාලය සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

දෙවන අදියර මෙම වසරේ අප්‍රේල් මස 27 වන දින ආරම්භ කිරීමට නියමිත බවත් ජාතික පාසල් ඇති කිරීමේදී ඒ සඳහා මුස්ලිම් පාසල් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කළ හැකි බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 8.12 අම්පාර පදියතලාව ජාතික පාසල - ගරු ඩී. වීරසිංහ මහතා

අම්පාර පදියතලාව ජාතික පාසලේ 4 සහ 5 ශ්‍රේණි සඳහා පන්ති 4ක් ඇති නමුත් 6 ශ්‍රේණිය සඳහා පන්ති 3ක් පමණක් තිබෙන බැවින් 6 ශ්‍රේණිය සඳහා එක් පන්තියක් වැඩි කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 8.13 ජාතික පාසල්වල 2,3 හා 4 ශ්‍රේණි සඳහා සිසුන් ඇතුළත් කිරීමේදී ජාතික පාසල් අධ්‍යක්ෂ වෙතින් අනුමැතිය ලබා ගැනීම - ගරු ලසන්ත අලගියවන්න මහතා

ජාතික පාසල්වල 2,3 හා 4 ශ්‍රේණි සඳහා සිසුන් ඇතුළත් කිරීමේදී ජාතික පාසල් අධ්‍යක්ෂ වෙතින් අනුමැතිය ලබා ගැනීමේ ප්‍රමාදයක් ඇති වන බැවින් ඒ සම්බන්ධයෙන් ගරු අමාත්‍යතුමා විසින් විමසීමක් කරන ලදී.

ජාතික පාසල්වල අමතර පන්ති සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම පෙබරවාරි මස 28 වන දින අවසන් කර ඇති බව අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

එමෙන්ම ඉදිරියේදී විශ්ලේෂණයක් සිදු කර සියලුම ජාතික පාසල්වල සියලුම ශ්‍රේණිවල සිසුන් සංඛ්‍යාව සහ ඇති පුරප්පාඩු සම්බන්ධයෙන් වෙබ් අඩවිය මගින් ප්‍රසිද්ධ කරන බවත් පුරප්පාඩු පිරවීම සඳහා අදාළ සීමාවන්ට යටත්ව විදුහල්පතිවරයාට බලය ලබා දීමට තීරණය කරන බවත් ඔහු විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

## 8.14 යාපනය විශ්ව විද්‍යාලයේ මාධ්‍ය ඒකකයක් ඉදි කිරීම සහ වෙනත් කරුණු - ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා

### 8.14.1 යාපනය විශ්ව විද්‍යාලයේ මාධ්‍ය ඒකකයක් ඉදි කිරීම

රුපියල් මිලියන 232 ක වියදමින් යාපනය විශ්ව විද්‍යාලයේ මාධ්‍ය ඒකකයක් ඉදි කිරීම සඳහා ගරු ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කළ යෝජනාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

ප්‍රථමයෙන්, මෙම යෝජනාව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු බවත් එහි අනුමැතිය ලබා ගැනීමෙන් පසු අධ්‍යාපන ලේකම්ගේ නිර්දේශය සමඟ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු බවත් අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

### 8.14.2 ජනමාධ්‍ය හදාරා පිටවන උපාධිධාරීන් සංවර්ධන නිලධාරීන් ලෙස පත් කිරීම

ජනමාධ්‍ය විෂයය හදාරා විශ්ව විද්‍යාලවලින් පිටවන උපාධිධාරීන් සංවර්ධන නිලධාරීන් ලෙස පත් කිරීම් සිදු කරන බවත් ඔවුන්ගේ විෂයන්ට අදාළව ගුරු පත්වීම් ලබා දෙන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

උපාධිධාරීන් සඳහා සංවර්ධන නිලධාරීන් ලෙස පත්වීම් ලබා දීම පොදු ප්‍රතිපත්තියක් අනුව සිදු කර ඇති බවත් පුරප්පාඩු ඇතිවීම මත සුදුසුකම් අනුව ඔවුන්ට ගුරු පත්වීම් සඳහා අයදුම් කළ හැකි බවත් අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

### 8.14.3 යාපනය විශ්ව විද්‍යාලයේ ගැටළුකාරී තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා පත් කරන ලද කමිටුවේ වාර්තාව මාධ්‍යයට නිකුත් කිරීම

යාපනය විශ්ව විද්‍යාලයේ ගැටළුකාරී තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා පත් කරන ලද කමිටුවේ වාර්තාව මාධ්‍යයට නිකුත් කිරීම තුළින් සිසුන් බලවත් අපහසුතාවයකට පත්ව ඇති බැවින් මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන ලෙස ඔවුන් විසින් ඉල්ලීම් කරන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති වෙත උපදෙස් දෙන බව අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

**8.14.4 යාපනය දිස්ත්‍රික්කයේ ජාතික පාසල්වල ගුරුවරුන්ගේ උසස්වීම්වලට අදාළ විභාග පැවැත්වීම**

යාපනය දිස්ත්‍රික්කයේ ජාතික පාසල්වල ගුරුවරුන්ගේ උසස්වීම්වලට අදාළ විභාග පැවැත්වීම චක්‍රලේඛ අනුව විධිමත් පරිදි සිදු නොවන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එමෙන්ම යාපනය දිස්ත්‍රික්කයේ විදුහල්පතිවරුන් සහ ගුරුවරුන් සඳහා දෙමළ භාෂාව ඉගැන්වීම සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙසද ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීම් කරන ලදී.

**8.15 පාසල් පද්ධතිය තුළ පවතින මේස සහ පුටු හිඟය - ගරු මංජුලා දිසානායක මහත්මිය**

පාසල් පද්ධතිය තුළ සිසුන් සඳහා මේස සහ පුටු හිඟයක් පවතින බැවින් ඒ කෙරෙහි අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමිය විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම තත්ත්වය දිවයින පුරාම නිරීක්ෂණය වන තත්ත්වයක් බව ගරු මන්ත්‍රීතුමන්ලා සහ ගරු මන්ත්‍රීතුමියන්ලා විසින් දැනුම් දෙන ලදී.

**8.16 උතුරු මැද පළාතේ අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙක් අනුයුක්ත කිරීම - ගරු එච්. නන්දසේන මහතා**

උතුරු මැද පළාතේ අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙක් අනුයුක්ත කිරීම හේතුවෙන් ගැටළුකාරී තත්ත්වයක් ඇතිව තිබෙන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

**9.** කාරක සභාව ප.ව.2.15 ට 2021 අප්‍රේල් මස 21 දින පෙ.ව. 11.00 දක්වා කල් තබන ලදී.

---

**පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**දෙවැනි රැස්වීම - 2021 මාර්තු 25**

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ගරු මහින්ද අමරවීර මහතා (සභාපති)
ගරු කිංස් නෙල්සන් මහතා
ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා
ගරු මංජුලා දිසානායක මහත්මිය

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා
ගරු ජගත් පුෂ්පකුමාර මහතා
ගරු ෆයිසාල් කාසිම් මහතා
ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු කපිල අතුකෝරල මහතා
ගරු තවරාජා කලෙයි අරසන් මහතා

**1. 2020.12.03 දින පැවති රැස්වීමේ කාර්ය සටහන් වලින් පැන නඟින කරුණු:-**

**1.1. පොතුවිල් ප්‍රදේශයේ වැලි ගොඩ දැමීමේ ගැටළු - ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා ( 2020.12.03 දිනැති කාර්ය සටහනේ අයිතම අංක 4.5 )**

මෙම කරුණට අදාළ වාර්තාව ගරු මන්ත්‍රීතුමා වෙත දන්වා යවන මෙන් ගරු සභාපතිතමා විසින් මධ්‍යම පරිසර අධිකාරියේ සභාපතිවරයාට දැනුම් දෙන ලදී.

**1.2. මාතලේ, නාලන්ද, පල්ලෙපොල ප්‍රදේශයන්හි ආක්‍රමණික යෝධ නිදිකුම්බා ශාඛය සම්බන්ධ ගැටළුව - ගරු රෝහණ දිසානායක මහතා ( 2020.12.03 දිනැති කාර්ය සටහනේ අයිතම අංක 4.9 )**

මේ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව ගරු මන්ත්‍රීතුමාට දන්වා යවන මෙන් ගරු සභාපතිතුමා විසින් මධ්‍යම පරිසර අධිකාරියේ සභාපතිවරයාට දැනුම් දෙන ලදී.

**1.3. කිතුල්කොටේ, වැල්ලවාය, තණමල්විල ප්‍රදේශවල වැලි ගොඩ දැමීම සහ වෙනත් කරුණු - ගරු ජගත් පුෂ්පකුමාර මහතා ( 2020.12.03 දිනැති කාර්ය සටහනේ අයිතම අංක 4.10 )**

මෙම කරුණ පිළිබඳව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් ඒකාබද්ධ පරීක්ෂණයක් සිදු කළ බවත්, මෙතෙක් ලබා දී ඇති බලපත්‍රවල කොන්දේසි උල්ලංඝනය කරමින් කටයුතු කිරීමේ සිදුවීම් කිසිවක් වාර්තා වී නොමැති බවත් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එසේ නමුත්, මෙම ප්‍රදේශවල බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කරමින් තවදුරටත් කටයුතු කරන බවට ගරු මන්ත්‍රීතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මෙම ප්‍රදේශවලට විශේෂ කණ්ඩායමක් යවා බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කරමින් කටයුතු කරන අයට එරෙහිව නීතිමය කටයුතු සිදු කර එම බලපත්‍ර තහනම් කිරීමට කටයුතු කරන ලෙසට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

මෙම ප්‍රදේශ පිළිබඳව නිරීක්ෂණයක් කර කරුණු පරීක්ෂා කර, ඒ සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග ද සමඟ වාර්තාවක් ලබා දෙන ලෙසට ගරු සභාපතිතුමා විසින් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත තවදුරටත් උපදෙස් ලබා දෙන ලදී.

මින් ඉදිරියට වැලි ගොඩ දැමීමේ කටයුතු ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් ලබා දුන් වාර්තාව අනුව සිදු කරනු ලබන බව ගරු සභාපතිතුමා විසින් තවදුරටත් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.4. වැලි ගොඩ දැමීමේ බලපත්‍රවල කොන්දේසි උල්ලංඝනය කිරීම - ගරු ජගත් පුෂ්පකුමාර මහතා**

වැලි ගොඩ දැමීමේ බලපත්‍රවල කොන්දේසි උල්ලංඝනය කරමින් වැලි කැපීම සහ වැලි ගොඩ දැමීමට අවසර ලබා දී ඇති භූමිවල පුනරුත්ථාපන කටයුතු නිසි ප්‍රමිතියකින් සිදු නොකිරීම හේතුවෙන් විශාල පාරිසරික හානියක් සිදුවන බවට ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මින් ඉදිරියට ප්‍රමාණවත් ඇප තැන්පතුවකට යටත්ව බලපත්‍ර නිකුත් කිරීමටත්, බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කරමින් කටයුතු කරන පුද්ගලයන්ට නැවත බලපත්‍ර නිකුත් නොකිරීමටත් අවශ්‍ය පියවර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත උපදෙස් ලබා දෙන ලදී.

**1.5. කැනීම් කටයුතු සඳහා බලපත්‍ර නිකුත් කිරීමේදී මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශ ලබා ගැනීම - ගරු ජගත් පුෂ්පකුමාර මහතා**

බලපත්‍ර නිකුත් කිරීමේදී මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශ අවශ්‍ය වන සහ අවශ්‍ය නොවන කටයුතු කවරේද යන්න සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මධ්‍යම පරිසර අධිකාරියේ අර්ථ දැක්වීමට අනුව මීටර 25 ක් ඉක්මවූ ගැඹුරක් සහිත, කැනීම් ප්‍රදේශය හෙක්ටයාර් 10 ට වැඩි සහ පිපිරීම් සිදු කළ යුතු ව්‍යාපෘති සම්බන්ධයෙන් පමණක් මධ්‍යම පරිසර අධිකාරිය මඟින් බලපත්‍ර නිකුත් කරනු ලබන බව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අධ්‍යක්ෂ (ඛනිජ හිමිකම්) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කැනීම් කටයුතු සඳහා බලපත්‍ර නිකුත් කිරීමේදී නිර්දේශ ලබා දීමට බලයලත් ආයතන සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමාට දැනුම් දීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.6. ඉරනමඩු ජලාශය ආශ්‍රිත ගැටළු - ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
**( 2020.12.03 දිනැති කාර්ය සටහනේ අයිතම අංක 4.12 )**

මෙම කරුණට අදාළව සම්පූර්ණ වාර්තාවක් පරිසර අමාත්‍යාංශය විසින් ගරු මන්ත්‍රීතුමා වෙත යවා ඇති බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.7. නින්දවූර් ප්‍රදේශයේ ස්වාභාවික ශක්ති ව්‍යාපෘති සමාගමේ ගැටළු - ගරු ෆයිසාල් කාසිම් මහතා**
**( 2020.12.03 දිනැති කාර්ය සටහනේ අයිතම අංක 4.13 )**

මෙම ව්‍යාපෘතිය සඳහා 2017 වර්ෂයේ සිට බලපත්‍රයක් ලබා දී නොමැති බවත්, මෙමඟින් පරිසර හානියක් සිදුවන බැවින් ව්‍යාපෘතිය නතර කරන ලෙසට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත කරන ලද නියෝගය එම ආයතනය විසින් මෙතෙක් ක්‍රියාත්මක කර නොමැති බවත් මධ්‍යම පරිසර අධිකාරියේ වැඩබලන නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිසරි දූෂණ පාලන) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කෙසේ නමුත්, ලංකා විදුලිබල මණ්ඩලය විසින් මෙම ව්‍යාපෘතිය භාර නොගන්නා බැවින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට මෙම කටයුතු තවදුරටත් පවත්වාගෙන යාමට නොහැකි වන බව ඒ මහතා විසින් තවදුරටත් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 2. වෙනත් කටයුතු

### 2.1. 2021 මාර්තු 31 දිනෙන් පසු කෘෂි රසායනික ද්‍රව්‍ය අඩංගු සැෂේ පැකට් තහනම් කිරීම - ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා

2021 මාර්තු 31 දිනෙන් පසු සැෂේ පැකට් භාවිතය තහනම් කිරීමට ගත් තීරණය මත සාමාන්‍ය ගොවි ජනතාව දැඩි දුෂ්කරතාවයකට මුහුණපාන බැවින් ඔවුන් සමඟ සාකච්ඡා කර භාවිතා කළ කෘෂි රසායනික ද්‍රව්‍ය අඩංගු සැෂේ පැකට් විනාශ කිරීමේ විකල්ප ක්‍රමවේදයක් සහිතව මෙම ගැටලුව සඳහා විසඳුමක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

එසේම, ඉවත දමන සැෂේ පැකට් එකතු කිරීමේ හෝ විනාශ කිරීමේ ව්‍යාපෘතීන් සඳහා අවශ්‍ය පිරිවැය දැරීමට එම ව්‍යාපාරික ප්‍රජාව කැමැත්ත ප්‍රකාශ කර ඇති බව ද ගරු මන්ත්‍රීතුමා විසින් තවදුරටත් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කෘෂි රසායනික අඩංගු සැෂේ පැකට් භාවිතය තහනම් කිරීමට ගත් තීරණයට 2021 මාර්තු 31 දිනෙන් පසු කන්න 2 ක් දක්වා සහන කාලයක් ලබා දීමටත්, 2021.12.31 දින දක්වා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමටත්, 2021.12.31 දිනෙන් පසු නීතිය ක්‍රියාත්මක කිරීමටත් තීරණය කර ඇති බවට මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 2.2. ඕස්ට්‍රේලියානු පෞද්ගලික සමාගමක් විසින් මන්නාරම දිස්ත්‍රික්කයේ ඉල්මනයිට් කැනීම් සිදු කිරීම - ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

මන්නාරම් දිස්ත්‍රික්කයේ මන්නාරම් දූපතේ ඉල්මනයිට් කැනීම් කටයුතු සිදුකරන ටයිටේනියම් සැන්ඩ්ස් ලිමිටඩ් සමාගම විසින් එම කැනීම් කටයුතු සඳහා අනුමැතියක් ලබා ගෙන තිබේ ද යන්න සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසන ලදී.

ඕස්ට්‍රේලියානු සමාගමක් විසින් ඔලුවිල් වරායේ සිට තිරුක්කෝවිල් පොතුවිල් දක්වා මෙවැනිම තවත් ව්‍යාපෘතියක් පවත්වාගෙන යන බව ගරු ෆයිසාල් කාසිම් මහතා ද කාරක සභාවට දැනුම්දෙන ලදී.

මෙම ව්‍යාපෘති දෙක සඳහාම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් ගවේෂණ කටයුතු සඳහා පමණක් බලපත්‍ර නිකුත් කර ඇති බවත්, ඒ සම්බන්ධයෙන් පවත්වාගෙන යන විශේෂ විමර්ශන වාර්තාව ලද පසු අවශ්‍ය ඉදිරි පියවර ගන්නා බවත් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 2.3. තිරුක්කෝවිල් ප්‍රදේශයේ ඉල්මනයිට් කැනීම් කටයුතු සඳහා සේවකයන් බඳවා ගැනීම - ගරු තවරාජා කලෙයි අරසන් මහතා

වසර 03 කට පෙර තිරුක්කෝවිල් ප්‍රදේශයේ ඉල්මනයිට් කැනීම් කටයුතු නතර කරන ලද නමුත් එම කැනීම් කටයුතු සඳහා නැවතත් මේ දිනවල සේවකයන් බඳවා ගැනීම සිදු කරන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් ගවේෂණ කටයුතු සඳහා පමණක් බලපත්‍ර නිකුත් කර ඇති බවත්, කැනීම් සඳහා බලපත්‍රයක් නිකුත් කරන්නේ නම් එය වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව සලකා බැලීමෙන් පසුව පමණක් සිදු කරන බව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

වෙරළ ආශ්‍රිත ව්‍යාපෘති සම්බන්ධයෙන් වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව කිසිදු බලපත්‍රයක් නිකුත් නොකරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 2.4. පරිසර අමාත්‍යාංශය යටතේ මාධ්‍ය ඒකකයක් ඇති කිරීම - ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා

පරිසරය සුරැකීම සඳහා රජයේ මැදිහත්වීම පිළිබඳ යාවත්කාලීන තොරතුරු ජනතාව වෙත රැගෙන යා හැකි පරිසර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ප්‍රබල මාධ්‍ය ඒකකයක් පැවතිය යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පරිසර අමාත්‍යාංශය සඳහා මාධ්‍ය ඒකකයක් ඇති කිරීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතින බවත්, දැනට පවතින රාජ්‍ය සහ පෞද්ගලික මාධ්‍ය ආයතන හරහා පරිසරය සුරැකීමේ වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් විස්තරාත්මක තොරතුරු ජනතාව අතරට රැගෙන යන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 2.5. ගරු ජගත් පුෂ්පකුමාර මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 2.5.1. දහයියාගල රක්ෂිතය තුළ ජීවත්වන ජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරීම

දහයියාගල රක්ෂිතය තුළ බෝගහපටට්ටිය සහ උඩවලව අතර සවිකර ඇති විදුලි වැට සහිත ප්‍රදේශයේ බලපත්‍රලාභී ඉඩම්වල ජීවත්වන ජනතාවට වන අලින්ගෙන් සිදුවන හානිය වැළැක්වීම සඳහා එම අලි වැට සහිත සීමාවන් වෙනස් කර රක්ෂිතයට සහ ජනතාවට අදාළ ප්‍රදේශයන් නිවැරදි කරන ලෙස අතිගරු ජනාධිපතිතුමා වෙත යෝජනා කර ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 2.5.2. විවිධ පුද්ගලයින් විසින් දහයියාගල රක්ෂිතය තුළ අයිතිය දක්වා මායිම් ලකුණු කිරීම

මෙම රක්ෂිතයට බලංගොඩ ප්‍රදේශයෙන් පැමිණෙන විවිධ පුද්ගලයන් එහි ඇති ගස් ලකුණු කර මායිම් වෙන්කරගෙන ඇති නමුත් එම ප්‍රදේශ හෙළි පෙහෙළි කර නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 2.5.3. පරිසර අමාත්‍යාංශ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව අන්තර් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවක් බවට පරිවර්තනය කිරීම

පරිසරය ආරක්ෂා කිරීම අමාත්‍යාංශ කිහිපයක් යටතේම සිදුවන බැවින් ඊට අදාළ සියලුම ආයතන කැඳවා අන්තර් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවක් ඇති කිරීමට ඇති හැකියාව පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසන ලදී.

මේ සඳහා පරිසර අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා විසින් කැබිනට් පත්‍රිකාවක් හරහා අන්තර් අමාත්‍යාංශ කමිටුවක් ඇති කර එම කමිටුවෙහිදී අදාළ කරුණු පිළිබඳ සාකච්ඡා කිරීමට පියවර ගෙන ඇති බව පරිසර අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 2.6. ගරු කපිල අතුකෝරල මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 2.6.1. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට නිකුත් කර ඇති වැලි සහ කළුගල් බලපත්‍රවල වලංගු කාලය දීර්ඝ කිරීම

මාර්තු මස 31 දිනෙන් අවසන් වීමට නියමිත වැලි සහ කළුගල් බලපත්‍රවල කාල සීමාව තවත් මාසයක කාල සීමාවකින් දීර්ඝ කර දෙන ලෙසත්, වැලි සඳහා අලුතින් බලපත්‍ර කිහිපයක් හෝ නිකුත් කිරීමට කටයුතු කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

බලපත්‍ර නිකුත් කිරීමේ බලතල දිස්ත්‍රික් ලේකම්වරුන්ට විමධ්‍යගත කර ඇති බැවින් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ තීරණය පරිදි මාර්තු මස 31 දිනෙන් අවසන් වන බලපත්‍රවල වලංගු කාල සීමාව අප්‍රේල් මස 30 වැනි දින දක්වා දීර්ඝ කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙසත් එම තීරණය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත වහාම දන්වා යවන ලෙසත් ගරු සභාපතිතුමා විසින් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත උපදෙස් ලබා දෙන ලදී.

### 2.6.2. වැලි බලපත්‍රවල තෙදින නීතිය ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන ගැටළු

වැලි බලපත්‍ර සඳහා පනවා ඇති තෙදින නීතිය ක්‍රියාත්මක කිරීමේදී වැලි බලපත්‍ර හිමියන්ට සිදුවන අසාධාරණ කටයුතු වැළැක්වීමට හැකිවන පරිදි අදාළ නිර්ණායකයන් ක්‍රමවත්ව සකස් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

### 2.6.3. අවශේෂ කැලෑ වගා කිරීමේ ව්‍යාපෘතිය

නැවත වන වගාව සඳහා යෝග්‍ය ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ හිස් ඉඩම් ඇති බවත් එවැනි ඉඩම්වල වසර 05 ක් වැනි කාලසීමාවක් තුළ දැව ලෙස කපා ගත හැකි ගස් වර්ගයන් වගා කිරීමට හැකි ව්‍යාපෘති ආරම්භ කළ හැකි බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

දැව සංස්ථාව විසින් සිදු කළ යුතු මෙවැනි ව්‍යාපෘති පරිසර අමාත්‍යාංශය විසින් දැනටමත් ආරම්භ කර ඇති බැවින් ත්‍රිකුණාමලය ප්‍රදේශයේ ඇති එවැනි ඉඩම් පිළිබඳව පරිසර අමාත්‍යාංශය දැනුවත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 2.6.4. වැලි ප්‍රවාහන ටිපර් රථ අත්අඩංගුවට ගැනීම හේතුවෙන් පැන නඟින ගැටළු

වැලි ප්‍රවාහන ටිපර් රථ අත්අඩංගුවට ගෙන නීතිමය කටයුතු සිදු කිරීමට දීර්ඝ කාලයක් ගතවීම හේතුවෙන් වැලි කර්මාන්තයට ඇති වන ගැටළු වැළැක්වීම සඳහා එම නඩු කටයුතු කඩිනම් කිරීම හෝ ස්ථානීය දඩ මුදල් අය කිරීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

වැලි බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීමට නියමිත නව ක්‍රමවේදය හරහා මෙම ගැටලු වලට නිසි විසඳුම් ලැබෙනු ඇති බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.6.5. දිස්ත්‍රික්කයේ ගල් කොරි සඳහා බලපත්‍ර ලබා දීමේදී එම දිස්ත්‍රික්කයේ ගල් කොරි පවත්වාගෙන යන පුද්ගලයන්ට ප්‍රමුඛත්වය ලබා දීම**

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කළුගල් කොරි සඳහා බලපත්‍ර ලබා දීමේදී දිස්ත්‍රික්කයේ ජනතාවට ප්‍රමුඛත්වය ලබා දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

වෙනත් ආයතන විසින් ලබා දෙන නිර්දේශයන්ට යටත්ව බලපත්‍ර නිකුත් කිරීම පමණක් මෙම කාර්යාංශය විසින් සිදු කරන බැවින් එම නිර්දේශ ලබා දෙන ආයතන විසින් මේ සම්බන්ධයෙන් තීරණය කළ යුතු බවට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.6.6. අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා තීරණ දැනුම්දීම**

අද දින රැස්වීමේදී ගන්නා ලද තීරණ රාජ්‍ය අමාත්‍යාංශයට හා අදාළ නිලධාරීන් වෙත ලැබීමට සලස්වන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

එම තීරණ අදාළ ආයතන හා නිලධාරීන් වෙත දැනුම්දීමට අවශ්‍ය පියවර ගන්නා බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**3.** කාරක සභාව 2021.03.25 දින ප.ව. 12.45 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

**ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**දෙවැනි රැස්වීම - 2021 මාර්තු 26**

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ගරු ඩග්ලස් දේවානන්දා මහතා (සභාපති)
ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා
ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු ෆයිසාල් කාසිම් මහතා
ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු අමරකීර්ති අතුකෝරළ මහතා
ගරු නසීර් අහමඩ් මහතා
ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා
ගරු එච්. නන්දසේන මහතා
ගරු අලි සබ්රි රහීම් මහතා
ගරු අජිත් රාජපක්ෂ මහතා

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා
ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

**1. වාර්ෂික වාර්තා සලකා බැලීම**

පාර්ලිමේන්තුව විසින් කාරක සභාව වෙත යොමු කරන ලද පහත සඳහන් වාර්ෂික වාර්තා සලකා බැලීමෙන් අනතුරුව එම වාර්ෂික වාර්තා වලට එකඟ වූ කාරක සභාව ඒ පිළිබඳ වාර්තාව, කාරක සභාවේ සභාපති ගරු ඩග්ලස් දේවානන්දා මහතා විසින් පාර්ලිමේන්තුවට පිළිගැන්විය යුතු යයි ද තීරණය කරන ලදී.

**1.1.** 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව

**1.2.** 2017 වර්ෂය සඳහා ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ වාර්ෂික වාර්තාව

**1.3.** 2015 වර්ෂය සඳහා ලංකා ධීවර සංස්ථාවේ වාර්ෂික වාර්තාව

**2. 2020.11.25 දින පැවැති රැස්වීමේ කාර්ය සටහන් වලින් පැන නඟින කරුණු:-**

**2.1. ඉන්දියානු ධීවර බෝට්ටු උතුරු මුහුදු සීමාවට ඇතුළුවීම - ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
**(2020.11.25 දිනැති කාර්ය සටහනේ අයිතම අංක 3.1.1 )**

ඉන්දියානු ධීවර බෝට්ටු ලංකාවේ මුහුදු සීමාවට ඇතුළුවීම වැළැක්වීම සම්බන්ධයෙන් ධීවර අමාත්‍යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය සහ අදාළ අනෙකුත් අංශ සමඟ සාකච්ඡා කර විසඳුම් ලබාදෙන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.2. උතුරු මුහුදේ රාත්‍රී කාලයේ සිලින්ඩර් යොදා මාළු ඇල්ලීම - ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
**( 2020.11.25 දිනැති කාර්ය සටහනේ අයිතම අංක 3.1.2 )**

රාත්‍රී කාලයේදී උතුරු මුහුදේ සිලින්ඩර් යොදා මසුන් ඇල්ලීම සපුරා තහනම් කර තිබුන ද එම කටයුතු තවදුරටත් සිදුවන බව ශ්‍රී ලංකා නාවික හමුදාවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (මෙහෙයුම්) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

නාවික හමුදාව සතු සීමිත සම්පත් උපයෝගී කරගෙන එලෙස නීති විරෝධී ලෙස මසුන් ඇල්ලීමේ කටයුතු සිදුකරන ධීවරයන් අත්අඩංගුවට ගැනීම් නිරතුරුවම සිදු කරන අතර මේ පිළිබඳව විශේෂ පරීක්ෂාවක් සිදු කර එම කටයුතු නැවැත්වීමට අවශ්‍ය ඉදිරි පියවර ගන්නා බව ඔහු විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

**2.3. කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ධීවර ජනතාව මුහුණ පාන ගැටළු - ගරු එස්. ශ්‍රීතරන් මහතා**
**( 2020.11.25 දිනැති කාර්ය සටහනේ අයිතම අංක 3.5.4 )**

මෙම කරුණ පිළිබඳව මීළඟ කාරක සභාවේදී සාකච්ඡා කිරීමට තීරණය කරන ලදී.

**2.4. ස්කූබා (Scuba) ක්‍රමයට මසුන් ඇල්ලීමේ තහනම ඉවත් කිරීම - ගරු කාදර් මස්තාන් මහතා**
**( 2020.11.25 දිනැති කාර්ය සටහනේ අයිතම අංක 3.8.1 )**

මෙම කරුණ පිළිබඳව මීළඟ කාරක සභාවේදී සාකච්ඡා කිරීමට තීරණය කරන ලදී.

**3. ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා**

**3.1 කුරුණෑගල, ගල්ගමුව, උස්ගල, සියඹලන්ගමුව ධීවර සමිතියට ධීවර ආම්පන්න ලබා ගැනීම සම්බන්ධව ගරු ශාන්ත බණ්ඩාර මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව**
(ගරු ශාන්ත බණ්ඩාර මහතා - යෝජනා අංකය 87)

මෙම යෝජනාව සම්බන්ධයෙන් අදාළ වාර්තාව ගරු මන්ත්‍රීතුමා වෙත යොමු කර ඇති බවට ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**4. වෙනත් කරුණු**

**4.1. අනුරාධපුර දිස්ත්‍රික්කයේ මිරිදිය ධීවර කර්මාන්තය දියුණු කිරීමට අවශ්‍ය පහසුකම් ලබා ගැනීම - ගරු එච්. නන්දසේන මහතා**

**4.1.1. නයිලෝන් දැල් ගෙන්වීම තහනම් කිරීම**

ධීවර කටයුතු සඳහා තහනම් කර ඇති නයිලෝන් දැල් ගෙන්වීම වැළැක්වීමට අවශ්‍ය පියවර ගන්නා මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.

නයිලෝන් දැල් ගෙන්වීම නතර කිරීමට කඩිනම් පියවර ගන්නා බව ධීවර අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

**4.1.2. ධීවර ජනතාවට දැල් මිලදී ගැනීමට සපහසුකම් සලසා දීම**

ධීවර සංස්ථාව හරහා දැල් මිලදී ගැනීමට පහසුකම් සහිත ස්ථානයක් අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ස්ථාපිත කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ධීවර ජනතාවට දැල් සැපයීමට සුදුසු ක්‍රමවේදයක් සකස් කරන බව ධීවර අමාත්‍යාංශයේ ලේකම්තුමිය විසින් දැනුම් දෙන ලදී.

**4.1.3. මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානයක් ඇති කිරීමට අවශ්‍ය පහසුකම් සලසා දීම**

යාන්ඔය මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානය ඇති කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

එම මධ්‍යස්ථානය ඇති කිරීමට සැලසුම් සකස් කර අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දිමට කටයුතු කරන බව ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

### 4.1.4. මත්ස්‍ය බීජ නිෂ්පාදනය වැඩි කර ගැනීමට අවශ්‍ය පහසුකම් ලබා දීම

මත්ස්‍ය බීජ නිෂ්පාදනය සිදු කරන මඩ පොකුණු කොන්ක්‍රීට් කර සකස් කර දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

මේ සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන බව ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

### 4.1.5. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ධීවර නිලධාරීන්ට නිල නිවාස පහසුකම් ලබා දීම

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටි ප්‍රධාන වැව් 06 ආශ්‍රිතව ධීවර නිලධාරීන්ට නිල නිවාස පහසුකම් ලබා දිමට කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

මෙම කරුණු සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමාගේ ද සහභාගීත්වය සහිතව විශේෂ සාකච්ඡාවක් පවත්වා එම පහසුකම් ලබා දීමට අවශ්‍ය පියවර ගන්නා බව ගරු සභාපතිතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

## 4.2. ගරු අමරකීර්ති අතුකෝරළ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.2.1. මින්නේරිය ධීවර සංස්ථාව සතු ඉඩම ඵලදායී කටයුත්තක් සඳහා යෙදවීම

විශාල අයිස් ගබඩාවක් පැවති විනාශවෙමින් පවතින මින්නේරිය ධීවර සංස්ථාව සතු ඉඩම ඵලදායී කටයුත්තකට යෙදවීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

මෙම භූමියේ අයිස් කර්මාන්ත ශාලාවක් ස්ථාපිත කිරීමට අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කර ඇති බව ලංකා ධීවර සංස්ථාවේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 4.2.2. මින්නේරිය ප්‍රදේශයේ ධීවර ජනතාවට අවශ්‍ය ධීවර ආම්පන්න ලබා ගැනීම

ධීවර ජනතාව විසින් ඉල්ලා සිටින ඔරු සහ දැල් හැකි ඉක්මනින් ලබා දෙන ලෙසත් වැව් වලට දමන මත්ස්‍ය පැටව් ප්‍රමාණය වැඩි කර දෙන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

ගරු මන්ත්‍රීතුමා ද සම්බන්ධ කර ගනිමින් සාකච්ඡා කර එම පහසුකම් ලබා දීමට පියවර ගන්නා බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 4.3. ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.3.1. බොල්ගොඩ ගඟ ආශ්‍රිතව ධීවර කටයුතු සිදු කිරීමට අවස්ථාව ලබා ගැනීම

බොල්ගොඩ ගඟ ආශ්‍රිතව මසුන් ඇල්ලීමේ කටයුතු තහනම් කරමින් පරිසර අධිකාරිය විසින් නිකුත් කර ඇති ගැසට් නිවේදනය සංශෝධන කරමින් එම ගඟ ආශ්‍රිතව ධීවර කටයුතු වල නිරතවන අඩු ආදායම්ලාභී ජනතාවට අවහිරයකින් තොරව ධීවර කටයුතුවල නිරතවීමට අවස්ථාව සලසා දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශ මට්ටමින් සාකච්ඡාවක් පවත්වා මසුන් ඇල්ලීමේ කටයුතුවල නියැලීම සඳහා බොල්ගොඩ ගඟ ආශ්‍රිතව වෙනම කලාපයක් වෙන් කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ, ධීවර අමාත්‍යාංශයේ සහ පරිසර අධිකාරියේ නියෝජිතයන් මෙන්ම ගරු මන්ත්‍රීතුමාගේ සහභාගීත්වයෙන් මේ පිළිබඳව සාකච්ඡාවක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 4.3.2. කොළඹ දිස්ත්‍රික්කයේ මොරටුව ප්‍රදේශය ආශ්‍රිතව ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති

ධීවර අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ මොරටුව ප්‍රදේශය ආශ්‍රිතව ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති කවරේද යන්න සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් විමසන ලදී.

ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ විසිතුරු මසුන් වගාව අලුතින් ආරම්භ කරන අයවලුන් සඳහා අධාර මුදලක්, තාක්ෂණ දැනුම සහ පුහුණුව ලබා දීමටත් මෙම ව්‍යාපෘතියේ දැනට නියුක්තවූවන් සඳහා එම කටයුතු වැඩි දියුණු කිරීමට අධාර මුදල්, තාක්ෂණ දැනුම සහ පුහුණුව ලබා දීමටත් යෝජිත බව රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

බොල්ගොඩ ගඟ ආශ්‍රිතව ධීවර කටයුතු සම්බන්ධයෙන් පැවැත්වීමට නියමිත සාකච්ඡාවේ දී මෙම කරුණ පිළිබඳව ද සාකච්ඡා කරන බව ගරු සභාපතිතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

## 4.4. ගරු ෆයිසාල් කාසිම් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.4.1. අඬ්ඩාලයිචෙනෙයි කෝනාවත්ත ප්‍රදේශයේ ඇල මාර්ගය දෙපස ධීවර බෝට්ටු නැවැත්වීමට හැකි පරිදි සකස් කිරීම

ධීවර බෝට්ටු නැවැත්වීමට හැකි වන පරිදි අඬ්ඩාලයිචෙනෙයි කෝනාවත්ත ප්‍රදේශයේ ඇල මාර්ගය දෙපස සකස් කරන දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ සම්බන්ධයෙන් අධ්‍යයනයක් කර සුදුසු කටයුතු කරන බවට ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 4.4.2. ඔලුවිල් වරාය සම්බන්ධ ගැටලුව

නිසි අධ්‍යයනයකින් පසුව ඔලුවිල් වරාය අංග සම්පූර්ණ ධීවර වරායක් ලෙස සංවර්ධනය කළ යුතු බවට ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පෞද්ගලික සමාගමක් විසින් ඔලුවිල් වරාය සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා වාර්තාවක් ඉදිරිපත්කර ඇති බවත් වරාය සංවර්ධන අධිකාරිය වෙතින් ඔලුවිල් වරාය

නැවත ලබාගැනීමට කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඒ පිළිබඳ සාකච්ඡා පවත්වන අවස්ථාවන්ට ගරු මන්ත්‍රීතුමාට ආරාධනා කරන බව ද ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 4.5. ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.5.1. යාපනය දිස්ත්‍රික්කයට අයත් මයිලෙට්ටි ධීවර වරාය නැවතත් ධීවර අමාත්‍යාංශය යටතට පවරා ගැනීම

වරාය අධිකාරිය යටතට පවරා ගත් යාපනය දිස්ත්‍රික්කයට අයත් මයිලෙට්ටි වරාය එහි පළවෙනි අදියරේ ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කළ නමුත් නැවත ධීවර ජනතාවට භාර නොදීමෙන් ඔවුන්ට ධීවර කටයුතුවල යෙදීමට නොහැකි තත්වයක් පැන නැගී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.
මෙම වරාය නැවතත් ධීවර අමාත්‍යාංශය යටතට පවරාගෙන පෙර මෙන් ධීවර සංවිධානය වෙත භාරදීමට කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.

පේදුරු තුඩුව, ගුරුනගර් සහ පේසාලෙයි-දකුණු සයුර යන ස්ථානවල ඉදිකිරීමට නියමිත නව වරායන් අවසන් කිරීම සඳහා වර්ෂ 1-3 පමණ කාලයක් ගතවන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එම කාලය තුළ සුදුසු ධීවරයින් හඳුනාගෙන ඔවුන්ට ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීම සඳහා පුහුණුව ලබාදී බදු සහන යටතේ ධීවර බෝට්ටු ලබාදීමට කටයුතු කරන බවත්, යාපනයේ ඇති ඕෂන් විශ්වවිද්‍යාලය මඟින් පුහුණු කටයුතු සිදු කරන බවත් ගරු සභාපතිතුමා විසින් තවදුරටත් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 4.5.2. යාපනය අර්ධද්වීපයේ ඇති ධීවර වරායන් සම්බන්ධ ගැටලු

යාපනය අර්ධද්වීපයේ ඇති ධීවර වරායන්වල වැලි ගොඩවී ඇති නිසා ධීවර කටයුතුවල යෙදීමට නොහැකි තත්වයක පවතින බවත් එම වැලි ඉවත්කිරීමට කටයුතු කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

එසේම, ධීවර වරායන් වලට ඇතිවන සුළගේ බලපෑම මත එම ස්ථාන වල නවතා ඇති ධීවර බෝට්ටු විනාශවන හෙයින් එම ගැටලුවට විසඳුමක් ලෙස පේදුරු තුඩුව, කීරිමලේ සිට කරෙයිනගර් දක්වා කළුගල් බැම්මක් තැනීම උචිත බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ධීවර වරායන්වල ගොඩවී ඇති වැලි ඉවත්කිරීම සහ කළුගල් බැම් ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 19 ක මුදලක් වෙන්කර ඇති බවත් යාපනය, කිලිනොච්චි, මන්නාරම සහ මුලතිව් ප්‍රදේශවල සහකාර අධ්‍යක්ෂකවරුන් සමග සාකච්ඡා කර ප්‍රමුඛතාවයන් අනුව කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 4.5.3. ඉරනතීවු දූපතට ගමන් කිරීමට අවසර ලබා ගැනීම

සම්පූර්ණයෙන් ධීවර ජනතාව ජීවත්වන ඉරනතීවු දූපතෙහි අවතැන්වූ ජනතාව ඉරනමාතා නගරයෙහි ජීවත්වන අතර ඔවුන්ට නිරන්තරයෙන්ම ඉරනතීවු දූපතට

ගමන්කිරීමට අවශ්‍ය වන අතර ඒ සෑම අවස්ථාවකම නාවික හමුදාවේ අවසරය ලබා ගැනීමට අවශ්‍ය වීම ගැටලුවක් බවට පත්ව ඇති බවද ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එසේ හෙයින් එම අවසරය නාවික හමුදාවෙන් ලබා ගැනීමට වෙනුවට ධීවර අමාත්‍යාංශයෙන් ලබාගැනීමට හැකි වන පරිදි අවශ්‍ය නීතිරීති සංශෝධනය කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.

මෙම දූපතට ඇතුළුවන බහුදින ධීවර යාත්‍රා සඳහා අවසරයක් ලබාගත යුතු වුවද එම දූපතේ ජීවත් වන ලියාපදිංචි වී ඇති ජනතාවට කිසිදු බාධාවකින් තොරව දූපතට ඇතුළු විය හැකි බවත් ලියාපදිංචි නොවූ ජනතාවට අවසරයක් අවශ්‍ය බවත් ශ්‍රී ලංකා නාවික හමුදාවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (මෙහෙයුම්) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම කරුණ සම්බන්ධයෙන් තවදුරටත් පරික්ෂා කර ගරු මන්ත්‍රීතුමාට දැනුම් දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත උපදෙස් ලබා දෙන ලදී.

එසේම, ඉහත ගැටළුවට විසඳුමක් ලෙස මෙම ප්‍රදේශයේ පොලිස් ස්ථානයක් ඉදිකිරීමට නියමිත බවත්, ඒ සම්බන්ධයෙන් නාවික හමුදාවද එකඟත්වය ප්‍රකාශකර ඇති බවත් ගරු සභාපතිතුමා විසින් තවදුරටත් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 4.5.4. පාසෙයියූර් හි ධීවර තොටුපළට ප්‍රවේශවන සහ පිටත්වන ධීවර බෝට්ටු මුහුණපාන ගැටලු

පාසෙයියූර් හි ධීවර තොටුපළ නොගැඹුරුව පවතින බැවින් ධීවර බෝට්ටු මුහුදට පිටත්වන සහ වෙරළට ආපසු පැමිණෙන අවස්ථාවේදී ධීවරයින් අපහසුතාවයන්ට ලක්වන බවත් එහි නවතා තබන බෝට්ටු සුළඟින් විනාශවන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එසේම, කොලුම්බුතුරෙයි තොටුපළ දීර්ඝ කාලයක් අතහැරදැමූ තත්වයක පවතින බැවින් එය ප්‍රතිසංස්කරණය කර දෙන මෙන් ද ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

ධීවර වරායන් ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කර ඇති බවත් අදාළ නිලධාරීන් සමඟ සාකච්ඡා කර ප්‍රමුඛතාවයන් අනුව කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

## 4.6. මහනුවර දිස්ත්‍රික්කයේ මහනුවර ආසනය යටතේ ඇති ප්‍රධාන නගර 03 සඳහා ධීවර සංස්ථාවේ වෙළඳ කුටි ලබා ගැනීම - ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

මහනුවර දිස්ත්‍රික්කයේ මහනුවර ආසනය යටතේ ඇති ප්‍රධාන නගර 03 සඳහා ධීවර සංස්ථාවේ වෙළෙඳ කුටි 03 ක් ලබා දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

පළමුව එක් වෙළෙඳ කුටියක් ලබා දීමට කඩිනමින් කටයුතු කරන බවත් පසුව සෙසු වෙළඳ කුටි 02 ලබා දීමට කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කරන ලෙස ද ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීතුමා වෙත දැනුම් දෙන ලදී.

## 4.7. ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.7.1. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ වරාය ප්‍රදේශයේ මසුන් ඇල්ලීමේ කටයුතු වලට අවසර ලබා දීම

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පවුල් 400 ක පමණ ජනතාව වරාය ප්‍රදේශය යනුවෙන් හැඳින්වෙන විශාල ප්‍රදේශයක දීර්ඝ කාලයක සිට කුඩා දැල් මඟින් මසුන් ඇල්ලීමේ කටයුතුවල යෙදී සිටි නමුත් දැනට මාස තුනක පමණ කාලයක සිට එම ප්‍රදේශයට ඇතුල්වීම තහනම් කර ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඒ හේතුවෙන් තම ජීවනෝපාය අහිමි වූ ධීවරයන් මහත් අසීරුතාවයට පත්ව ඇති බැවින් එම ප්‍රදේශය තුළ මසුන් ඇල්ලීමේ කටයුතු සඳහා නැවත අවසර ලබා දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

මෙම කරුණ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකරන බවට ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 4.7.2. අම්පාර - තිරුක්කෝවිල් වෙරලාසන්න ප්‍රදේශයේ ඉල්මනයිට් කැණීම් කටයුතු තහනම් කිරීම

අම්පාර - තිරුක්කෝවිල් වෙරලාසන්න ප්‍රදේශයේ ඉල්මනයිට් කැණීම් කටයුතු සඳහා වූ පාරිසරික බලපෑම් පිළිබඳ ඇගයීම් වාර්තාවක් සකස් කිරීම සඳහා ඕස්ට්‍රේලියානු සමාගමකට පවරා ඇති අතර මෙම කැණීම් කටයුතු හේතුවෙන් ඇතිවිය හැකි විශාල පාරිසරික හානිය සැළකිල්ලට ගෙන ඒ සඳහා ධීවර අමාත්‍යාංශයේ අනුමැතිය ලබා නොදෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

මේ සම්බන්ධයෙන් නිසි අධ්‍යයනයක් කර අවශ්‍ය පියවර ගැනීමට ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

### 4.7.3. මඩකළපුව දිස්ත්‍රික්කයට අයත් වාලච්චේන වරායේ වැලි ඉවත් කිරීම

මඩකළපුව දිස්ත්‍රික්කයට අයත් වාලච්චේන වරායේ වැලි ඉවත්කර පිරිසිදු කිරීම සඳහා පෞද්ගලික සමාගමක් වෙත පවරා ඇති අතර එම සමාගම එම වරායෙහි වැලි කැණීම් කටයුතුවල නිරතවන බවට ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම වැලි කැණීම් කටයුතු සඳහා පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාවක් ලබා ගෙන තිබේ ද යන්න පිළිබඳව පැහැදිලි කරන ලෙසත්, එසේ නම් මෙම කටයුත්ත පවත්නා නීතිරීති වලට අනුගතව නිසි ක්‍රමවේදයකට අනුව සිදුකිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

මේ සම්බන්ධයෙන් නිසි අධ්‍යයනයක් සිදු කර කරුණු ඉදිරිපත් කරන බවට ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 4.7.4. වාලච්චේන ප්‍රදේශයේ අයිස් කර්මාන්තශාලා විසින් නළ ළිං මඟින් ජලය ලබා ගැනීම මත සිදුවන පරිසර විනාශය

වාලච්චේන ප්‍රදේශයේ පිහිටි අයිස් කර්මාන්තශාලා විසින් එහි මෙහෙයුම් කටයුතු සඳහා නළ ළිං මඟින් ජලය ලබා ගැනීම මඟින් පරිසර හානියක් සිදුවන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 4.7.5. මඩකලපුව දිස්ත්‍රික්කයේ පිහිටි භාවිතයට නොගෙන අත්හැරදමා ඇති ලංකා ධීවර සංස්ථාවට අයත් ගොඩනැඟිලි ඵලදායී කටයුත්තකට යොදා ගැනීම

කලුවන්කර්නි හා කල්ලාරු ප්‍රදේශයේ පිහිටි ධීවර සංස්ථාවට අයත් ගොඩනැඟිලි කිහිපයක් භාවිතයට නොගෙන අත්හැර දමා ඇති බවට ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එම ගොඩනැඟිලි මෙන්ම කලුවන්කර්නි ප්‍රදේශයේ පිහිටි අබලන් තත්ත්වයේ පවතින කුඩා පාළම ද භාවිතයට ගත හැකි පරිදි සකස් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

මීළඟ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා රැස්වීම පැවැත්වීමට පෙර මේ සම්බන්ධයෙන් පිළිතුරු ලබා දීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 4.7.6. මඩකලපුව දිස්ත්‍රික්කයේ ධීවර වෙළඳසැල් පිහිටුවීම

මඩකලපුව දිස්ත්‍රික්කයේ පරිභෝජනයට සෑහෙන තරම් මාළු ලැබෙන බැවින් ලංකා ධීවර සංස්ථාවේ ධීවර වෙළඳ සැලක් පිහිටුවීමට කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

එම ධීවර වෙළඳ සැල් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් ගරු සභාපතිතුමා විසින් ලංකා ධීවර සංස්ථාවේ සභාපති වෙත උපදෙස් ලබා දෙන ලදී.

## 4.8. හම්බන්තොට සහ කිරින්ද ධීවර වරායේ වැලි ඉවත් කිරීම කඩිනම් කිරීම - ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

මෙම ධීවර වරායන් දෙකෙහි වැලි ඉවත් කිරීමේ කටයුතු කඩිනම් කිරීම සඳහා ධීවර අමාත්‍යාංශයේ අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

ධීවර වරායන්හි වැලි කැනීම් කටයුතු සඳහා කැබිනට් අනුමැතිය ලැබී ඇති බැවින් මෙම කටයුතු කඩිනමින් යථා තත්වයට පත් කිරීමට අවශ්‍ය ආයතන සමඟ සාකච්ඡා පැවැත්වෙන බව ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එසේම හම්බන්තොට වරාය සඳහා විශේෂ දිය කඩනයක් සෑදීමට සැලසුම් කර ඇති බව ද ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 4.9. ට්‍රෝලර් යාත්‍රා මගින් ධීවර කටයුතුවල යෙදීම - ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

පසුගිය සමයේ ශ්‍රී ලංකාවේ ට්‍රෝලර් යාත්‍රා මඟින් ධීවර කටයුතුවල යෙදීම සම්පූර්ණයෙන් තහනම් කරන ලද නමුත් එම අවස්ථාවේ දී ඉදිරිපත් කරන ලද යෝජනාවක් අනුව අඩි 28 ක් දිග සහ අශ්වබල 30 ක යාත්‍රා මඟින් මසුන් ඇල්ලීමට අවසර ලැබුනු බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී. ඒ අනුව පුත්තලම, මන්නාරම සහ යාපනය යන පළාත්වල එම කටයුතු තවදුරටත් ක්‍රියාත්මක වෙමින් පවතින බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් නාරා ආයතනය විසින් පරීක්ෂා කරන ලදුව කොරල් පර ඇති ස්ථාන වෙන්කර වාර්තාවක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ට්‍රෝලර් යාත්‍රා මඟින් ධීවර කටයුතුවල යෙදීමට අවසර ලබාදිය හැකි බව නීතිපති විසින් දන්වා ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් තවදුරටත් දන්වා සිටින ලදි.

නාරා ආයතනයේ වාර්තාව ලැබී ඇති බැවින් ඒ සම්බන්ධ ඉදිරි කටයුතු කඩිනමින් සිදුකරන බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

## 4.10. ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.10.1. ත්‍රිකුණාමලය - සැල්ලි ධීවර ග්‍රාමයේ පිහිටි ධීවර තොටුපළ සකස් කර ගැනීම

ත්‍රිකුණාමලය - සැල්ලි යන ධීවර ග්‍රාමයේ ජනතාවට ධීවර තොටුපළක් නොමැති නිසා ඔවුන්ගේ ධීවර යාත්‍රා සහ ආම්පන්න විනාශවන බැවින් එහි ඇති ගල්පර ඉවත්කර ධීවර තොටුපළ සකසා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

එම ප්‍රදේශයේ ගල්පර කඩා ඉවත්කිරීමෙන් පාරිසරික හානි ඇතිවිය හැකි බැවින් ඒ සම්බන්ධයෙන් කටයුතු කල නොහැකි බවත් විකල්පයක් ලෙස වෙරළට සම්බන්ධ වන සේ ජල මාර්ගයක් සකස්කර දීමට හැකි බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 4.10.2. මන්නාරම දූපතේ ටයිටේනියම් වැලි කැනීම් කටයුතු සිදු කිරීම

ඕස්ට්‍රේලියානු සමාගමක් විසින් නිසි අනුමැතියකින් තොරව මන්නාරම දූපතේ ටයිටේනිම් වැලි කැණීම් සිදුකරන බැවින් එම ප්‍රදේශයේ ධීවර කටයුතුවලට බලපෑම් ඇතිවන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඉහත සඳහන් කරුණු ඇතුළත් ඉල්ලීමක් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවට ඉදිරිපත් කරන ලෙසත් අනතුරුව ඒ සම්බන්ධයෙන් කටයුතු කළහැකි බවත් ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

## 4.11. ගරු නසීර් අහමඩ් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.11.1. වාලච්චේන ප්‍රදේශයේ යාත්‍රා අලුත්වැඩියාව

වාලච්චේන ප්‍රදේශයේ ධීවර යාත්‍රා 600 කට වැඩි සංඛ්‍යාවක් ඇති බැවින් එම යාත්‍රාවල අලුත්වැඩියාව කටයුතු සිදු කිරීම සඳහා ස්ථානයක් ස්ථාපිත කරදෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

තවද, ධීවරයින්ට යම් කාලසීමාවක් තුළ යාත්‍රා නිරීක්ෂණ පද්ධති ලබා ගත යුතු බවට නියෝගයක් නිකුත් කර ඇති බැවින් ඔවුන් ණය ලබාගෙන ඇති බැවින් ඒ සඳහා ඔවුන්ට සහන ලබාදෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.
ඕස්ට්‍රේලියානු රජයේ ආධාර යටතේ යාත්‍රා නිරීක්ෂණ පද්ධති නොමිලේ ලබාදීමට නියමිත බැවින් ඉහත ධීවරයින් ද එයට ඇතුලත් කර ගන්නා බවත්, ඒ අනුව ධීවර අමාත්‍යාංශයේ නිර්දේශ යටතේ ඉදිරිපත් කිරීමෙන් සහන ලබාගත හැකි බවත් ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

### 4.11.2. එරාවූර් ලැගූන් වේල්ලෙහි ඉදිකිරීම් කටයුතු

එරාවූර් ලැගූන් වේල්ලෙහි ඉදිකිරීම් කටයුතු අතරමැද නවතා දමා ඇති අතර එය විනාශ වෙමින් පවතින බැවින් යම් ව්‍යාපෘතියක් යටතේ එම කටයුතු නැවත ආරම්භ කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

මේ සම්බන්ධයෙන් අධ්‍යයනය කර මීළඟ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවට පිළිතුරක් ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් ලබා දෙන ලදී.

## 4.12. ගරු අලි සබ්රි රහීම් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

කල්පිටිය, පුත්තලම යන ප්‍රදේශවල තමා ධීවර කටයුතු සම්බන්ධ දිස්ත්‍රික් සභාපති වශයෙන් කටයුතු කරන නමුත් එහි සංවර්ධන කටයුතු සඳහා තමාට දැනුම්දීමක් හෝ කැඳවීමක් නොලැබෙන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් අධ්‍යයනය කර මීළඟ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවට පිළිතුරක් ලබා දෙන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**5.** කාරක සභාව මධ්‍යාහ්න 12.00 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

**ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**දෙවැනි රැස්වීම - 2021 ජූලි 20**

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා (සභාපති)
ගරු ශාන්ත බණ්ඩාර මහතා
ගරු උද්දික ප්‍රේමරත්න මහතා

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු මහින්ද අමරවීර මහතා
ගරු චන්දිම වීරක්කොඩි මහතා
ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා
ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
ගරු ඩයනා ගමගේ මහත්මිය

**1. වාර්ෂික වාර්තා සලකා බැලීම**

පාර්ලිමේන්තුව විසින් කාරක සභාව වෙත යොමු කරන ලද පහත සඳහන් වාර්ෂික වාර්තා කාරක සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව එම වාර්තාවලට කාරක සභාවේ එකඟතාව පළකරන ලද අතර එම වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයිද තීරණය කරන ලදී.

**1.1.** 2017 වර්ෂය සඳහා සැලසිනෙ රූපවාහිනී ආයතනයේ වාර්ෂික වාර්තාව
**1.2.** 2018 වර්ෂය සඳහා සැලසිනෙ රූපවාහිනී ආයතනයේ වාර්ෂික වාර්තාව
**1.3.** 2017 වර්ෂය සඳහා සීමාසහිත ස්වාධීන රූපවාහිනි මාධ්‍ය ජාලයේ වාර්ෂික වාර්තාව
**1.4.** 2018 වර්ෂය සඳහා සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ වාර්ෂික වාර්තාව
**1.5.** 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ වාර්ෂික වාර්තාව

**2. ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා -**

**2.1 බූස්ස තැපැල් කාර්යාලය සඳහා අත්පත් කරගත් රත්ගම, කටුදම්පේ ලිපිනයේ පදිංචි ඩබ්ලිව්. පාලිත ද සොයිසා ගුණසේකර මහතාට අයත් ඉඩම නිදහස් කර දෙන ලෙස ඉල්ලීම**
(ගරු චන්දිම වීරක්කොඩි මහතා - යෝජනා අංක 67)

ඉහත ඉඩම රජයට අත්පත් කරගෙන වසර 14 ක් පමණ ගතවී ඇතත් මෙතෙක් අදාළ තැපැල් කාර්යාලය ඉදි කිරීමට කටයුතු කර නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ගුණසේකර මහතාට සාධාරණයක් ඉෂ්ඨ කිරීමට ඇති හැකියාව පරීක්ෂා කර අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**2.2 පැලවත්ත තැපැල් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු, හඳුනාගත් ඉඩම තුළ ඉදිකිරීම් කටයුතු සිදු කිරීම සඳහා කටයුතු සලසා දීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කරන ලද ඉල්ලීම**
(ගරු ජයන්ත සමරවීර මහතා - යෝජනා අංක 112)

පර්චස් 20 ක බිම් ප්‍රමාණයක් තැපැල් කාර්යාලයක් ඉදිකිරීම සඳහා අවශ්‍ය නොවන බැවින් රාජ්‍ය හා පෞද්ගලික ව්‍යාපෘතියක් ලෙස දෙපාර්තමේන්තුවට අවශ්‍ය ප්‍රමාණයේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා පියවර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශයේ ලේකම්ට උපදෙස් ලබා දෙන ලදී.

**2.3 විදේශීය ටෙලිනාට්‍ය හා චිත්‍රපට මෙරට මාධ්‍යය තුළ විකාශය කිරීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කරන ලද ඉල්ලීම**
(ගරු ලසන්ත අලගියවන්න මහතා - යෝජනා අංක 156)

විදේශීය ටෙලි නාට්‍යය මෙරට තුල විකාශය කිරීමේදී රජයට අයකරගනු ලබන බදු මුදල සම්බන්ධයෙන් ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය විසින් විමසීමක් කරන ලද අතර දේශීය ටෙලි නාට්‍යය කර්මාන්තය ආරක්ෂා කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස ඉල්ලීමක් කරන ලදී.

කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් විදේශීය ටෙලි නාට්‍ය විකාශය කිරීමේදී බදු අයකිරීම නතර කර තිබුණද 2021 පෙබරවාරි මස සිට යලි බදු පැනවීමට පියවර ගන්නා ලද බව ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් රුවන් සත්කුමාර මහතා විසින් දැනුම් දෙන ලදී.

දේශීය ටෙලි නාට්‍ය කර්මාන්තය ආරක්ෂා කිරීමට අවශ්‍ය නීතිමය පසුබිම සකස් කිරීමට පියවර ගනු ලබන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.4 රජයේ මුද්‍රණාලයේ සේවකයන්ට සිදු වන අසාධාරණය සම්බන්ධයෙන් එහි සේවයේ නියුතු නිලධාරීන් පිරිසක් විසින් කරන ලද ඉල්ලීම**
(ගරු බුද්ධික පතිරණ මහතා - යෝජනා අංක 149)

ඉහත යෝජනාව සඳහා පිළිතුරු වාර්තාව ගරු මන්ත්‍රීතුමා වෙත යොමු කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**2.5 විශ්‍රාම වැටුප නොලැබීම සම්බන්ධයෙන් අංක 145, පුෂ්පාරාම මාවත, පහළ බියන්විල, කඩවත යන ලිපිනයේ පදිංචි එල්.ජී. කරුණාරත්න මහතාගේ ඉල්ලීම**
(ගරු බුද්ධික පතිරණ මහතා - යෝජනා අංක 264)

ඉහත යෝජනාව සඳහා පිළිතුරු වාර්තාව ගරු මන්ත්‍රීතුමා වෙත යොමු කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**2.6 අංක 387A, කුඩාගම්මාන 1/2, වම් ඉවුර, බෙරලිහෙල, තිස්සමහාරාමය යන ලිපිනයේ පදිංචි කේ. ඩබ්. වාසනා ජයමාලි මහත්මියට උප තැපැල් ස්ථානාධිපති තනතුර ලබා නොදීමෙන් සිදු වූ අසාධාරණය සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කරන ලද ඉල්ලීම**
(ගරු විජිත බේරුගොඩ මහතා - යෝජනා අංක 282)

ඉහත යෝජනාව සඳහා පිළිතුරු වාර්තාව ගරු මන්ත්‍රීතුමා වෙත යොමු කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**2.7 මධ්‍යම තැපැල් හුවමාරුවේ සේවය කර ඇති අංක 60/9/53, සහස්පුර නිවාස සංකීර්ණය, බේස්ලයින් පාර, බොරැල්ල, කොළඹ 08 යන ලිපිනයේ පදිංචි පී. ට්‍රෙවින් ක්ලින්ටන් මහතා විසින් නැවත සේවයේ පිහිටුවන ලෙස කර ඇති ඉල්ලීම**
(ගරු විමල් වීරවංශ මහතා - යෝජනා අංක 356)

ඉහත යෝජනාව සඳහා පිළිතුරු වාර්තාව ගරු මන්ත්‍රීතුමා වෙත යොමු කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**3. වෙනත් කටයුතු**

## 3.1 මෙරට මාධ්‍ය වාර්තාකරණ කටයුතු විධිමත් කිරීම හා වෙනත් කරුණු - ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා (සභාපතිතුමා)

### 3.1.1 මාධ්‍ය වාර්තාකරණ කටයුතු විධිමත් කිරීම

මෙරට මාධ්‍ය හැසිරවීමේ කටයුතු විධිමත් කිරීම සඳහා අවශ්‍ය පසුබිම සකස් කිරීමට අවශ්‍ය පියවර ගැනීමේ අරමුණෙන් නීතිඥයන් ඇතුළු විද්වත් පිරිස් සමග සාකච්ඡා පවත්වනු ලබන බවත් එමගින් ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ සේවයේ නියුතු අය ආරක්ෂා කිරීමට මෙන්ම මිලියන 22 ක් වූ මෙරට පුරවැසියන්ට නිවැරදි තොරතුරු සම්ප්‍රේශණය කිරීමට කටයුතු පිළියෙළ කිරීම අමාත්‍යාංශයේ වගකීම කොට සලකන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

තොරතුරු වාර්තාකරණයේදී මාධ්‍යකරුවන් ස්වයං පාලනයක් ඇති කරගත යුතු බව ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී. පුද්ගලික පළිගැනීමේ චේතනාව මත තොරතුරු වාර්තාකරණය නොකළ යුතු බවද පෙන්වා දෙන ලදී. මෙම කටයුතු නියාමනය කිරීම සඳහා ප්‍රමාණවත් නීති පද්ධතියක් හා වාරණයක් තිබීමේ අවශ්‍යතාවය ගරු සභාපතිතුමා විසින් තවදුරටත් පෙන්වා දෙන ලදී.

### 3.1.2 රූපවාහිනී නාලිකා අයිතිය ලබාදීම

රූපවාහිනී නාලිකා අයිතිය ලබාදීම සම්බන්ධයෙන් අවිධිමත් ක්‍රමවේදයක් පැවත ඇති බැවින් නීතිමය රාමුව තුල එකී කටයුතු ක්‍රමවත්ව සිදුකිරීමට අවශ්‍ය ක්‍රමවේදය සකස්කරමින් පවතින බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

## 3.2 නිවැරදි මාධ්‍ය වාර්තාකරණය හා වෙනත් කටයුතු - ගරු ඩයනා ගමගේ මහත්මිය

### 3.2.1 නිවැරදි මාධ්‍ය වාර්තාකරණය

සමහර මාධ්‍ය මගින් සමාජ සංස්ථාවට හා පුරවැසියන්ගේ පෞද්ගලිකත්වයට හානි වන පරිදි මාධ්‍ය වාර්තාකරණයේ යෙදීම මගින් සමාජයට හා පුරවැසියන්ට ඉතාමත් අයහපත් තත්ත්වයක් ඇති කරන බව ගරු මන්ත්‍රීතුමිය විසින් දැනුම් දෙන ලදී.

### 3.2.2 රූපවාහිනී නාලිකා තුල විදේශීය ටෙලිනාට්‍යය විකාශය අවම කිරීම

මෙරට රූපවාහිනී නාලිකා තුල විදේශීය ටෙලි නාට්‍යය විකාශය කිරීම අවම කොට දේශීය ටෙලිනාට්‍යය විකාශය කිරීම සඳහා වැඩි අවස්ථා සලසන ලෙස ගරු මන්ත්‍රීතුමිය විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.2.3 රූපවාහිනී නාලිකාවල පාසැල් ළමුන් සඳහා අධ්‍යාපනික වැඩසටහන් වැඩි වශයෙන් විකාශය කිරීම

රූපවාහිනී නාලිකාවන්හි වැඩි වශයෙන් අධ්‍යාපනික වැඩසටහන් විකාශය කිරීමට කටයුතු කරන ලෙසත් පුද්ගලික රූපවාහිනී නාලිකාද ඒ සඳහා යොදවා ගන්නා ලෙසත් ගරු මන්ත්‍රීතුමිය විසින් ඉල්ලීමක් කරන ලදී.

රූපවාහිනී නාලිකා ආරම්භ කිරීම සඳහා බලපත්‍ර ලබාදීමේදී අධ්‍යාපනික වැඩසටහන් විකාශය අනිවාර්යය කිරීමට නීතිමය රෙගුලාසි පැණවීමට කටයුතු කරන මෙන් ද ගරු මන්ත්‍රීතුමිය විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.2.4 ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය තුළ එහි සභාපතිවරයාට අයිති ටෙලි නාට්‍ය විකාශය කිරීම

ස්වාධීන රූපවාහිනීය මගින් එහි සභාපතිවරයාට අයත් ටෙලිනාට්‍යය විකාශය කිරීම නිසා අනෙකුත් කලාකරුවන්ට අවස්ථාවන් නොලැබීයාම සම්බන්ධයෙන් ඉදිරිපත් වී තිබෙන චෝදනා සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමිය විසින් විමසීමක් කරන ලදී.

ඉහත කී ටෙලිනාට්‍ය පුද්ගලික ආයතනයක් මගින් ස්වාධීන රූපවාහිනී ආයතනයේ පිළිගත් ප්‍රතිපත්තීන්ට අනුව නිෂ්පාදනය කරන අතර ඒවා විකාශය කිරීම සඳහා අදාළ කමිටුව මගින් අනුමැතිය ලබාගෙන ඇති බවත් ස්වාධීන රූපවාහිනී මාධ්‍යජාලයේ සාමාන්‍යාධිකාරී ඩබ්.පී.ඒ.එම්. විජේසිංහ මහතා විසින් ප්‍රකාශ කරන ලදී. එම ටෙලි නාට්‍යය අධ්‍යක්ෂණය කිරීමේ කාර්යය පමණක් ආයතනයේ සභාපති විසින් සිදු කර ඇති බවද විජේසිංහ මහතා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

ටෙලි නාට්‍යය සඳහා පිටපත් ලිවීමේදී ඒවායේ ප්‍රමිතිය සම්බන්ධයෙන් වඩා සැලකිලිමත් විය යුතු බව ගරු උද්දික ප්‍රේමරත්න මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

ස්වාධීන රූපවාහිනී ආයතනය සම්බන්ධයෙන් කිසිදු අක්‍රමිකතාවයක් සිදු නොවීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී

### 3.2.5 මාධ්‍යවේදීන්ට කොවිඩ් එන්නත ලබාදීම

ලියාපදිංචි වී ඇති සහ ලියාපදිංචි වී නොමැති මාධ්‍යවේදීන්ටද වයස් සීමාවකින් තොරව කොවිඩ් එන්නත ලබා දීමට කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රීතුමිය විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.2.6 මාධ්‍ය නාලිකාවල දේශපාලන සංවාද සඳහා කාන්තා මන්ත්‍රීවරියන්ට අවස්ථාව ලබාදීම

මාධ්‍ය නාලිකාවල දේශපාලන සංවාද සඳහා කාන්තා මන්ත්‍රීවරියන්ට ප්‍රමාණවත් අවස්ථාවන් ලබාදීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමිය විසින් ඉල්ලීමක් කරන ලදී.

## 3.3 අන්තර් ජාලය තුළ ප්‍රවෘත්ති පළකරනු ලබන වෙබ් අඩවි ලියාපදිංචි කිරීමට කටයුතු කිරීම සහ වෙනත් කරුණු - ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

### 3.3.1 අන්තර් ජාලය තුළ ප්‍රවෘත්ති පළකරනු ලබන වෙබ් අඩවි ලියාපදිංචි කිරීමට කටයුතු කිරීම

අන්තර් ජාලයේ මෙරට ප්‍රවෘත්ති පළ කරනු ලබන වෙබ් අඩවි විශාල ප්‍රමාණයක් පවතින බැවින් එම වෙබ් අඩවි නීත්‍යානුකූලව ලියාපදිංචි කිරීමට කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

එම වෙබ් අඩවි ලියාපදිංචි කළයුතු බවට මේ වනවිටද ප්‍රතිපත්තිමය වශයෙන් තීරණය කර ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**3.3.2 මාධ්‍ය වාර්තාකරුවන් විසින් පුද්ගලික හැඳුනුම්කම් මත ප්‍රවෘත්ති වාර්තාකරණය කිරීම**

ඇතැම් මාධ්‍ය වාර්තාකරුවන් විසින් පුද්ගලික හැඳුනුම්කම් මත ප්‍රවෘත්ති වාර්තා කිරීම නියාමනයට අවශ්‍ය පියවර ගන්නා ලෙස ඉල්ලීමක් කරන ලදී.

ඒ සඳහා අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**3.4 යාපනය විශ්ව විද්‍යාලයේ බහුවිධ සන්නිවේදන මධ්‍යස්ථානයක් පිහිටුවීම - ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා**

යාපනය විශ්ව විද්‍යාලයේ ජනමාධ්‍ය අංශය තුළ සියළු පහසුකම් සහිත බහුවිධ සන්නිවේදන මධ්‍යස්ථානයක් ඉදිකිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙය උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් කරුණක් බැවින් කාරක සභාවේ ඉල්ලීමක් ලෙස ඉහත ඉල්ලීම අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් කාරක සභාවේ ලේකම් වෙත උපදෙස් ලබා දෙන ලදී.

පුවත්පත් මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා කටයුතු කෙරෙමින් පවතින බව පුවත්පත් මණ්ඩලයේ සභාපති මහින්ද පතිරණ මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**4.** කාරක සභාව ප.ව. 3.30 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

**වනජීවී හා වන සංරක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**දෙවැනි රැස්වීම - 2021 සැප්තැම්බර් 21**

**පැමිණ සිටි සාමාජික මන්ත්‍රීන්**

ගරු සී.බී. රත්නායක මහතා (සභාපති)
ගරු විමලවීර දිසානායක මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු චාමර සම්පත් දසනායක මහතා
ගරු කුමාරසිරි රත්නායක මහතා

**පැමිණ සිටි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු අංගජන් රාමනාදන් මහතා
ගරු මහින්ද අමරවීර මහතා
ගරු පියංකර ජයරත්න මහතා
ගරු ජානක වක්කුඹුර මහතා
ගරු කනක හේරත් මහතා
ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
ගරු ජගත් පුෂ්පකුමාර මහතා

ගරු හරීන් ප්‍රනාන්දු මහතා
ගරු ශාන්ත බණ්ඩාර මහතා
ගරු මනූෂ නානායක්කාර මහතා
ගරු අශෝක ප්‍රියන්ත මහතා
ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
ගරු වාල්ස් නිර්මලනාදන් මහතා
ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා
ගරු ඉෂාක් රහුමාන් මහතා
ගරු වරුණ ලියනගේ මහතා
ගරු අමරකීර්ති අතුකෝරළ මහතා
ගරු අකිල එල්ලාවල මහතා
ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා
ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා
ගරු උදයකාන්ත ගුණතිලක මහතා
ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය
ගරු කුලසිංහම් තිලීපන් මහතා
ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා
ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා
ගරු එච්. නන්දසේන මහතා
ගරු කිංස් නෙල්සන් මහතා
ගරු අනුප පස්කුවල් මහතා
ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය
ගරු මායාදුන්න චින්තක අමල් මහතා
ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා
ගරු අජිත් රාජපක්ෂ මහතා
ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා
ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා
ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
ගරු ගාමිණී වලේබොඩ මහතා
ගරු වීරසුමන වීරසිංහ මහතා
ගරු ඩයනා ගමගේ මහත්මිය

## 1. නියෝග සහ වාර්ෂික වාර්තා සලකා බැලීම

### 1.1. (469 අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 71 වගන්තිය සමඟ කියවිය යුතු, එකී ආඥා පනතේ 22අ වගන්තිය යටතේ නියෝග

(469 අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 71 වගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥා පනතේ 22අ වගන්තිය යටතේ වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩ පිළිවෙළවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 අගෝස්තු 19 දිනැති අංක 2241/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග (2021 සැප්තැම්බර් මස 07 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

මෙම නියෝගය සඳහා  කාරක සභාවේ එකඟතාවය ලබා දෙන ලදී.

**1.2. වාර්ෂික වාර්තා සලකා බැලීම**

**1.2.1.** 2017 වර්ෂය සඳහා රාජ්‍ය දැව සංස්ථාවේ වාර්ෂික වාර්තාව
**1.2.2.** 2018 වර්ෂය සඳහා රාජ්‍ය දැව සංස්ථාවේ වාර්ෂික වාර්තාව

**2. පසුගිය කාර්ය සටහන්වලින් පැන නඟින කරුණු**

උක්ත රැස්වීමේ දී ගරු මන්ත්‍රීවරුන් ඉදිරිපත් කරන ලද යෝජනා සහ ලිඛිත යෝජනා සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ජනරාල්වරයා විසින් හෝ අදාළ ගරු මන්ත්‍රීතුමන්ලාට පිළිතුරු යවා ඇති බව අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3. වෙනත් කරුණු**

**3.1. ගරු කුමාරසිරි රත්නායක මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**

**3.1.1. ඔක්කම්පිටිය ඉලුක්පිටිය දක්වා අලි වැට හා අගල් ඉදිකිරීම**

ඔක්කම්පිටිය සිට ඉලුක්පිටිය දක්වා කිලෝ මීටර් 3 ½ ක පමණ ප්‍රමාණයක් සඳහා ඉදිකිරීම් ආරම්භ කර ඇති අලි වැට සහ අගල් කැපීමේ කටයුතු අවසන් කිරීමට කඩිනමින් කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**3.1.2. ආනපල්ලම අලි අගල ඉදිකිරීම**

ආනපල්ලම අලි අගල ඉදිකිරීමේ කටයුතු අවසන් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමට ඇති හැකියාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මේ සඳහා අවශ්‍ය පියවර ගන්නා බව ගරු රාජ්‍ය අමාත්‍යාතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.2. ගරු පියංකර ජයරත්න මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**

**3.2.1. පුත්තලම දිස්ත්‍රික්කයේ අලි මිනිස් ගැටුම**

පුත්තලම දිස්ත්‍රික්කය තුළ අලි අගල් කැපීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

පස් ඉවත් කිරීම සඳහා මාර්ග ඉදිකිරීමේ කටයුතු වල නියුතු ආයතන හා සාකච්ඡා කර, මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.2.2. ආනමඩුව ප්‍රදේශයේ සිටින අලි ඇතුන් විල්පත්තුව අභය භූමියට පලවා හැරීම**

ආනමඩුව ප්‍රදේශයේ ගැවසෙන අලි ඇතුන් එම ප්‍රදේශ මායිමේ පිහිටා ඇති විල්පත්තුව අභය භූමිය වෙත පළවා හැරීමට අවශ්‍ය පියවර ගන්නා මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම වැඩ පිළිවෙල පිළිබඳව අදාළ ආයතන හා පුද්ගලයින් සමඟ මූලික සාකච්ඡාවක් පැවැත්වීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් වනජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත උපදෙස් ලබා දෙන ලදී.

## 3.3. අලි මිනිස් ගැටුම් වැළැක්වීම සඳහා ආචාර්ය පෘථිවිරාජ් ප්‍රනාන්දු මහතා විසින් ඉදිරිපත් කළ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම - ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා

ආචාර්ය පෘථිවිරාජ් ප්‍රනාන්දු මහතා විසින් දීර්ඝ අධ්‍යයනයකින් පසුව අලි මිනිස් ගැටුම් වැළැක්වීමට ක්‍රියාවට නංවන ලද ක්‍රමවේදය අත්හදා බලන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

එම කාර්යය දැනට ක්‍රියාත්මක වෙමින් පවතින බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 3.4. ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 3.4.1. හම්බන්තොට දිස්ත්‍රික්කයේ කිරි ගොවියන් සඳහා තෘණ භූමි ලබා දීම

හම්බන්තොට දිස්ත්‍රික්කයේ කිරි ගොවීන් සඳහා ලබා දීමට සැලසුම් කළ වන සංරක්ෂණ කලාප තුළ පිහිටි තෘණ භූමි කිරි ගොවින්ට ලබා දීමට කඩිනම් පියවර ගන්නා මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.

මේ සම්බන්ධයෙන් කඩිනම් විසඳුමක් ලබා දීමට අවශ්‍ය කටයුතු වහාම සිදු කරන මෙන් ගරු සභාපතිතුමා විසින් වන සංරක්ෂණ ජනරාල් වෙත උපදෙස් ලබා දෙන ලදී.

### 3.4.2. අලි කළමනාකරණ රක්ෂිත තුළ පිහිටි ගල් මෝල් සඳහා බලපත්‍ර ලබා ගැනීම

අලි කළමනාකරණ ඒකකය පිහිටුවීමේ කටයුතු අවසන්ව නොමැති බැවින් රක්ෂිතය තුළ පිහිටි ගල් මෝල් සඳහා බලපත්‍රවල කාලසීමාව දීර්ඝ කිරිම ප්‍රමාද වීම තුළින් සංවර්ධන කටයුතු වලට බාධා ඇති වන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අලි කළමනාකරණ රක්ෂිතය ගැසට් කිරීමෙන් නීතිය ක්‍රියාත්මක කරන ආයතන සඳහා පවරා ඇති වගකීම වෙනස් වීම පමණක් සිදුව ඇති බැවින් ඉහත සඳහන් ගල් මෝල් සඳහා පවත්නා නීතිය යටතේම ඉදිරියට කටයුතු කළ හැකි බව වනජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අද දින පැවැති අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ දී සාකච්ඡාවට භාජනය වූ කරුණු පදනම් කරගෙන ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටුවේ දී මේ පිළිබඳව සාකච්ඡා කර අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන මෙන් ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීතුමා වෙත දැනුම් දෙන ලදී.

**3.5. මොණරාගල දිස්ත්‍රික්කයේ කුඹුක්කන පැල තවාන වටා අලි වැට ඉදි කිරීම - ගරු කනක හේරත් මහතා**

මොණරාගල දිස්ත්‍රික්කයේ කුඹුක්කන පැල තවාන වටා අලි වැට ඉදි කිරීමේ කටයුතු සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මෙම කටයුතු අවසන් කිරීමට අවශ්‍ය බලශක්ති කට්ටල (Energizer) කාර්මික තාක්ෂණ ආයතනය මඟින් ලබා ගැනීමට ඇති හැකියාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට කාර්මික තාක්ෂණ ආයතනයේ නිලධාරීන් මීළඟ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවට කැඳවන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම් වෙත උපදෙස් ලබා දෙන ලදී.

**3.6. ගොපළුගල රක්ෂිතය වැඩි දියුණු කිරීම - ගරු වීරසුමන වීරසිංහ මහතා**

මාතර දිස්ත්‍රික්කයේ කොටපල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් ගොපළුගල රක්ෂිත භූමිය වැඩි දියුණු කර සංරක්ෂණය කිරීමට අවශ්‍ය කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

දැනට ඉඩම් ප්‍රතිසංස්කරණ සභාව සතු මෙම භූමිය වන සංරක්ෂණ මායිම්වලට ඇතුළත් කර රක්ෂිතයත් ලෙස අත්පත් කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා බව වන සංරක්ෂක ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම භූමිය රක්ෂිතයක් ලෙස අත්පත් කර ගැනීමට දිස්ත්‍රික් සංවර්ධන කමිටුව හරහා යෝජනාවක් ඉදිරිපත් කරන මෙන් ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීතුමා වෙත දැනුම් දෙන ලදී.

**3.7. මීරිගම ප්‍රදේශයේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම්වල පදිංචිකරුවන් සඳහා හිමිකම් ඔප්පු ලබා ගැනීම - ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය**

මීරිගම ප්‍රදේශයේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම්වල නිවාස ඉදිකර වසර 50 කට අධික කාලයක් ස්ථිර පදිංචිකරුවන් ලෙස වාසය කරන ජනතාව සඳහා එම නිවාස වල ස්ථිර හිමිකාරීත්වය ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමිය විසින් ඉල්ලා සිටින ලදී.

මේ සඳහා දිස්ත්‍රික් සංවර්ධන කමිටුව හරහා යෝජනාවක් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීතුමිය වෙත දැනුම් දෙන ලදී.

එම යෝජනාව අනුව නිවාස සඳහා අයිතිය ලබා දීමට හැකියාවක් තිබේ ද යන්න සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් වන සංරක්ෂක ජනරාල් වෙත උපදෙස් ලබා දෙන ලදී.

## 3.8. ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 3.8.1. ගම්පහ දිස්ත්‍රික්තයේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් වල වගා කටයුතු සිදු කිරීමට අවස්ථාව ලබා ගැනීම

ගම්පහ දිස්ත්‍රික්කයේ වන සංරක්ෂණ මායිම්වලට ඇතුළත් කර ඇති ඉඩම් වල වසර ගණනාවක සිට වගා කටයුතු සිදුකරන ජනතාවට තවදුරටත් වගා කටයුතු සිදු කර ගැනීමට අවස්ථාව ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

එම ඉඩම් නිදහස් කිරීමට හැකියාවක් තිබේ ද යන්න පරීක්ෂා කර බැලීම සඳහා එම ඉඩම්වල තොරතුරු සඳහන් කර ඉල්ලීමක් ඉදිරිපත් කරන මෙන් ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

### 3.8.2. අත්තනගල්ල ප්‍රදේශයේ විහාරස්ථාන සඳහා ඇත් පැටවුන් දෙදෙනෙකු ලබා ගැනීම

ඓතිහාසික අත්තනගල්ල රජමහා විහාරස්ථානය සහ වාරණ රජමහා විහාරස්ථානය සඳහා ඇත් පැටවුන් දෙදෙනෙකු ලබා දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.

පෙරහැර පවත්වනු ලබන අවස්ථාවන් වලදී ඒ සඳහා අලි ඇතුන් ලබා දිය හැකි නමුත් ස්ථිර පදනමින් විහාරස්ථාන සඳහා ඇත් පැටවුන් ලබා දීමට හැකියාවක් නොමැති බව ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 3.9. ගරු අංගජන් රාමනාදන් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 3.9.1. යාපනය හා කිලිනොච්චි දිස්ත්‍රික්ක වල පවතින ගැටලු

වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය සතු ඉඩම්වල දීර්ඝ කාලීනව පදිංචිව සිටින ජනතාවට එම ඉඩම් නිදහස් කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.
මෙම කරුණු පිළිබඳව ස්ථානීය පරීක්ෂාවක් සිදුකර ගරු මන්ත්‍රීතුමා සහ යාපනය දිස්ත්‍රික්කය නියෝජනය කරන සෙසු මන්ත්‍රීවරුන් සමඟ සාකච්ඡාවක් පවත්වා විසඳුමක් ලබා දීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 3.9.2. ඉඩම් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද ලිපිය පිළිබඳව

නව ඉඩම් ගැසට් කිරීම සඳහා අධිකාරී බලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට පවරා ඇති බව දැනුම් දෙමින් නිකුත් කරන ලද ලිපිය පිළිබඳව යාපනය සහ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ වන සංරක්ෂණ නිලධාරීන් දැනුවත් වී නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 3.10. අම්පාර මඩකලපුව මායිමේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් කජු වගාව සඳහා සිවිල් ආරක්ෂක බලකායට ලබා දීම - ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

අම්පාර මඩකලපුව මායිමේ වන සංරක්ෂණ කලාපයට ඇතුළත් කෙවිලියාමඩු මංගලගම ප්‍රදේශයේ ඉඩම් කජු වගා කිරීම සඳහා සිවිල් ආරක්ෂක බලකාය වෙත ලබා දී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඒ පිළිබඳව පරීක්ෂා කර ගරු මන්ත්‍රීතුමා වෙත වාර්තාවක් ලබා දෙන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 3.11. ගරු ඩයනා ගමගේ මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 3.11.1. වන අලි ගම්මානවලට පැමිණීම වැළැක්වීමට අප්‍රිකානු රටවල් ගනු ලබන පියවරවල් අධ්‍යයනය කිරීම

වන අලි ගම් වැදීම වැළැක්වීම සඳහා අප්‍රිකානු රටවල් ගනු ලබන සාර්ථක ක්‍රියාමාර්ග අධ්‍යයනය කර ශ්‍රී ලංකාවට ගැළපෙන ලෙස එම ක්‍රමවේදයන් යොදා ගැනීමට වැඩපිළිවෙලක් සකස් කළ යුතු බවට ගරු මන්ත්‍රීතුමිය විසින් යෝජනා කරන ලදී.

### 3.11.2. වන අලීන්ට අවශ්‍ය ආහාර වගා කිරීම සඳහා කැලෑ ප්‍රදේශයක් වෙන් කිරීම

වන අලි ආහාරයට ගන්නා කෑම වර්ග කැලෑව තුළ වෙනම ප්‍රදේශයක රාජ්‍ය අනුග්‍රහය මඟින් වගා කර වන අලි එම ප්‍රදේශ වෙත යොමු කිරීම තුළින් වන අලි ගම් වැදීම වළක්වා ගත හැකි බවට ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාව වෙත දැනුම් දෙන ලදී.

එසේම, වන අලි ගැවසෙන ප්‍රදේශවල වී අස්වැන්න ආරක්ෂා කර ගැනීමට වී ගබඩා සකස් කිරීමට සහ එම ගබඩා ආරක්ෂා කිරීම සඳහා වැඩ පිළිවෙලක් සකස් කළ යුතු බවට ගරු මන්ත්‍රීතුමිය විසින් යෝජනා කරන ලදී.
රාජ්‍ය අමාත්‍යාංශය විසින් වී තොග රැස් කිරීමේ සහ ආරක්ෂා කිරීමේ කටයුතු ආරම්භ කර ඇති බවත් වන අලි ඇතුන් ආහාරයට ගන්නා භෝග වගා කිරීම පිළිබඳව ගරු මන්ත්‍රීතුමියගේ යෝජනාව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගන්නා බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ආර්ථික මධ්‍යස්ථානවලින් ඉවත් කරන අලි ඇතුන් කෑමට ප්‍රිය කරන පළතුරු සහ එළවළු අලි ඇතුන් සඳහා ලබා දීමට කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රීතුමිය විසින් ඉල්ලීමක් කරන ලදී.

## 3.12. අනුරාධපුර දිස්ත්‍රික්කයේ වනජීවී හා වන සංරක්ෂණ කලාපයට ඇතුළත් ඉඩම් වගා කටයුතු සඳහා ලබා දීම - ගරු ඉෂාක් රහුමාන් මහතා

අනුරාධපුර දිස්ත්‍රික්කයේ වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය සතු ඉඩම්වල වගා කටයුතු සිදු කළ ජනතාවට එම ඉඩම්වල නැවතත් වගා කටයුතු සිදු කිරීමට අවස්ථාවක් ලබා දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට ඉල්ලීමක් කරන ලදී.

රක්ෂිත කලාපවලට ඇතුළත් ඉඩම්වල මීට පෙර වගා කටයුතු කළ ජනතාවට නැවතත් එම ඉඩම්වල වගා කිරීමට අවසර ලබා දී ඇති බව ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 3.13. ගරු ජගත් පුෂ්පකුමාර මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 3.13.1. අවශේෂ කැළෑ තුළ මායිම් වෙන් කර ගනිමින් කැළෑ එළි කිරීම

මේ පිළිබඳව ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පොලිස්පතිතුමාගේ සහභාගීත්වයෙන් පැවැති සාකච්ඡාවේ දී, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු ඉඩම්වල අනවසර එළි පෙහෙළි කිරීම් වැටලීමේ කටයුතු පොලිස් දෙපාර්තමේන්තුවේ සහය ඇතිව සිදු කිරීමට තීරණය වූ බව අතිරේක වන සංරක්ෂණ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ පිළිබඳව තවදුරටත් පරීක්ෂා කර බැලීම සඳහා නිලධාරී කණ්ඩායමක් යෙදවීමට අවශ්‍ය පියවර ගන්නා බව ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

### 3.13.2. දහයියාගල අභය භූමිය

2002 වර්ෂයේ දී දහයියාගල අභය භූමියක් ලෙස ගැසට් කරන අවස්ථාව වන විට එම භූමියේ පදිංචිව සිටි ජනතාව එම ස්ථානවලම පදිංචිය තහවුරු කර ගත හැකි පරිදි අභය භූමියට අයත් මායිම් සංශෝධනය කර නැවත ගැසට් පත්‍රයක් නිකුත් කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් තවදුරටත් ඉල්ලා සිටින ලදී.

අදාළ ප්‍රාදේශීය ලේකම් සමග සාකච්ඡා කර මෙම කටයුතු නිරවුල් කර ගැනීමට අවශ්‍ය කඩිනම් පියවර ගන්නා මෙන් ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් වනජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනාරාල් වෙත උපදෙස් ලබා දෙන ලදී.

## 3.14. ලාහුගල පොතුවිල් වන භූමි මායිම් නිරවුල්කරණය - ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා

වේගාමම් ප්‍රදේශයේ ලාහුගල පොතුවිල් වන භූමි මායිම් නිරවුල් කිරීමේ කටයුතු අවසන් කිරීමට කඩිනම් පියවරක් ගන්නා මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.

මේ සඳහා ඉඩම් අයිතිය තහවුරු කර ගැනීම සඳහා තොරතුරු රැස් කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතින බව වනජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 3.15. ගරු ශාන්ත බණ්ඩාර මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 3.15.1. අලි තර්ජනයෙන් ජනතාව ආරක්ෂා කිරීමට වැඩපිළිවෙලක් සකස් කිරීම

පොල්පිතිගම අලි කොරිඩෝව සඳහා වෙන් කළ ප්‍රදේශය එහි පදිංචිකරුවන් වෙත නැවත ලබා දීමට ගන්නා ලද තීරණය අනුව එම ප්‍රදේශවාසීන් අලි තර්ජනයෙන් ආරක්ෂා කිරීමට වැඩ පිළිවෙලක් සකස් කර තිබේ ද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් විමසීමක් කරන ලදී.

වන අලින්ට ජලය ලබා ගැනීම සඳහා හක්වටුනා ඔය දිගේ ගමන්කර හක්වටුනා ජලාශය වෙත පැමිණීමට හැකිවන පරිදි සැලසුම් සකස් කර ඉඩම් නියමානුකූල කිරීම සිදු කර ඇති බව වනජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනාරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 3.15.2. ගල්ගමුව ප්‍රදේශයේ වනජීවී හා වන සංරක්ෂණ නිලධාරීන්ගේ පහසුකම් පිළිබඳ ගැටලු

වනජීවී හා වන සංරක්ෂණ නිලධාරීන්ගේ පවතින හිඟය සහ නිලධාරීන්ට රාජකාරී කටයුතු වල නිරත වීමට ප්‍රවාහන පහසුකම් නොමැතිවීම පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවේ අවධානයට යොමු  කරන ලදී.

නිලධාරින්ට අවශ්‍ය පහසුකම් සලසාදීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතින බවත් එය ජාතික ප්‍රතිපත්තියක් ලෙස ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අලි වෙඩි ලබා දීමේ ක්‍රමවේදය හා නිකුත් කරන ප්‍රමාණය පිළිබඳව ද ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

අලි වෙඩි නිකුත් කිරීම ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ වනජීවී දෙපාර්මේන්තුව හරහා සිදු කරන අතර නිකුත් කරන ප්‍රමාණය අට ලක්ෂය සිට දොලොස් ලක්ෂය දක්වා වැඩි කර ඇති බවත් ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

## 3.16. ගරු අමරකීර්ති අතුකෝරළ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 3.16.1. බකමූණ නගරයේ වනජීවී අභයභූමි කලාපය තුළ පදිංචි ජනතාව සඳහා ඔප්පු ලබා දීම

ඇළහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් බකමූණ නගරයේ වනජීවී අභයභූමි කලාපය තුළ පදිංචි ජනතාව සඳහා ඉඩම් ඔප්පු ප්‍රදානය කිරීමේ කටයුතු කඩිනම් කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

මේ පිළිබඳව අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් වනජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් ලබා දෙන ලදී.

### 3.16.2. අතරගල්ලෑව කිරිඔය ප්‍රදේශයේ කාබනික පොහොර නිෂ්පාදනයට ලබා දී ඇති ඉඩම නිදහස් කර ගැනීම

වනජීවී කලාපයට අයත් කාබනික පොහොර නිෂ්පාදනයට ලබා දී ඇති මෙම ඉඩම මෙහෙයුම් කටයුතු සඳහා නිදහස් කර දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

එම ඉඩම නිදහස් කිරීම සම්බන්ධයෙන් අදාළ සහකාර අධ්‍යක්ෂවරයාට උපදෙස් ලබා දී ඇති බව වනජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අද දින අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ තීරණය පරිදි ඉදිරි කටයුතු කරන මෙන් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 3.17. ගරු වරුණ ලියනගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 3.17.1. උඩවලව රක්ෂිතයට ඇතුළත් තෘණ වගාව සඳහා ලබා දී ඇති භූමිය නැවත රක්ෂිතයට එකතු කිරීම

වැලිගෙපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හඳගිරිය ප්‍රදේශයේ තෘණ වගාව සඳහා මුදා හැර ඇති උඩවලව රක්ෂිතයට අයත් බිම් නැවත රක්ෂිතයට එක් කර ගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

එම ප්‍රදේශය නැවත රක්ෂිතයට ඇතුළත් වන ලෙස විදුලි වැට සකස් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

### 3.17.2. පට්ටිපොළ සිට ඔහිය වෙත ප්‍රවේශ වන මාර්ගයේ ප්‍රවේශපත් නිකුත් කිරීම

මෙම මාර්ගය භාවිතා කරන ලෝකාන්තය නැරඹීම සඳහා ගමන් නොකරන මගීන්ට ප්‍රවේශපත් නිකුත් කිරීම අසාධාරණ කටයුත්තක් බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ පිළිබඳ කරුණු පරීක්ෂා කර සතියක් තුළ වාර්තාවක් ගරු මන්ත්‍රීතුමාට යොමු කරන මෙන් ගරු සභාපතිතුමා විසින් වනජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් ලබා දෙන ලදී.

### 3.17.3. 2014 වසරේ බඳවාගත් තාවකාලික (ආදේශක) සේවකයින් ස්ථිර කිරීම

2014 වසරේ බඳවාගත් අනියම් සේවකයින් ස්ථිර කිරීමට වැඩපිළිවෙලක් සකස් කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.

එම කරුණ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්නා බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 3.17.4. වන සංරක්ෂණ කලාපයට අයත් බෙලිහුල් ඔය සංචාරක ප්‍රදේශයේ කඳු නැගීමට සහ කඳවුරු බැඳීමට සංචාරකයන් සඳහා අවස්ථාවක් ලබා දීම

මෙම ප්‍රදේශයේ කඳු නැගීමට සහ කඳවුරු බැඳීමට පැමිණෙන සැබෑ සංචාරකයින් සඳහා එම ප්‍රදේශයේ සංචාරය කිරීමට අවස්ථාව ලබා දීමට වැඩපිළිවෙලක් සකස් කර දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.
මේ සඳහා අදාළ සියලු අංශ සම්බන්ධ කර ගෙන සංචාරක මුර පොලක් ස්ථාපිත කිරිමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් වන සංරක්ෂක ජනරාල් වෙත උපදෙස් ලබා දෙන ලදී.

## 3.18. වනජීවී කලාපයට අයත් පදවිය අභයභූමිය තුළ පදිංචිකරුවන්ට නිවාස අයිතිය ලබා දිම - ගරු එච්. නන්දසේන මහතා

මෙම අභයභූමිය ගැසට් කිරීමට පෙර එහි දීර්ඝ කාලීනව පදිංචිව සිටි ජනතාවට ස්ථිර නිවාස අයිතිය ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

එම නිවාස පිළිබඳ තොරතුරු වනජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 3.19. හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ සිදුවන වන විනාශය - ගරු මහින්ද අමරවීර මහතා

හම්බන්තොට දිස්ත්‍රික්කයේ වනජීවී හා වන සංරක්ෂණ කලාප තුළ පිහිටි ඉඩම් අනවසරයෙන් එළි පෙහෙලි කිරීම පිළිබඳව අවධානය යොමු කරන මෙන් ගරු අමාත්‍යතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.

මෙවැනි නීති විරෝධී ක්‍රියාවන් සඳහා නීතිමය ක්‍රියා මාර්ග ගැනීමේ දී වැරදි සඳහා උපරිම දඬුවම් පනවා කටයුතු කරන ලෙස ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් වනජීවී හා වන සංරක්ෂණ නිලධාරීන් වෙත උපදෙස් ලබා දෙන ලදී.

අද දින අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා තීරණය අනුව මෙම කරුණ පිළිබඳව විශේෂ අවධානය යොමු කර වහාම අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් වනජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් ලබා දෙන ලදී.

## 3.20. ගරු මායාදුන්න චින්තක අමල් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 3.20.1. තබ්බෝව රක්ෂිතය තුළ පදිංචිකරුවන් මුහුණ පාන ගැටළු

කරුවලගස්වැව තබ්බෝව රක්ෂිතයේ මායිම් නියමානුකූලව සිතියම්ගත නොකිරීම හේතුවෙන් එම ප්‍රදේශයේ පදිංචිකරුවන් විවිධ ගැටලු වලට මුහුණපාන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ප්‍රදේශවාසීන් විසින් රක්ෂිත තුළ සිදු කරන අනවසර කටයුතු වලට දඬුවම් ලබා දීමේදී සිදු කළ වරදට පමණක් නොව වෙනත් හේතු මත දඬුවම් ලබා දීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක වන බව ගරු මන්ත්‍රීතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මායිම් ලකුණු කරන අවස්ථාවලදී එම ස්ථානවලට වනජීවී හා වන සංරක්ෂණ නිලධාරීන් හා ප්‍රාදේශීය ලේකම් යොමු කිරීමට කටයුතු කරන ලෙස ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් වනජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් ලබා දෙන ලදී.

රක්ෂිතය තුළ සිදුවන අනවසර ක්‍රියාකාරකම් සඳහා දඬුවම් ලබා දීම වනජීවී වැරදිවලට පමණක් සීමා කරන ලෙස ද ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබා දෙන ලදී.

### 3.20.2. තම්බපණ්ණි රජමහා විහාර භූමිය වෙන්කර ගැනීම

වනජීවී හා වන සංරක්ෂණ කලාපය තුළ පිහිටි තම්බපණ්ණි රජමහා විහාර භූමිය වෙන්කර දීමේ කටයුතු කඩිනම් කර දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.
මේ පිළිබඳව අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් ගරු සභාපතිතුමා විසින් වනජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් ලබා දෙන ලදී.

### 3.21. ගාල්ල කොට්ටව රක්ෂිතය සම්බන්ධව - ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගාල්ල කොට්ටව රක්ෂිතය ගැසට් නිවේදනයක් මඟින් ප්‍රකාශයට පත් කර තිබේ ද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් විමසීමක් කරන ලදී.

කොට්ටව රක්ෂිතයක් ලෙස ගැසට් කර ඇති බවට වන සංරක්ෂක ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 3.22. සල්ගල රක්ෂිතයට අයත් ලෙනගල ග්‍රාම නිලධාරී වසමට යාබදව අලුතින් වැවක් සාදා ගැනිම - ගරු උදයකාන්ත ගුණතිලක මහතා

කෑගල්ල දිස්ත්‍රික්කයේ සල්ගල රක්ෂිතයට ඇතුළත් ලෙනගල ග්‍රාමනිලධාරී වසමේ පිහිටි සල්ගල ස්වාභාවික ජලාශයට ඉහළින් පිහිටි තැනිතලා මුඩු බිම භාවිතා කර වැවක් ඉදිකර ගැනීමට අනුමැතියක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

මේ පිළිබඳව පරීක්ෂා කර බලා අවශ්‍ය පියවර ගන්නා බව ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

### 3.23. ගරු චාල්ස් නිර්මලනාදන් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

#### 3.23.1. මන්නාරම මුලතිව් ප්‍රදේශය ආශ්‍රිතව ඉදිකරන කුරෛ ජලාශයේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරිම

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝගය මත ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නතර කළ කුරෛ ජලාශයේ ඉදිකිරීම් අවසන් කිරීම සඳහා අදාළ අනුමැතිය ලබා දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

මෙම ව්‍යාපෘතිය සම්බන්ධ පාරිසරික බලපෑම වාර්තාව ලැබීමෙන් පසු එහි කරුණු සලකා බලා අවශ්‍ය පියවර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් වන සංරක්ෂක (පරිසර කළමනාකරණ හා සම්පත්) වෙත උපදෙස් ලබා දෙන ලදී.

#### 3.23.2. වන සංරක්ෂණ කලාපයට අයත් මුලතිව් මුරුගණ්ඩි ග්‍රාම නිලධාරී වසමට අයත් අක්කර 10 ක පමණ ප්‍රදේශය නැවත ජනතාවට ලබා ගැනීම

වන සංරක්ෂණ කලාපය තුළ අක්කර 10 ක පමණ ප්‍රදේශයක ජීවත් වූ ජනතාවට එම ඉඩම් නැවත ලබා දීම පිළිබඳව අවධානය යොමු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.

#### 3.23.3. මුලතිවු දිස්ත්‍රික්කයේ කුරුඳුකුලම් වැව ප්‍රදේශයේ කුඹුරු ඉඩම් නැවත ලබා ගැනීම

මුලතිවු දිස්ත්‍රික්කයේ වන සංරක්ෂණ කලාපයට අයත් කුරුඳුකුලම් වැව ප්‍රදේශයේ කුඹුරු ඉඩම් වල තවදුරටත් වගා කටයුතු සිදු නොකරන ලෙස වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාව වෙත දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් ස්ථානීය පරීක්ෂාවක් සිදු කර වාර්තාවක් ලබා ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් වන සංරක්ෂක ජනරාල් වෙත උපදෙස් ලබා දෙන ලදී.

### 3.23.4. මන්නාරම දිස්ත්‍රික්කයේ පල්ලි මුනෙ, පරපාන්කන්දල්, වංගාලෙ වැනි ගම්මාන වන භූමි කලාප තුළට ඇතුළත් කිරීම

වනජීවී කලාපයට ඇතුළත් මන්නාරම දිස්ත්‍රික්කයේ පල්ලි මුනෙ, පරපාන්කන්දල් සහ වංගාලෙ ගම්මාන නැවත එම ජනතාවට ලබා දීමේ වැඩපිළිවෙළ කඩිනම් කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

පරපාන්කන්දල් හා වංගාලෙ ගම්මාන නැවත ජනතාවට ලබා දීමට අවශ්‍ය ඉදිරි පියවර ගැනීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව වනජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

පල්ලි මුනෙ ගම්මානය සම්බන්ධයෙන් ඉඩම් බැහැර කිරීමක් සිදු කළ යුතු බැවින් අමාත්‍යාංශ මට්ටමින් උපදෙස් ලබා ගත යුතු බව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

පල්ලිමුනෙ ගම්මානය හැර සෙසු ගම්මාන දෙක ජනතාවට ලබා දීමට අවශ්‍ය කටයුතු කඩිනම් කරන මෙන් ගරු සභාපතිතුමා විසින් වනජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් ලබා දෙන ලදී.

## 3.24. ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 3.24.1. වවුනියාව, නෙඩුංකේනි, වෙඩුක්කුනාරි මලෙයි ශිව කෝවිලට යන මාර්ගය ජනතාවට විවෘත කර දීම

2020.12.03 දින පැවැති රැස්වීමෙහි කාර්ය සටහන්වල 4.7.2 හි සඳහන් කරුණ - "වවුනියාව, නෙඩුංකේනි, වෙඩුක්කුනාරි මලෙයි" යනුවෙන් සංශෝධනය විය යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් සඳහන් කරන ලදී.

මෙම කෝවිලට යන මාර්ගය බැතිමතුන් සහ වාහනවලට ගමන් කළ හැකි පරිදි නිදහස් කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.

මෙම කෝවිල පුරා විද්‍යා රක්ෂිතය තුළ පිහිටා ඇති බැවින් එම ප්‍රදේශය ආශ්‍රිතව වෙනත් ක්‍රියාකාරකම් සිදු නොකරන ලෙස දැනුම් දී ඇති බව වනජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා මීළඟ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවට පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කැඳවීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශයේ ලේකම්වරයාට උපදෙස් ලබා දෙන ලදී.

### 3.24.2. මුලතිව් දිස්ත්‍රික්කයේ අක්කර 2500 ක කුඹුරු ඉඩම් වන සංරක්ෂණ කලාපයෙන් නිදහස් කර ගැනීම

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මායිම්වලට ඇතුළත් කර ඇති මෙම ඉඩම් නිදහස් කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**3.24.3. වවුනියාව සෙට්ටිකුලම දිස්ත්‍රික් ලේකම් කොට්ඨාශයේ ආණ්ඩියා පුලියංකුලම 207 වසමට අයත් කෘෂි ඉඩම් වන සංරක්ෂණ කලාපයෙන් නිදහස් කර ගැනීම**

මෙම කෘෂි ඉඩම් වන සංරක්ෂණ කලාපයට ඇතුළත් කර ඇති බැවින් එම ඉඩම් නිදහස් කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**3.24.4. මඩකලපුව දිස්ත්‍රික්කයේ කෙවිලියාමඩු ප්‍රදේශයට අයත් අක්කර පහක පමණ ඉඩමක් මිදි වගාකිරීම සඳහා ග්‍රාම ආරක්ෂක නිලධාරීන් වෙත ලබා දීම**

මිදි වගාකිරීම සඳහා  ග්‍රාම ආරක්ෂක නිලධාරීන් වෙත ලබාදී ඇති මෙම ඉඩම එම ප්‍රදේශයේ ජන අනුපාතය වෙනස් කිරීම සඳහා ගත් උත්සාහයක් බව පෙනී යන බැවින් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස  ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.

ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධයෙන් පරීක්ෂා කර මීළඟ කාරක සභා රැස්වීමට වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශ නිලධාරීන් වෙත උපදෙස් ලබා දෙන ලදී.

මෙම ගැටලු සම්බන්ධයෙන් පරීක්ෂා කර පිළිතුරු ඇතුළත් වාර්තාවක් ගරු මන්ත්‍රීතුමා වෙත ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශ නිලධාරීන් වෙත උපදෙස් ලබා දෙන ලදී.

**4.** කාරක සභාව 2021.09.21 දින ප.ව.04.30 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---